

දිවයින
ඉරිදා සංග්‍රහය

ලිපි මාලාවක් ඇසුරින්

අතහැරීම 10

මහ රහතුන් වැඩි මඟ ඔස්සේ

ඉදිරිපත් කිරීම

ඉන්ද්‍රජිත් සුබසිංහ

මහ රහතුන් වැඩි
මඟ ඔස්සේ

අතහැරීම 10

ඉදිරිපත් කිරීම
ඉන්ද්‍රජිත් සුබසිංහ

දිවයින ඉරිදා සංග්‍රහයේ
ලිපි මාලාවක් ඇසුරිනි

© ඉන්ද්‍රජිත් සුබසිංහ

පළමුවන මුද්‍රණය - 2017 ජූලි
දෙවන මුද්‍රණය - 2017 අගෝස්තු

වෙබ් පිටුව:

www.maharahathunwedimagaosse.com
www.mrwo.lk

ISBN - 978-955-7887-22-7

පොත ලබාගත හැකි ස්ථාන :

දිවයින පුරා පොත් අලෙවිසැල්
තැපැල් මගින් ඔබට ආසන්නම තැපැල් කාර්යාලය වෙතට

මෙතෙක් පළ වී ඇති පොත් පිළිබඳ සම්පූර්ණ විස්තරය සඳහා
පසුපස කවරයේ ඇතුල් පැත්ත බලන්න.

විමසීම් -

දුරකථන: 011 2755767
011 2755768 (සතියේ දිනයන්හිදී පෙ.ව. 9.30 සිට ප.ව. 4.30 දක්වා)

ඡායාරූප
වාසල සේනාරත්න

මුද්‍රණය සහ බෙදාහැරීම
ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂන්ස් සෙන්ටර්
444/3B, පිටිපන දකුණ, හෝමාගම

(සෝයා තෙල් භාවිතයෙන් නිපදවනු ලැබූ, විෂ රහිත පරිසර හිතකාමී තින්ත භාවිතයෙන් මුද්‍රිතයි.)

මහරහතුන් වැඩි මඟ ඔස්සේ

මේ ලිපි මාලාව ලියූ ස්වාමීන්
වහන්සේ මේ වන විට කොහි වැඩ
සිටිනවා දැයි මම
නො දනිමි. එහෙත් උන්වහන්සේ
මේ පින්බිමේ කුමන හෝ ගැඹුරු
වනගැබක අලි, කොටි, වලසුන්
මැද ඒක විහාරීව දහම් සුව විඳිමින්
සිටිතැයි මම විශ්වාස කරමි. මේ
ඝෝර කටුක සංසාරයේ බිය දැක
මේ ආත්මයේදී ම සසර
=කින් එතෙරවීම අදිටන් කරගනිමින්
ඍජුව නිවන් මඟ ගමන් කළ
උන්වහන්සේ ලබා ඇති මග ඵල
ගැන කියන්නට තරම් මම සමතෙක්
නො වෙමි. එහෙත් උන්වහන්සේ
වැඩිය යුතු බවුන් වඩන උතුමකු බව
කියන්නට මම නො පැකිළෙමි. තම
අවබෝධය මෙන් ම අත්දැකීම් ද
උන්වහන්සේ සතු වූ සටහන් පොත්
කිහිපයක සංස්කරණය නො කළ
සටහන් ලෙසින් මා අතට පත් කළ
උන්වහන්සේ නො පෙනී
ගියහ. එහෙත් ඒ සටහන්
කෙතරම් දාර්ශනික ද, ගැඹුරු
ද, ආශ්චර්යමත් ද, නිවන්
ම'ට පිළිපන් ගිහි පැවිදි උභය
පාර්ශවයට ම මෙය අගනා
පූජාවක් වනු ඇතැයි මගේ පුහු=න්
සිත කියයි. මේ සියල්ල ඔබ
වෙත ඉදිි%පත් වුව ද ඒවා ලියූ
උන්වහන්සේගේ නාමය හෙළි නො
කරන සේ කරන ලද ඇයැ=මක්
ද විය. ක්තෘ අඥාත වුව ද මේ
සියල්ල ඔබ හැමගේ යහපතට
හේතු වනු නිසැක ය. ඒ නිසා ම
මා ලද ඒ අතිශයින් අගනා දහම්
පඬුර පොතක් ලෙසින් ඔබ අතට
පත්කිරීමට මට ඉඩ =න මැනවි!

(2012 වෙසක් පුන් පොහෝ දින)



(පින්වත් ඔබ වෙනුවෙන් මෙම සටහන් තැබූ භික්ෂුන් වහන්සේ විසින් ලියුවකි.)

'මහ රහතුන් වැඩි මඟ ඔස්සේ ' ලිපි මාලාව පින්වත් ඔබ වෙනුවෙන් පුදනු ලැබූ උන්වහන්සේ එදා ඒ සටහන් තබනු ලැබුවේ අප්‍රකටව ය. මහා ඝන වනන්තරයේ ඈත කුටියක සිට, සිතත්, පරිසරයත් සහමුලින් ම නිසල මොහොතක, ලොව ම නිදනා රාත්‍රියක, විටෙක රූස්ස ගස් අතරින් පෙරී එන ළහිරු කිරණ හෝ තවත් විටෙක ලන්තෑරුමේ දුප්පත් එළියේ පිහිටෙන් තැබූ ඒ සටහන් දිවයින සිසාරා සදහම් සුවඳ වී හමා ගියේ ය. ඒ සුවඳ හමන්නේ කොයි ඉසව්වෙන් දැයි සැඳැහැති දනෝ විමසූහ. ඒ දහම් සුවඳින් හදවත සුවඳවත් කරගත් අයෙක් භාග්‍යවතුන් වහන්සේගේ ඒ දහම් සුවඳ පතුරුවාහළ බුදුපුතුන් දැකීමට ප්‍රාර්ථනා කළහ; සත්‍යක්‍රියා කළහ; තවමත් ගළපාගත නොහැකි දහම් ගැටලුවක් වේ නම් එය ඒ පින්වත් ස්වාමීන් වහන්සේගෙන් ම විමසා ගළපාගැනීමට උනන්දු වූ හ.

කාලයාගේ ඇවෑමෙන් ඒ ප්‍රාර්ථනා ඉටු විය. සටහනකින් ඔබ දුටු උන්වහන්සේව සියැසින් දැකගැනීමට ඔබට හැකි විය. නැතිනම් ඔබට ඒ සඳහා හේතු තිබුණි. එතෙක් ඇසින් කියවූ දහම් ගැළපුම දෙසවනින් ඇසීම උදෙසා දසදහස් ගණනින් රැස් වූ හ. පිරිස කොතරම් උන්වහන්සේ වටා රැස් වුව ද, උන්වහන්සේ උන්වහන්සේගේ ස්වභාවයෙන් ම සිටි සේක. රැස් වන කඳු ගණන් පිරිකර ද, දහස් ගණන් පිරිවර ද ලෝකය වශයෙන් ම, මාරයා වශයෙන් ම දුටු සේක. ප්‍රශංසාවත්, සාධුකාරයත්, ගැරහුමත්, විවේචනයත් ධර්මයට ම ගැළපූහ.

වනයේ රුක්ෂ මණ්ඩලයක රැඳුණු හුදකලාව තමන් වහන්සේගේ විවේකය පිණිසත්, ගම-නගරයේ සැකසුණු ධර්ම මණ්ඩපයක ඉල්ලීම ධර්මකාමී ජනතාවගේ පහසුව පිණිස කැපකිරීමක් ලෙසත් වස්කාලයෙන් වස්කාලය, උන්වහන්සේ ඉකුත් වසර කිහිපය ගෙවා දැමූහ. නමුත් උන්වහන්සේ අප සැම කෙරෙහි අනුකම්පාවෙන් අඛණ්ඩව ම ශ්‍රී සද්ධර්මය අප සැම වෙත දායාද කළ සේක. මේ එවැනි වූ තවත් උතුම් දහම් ගැළපුම් පෙළක එකතුවකි.

පිදුම

මේ අනන්ත වූ සංසාරයේ අප කරක් නො ගැසූ තැනක් වේ ද? අත් නො විඳි අත්දැකීමක් වේද්ද? ඒ සා තැන්හි කරක්ගසා, ඒ සා අත්දැකීම් විඳ මෙලෙසින් තවත් උපතක් ලැබූ අපි මේ භව-චක්‍රයේ තවත් කැරකෙමු ද? අප හැමදා ම කැරකුණේ එක ම තැනක් වටා ය; විඳගත්තේ ජාති, ජරා, ව්‍යාධි, මරණ වැනි එක ම අත්දැකීම් පෙළකි.

හිත හැරුණු අතේ, හිස හැරුණු අතේ යන්නන් වාලේ ගිය මේ ගමනේ වෙහෙස යනු 'දුක' යැයි කියාදුන්, ඒ දුකට සමුදීමේ ක්‍රමවේදය 'දුක අවබෝධ කිරීම' යැයි කියාදුන්, දුක අවබෝධ කිරීමේ උත්සාහයට වචනයකින් හෝ ආදර්ශයෙන් හෝ සවිය දෙන කල්‍යාණ මිත්‍රයෙක් යැයි කියන්නා වූ යමෙක් වෙත් ද, ඒ කල්‍යාණ මිත්‍රයා වෙනුවෙන් මෙය පුදමි.

ඉන්ද්‍රජිත්

පටුන

නිරය ඇත්තේ මිහිපිට ම ද...? 1

නිරය යනු කෘත්‍රිම වූ මැවීමක් ද? 5
නැතිනම් ස්වාභාවික පරිසරයක් ද?

නිරය යනු අස්වාභාවික මැවීමක් නො වන බව තවදුරටත්.... 9

මේ කීවේ නිරයන් 128ක් අතුරින් 7ක් ගැන පමණි 12

සංස්කාර නම් මැජික්කාරයා දකගන්න 15

පින දැක සැඟවෙනු කුමකට සිල් රැක එය විඳිනු මිසක 19
(භික්ෂුව මල් ඇතිරූ පාවඩ මතින් ගමන් කළේ ඇයි...?)

ඔබ අනුන්ගේ සංස්කාරයන්ට ඔරවන්නෙක් ද? 24

කල්ප විනාශයක දර්ශන මාත්‍රයක්.... 27

වධකයා කලණ මිතුරු වෙස්ගෙන ඒවි. පරිස්සමෙන්.... 31

සසුන රැක්කොත් එහෙමයි, සසුන නැසුවොත් මෙහෙමයි.... 33

තෘෂ්ණාවේ ආධිපත්‍යයට එරෙහිව අභියෝග කිරීම පිණිස.... 37

ඔබ ශීලයෙන් දුර්වල අය සමඟ ගැටේ ද? 41
එසේ නම් වරද ඒ අයගේ නොවේ

භික්ෂූන් වහන්සේ නමක් සමඟ කටයුතු
කරන විට උපේක්ෂා සහගත වන්න 46

ශීලයෙන් පරිපූර්ණ වූ පමණින් භවයේ සුරක්ෂිත වේ ද? 49

චිත්ත විශුද්ධියෙන්, ප්‍රඥා විශුද්ධියෙන් දුර්වල නම්.... 52

සම්මා දිට්ඨිය නමැති නිවැරදි දොරටුවෙන් ඇතුළු වෙන්න 56

දෙවන කොටස - විශේෂ ලිපි 59

තමන්ගේ ආයු කාලයෙන් තවත් වසරක් ගෙවී යනවා නේ ද? එසේනම්.... 61

පින නිසා ලැබුණු දේ පවට නම් බිලි නො දෙමු 66

අලුත් අවුරුද්දෙත් ඔබ පරණ චරිතය ම ද? 72

ආයු බෝ වන්න, නව වසරේ මේ ගැනත් සිතන්න 77

පන්සල, ආරණ්‍යය කුසලයට ම මිස අකුසලයට නම් නො යොදන්න 83

මත් පානයත්, මත් දානයත් දුරින්ම දුරුකරන්න 86

පිටි කොටන්න ගිය කාලය ඉතිරිවුණා 89
ඉතිරි කරපු කාලයේ කෝ පිං පිරුණා

මේ, මා ඔබට දුන් අලුත් අවුරුදු තෑග්ග යි 91

සිංහල බෞද්ධකම ධර්මයෙන් අර්ථ ගැන්වූ අවුරුදු උදාවකට.... 95

අබුද්ධෝත්පාද කාලයන්ගේ කටුක බව ගැන සිතා මේ තෙමඟුල අර්ථවත් කරගන්න 105

ලස්සන වෙසක් සැරසිල්ලෙන් ද අර්ථවත් ධර්මයක් ම දකින්න 112

බුදු සිතක උපදිනා සිතිවිල්ලක් ඔබේ සිත තුළත් උපදවාගන්න 116

මැතිවරණයක සැඟ ව ඇති මාරධර්ම 125

තෙවන කොටස 135
(සතර සතිපට්ඨානය සඳහා ප්‍රවේශය සබ්බාසව සූත්‍රය)

භාවනාවට පෙර - මෙසේ කළ යුතු ම ය 137
(සතර සතිපට්ඨානය සඳහා ප්‍රවේශය)

වේදනාවත් සංඥාවත් හඳුනාගන්න 140

දර්ශනයෙන් දුරු කළ යුතු ආශ්‍රවයන් මෙසේ දුරු කරන්න 144

ඉන්ද්‍රිය සංවරය උදෙසා 148

රූපය ඉදිරියේ වහලෙක් නොවී,
නිහඬ උපක්‍රමශීලී ගවේෂකයෙක් වෙන්න 152

ඔබත් මේවා නො දැන, නැති ආශ්‍රවයන් ඇතිකර ගත්තා ද? 156

දකින්න, විශ්වාස කරන්න සංස්කාරයන්ගේ සාධාරණය.... 160

තෘෂ්ණාව දන්දී අහර පමණක් භුක්ති විඳින්න
(ප්‍රත්‍යවේක්ෂාව ගැන....) 165

ඔබේ නිවස පිහිටි බිම්කඩ, සසරේ ඔබ දහස් වරක්
මිහිදන් වූ සුසානය ම නොවේ ද? 169

දිනකට අවම වශයෙන් අකුසල සිත් පහක්
දුරු කරන්න පුරුදුවෙන්න 173

භික්ෂූන් වහන්සේගේ ඥාතිත්වය හඳුනාගන්න
(නැතහොත් නැති ආශ්‍රවයන් ඇති වේවි) 177

හොඳ ළමයෙක් වීමට වඩා අවබෝධාත්මක
ළමයෙක් වීමයි වටින්නේ 181

මඟහැරිය යුතු දේ මඟ නො හැරියහොත්.... 186

මඟහැර යාමෙන් මේ ආශ්‍රවයන් ද දුරු කළ හැකි ය 190

පුංචි කුහුඹුවාගෙනුත් ඔබ ලොකු ආශ්‍රවයන් ඇතිකර ගන්නවා ද? 194

මෙතැන් සිට සමථ-විදර්ශනාවට එන්න 197

(මෙතැන් පටන් ඉදිරියට ඇති ලිපි කිහිපය තුළ ඉදිරිපත් කෙරෙනුයේ පිංවත් භික්ෂූන් වහන්සේ විසින්, මේ ඝෝර, කටුක, භයානක සසරේ ඇති නිරය නම් අතිශය දරුණු අවදානම පිළිබඳ පිංවත් ඔබට කරනු ලබන විග්‍රහයකි.)

නිරය ඇත්තේ මිහිපිට ම ද...?

(නිරය - 1)

වස්සාන කාලය නිමා කරලා භික්ෂුව ගම්මානයේ පිංවතුන්ලාට පින් අනුමෝදන් කිරීමේ පිංකමක් සිද්ධ කළා. හුදෙකලාව කුටිවල වස් ශීලය සමාදන් වන ස්වාමීන් වහන්සේලාට කඨින චීවරයක් පිළිගැනීම කැප නැහැ. කඨින චීවරයක් පිළිගැනීම තුළ කළයුතු විනය කාරණාවන් කිහිපයක් ම තිබෙනවා. එම විනය කර්මයන් සිදුකරගන්න අවම වශයෙන් උපසම්පදා ස්වාමීන් වහන්සේලා පස්නමක්වත් වැඩසිටිය යුතු වෙනවා. මේ හේතුව නිසා හුදෙකලාව කුටිවල වස් පවාරණය කරන ස්වාමීන් වහන්සේලා කඨින වස්ත්‍ර පිළිගැනීමකින් තොරව පිං අනුමෝදන් කිරීමේ පිංකමක් පමණයි සිදුකරන්නේ. පිංකමට පැමිණි එක පිංවතෙක් භික්ෂුවගෙන් ප්‍රශ්නයක් විමසුවා. එම ප්‍රශ්නය තමයි, "ස්වාමීන් වහන්ස, අපාය තිබෙන්නේ මනුෂ්‍ය ලෝකයේ ද?" කියලා.

මනුෂ්‍යයා තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් දුර්වල වනවිට, මනුෂ්‍යයා තුළ අකුසල මූලයන් ශක්තිමත් වෙන විට සුගතිය, දුගතිය පටලවා ගන්නවා. එම පිංවතුන් තමන් ඉපදුණු මනුෂ්‍ය ලෝකය නමැති සුගතියත්, දුගතියක් වශයෙනුයි දකින්නේ. සුගතිය දුගතියක් කර දකින පිංවතා නිරතුරුව ම සුගතිය අහිමි කරගන්නවා.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, පිංවත් ඔබ යම්හෙයකින් මැරෙන මොහොතේ "උපාදාන පච්චයා භවය" කියන ධර්මතාව හේතුවෙන් සතර අපායන්ට අයිති නිරයට වැටුණොත්, නිරය පාලකයෝ එම නිරිසතුන්ව පංචවිධ

බන්ධනයට ලක් කරනවා ය කියලා. පංචවිධ බන්ධනය කියලා කියන්නේ, නිරිසතාව ගිනියම් වූ පොළවේ මුනින් අතට නිදිකරවා, අත් දෙකට, කකුල් දෙකට, උදරයට රත් වූ යවුල් ගසා පොළවට සිරකරනවා. දෙවනුව යමපල්ලන් නිරිසතුන්ව දෙපයින් සිටුවා හිසේ පටන් මුවහත ඇති වෑයකින් රහිනවා. තියුණු පිහියකින් කෙසෙල් බඩයක් රහින්නේ, පෙති කපන්නේ යම් සේ ද එලෙස එම නිරිසතාව රහිනවා. දුකෙන් පීඩිතව මියයන සතා එතැන ම නැවත ඉපදෙනවා. ආයිමත් යමපල්ලන් එම නිරිසතාව ඔළුවෙන් සිටුවා වෑයෙන් රහිනවා ය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

ඝන යකඩ පවුරින් වටවුණු, ඇවිලෙන ගිනිදැල්වලින් යුත්, සියක් යොදුනක් පැතිර පවතින මහා නිරයන් දෙකවන, චතුස්තම්භ සහ චතුර්ද්වාරයේ දොරටුව යම් කාලයක දී විවෘත වෙනවාය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. පිච්චීමෙන් බේරීම සඳහා විවෘත වූ දොරටුව දෙසට දුවයන නිරිසතාගේ සිවිය ද, සම ද, මස ද, නහර ද, ඇට ද, ඇට මිදුලු ද ගිනිදැල්වලට පිච්චිලා යනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, යම් නිරිසතෙක් ගූථ නිරයට වැටුණොත්, ගූථ නිරයේ සිටිනා තියුණු තුඩ සහිත පණුවන් එම නිරිසතාගේ සිවිය, ඇට, මස්, නහර සිඳ කනවා ය කියලා. ගූථ නිරයට සමාන්තරව පිහිටා තිබෙන උණු අළු නිරය ගිනියම් වූ අළුවලින් සැදුණකි. අළු නිරයට සමාන්තරව පිහිටි, සියක් යොදුනක් උසට නැගුණු හිඹුල් වනයේ කටු උල් ඇති, ඒ සෑම කටුවක උලකින් ම ගිනිදැල් නැඟෙන හිඹුල් වනයේ ඇති ශාකවල කටු උල්වලට නිරිසාගේ සම්, මස්, නහර ඉරී, පැලී, තැලී මරණීය දුකට පත්වෙනවා.

නිරයේ හිඹුල් වනයට සමාන්තරව පිහිටි අසිපත්‍ර වනයේ තියුණු මුවහත ඇති පත්‍ර, ඒ කියන්නේ කොළ වාතයෙන් සෙලවී නිරිසතුන්ගේ අත්, පා, ගෙල, නාසය, කන සිඳ දමනවා. අසිපත්‍ර වනයේ සිටින සෑම නිරිසතෙක් ම සෑම තප්පරයක දී ම තියුණු

මුවහත ඇති පත්‍රවලින් කැපී යනවා. ලී මෝලක දැව කොටයක් පරාල, රීප්පවලට ඉරී යන්නා සේ නිරිසතුන් කැලිවලට ඉරී යනවා.

අසිපත්‍ර වනයට සමාන්තරව පිහිටි වෛතරණී ක්ෂාරෝදක නදිය යනු උණු වූ, ගිනියම් වූ ලෝදිය ජලය බවට පත් වූ ගංගාවක්. ක්ෂාරෝදක නදියට වැටෙන නිරිසතුන් ගිනිගෙන දැවෙන ලොහොදිය ම ජලය ලෙස පානය කරනවා. යමපල්ලන් ලොහොදිය ජලය නිරිසතුන්ගේ කටට වත්කරනවා. එවිට නිරිසතුන්ගේ මුව, දෙතොල්, උගුර, උදරය ගිනිගෙන දැවෙනවාය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

නිරිසතුන් මහ නිරයෙන් ගුථ නිරයට වැටෙනවා. ගුථ නිරයෙන් උණු අළු නිරයට වැටෙනවා. උණු අළු නිරයෙන් හිඹුල් වනය නිරයට වැටෙනවා. මෙසේ නිරිසතුන් නිරයෙන් නිරයට වැටෙන ස්වභාවය පිළිබඳව යම් වැටහීමක් ඇතිකර ගැනීමට පහත සිද්ධියෙන් පුළුවන්කම ලැබෙනවා.

පිංවත් මහත්මයෙක් භික්ෂුවට ප්‍රකාශ කළා, එක්තරා අවස්ථාවක තමන්ට දහවල් එකට පමණ තද අව්රශ්මිය ඇති මොහොතක, අනුරාධපුර ප්‍රදේශයේ ගල් තලාවක පාවහන් රහිතව ගමන් කරන්න සිදුවුණා ය කියලා. තද අව්රශ්මියෙන් පොළව ගිනියම් වෙලා තිබීම නිසා නිරාවරණ දෙපාවල යටිපතුල්වල දියපට්ටා ඇවිල්ලා. ඒ වෙලාවේ යටිපතුල් පිච්චීමේ වේදනාව උසුලාගන්න බැරිව ඒ මහත්මයා දුවගෙන ඇවිත් එතන තිබ්චච කුඩා තණබිස්සකට ගොඩවෙලා. එම තණබිස්සේ තනිකරම තිබිලා තිබෙන්නේ නිදිකුම්බා කටු. අව්රශ්මියට පිළිස්සුණු යටිපතුල්වලට දැන් කටු ඇනීමේ වේදනාවත් එකතුවෙලා. එම වේදනා දෙකෙන් ම මිදෙන්න දුවගෙන ඇවිත් ඒ අවට තිබුණු මඩ සහිත කුඩා වගුරකට බැහැලා, මඩේ තිබුණු බෝතල් කටුවකට කකුල කැපිලා. බලන්න, විනාඩි පහක් වැනි පුංචි කාලයක දී යටිපතුල් පිච්චීමේ වේදනාවෙන් මිදෙන්න ගිහිල්ලා කටු ඇනීමේ වේදනාවට පත්වුණා. කටු ඇනීමේ වේදනාවෙන්

මිදෙන්න ගිහිල්ලා බෝතල් කටුවට යටිපතුල කැපී රුධිරය ගැලීමේ වේදනාව අයිතිකොට ගත්තා. ඉහත සිද්ධියට අදාළව පිංවතුන්ලාට නිරිසතුන් නිරයකින් තවත් නිරයකට වැටීමේ ස්වාභාවික ක්‍රමවේදය තේරුම් ගන්න පුළුවන්කම තිබෙනවා. එක නිරයක තියුණු කටුක වේදනාවෙන් මිදෙන්න යන විට තවත් නිරයක දුක අයිතිකර ගන්නවා. සැපයක් සොයන මොහොතක, අකුසලය හේතුවෙන් වේදනාව ම, දුක ම පිහිටට එනවා.

වර්තමාන සමාජයේ දැනුම ජීවිතය කොටගත් සමහරක් පිංවතුන්ලා නිරයේ ඉහත ක්‍රියාකාරකම් හාස්‍යයෙන් යුතුව ප්‍රතික්ෂේප කරනවා භික්ෂුව දැක තිබෙනවා. උතුම් ශ්‍රී සද්ධර්මය නුවණින් මෙනෙහි කර දැකීමට ඇති අදක්ෂභාවය නිසා ම අපායක්, නිරයක් නැහැයි කියන පිංවතුන්ලා සකස්කර ගන්නා එම මිථ්‍යා දෘෂ්ටික සිතුවිල්ල නිසා ම නිරයට වැටීමට අදාළව අකුසල් සංස්කාරයන් රැස්කර ගන්නවා.

නිරය යනු කෘත්‍රිම වූ මැවීමක් ද? නැතිනම් ස්වාභාවික පරිසරයක් ද?

(නිරය - 2)

නිරය කියලා කියන්නේ යොදුන් දසදහස් ගණනක් මහපොළව යට තිබෙන ස්වාභාවික පරිසරයක්. නිරය කියන්නේ කවුරුන් හෝ වැරදිකරුවන්ට දඬුවම් දෙන්න කෘත්‍රිමව ඇති කළා වූ පරිසරයක් නො වේ. නිරය කියන්නේ දෙවියෙක්, බ්‍රහ්මයෙක් මැව්වා වූ පරිසරයක් නො වේ. පිංවත් ඔබ, මනුෂ්‍යයා වාසය කරන මේ මනුෂ්‍ය ලෝකය නමැති පරිසර පද්ධතිය උපමාවට ගන්න. තද අව්රශ්මියෙන් ගිනිගන්නා කාන්තාර කලාපයන් තිබෙනවා. තද ශීතලෙන් අයිස් මිදෙනා කලාපයන් තිබෙනවා. තද සුළං, මීදුමෙන් යුත් පරිසර කලාපයන් තිබෙනවා. නිරය කියලා කියන්නේ ස්වාභාවික පාරිසරික කලාපයක්. පිංවත් ඔබ ජීවත්වන මනුෂ්‍ය ලෝකයේ ප්‍රමාණයෙන් හතරෙන් තුනක් ම මහා සාගරය විසින් වසාගෙනයි තිබෙන්නේ. මනුෂ්‍ය ලෝකයේ බිම් ප්‍රමාණයෙන් හතරෙන් එක් කොටසක් පමණයි, මනුෂ්‍යයාගේ වාසස්ථාන බවට පත්වෙලා තිබෙන්නේ. නමුත් මහා සාගරය යටත් නිරයන් පිහිටා ඇති නිසා මනුෂ්‍ය ලෝකයේ මනුෂ්‍යයා ජීවත් වන බිම් ප්‍රමාණය වගේ තවත් තුන්ගුණයක් නිරයේ බිම් ප්‍රමාණය විශාල වෙනවා.

කවදාහරි අනාගතයේ දවසක කල්ප විනාශයක් සිදුවෙනවිට මහා සාගරය සිඳීගොස් වැලිතලාවක් බවට පත්වෙනවා. සිඳී ගිය මහා සාගරයට තවත් යොදුන් දහස් ගණනක් යටින් නිරයන් පිහිටලා තිබෙනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

පිංවත් ඔබට දැන් වැටහෙන්න ඕනේ, නිරය කියලා කියන්නේ මොන තරම් පැතිරුණු සංකීර්ණ වූ, මහපොළොව යට තිබෙන ස්වාභාවික පාරිසරික කලාපයක් ද කියලා. එම ස්වාභාවික පරිසරය ගිනියම් වූ, උෂ්ණත්වය අධික පරිසරයක්. පිංවත් ඔබ, මනුෂ්‍ය ලෝකයේ ගිනිකන්දක් සිහියට නඟාගත්තොත් ගිනිකන්දක් සක්‍රීය වී ලාවා වැගිරෙන හැටි, ගින්දර වැගිරෙන හැටි, උණු අළු වැගිරෙන හැටි, උණු දිය වැගිරෙන හැටි සිහියට නඟාගන්න. පිංවත් ඔබ දකින ගිනිකන්දක් කියන්නේ, එහි ක්‍රියාකාරීත්වය කියන්නේ ස්වාභාවික පාරිසරික ක්‍රියාදාමයක්. නිරයන්ගේ පාරිසරික ස්වභාවයන් මෙයට සමාන යි.

පිංවත් ඔබ, මනුෂ්‍ය ලෝකයේ තිබෙන ගිනිකන්දක් සිහියට නඟාගෙන මේ මුළු මනුෂ්‍ය ලෝකය ම ගිනි කන්දක් කර මොහොතක් දකින්න. එම ගිනිකන්දෙන් ලාවා වැගිරෙන හැටි, ලෝදිය වැගිරෙන හැටි, ලෝදියෙන් ගංගා පිරෙන හැටි නුවණින් දකින්න. නිරය කියලා කියන්නේ මීට සමාන, අධික උෂ්ණත්වයෙන් යුත්, ස්වාභාවිකව ගොඩනැගුණු පාරිසරික පද්ධතියක්.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, යොදුන් සියයක් පුරා පැතිර පවතින මහනිරයන් දෙක ඝන යකඩ පවුරකින් වටවෙලා තිබෙනවා ය කියලා. ශ්‍රද්ධාව දුර්වල පිංවතුන්ලා ප්‍රශ්න කරනවා, මහපොළොවෙන් යොදුන් දසදහස් ගණනක් යට කොහොමද යකඩ පවුරක් තිබෙන්නේ, කවුද මේවා හැදුවේ කියලා.

එම ඝන යකඩ පවුරු කවුරුන් හෝ හැදුවා වූ යකඩ පවුරක් හෝ කවුරුන් හෝ මැව්වා වූ යකඩ පවුරක් නො වේ. නිරයේ ගිනිගෙන ගලායන ලෝදිය ඝන වීමෙන් ස්වාභාවිකව ම සැදුණා වූ ඝන යකඩ පවුරකින් තමයි, මහනිරයන් දෙක වට වී තිබෙන්නේ.

යම් කාලයක් ගතවූවාට පසුව මහනිරයේ ඝන යකඩ පවුරේ දොරටුවක් විවෘත වෙනවා ය කියන්නේ, යමපල්ලෙක් විවෘත කරනවා හෝ ස්වයංක්‍රීයව එම දොරටුව විවෘත වෙනවා නො වේ.

එම ඝන යකඩ පවුරේ යම් විවරයක් ස්වාභාවික හේතූන් නිසා ම විවෘත වෙනවා. පිංවත් ඔබ නුවණින් දකින්න, තද මීදුම තිබෙන වෙලාවට පරිසරය සම්පූර්ණයෙන් ම මීදුමෙන් වැසී යනවා. හිරු මතු වී එනවිට මීදුම බැහැර වී යනවා. කම්මලේ යකඩයක් හොඳින් රත් කරන විට එම යකඩය ගිනියම් වී මුලින්ම ප්‍රමාණයෙන් ලොකු වෙනවා. ඒ වගේ නිරයේ උෂ්ණත්වයේ වැඩිභාවය නිසා වැසී තිබෙන විවරයන්, යම් මොහොතක ස්වාභාවික හේතූන් මත ඇතිවන උෂ්ණත්වයේ අඩුභාවයන් නිසා එම ඝන ස්වභාවය දියවී ගොස් විවරයක් විවෘත වෙන්න පුළුවන්. නැවත ක්ෂණිකව ඇතිවන උෂ්ණත්වයේ දැඩිභාවය නිසා එම විවෘත වූ විවරය වැසීයන්න පුළුවන්. මහනිරයන්ගේ දොරටු යම් කාලයක දී කෙටි මොහොතකට විවෘත වෙනවා ය කියන්නේ මෙවැනි ස්වාභාවික පාරිසරික හේතූන් නිසා වෙන්න පුළුවන්.

මහනිරයන්ට සමාන්තරව උණු අළු නිරය තිබෙනවා ය කියනවා. මහනිරයන්ගේ ගිනි ජාලාවන්ට පිළිස්සී ගලා එන ලෝදිය, ලාවා නිවී ඇතිවෙන උණු අළු සහිත පරිසර කලාපය, මේ උණු අළු නිරය වෙන්න පුළුවන්. එසේ නැතිව කවුරුන් හෝ උණු අළු නිරයක් කෘත්‍රිමව නිර්මාණය කෙරුවා නො වේ. නිරයේ දැඩි උෂ්ණාධික පරිසරයේ ස්වාභාවික හේතුඵල ධර්මයනුයි, ඉහතින් පිංවත් ඔබ දකින්නේ.

පිංවතුන්ලා කියනවානේ, නිරයට වැටුණහම කටුඉඹුලේ නග්ගනවා ය කියලා. නිරයේ තිබෙන්නේ එක කටුඉඹුලක් නො වේ. නිරිසතුන් කෝටිගණනින් අකුසලයේ දඬුවම් ලබන නිරයට එක කටුඉඹුලකින් කුමක් කරන්න ද? මේ කටුඉඹුල කියන්නේ, අපේ රටේ සිරගෙදර තිබෙන කෘත්‍රිමව හදපු එල්ලුම් ගසක් වගේ ගසක් නො වේ. නිරයේ ඉඹුල් වනයේ ඇති ඉතාමත් උසට වැඩුණු ස්වාභාවික ශාක පද්ධතිය තමයි කටුඉඹුල් ගස් කියන්නේ. නිරයේ අධික උෂ්ණත්වය නිසා කටුඉඹුල් ගසේ කොළ නැහැ; කටු සහ තියුණු උල් පමණයි තිබෙන්නේ. අපේ රටවල උෂ්ණාධික ප්‍රදේශවල වැවෙන කටු සහ උල් අධික ශාක ගැන පිංවත් ඔබ

මොහොතක් නුවණින් දකින්න. නිරයේ අධික උෂ්ණත්වය නිසා ම එම උෂ්ණත්වයට ඔරොත්තු දීමට එම කටුඉඹුල් ගස්වල කටු සහ උල්, යකඩ සහ වානේ වගේ ම ශක්තිමත්. මෙම ශාකවල කටු මුල් නිරතුරුව ම අධික උෂ්ණත්වයෙන් යුත් පරිසරයට නිරාවරණය වීමෙන්, එම පරිසරයේ ඇති තද සුළං හේතුවෙන්, මෙම කටු, උල් එකිනෙක ගැටීම හේතුවෙනුත් ඉඹුල් වනයේ සෑම ගසකම කටු, උල් තියුණු ලෙස මුවහත් වෙලයි තිබෙන්නේ. නිරයේ කටුඉඹුල් වනයට වැටෙන නිරිසතුන්ගේ සම්, මස්, නහර මෙම කටුවලට, උල්වලට ඇනී ඉරී, කැපී, පැලී යනවා කියන්නේ නිරයේ ස්වාභාවික පරිසර පද්ධතියෙන් ම එම දුක නිරිසතාට උරුම වෙනවා.

නිරය යනු අස්වාභාවික මැවීමක් නො වන බව තවදුරටත්....

(නිරය - 3)

පිංවත් ඔබ මෙහෙම සිතන්නකෝ: මනුෂ්‍ය ලෝකයේ විශාල කැලෑවක් තිබෙනවා. ඔබ ඔය කැලෑවට ඇතුළු වුණොත් එම කැලයේ ඇති ගස්වල මුලක, කඳක, උලක, කටුවක නො ගැටී ඔබට එක දශමයක්වත් ඉදිරියට යන්න පුළුවන් ද? නිරයේ හිඹුල් වනය නමැති කටුක, තියුණු මුවහත ඇති උල්, කටු සහිත කැලෑ ප්‍රදේශයට වැටුණ නිරිසතා සෑම තත්පරයකට ම උල්, කටුවලින් තම සිරුර ඉරී, කැපී වේදනාවට, මරණීය වේදනාවට පත්වෙනවා. හිඹුල් වනයේ මහපොළව ගිනියම් ව ඇති නිසා නිරිසතා ගිනියම් වූ පොළවේ දුවමින් තමයි සිටින්නේ. ගිනියම් වූ පොළවෙන් පිච්චෙන ශරීරය බේරාගන්න, තියුණු කටු, උල් සහිත පරිසරයක දිවයන විට ඇතිවන තත්වය ඔබ නුවණින් දකින්න උත්සාහ ගන්න.

නිරයේ අසිපත්‍ර වනය කියන්නේ ඉහත ආකාරයේ ම නිරයේ ස්වාභාවිකව ම වැඩෙන ශාක පද්ධතියක්. මේවා ගිනියම් වූ පොළවේ යොදුන් දසදහස් ගණන් පැතිර ගිය ශාකයන්. නිරයේ තද ගිනිරස්නයට ඔරොත්තු දෙන ආකාරයට ස්වාභාවිකව ම අසිපත්‍ර වනයේ ශාකවල කොළ, අතු, රිකිලි වානේ, යකඩ වාගේ තදභාවයෙන් යුක්ත යි. අසිපත්‍ර වනයේ අධික උෂ්ණත්වය නිසා රත්වී ඇති ශාකයන්ගේ කොළඅතු, පරිසරයේ ඇති සුළඟට එකිනෙක ගැටීම නිසා මෙම ශාකවල කොළඅතු දැලිපිහියක

මුවහත සේ මුවහත් වෙලයි තිබෙන්නේ. අසිපත්‍ර වනයේ මහපොළව ගිනියම් ව ඇති නිසා, ගින්නෙන් බේරීමට දිවයන නිරිසතුන් තද සුළඟට සෙලවෙන අසිපත්‍ර වනයේ මුවහත ඇති කොළඅතුවල පැටලී ශරීරය ඉරී, පැළී මරණීය වේදනාවන්ට පත්වෙනවා. අසිපත්‍ර වනයේ තද සුළඟට අතුකොළ සෙලවෙන මොහොතක් පාසා නිරිසතුන්ගේ අත, පය, බෙල්ල, කන්, නාසය කැපී යනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, නිරයේ හිඹුල් වනයේ, අසිපත්‍ර වනයේ ඇති ශාකවල කටුවලින්, උල්වලින්, කොළඅතුවලින් ගිනිදැල් පිටවෙනවා ය කියලා. නිරයේ ගස්වලින් ගිනිදැල් පිටවෙනවා ය කියන කාරණය ස්වාභාවික පාරිසරික ඵලයන් ම යි. මනුෂ්‍ය ලෝකයේ හිම වැටෙන ප්‍රදේශවල හිම වැටෙන කාලයට සියලු ම ගස්කොළන්, අතු, කොළ හිම බැඳී අයිස් තට්ටුවක් වගෙයි පෙනෙන්නේ. නිරයේ ගිනිගත් පරිසරයේ හටගන්නා ශාකවල මුල, කඳ, අතු, කොළ, කටු, උල්වලින් ගිනිදලු පිටවීම අරුමයක් නො වන බව පිංවත් ඔබට වැටහෙනවා ඇති. ශීතල දේශගුණයේ ඇති ගස්වලින් ජලය බේරෙනවා වගේ ම ගින්නෙන් ගිනියම් වූ නිරයේ ශාකවලින් ගිනිදැල් විහිදෙනවා. මේ සෑම ක්‍රියාවක් ම ස්වභාව ධර්මයේ ක්‍රියාකාරකම් මිස කවුරුන් හෝ කෘත්‍රිමව ඇතිකරන දේවල් නො වේ.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, නිරයේ අසිපත්‍ර වනයට සමාන්තරව පිහිටි වේතරණී ක්ෂරෝධක නදිය පිළිබඳව. පිංවත් ඔබ ජීවත්වෙන මනුෂ්‍ය ලෝකයේ වැස්ස හේතුවෙන් ගංගා, ඇළ, දොළ, ජලයෙන් පිරීයන්නා සේ අධික ගිනියම් වූ උෂ්ණාධික පාරිසරික කලාපයක් වන නිරයේ ගංගා, ඇළ, දොළ පිරීයන්නේ ගිනිකඳුවලින් ගලා එන ලෝදියෙන්, ලාවාවලින්. මනුෂ්‍ය ලෝකයේ ගඟට ඔබ බැස්සොත් ඔබට වතුර බොන්න පුළුවන්. එය ඔබගේ කුසල් විපාකයක්. නමුත් නිරිසතුන් නිරයේ ගංගාවන්ට වැටුණොත් එම නිරිසතුන්ට බොන්න වෙන්නේ ලෝදිය, ලාවා ම යි. මේ ලෝදිය ගංගාවන් කවුරුත් කෘත්‍රිමව

ඉදිකළා නො වේ. නිරයේ ගිනියම් වූ පරිසරය විසින් ඇතිකළා වූ හේතුඵල ධර්මයන් ම ය.

වර්තමානයේ තද ශීතලෙන් යුත් හිමාලයේ, එම දරුණු ශීතලට ඔරොත්තු දෙන හිමවලසුන්, හිමමුවන් ජීවත්වෙනවා වගේ ම, මැදපෙරදිග තද කාන්තාර ප්‍රදේශවල ඔටුවන් වැනි තිරිසන් සතුන් වගේ ම, කෘමිසතුන් අප්‍රමාණව ජීවත්වෙනවා.

පිංවත් ඔබට වෛද්‍ය උපදෙස් ලැබෙන්නේ, ජලය නටන තෙක් උණුකර පානය කරන්න කියලා. එම උපදේශයේ අර්ථය වෙන්නේ, නටන තෙක් ජලය උණු නො කළොත් එම ජලයේ ජීවීන් ජීවත් වෙනවා ය කියන එක යි. නමුත් වෙනත් පරිසරයක තත්වය මෙය නො වෙයි. ඒ ඒ පාරිසරික තත්වයන්ට අදාළව ඒවායේ ස්වාභාවික ජීවීන් ජීවත්වෙනවා වගේ ම, නිරයේ දැඩි ගිනි උෂ්ණත්වයට අදාළව එම උෂ්ණත්වයට ඔරොත්තු දෙන ජීවීන් සහ ශාක නිරයේ තිබෙනවා.

ගූථ නිරයේ ජීවත්වන, තියුණු තුඩ ඇති පණුවන් කවුරුන් හෝ නිරිසතුන්ට දඬුවම් දෙන්න නිර්මාණය කළ, පෝෂණය කළ පණුවන් නො වෙයි. අතීත බලවත් අකුසල් හේතුවෙන් නිරයේ ශුෂ්ක පරිසරයේ එම පණුවන් උපත ලබනවා. පිංවත් ඔබව මුහුදට වැටුණොත් මාළුන් ඔබව මරාගෙන කනවා වගේ, කිඹුලන් සිටින ගංගාවකට වැටුණොත් කිඹුලන් ඔබව මරාගෙන කනවා වගේ ඔබ ගූථ නිරයට වැටුණොත් ගූථ නිරයේ සිටින තියුණු තුඩ සහිත පණුවන් ඔබව මරාගෙන කනවා. මුහුදට කවුරුවත් මාළු ගෙනත් දැම්මා ද? ගංගාවන්ට කවුරුවත් කිඹුලන් ගෙනත් දැම්මා ද? මේ සියල්ල හේතුඵල ධර්මයන්; ස්වාභාවික පාරිසරික ක්‍රියාකාරකම්. ගූථ නිරයේ පණුවනුත් ඉහත පාරිසරික ක්‍රියාදාමයේ ම කොටසක් වෙනවා.

මේ කීවේ නිරයන් 128ක් අතුරින් 7ක් ගැන පමණි

(නිරය - අවසන් කොටස)

පිංවත් ඔබට දැන් ප්‍රශ්නයක් වෙන්න පුළුවන්, නිරයේ සිටින යමපල්ලන් කියන්නේ කවුරුන් ද කියලා. යමපල්ලන් කියන්නේ නිරයේ උපත ලබා ඇති ආයුෂ, වර්ණය, බලය වැඩි නිරිසතුන් පිරිසක් ම යි. යමපල්ලන් නිරයේ උපත ලබන්නේ අතීත බලවත් අකුසල විපාකයන් නිසා. පිංවත් ඔබ මෙහෙම සිතන්නකෝ: දුප්පත් කම්කරු මහත්මයෙකුත්, රටේ පාලක පිංවතෙකුත් සිහියට නඟාගන්නකෝ. දෙදෙනා ම මනුෂ්‍යයෝ, නමුත් දෙදෙනාගේ ආයුෂ, වර්ණය, සැපය, බලය වෙනස්. සිරගෙදර අලුගෝසු මහත්මයෙක්, මරණ දඬුවමට නියම වූ සිරකරුවන් සිහියට නඟාගන්නකෝ. නිරිසතාත් යමපල්ලාත් කියන්නේ ඉහත ස්වභාවයන්ට යටත් දෙදෙනෙක්. නිරයේ තිබෙන කටුක, උෂ්ණාධික පරිසරය නිසා ම ආයුෂ, වර්ණය, බලය වැඩි යමපල්ලන් නිරතුරුව ම වියරුවෙන් සිටින්නේ. යමපල්ලන් ලබන එක ම සැපය තමයි, නිරිසතුන් දණ්ඩනයට පත්කර ලබන සැපය. යමපල්ලන්ගේ මේ වියරු සැපය නිසා ම යමපල්ලන් අතිශයින් තියුණු අකුසල් රැස්කර ගන්නවා. නිරිසතුන්ගේ අකුසල් විපාකයන් බලවත්භාවය නිසා ම යි, යමපල්ලන්ගේ වියරුභාවය සකස්වෙන්නේ.

පිංවත් ඔබ යුධ සමයක වධකාගාරයක් සිහියට නඟාගන්න. වධකාගාරයේ යුධ සිරකරුවන්ට දසවධ දෙන වධකයන් වධයට ලක්වෙන සිරකරුවන් ගැන දුක්වෙනවා ද? වධකයන්ගේ එකම

වියරුව වඩදීම යි. ඔවුන් අනුනට වධදීමෙන් ම යි තෘප්තියක් ලබන්නේ. විදේශ රටවල සත්ව ගොවිපළවල්වල ඌරන්, හරකුන් මරනවිට එම සතුනට අතිශය කෲර වධයන් පමුණුවනවා. හරකා කකුල් දෙකෙන් බාල්කයක එල්ලලා, එම සතාගේ උගුරු දණ්ඩ කපලා බාල්දියට ලේ ටික එකතුකර ගන්නවා. ඌරන් මැරීමට පෙර එම සතුනට දරුණු ලෙස පහර දෙනවා. සත්ව හිංසාකරුවන් මේ සියල්ල කරන්නේ හරි ම තෘප්තියෙන්. නිරයේ නිරිසතුන්ට දඬුවම් කරන යමපල්ලන්ගේ ක්‍රියාකාරීත්වයත් ඉහත කාරණයන්ට අදාළව පිංවතුන් තේරුම් ගතයුතු යි. මේ මොහොතේ නිරයේ නිරිසතුන්ට දසවධ දෙන යමපල්ලන් ඊළඟ මොහොතේ දුක් විඳින නිරිසතෙක් බවට පත් වී යමපල්ලන්ගේ වියරු දණ්ඩනයන්ට ලක්වෙන්න පුළුවන්.

නිරයන්ගේ යම් ස්වභාවයන් ගැන භික්ෂුව තැබූ ඉහත සටහන සමහරක් පිංවතුන්ලාගේ විවේචනයට ලක්වෙන්න පුළුවන්. මෙම සටහන තුළින් භික්ෂුවට අවශ්‍ය වුණේ නිරය යනු, වැරදි කරන අයට දඬුවම් දීමට කෘත්‍රිමව නිර්මාණය වූවක් නො ව, නිරය යනු මහපොළොව යට තිබෙන ස්වාභාවික පරිසරයක් ය කියන කාරණය පිංවත් ඔබලාට මතුකර පෙන්වන්න.

මනුෂ්‍ය ලෝකයේ ඇති ස්වාභාවික සෞම්‍ය පරිසරයේ පිංවත් ඔබ උපත ලැබුවේ අතීත පිනේ ශක්තිය නිසා ම යි. තවත් පිංවතෙක් ඈත ශුෂ්ක ප්‍රදේශයක, කාන්තාර ප්‍රදේශයක උපදින්නේ එම පිංවතාගේ අකුසල් සංස්කාරයන් විපාකදීම සඳහා ම යි. අකුසල් සිදුකරගන්නා, සිල්පද දුර්වල කරගන්නා මනුෂ්‍යයෝ, දෙවියන් එම අකුසල් විපාක දීමට ගැළපෙන ගිනියම් වූ ස්වාභාවික පරිසර පද්ධතියක් වන නිරයේ උපද්දනවා.

පිංවත් ඔබ මොහොතක් දෑස් දෙක පියාගෙන, ගිනිකඳුවලින් ගහන පරිසරයක, ලෝදිය, ලාවා මහපොළොව මත ගලාගෙන යන පරිසරයක, උණු අළුවලින් මහපොළොව වැසීගිය පරිසරයක, මුවහත ඇති තියුණු කටු, උල්, කොළ, අතු සහිත ශාක බහුල පරිසරයක, ගංගා, ඇළ, දොළ ලෝදියවලින්, ලාවාවලින් පිරීගිය

පරිසරයක, ඔබ වටා ආයුෂ, වර්ණ, සැප, බලය වැඩි වියරු මිනිසුන්, වධකයන් ජීවත්වන පරිසරයක ඔබ ඉපදුණොත් ඇතිවෙන කටුක දුක මොහොතක් නුවණින් දකින්න. පොළොව ගිනියම් වී ඇති නිසා ඔබට නැවතී සිටින්නත් බැහැ. මුවහත තියුණු කටු, උල්, අතු, කොළ, සහිත ගස්කොළන් නිසා ඔබට දුවන්නත් බැහැ. නමුත් නිරයට ඔබ වැටුණොත් බැහැ කියලා බැහැ. අත, පය, බෙල්ල, සම්, මස්, නහර ඉරාගෙන, කපාගෙන ඔබට දුවන්නට වෙනවා. මොකද, ගිනියම් වූ පොළොව ඔබට නැවතී සිටින්නට ඉඩදෙන්නේ නැහැ. නිරයේ ගිනිගන්නා ස්වාභාවික පරිසරයේ ඔබ උපත ලැබුවොත් නැවතීමක් ගැන හෝ ආරක්ෂා වීමක් ගැන හිතන්නවත් බැහැ.

පිංවත් ඔබ මේ සටහන කියවා අකුසලය ඉදිරියේ, දුශ්ශීලභාවය ඉදිරියේ සතිය, සිහිය ඇතිකරගන්න. එවිට ඔබ නිරයට වැටීමෙන් නැවතුණා වෙනවා; ගිනියම් වූ පොළොවේ අතපය ඉරාගෙන දුවන දිවීම නැවැත්තුවා වෙනවා. අකුසලය ඉදිරියේ පිංවත් ඔබ ඇතිකරගන්නා සතිය, සිහිය මුල්කරගත් සතර සතිපට්ඨාන ධර්මතාවයන් ම යි පිංවත් ඔබව මේසා දරුණු සතරඅපා දුකෙන් මුදවා දෙන්න උපකාරක ධර්මයක් සකස්කර දෙන්නේ. භික්ෂුව ඉහත සටහනින් මතුකර පෙන්වූයේ නිරයන් 128කින් නිරයන් 7ක ස්වභාවය පමණක් බව පිංවත් ඔබට මතක් කර සිටිමි.

සංස්කාර නම් මැජික්කාරයා දැකගන්න

භික්ෂුව පිණ්ඩපාතයේ වඩින කැලෑ මාර්ගයේ අඩිපාර, කොළ අතු වැටිලා අපවිත්‍ර වෙලයි තිබුණේ. ගමේ පිංවත් මහත්මයෙක් ඊයේ සවස එම අඩිපාර හොඳින් අතුගාලා පිරිසිදු කරලා තිබුණා. මහා සංඝරත්නය අරමුණුකොට, මංමාවත් පිරිසිදු කිරීමේ පිනෙන්, මහත්මයාට සුවපහසු, මටසිලිටු බුමුතුරුණු, පලස්, ඇතිරිලි, සැපවත් යානවාහන සහිත මහේශාදී සැපසම්පත් ලැබේවා කියලා භික්ෂුව එම මහත්මයාට පිං අනුමෝදන් කළා. යම් පිංවතෙක් මහා සංඝරත්නය අරමුණු කොට මංමාවත් පිරිසිදු කරනවා නම් ඉහත ආනිශංසයන් ලැබෙනවා ය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. එම නිසා ම ශ්‍රාවකයින් වන අපිත් එම සම්පත් ලැබේවා කියලා ගිහි පිංවතුන්ලාට ආශිර්වාද කරනවා. මෙවැනි ආශිර්වාද කිරීම් හේතුවෙන් ගිහි පිංවතුන්ලා තුළ කුසලය කෙරෙහි තවතවත් ඡන්දය ඇතිවෙනවා. අපි පිංවතුන්ලාට එවැනි සශ්‍රීක ජීවිත ප්‍රාර්ථනා කළත්, වර්තමාන සමාජයේ, පෙර පින නිසා ම මේ ජීවිතයේ දී සශ්‍රීක මහේශාඛ්‍ය ජීවිත ගතකරන, ආයුෂ, වර්ණ, සැපය, බලය සහිත ජීවිත ගතකරන පිංවතුන්ගේ සැපයන් කෙරෙහි ද්වේෂයෙන්, වෛරයෙන් කටයුතු කරන පිරිස් සිටින බව සමාජයේ සිදුවන ක්‍රියාකාරකම් තුළින් විද්‍යමාන වෙනවා. මෙය පිනට කරන අභියෝගයක් වෙනවා.

සිද්ධාර්ථ කුමාරයා කිඹුල්වත් නුවර ශාක්‍ය වංශයේ උපත ලබන්නේ, රම්‍ය, සුරම්‍ය, සුභ මාළිගාවල කුමාර සැපසම්පත් වින්දේ කුසල් සංස්කාරයන්ගේ ඵලයක් නිසා. අනුරුද්ධ මහ රහතන් වහන්සේ ගිහි කුමාර අවධියේ තම සිටු මන්දිරයේ සිට

ඇල්සහල් අනුභව කරනවා. නමුත් මේ ඇල්සහල් ලැබෙන්නේ කොහොමද කියලා අනුරුද්ධ කුමාරයා දැනගෙන සිටියේ නැහැ. මෙවන් මහේශාඛ්‍ය ජීවිත මේ අය ලැබුවේ, අතීත කුසල් සංස්කාරයන්ගේ විපාකයන් නිසා. විශාඛා සිටු දියණියට ලක්ෂ ගණනක් වටිනා මහාමේලපළඳනාව තෑගි ලැබෙන්නේ, අතීත කුසල් සංස්කාරයන්ගේ විපාකයන් නිසා. අනේපිඬු සිටුතුමාට ජේත උයන රන්කාසිවලින් අහුරන්න තරම් ධනයක් ලැබුණේ, අතීත කුසල් සංස්කාරයන්ගේ ඵලයන් නිසා. මේවා සමාජ අසාධාරණයන් නිසා සිදුවෙච්ච දේවල් නො වේ. නමුත් සම්මා දිට්ඨියේ අර්ථයන් නො දන්නා මිථ්‍යා දෘෂ්ඨික පිංවතුන්. මේ උතුම් කුසල් ශක්තිය නොවැදගත්, මිථ්‍යා දෘෂ්ඨික මතවාද තුළින් විවේචනයට ලක්කරනවා; අනුන්ගේ සැපය, සශ්‍රීකභාවය, වත්පොහොසත්කම් දකිනකොට ද්වේෂය ඇතිකොට ගන්නවා. ඇයි ඔහුට ලැබුණේ, ඇයි මට නො ලැබුණේ කියලා ධර්මානුකූලව ගළපා දකින්න දක්ෂ නැහැ. දුප්පත්කම, දරිද්‍රතාවය ආණ්ඩු පෙරළිවලින් ජය ගන්න උත්සාහ ගන්න පිංවතුන්, පන්සලකට, පිංකම්පොළකට නො යා, පෙළපාළියට යනවා. පෙළපාළි ගිය මනුෂ්‍යයෝ පසුකලක රටේ ප්‍රභූන් බවට පත්වෙන්නේ, අතීත කුසල් සංස්කාරයන්ගේ ඵලයන් නිසා ම යි. මෙතනදි පින ඔබට විසඳලා දෙන්නේ හේතුඵල ධර්මයකුයි. එම පිංවතාට පන්සලට, පිංකම්පොළට යන්න සිත දෙන්නේ නැතුව, ඔහුට පෙළපාළියට යන්න කැමැත්ත ඇතිවෙන්නේ, ඔහු තුළ සැඟවී ඇති, එහෙත් ඔහු නො දන්නා අතීත කුසල් සංස්කාරයන්ට විපාක දීමට මාර්ගය මතුකොට දීමට යි.

පෙර ජීවිතයේ ඔහු සිල්පද ආරක්ෂා කොටගෙන, මහා සංඝරත්නය අරමුණු කොටගෙන හවුලේ දන් පූජාකරගෙන ශක්තිමත් පිංකම් කරගෙන තිබුණත්, ඔහු ගිය ජීවිතයේ මැරෙන වේලාවේ සකස්වුණ අවසාන චුතිසිතට, අරමුණු වෙන්නේ දුර්වල කුසල් සිතක්. අවසාන චුතිසිතට අරමුණු වුණු දුර්වල කුසල් චිත්තය හේතුවෙන්, ඔහු මේ ජීවිතයේ දී එම දුර්වල කුසල්

චිත්තයට අදාළව සාමාන්‍ය පවුලක, ගොවි පවුලක උපත ලබනවා. නමුත් ඔහු සතුව යටපත් වී ගිය බලවත් කුසල් ශක්තියක් ඇති නිසා, ඔහුගේ කැමැත්ත, පන්සලට, පිංකමට නො ව, පෙළපාළි යන්නට යොමුවෙනවා.

මෙතනදී යොමුවීම කියන කාරණය, විඥානය වශයෙන් පිංවත් ඔබ ගතයුතු යි. අවසානයේ සාමාන්‍ය පවුලක ඉපදී, පන්සලට, පිංකමට වඩා පෙළපාළි යන්න යොමු වුණා; මහේශාඛ්‍ය ජීවිතයකට පත්වෙනවා. දැන් මෙයින් ඔබට තේරෙනවා ඇති, විඤ්ඤාණය නමැති මැජික්කරුවා, ඔබේ අතීත කුසලය, අකුසලයට අදාළව කැමැත්ත, අකමැත්ත මෙහෙයවන හේතුඵල ධර්මයන්ගේ යථා ස්වභාවය බව. සමාජය තුළ සිදුවන සෑම ජයග්‍රහණයක් ම, පරාජයක් ම සංස්කාරයන්ගේ නූල් සූත්තරය නිසා ම සිද්ධවෙන බව ඔබට වැටහෙනවා ඇති. ඉහත පිංවතාට පන්සලට, පිංකමට යන්න සිත නො දෙන්නේ, පෙර ජීවිතයේ කුසල් ශක්තිය නිසා. ඔහුට පෙළපාළි යන්න සිත යොමු වූයේ, අතීත කුසලය විපාක දීමට, මාර්ගය විවරකොට දීමට අවශ්‍ය නිසා. දැන් පිංවත් ඔබට වැටහෙනවාද, කුසලය සහ අකුසලය විපාකදීමේ දී මොන තරම් උපක්‍රමශීලී ස්වභාවයක් ගන්නවා ද කියලා.

පිංවත් ඔබට භික්ෂුව ඉහත කාරණය සටහන් තබන්නේ, ඔබට මේ ජීවිතයේ දී උතුම් සෝවාන් ඵලයට පත්වීමට නො හැකිවුණොත්, පින කියන ධර්මයේ ආශ්චර්යවත්භාවය කෙරෙහි ඔබ තුළ ඡන්දයක් ඇතිකොට දෙන්න; අවසාන චුතිසිතේ ඇති වූ යම් දුර්වලතාවයක් හේතුවෙන් ඔබ සාමාන්‍ය පවුලක ඉපදුණත්, මහේශාක්‍ය භාවය ඔබට අහිමි නැහැ කියන කාරණය මතුකොට පෙන්වන්න.

හැබැයි ඉතිං සංස්කාරයෝ අනිත්‍ය යි; වෙනස්වෙලා යනවා; අහිමිවෙලා යනවා; විකෘතිවෙලා යනවා; පරාජය වෙලා යනවා. ජය වේවා කියපු මනුෂ්‍යයෝ ම, අවසානයේ දී බන්ධනාගාරගත වේවා යැයි කියනවා. මුළාවක්, විජ්ජාවක්, මායාවක් ම යි ලෝකය පෙර ජීවිතයේ සුගතියක සිට මනුෂ්‍ය ලෝකයට

ඇවිල්ලා, මෝහය ජීවිතය කොටගන්නා නිසා ම මරණින් මතු සතර අපායන්ට වැටෙනවා. මනුෂ්‍යයාට පින විපාක දෙනකොට, හැමෝම ඔහුට ජයවේවා කියනවා. පින ගෙවී යනකොට, තවත් පිංවන්තයෙකුට ජයවේවා යැයි කියනවා. දක්ෂයා අකුසලයට යට නො වී, කුසලය තුළින් නැවත පින මතුකොට ගන්නවා. තට්ටුමාරු ක්‍රමයට මෝහබරිත සත්වයාට පින සහ පව මැජික් පෙන්වනවා. සංස්කාරයක් වූ පින සහ පව, මගේ කොටගැනීම නිසා, මැජික්කරුවාගේ මැජික් සාස්තරයට සත්වයා නිරතුරුව ම කොටුවෙනවා.

පින දැක සැඟවෙනු කුමකට
සිල් රැක එය විඳිනු මිසක

(භික්ෂුව මල් ඇතිරූ පාවඩ මතින් ගමන් කළේ ඇයි...?)

දෙවියා, බ්‍රහ්මයාට සාපේක්ෂව මනුෂ්‍යයාට පින සහ පව විපාක දීමේ වේගය වැඩියි. පින විපාක දෙන විට ආස්වාදයේ බලවත්භාවය නිසා ම අකුසල් මූලයන් රැස් වී පින විනාශකොට දමනවා. දැන් ඔහු පරාජිතයෙක්. ලෝකය කවදාවත් හිස්වීමක් නැහැ; පුරප්පාඩු නැහැ. තව තත්පරයකින් ශක්‍ර දෙවියන් දිව්‍ය ලෝකයේ දී පිරිනිවී ගියොත්, ඒ ක්ෂණයේ දී ම ශක්‍ර දෙවියන් වෙලා තවත් පිංවන්තයෙක් උපත ලබනවා. තාවකාලිකව හෙවත් වැඩ බලන්න කවුරුවත් පත්කරන්නේ නැහැ. තණ්හා පච්ඡයා උපාදාන, උපාදාන පච්ඡයා භව කියන ධර්මතාවය, සැපයන් කෙරෙහි, සශ්‍රීකභාවය කෙරෙහි කැමැත්ත කෙරෙහි ඇස ගසාගෙනයි සිටින්නේ. අතිරික්තය නිසා තරගයක් මිසක් පුරප්පාඩුවක් නැහැ. තෘෂ්ණාව යසඅගේට, භවයේ නිලතලවල පුරප්පාඩු අසුරු සැණින් පුරවනවා.

නමුත් බුදුරජාණන් වහන්සේ නමක් නැවත ලෝකයේ පහළවෙන්න තවත් අවුරුදු ලක්ෂ විසිපහකට වඩා කාලයක් ගතවෙනවා. තෘෂ්ණාවේ නිරෝධයට, තෘෂ්ණාවේ විනාශයට මාර්ගය මතුකොටදෙන බුදුරජාණන් වහන්සේලාගේ පහළවීම දුර්ලභ වෙන්නේ, ලෝකයේ නැවැත්මට වඩා ලෝකයේ ගලාගෙන යෑම ශක්තිමත් නිසා ම යි. පිංවත් ඔබ තුළ තෘෂ්ණාව වැඩිවෙනකොට, ඔබට ලෝකය දීර්ඝ වෙනවා. ඔබේ තෘෂ්ණාව සියුම් වෙනකොට, ඔබ ලෝකයෙන් හුදෙකලා වෙනවා.

ලෝකයත්, රටත්, ජාතියත්, ආගමත් තමා තුළ සකස් වෙන පංචඋපාදානස්කන්ධයක් වූ ධර්මයන්. ඔබ කාම, රූපී, අරූපී භවාත්‍රය තුළ, නැතිනම් ලෝක සිතියම තුළ ලෝකය සෙවීමේ නිරර්ථක වෑයමක යෙදී සිටිනවා. නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, සම්මුති ලෝකය තුළ ලෝකය සොයන්න එපා, තමා තුළින් ලෝකය මතුකොටගන්න කියලා. පිංවත් ඔබ තවමත් එයට සූදානම් නැතිනම්, ඔබ වැටෙන දීර්ඝ භවගමනට එක ම මඟ වියදම වෙන්නේ පින යි.

පිංවතෙක් භික්ෂුවගෙන් ප්‍රශ්නයක් ඇසුවා, පින කියන වචනයේ අර්ථය කුමක්ද කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, පින කියලා කියන්නේ සැපයට කියන තවත් නමක් ය කියලා. එහෙමනම් සත්වයා ලබන ආයුෂ, වර්ණය, සැපය සහ බලයයි පින කියලා කියන්නේ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, යමෙක් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන්, ගෞරවයෙන්, කර්මය-කර්මඵල විශ්වාසයෙන්, සියතින් සාදාගත් දෙයින්, සකසා ප්‍රණීතව දන්දීමෙන් සශ්‍රීක යසඉසුරින් පිරි ධන සම්පත් ලබනවා ය කියලා. ඔහු තමන් ලබන්නා වූ ධන සම්පත්, යසඉසුරු තමාගේ සැපය උදෙසා සුව සේ පරිහරණය කරනවා. සමාජයේ ජීවත්වන පිංවතුන් සිටිනවා, එම අය තමන්ට යසඉසුරු, ධන සම්පත් ලැබුණත්, ඒවා සුව සේ පරිහරණය කොට ජීවිතයට සැප ලබන්නට ඔවුන්ට සිතදෙන්නේ නැහැ. ලක්ෂ ගණන් ආදායම් තිබෙනවා. නමුත් ඔහු කෑමට ගන්නේ නීරස, කටුක ආහාරයක්. අල්මාරියේ ඇඳුම් කට්ටල විශාල සංඛ්‍යාවක් තිබෙනවා. නමුත් ඔහු පරිහරණය කරන්නේ එක ම ඇඳුමක් පමණයි. ගෙදර වාහනයක් තිබෙනවා. නමුත් ඔහු ගමන් කරන්නේ පොදු වාහනයක. සම්පත්, ධනය ලැබුණා. නමුත් භුක්ති විඳින්නට ඉඩදෙන්නේ නැහැ.

මීට ප්‍රධාන ම හේතුව වෙන්නේ පෙර ජීවිතයේ දී දන් පූජා කළ නමුත් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව, ගෞරවය, කර්මය-කර්මඵල විශ්වාසය, සියතින් සාදා දන්දීම, ප්‍රණීතව සකසා දන්දීම කියන අර්ථයන් දුර්වලවයි ඔහු දානය පූජාකරගෙන තිබෙන්නේ. නමුත්

පිංවතුන්ලා, මේ සංස්කාරයන්ගේ ස්වභාවය ධර්මානුකූලව හඳුනාගැනීමට නො හැකිවීම නිසා ම, මෙවැනි කර්ම විපාකයන් තමාගේ අල්පේච්ඡභාවය, තමාගේ සරලභාවය වැනි නොමඟ ගිය අර්ථකථනයන්ගෙන් හඳුන්වාගන්නවා. අකුසල් සංස්කාරයන්ගේ විපාකය නිසා යම් පිංවතෙකුට සැපසම්පත්, යසඉසුරු ලැබෙද්දී ඒවා භුක්ති විඳීමට, ඒවායින් සැප ලැබීමට සිත නො දෙනවා ය කියලා, කුසල් සංස්කාර හේතුවෙන් තමන්ට ලැබෙන යසඉසුරු, සැපසම්පත්, ධනය, සුව සේ සැප සේ භුක්ති විඳින පිංවතුන්ලාට, ඔවුන් වැරදියි කියලා ඇඟිල්ල දිගු කරනවා නම්, එය ධර්මය වැරදියි කියලා ඇඟිල්ල දිගුකිරීමක් වෙනවා. පින විපාකයට එන විට සැබෑ දක්ෂයා පිනට අදාළ සැපයන් භුක්ති විඳින්නේ සිල්පද ආරක්ෂා කරගෙන යි. අදක්ෂයා, තමාගේ පිනට අදාළ සැපයන් ලැබෙනකොට ආස්වාදයට මත් වී, ශීලයෙන් දුර්වලභාවයට පත් වී අනතුරට පත්වෙනවා.

ගිහි පිංවතුන්ලාට පින විපාක දෙන විට, එම සැපයන්ගෙන් පලායන්න කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, පෙර පින නිසා ලැබෙන ආයුෂ, වර්ණය, සැපය, බලය සිල්පද ආරක්ෂා කොටගෙන භුක්ති විඳින්න ය කියලයි. ගිහි පිංවත් ඔබ පින ප්‍රතික්ෂේප කරනවා නම්, සැපය ප්‍රතික්ෂේප කරනවා නම්, ඒ තමන් ප්‍රතික්ෂේප කරන්නේ ධර්මයේ අර්ථයනුයි. මේ සටහන් තබන භික්ෂුව පසුගිය වසර දෙකේ දී ප්‍රසිද්ධ ධර්මදේශනාවන් පවත්වන විට පිංවතුන් මහා සංඝරත්නය අරමුණුකොට, භික්ෂුවට මලින්, සුවඳින්, ආලෝකයෙන්, පාවඩවලින් අප්‍රමාණ පූජාවන් දැක්වූවා. හුඟක් පිංවතුන් ස්වයංව තීරණය කරලා භික්ෂුව වඩින පාවඩ මත මල් අතුරා තිබුණා. භික්ෂුව තුළ මේ කිසි ම ධර්මතාවයකට ඇලීමක් හෝ ගැටීමක් ඇතිවුණේ නැහැ. මේවා නිසා සකස් වූ උපේක්ෂා සහගත සිතත් අනිත්‍ය වශයෙන් දකිමින්, එම පූජාවන් පැවැත්වූ පිංවතුන්ලාට, පූජා කළ සෑම මලකට ම ධර්මයේ ඉහළ ම වටිනාකම ලබාදුන්නා. නමුත් සමහරක් පිංවතුන්ලා, පිනේ විපාකදීමේ ස්වභාවය නො දන්නා නිසා ම මේවා දැකලා

ගැටුණා. නමුත් භික්ෂුව එම පිංවතුන්ලාට පිළිතුරු වශයෙන් ප්‍රකාශ කළේ, දිව්‍යතලයේ දිව්‍ය උයන්වල, දිව්‍ය මදාරා මල්ගස් තිබෙනවා. මේ දිව්‍ය මදාරා මල්ගස් හොඳින් වැඩුණු අඹගස් වගේ විශාලයි. එම දිව්‍ය මදාරා මල්ගස්වල කොළ නැහැ. තනිකර ම මලින් බරවෙලයි තිබෙන්නේ. සුදු, නිල්, රතු, කහ... නේක වර්ණ මල්ගස් තිබෙනවා. මේ දිව්‍ය මදාරා මල්ගස්වලින් මදාරා මල් ගෙනැවිත්, භික්ෂුව වඩින පාවඩ මත ඇතිරුවත්, භික්ෂුව නො බියව, නො පැකිළව එම මල්පාවඩ මත වඩිනවා ය කියලා.

භික්ෂුවගේ ශීලය, සමාධිය, ප්‍රඥාව ගැන භික්ෂුවට සැකයක් නැහැ. මේවා දුර්වල වුණු තැනයි, එවැනි දෑ පරිහරණය පිණිස බිය සකස්වෙන්නේ. භික්ෂුව එදා මල්පාවඩ මත ගමන් කළේ, මලින්, සුවඳින්, ආලෝකයෙන් කළ පූජාවන් සංසරත්නය වෙනුවෙන් පිළිගත්තේ ලෝකයාට ආදර්ශයක් දෙන්නයි, මෙන්න පින නමැති සංස්කාරයන්ගේ සැබෑ ම ඵලය කියලා. පිංවතුන්ලාට ධර්මයේ පාඩමක් කියාදීමට යි. මේ පාඩම සම්මා දිට්ඨියේ අර්ථය පිළිබඳව පාඩමක්. අපි මේ කුසල් සංස්කාරයන් විපාක දෙන ස්වභාවය සඟවාගෙන සිටියොත්, පිංවතුන්ලාට ආදර්ශයක් නොමැති වෙනවා. එදා භික්ෂුවට පුළුවන් වුණා, පිනේ සහ කුසලයේ සැබෑ ම ශක්තිය පිංවතුන්ලාට ඔප්පුකොට පෙන්වලා, පිංවතුන්ලාට පින කෙරෙහි ඇති ඡන්දය ශක්තිමත්කොට දෙන්න; භවගමනේ සැපයට අදාළ සංස්කාරයන් දියුණුකොට දෙන්න. පිංවත් ඔබට මුල් පියවරේ දී ප්‍රඥාව මතුකොට ගැනීම පිණිස ආයුෂ, වර්ණය, සැපය, බලය අත්‍යවශ්‍ය වෙනවා. භික්ෂුව නැවතත් පිංවත් ඔබට කරුණාවෙන් මතක්කොට දෙනවා; පින විපාක දෙනකොට සැපයෙන් පලායන්න එපා. සිල්පද ආරක්ෂා කරගෙන පින භුක්ති විඳින්න. ලෝකයාට පිනේ ශක්තිය මතුකොට පෙන්වන්න. මෙය සම්මා දිට්ඨියට පත් වූ පිංවතෙකුගේ ප්‍රධාන ලක්ෂණයක් වෙනවා.

බුදුරජාණන්වහන්සේගේ පෙර පාරමී ශක්තිය නිසා ම ලැබුණු දෙතිස් මහා පුරුෂ ලක්ෂණ උන්වහන්සේ සඟවාගෙන

ජීවත්වුණේ නැහැ. පිනේ ඵලයට බුදුරජාණන් වහන්සේ විවෘතව බබළන්න දුන්නා. සීවලී මහ රහතන් වහන්සේ ප්‍රත්‍යලාභීන් අතර අග්‍රස්ථානය ලැබුවා ය කියලා, අනෙක් සෑම රහතන් වහන්සේ නමකට ම වඩා තමන්ට සිව්පසය ලැබුණා ය කියලා, මෙය දැක අනෙක් ස්වාමීන් වහන්සේලා ගැටේවි යයි සිතා කැලයට ගොස් ජීවත්වුණේ නැහැ. මහානාම ශාක්‍යයා මේ ශාසනයේ ප්‍රණීතව දන්දෙන්නන් අතර අග්‍රස්ථානයට පත් වූ උපාසකතුමා. එතුමා, දකින අනෙක් අය ගැටේවිය කියලා තමන් විසින් ස්වාමීන් වහන්සේලා උදෙසා ප්‍රණීතව දන්දීම නැවැත්තුවේ නැහැ. ධර්මය සඳහිරු සේ බබළනවා.

ඔබ අනුන්ගේ සංස්කාරයන්ට ඔරවන්නෙක් ද?

අග්ගඤ්ඤ සූත්‍රයේ සඳහන් වෙනවා, ලෝකය නැවත හටගැනීමෙන් පසුව, මුලින් ම මනුෂ්‍ය සමාජයට පාලකයෙක්, රජකෙනෙක් පත්වුණේ කොහොමද කියලා. ආභස්සරා බ්‍රහ්ම ලෝකයෙන් ආලෝක සංඥාවෙන් පැමිණි, සමාධිය ආහාරය කොටගත් බ්‍රහ්මයින්, රස පොළොවේ රසය කෙරෙහි තෘෂ්ණාවෙන්, රස පොළොවේ කුළුඳුලේ හටගත් බිම් පපඩම්, මීපැණි රසැති තම්පලා, මහපොළොව මත ඉබේ හටගත් ඇල් සහල් කෙරෙහි තෘෂ්ණාවෙන්, මේවා වැඩිවැඩියෙන් අයිතිකොට ගැනීමට යෑම හේතුවෙන්, බලවත් කෙනා දුබලයාගේ දෙය අයිතිකොට ගැනීමට යෑම හේතුවෙන්, නැති කෙනා ඇති කෙනාගෙන් සොරාගැනීම හේතුවෙන් ඇති වූ අර්බුදයට පිළියමක් වශයෙන්, ජනතාව එකතුව තමන් අතර සිටින ආයුෂ, වර්ණය, සැපය, බලය වැඩි ම පුද්ගලයා තම පාලකයා වශයෙන් තෝරාගත්තා. මොහු මිනිස් ප්‍රජාවගේ පළමු පාලකයා වෙනවා. මේ පාලකයාගේ නඩත්තුව සඳහා සෑම පුද්ගලයෙක් ම තම අස්වැන්නෙන් සුළු කොටසක් ලබාදීමට එකඟවෙනවා. මෙය රාජ්‍ය බදු ක්‍රමයේ ආරම්භය වෙනවා. මනුෂ්‍ය ප්‍රජාව ඇති වූ දා පටන් ම පාලකයා කියන්නේ පිනේ ඵලයක් ම යි.

අතීතයේ ජීවත් වූ කොසොල් රජතුමා, බිම්බිසාර රජතුමා, උදේනි රජතුමා, අජාසත්ත රජතුමා තමන්ට පෙර පින නිසා ම ලැබුණු සම්පත්, සැපයන් සුව සේ පරිහරණය කළා; රජ මාළිගාවල ජීවත් වුණා; මිල අධික ම අජානීය අසුන්, ඇතුන් පරිහරණය

කළා. මේ සෑම රජ කෙනෙකුට ම රූමත් අන්තඃපුර බිසෝවරු සිටියා. මේ බිසෝවරුන් අයිතිකොට ගැනීමේ දී රජතුමාට සම්මත විනයක් තිබුණා. තමන් රජු ය කියලා රජවරු මේ විනය කඩ කළේ නැහැ. ස්වාමිපුරුෂයා ජීවතුන් අතර සිටින කිසි ම කාන්තාවක් රජවරු තම අන්තඃපුරයට ගත්තේ නැහැ. මේ සෑම රජකෙනෙක් ම බුදුරජාණන් වහන්සේව සමීපව ඇසුරු කළ අය යි. ඒත් බුදුරජාණන් වහන්සේ කිසි ම අවස්ථාවක දී රජවරු ලබන මේ සැපසම්පත් විවේචනය කළේ නැහැ; අන්තඃපුර වසාදමන ලෙස බලපෑම් කළේ නැහැ. බුදුරජාණන් වහන්සේ දන්නවා මේ හැම සැප සම්පතක් ම අතීත කුසල් සංස්කාරයන්ගේ ඵලයන් ය කියලා. රාජ්‍ය වංශයට උරුම සම්ප්‍රදායන්ට බුදුරජාණන් වහන්සේ ගරු කළා. බුදුරජාණන් වහන්සේ මේ සෑම රජ කෙනෙකුට ම තෙරුවන් කෙරෙහි ඇති ශ්‍රද්ධාවේ වටිනාකම පැහැදිලි කළා. ශීලයේ, දානයේ වටිනාකම පැහැදිලි කොට අවවාද අනුශාසනා කළා. බිම්බිසාර රජතුමාගේ ඛේමා අගබිසව රාජ සම්පත් හැරදමා උතුම් අරහත් උත්තමාවියක් බවට පත්වුණා. උදේනි රජතුමාගේ සාමාවතී බිසව සෝවාන් ඵලයට පත්ව සිටි අන්තඃපුර බිසවක්. කොසොල් රජතුමාගේ මල්ලිකා බිසව නිරතුරුව ම බුදුරජාණන් වහන්සේගෙන් අවවාද අනුශාසනා ලැබුව බිසවක්. මේ කිසි ම තැනක බුදුරජාණන් වහන්සේ වැරැද්දක් දැක්කේ නැහැ.

දඹදිව සෑම රාජ්‍යයක ම ප්‍රසිද්ධ ගණිකාවක් සිටියා. මේ ප්‍රසිද්ධ ගණිකාව රාජ්‍යයට සම්පතක්, ගෞරවයක් හැටියට යි එදා ජනයා දැක්කේ. ඇයගේ රූමත්භාවය නිසා ම රාජ්‍යයේ ජනප්‍රියභාවය වැඩිවුණා. මෙවැනි ප්‍රසිද්ධ ගණිකාවක් තමයි, අම්බපාලිය. ඇය බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නයට තම නිවසේ දානයකට ආරාධනා කළා. බුදුරජාණන් වහන්සේ ඇයගේ දානය සතුටින් භාරගත්තා. මේ බව දැනගත් ලිච්ඡවී කුමාරවරු, අම්බපාලියගේ දානය ප්‍රතික්ෂේප කොට තම දානය පිළිගන්නා ලෙස බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටියා. බුදුරජාණන් වහන්සේ එම ඉල්ලීම ප්‍රතික්ෂේප කොට අම්බපාලියගේ දානයට වැඩම කළා. අම්බපාලිය ප්‍රසිද්ධ ගණිකාවක් වුවත් බුදුරජාණන්

වහන්සේ ඇය තුළින් ඇයගේ රූමත්භාවය, ධනසම්පත් සේ ම ගණිකාවක් වීම ද දැක්කේ සංස්කාරයන්ගේ ඵලයන් හැටියට යි.

පිංවතුන්ලාට කුසල්, අකුසල් සංස්කාරයන්ගේ විපාකයන් මතුකොට පෙන්වා දෙන්නේ සම්මා දිට්ඨියේ අර්ථය යි. ඔබ තුළ සම්මා දිට්ඨියේ අර්ථයන් දුර්වල නම්, මේ කාරණා නිවැරදිව හඳුනාගන්න බැරිවෙනවා. ලෝකයේ මිථ්‍යා දෘෂ්ටියෙන් පෝෂණය වුණ, යම් යම් දේශපාලන මතවාදයන් තිබෙනවා. එම මතවාදයන් විසින් ලෝකයට උගන්වන්නේ රජතුමාත්, කම්කරු පිංවතාත් සම මට්ටමක තිබිය යුතුයි කියලා; සම අයිතිවාසිකම් භුක්ති විඳිය යුතු ය කියලා. මෙවැනි මිථ්‍යා දෘෂ්ටික මතවාදයන්, පිංවතුන්ලාව මුළාකිරීමටත්, පිංවතුන්ලා තුළ ද්වේෂය ඇතිකිරීමටත් හොඳ පොහොරක් වෙනවා. නමුත් එවැනි මතවාද බුද්ධාගම විසින් දැඩි සේ ප්‍රතික්ෂේප කරනවා.

යම් පිංවතෙක්, තවත් පිංවතෙක් විඳින සැපය විවේචනය කරනවා නම්, ඔහු විවේචනය කරන්නේ උතුම් සද්ධර්මයේ අර්ථයක් ම යි. සමාජය තුළ ජීවත්වෙන, ආයුෂ, වර්ණය, සැපය, බලය සහිත, සිල්පද ආරක්ෂා කොටගෙන එම සැපයන් භුක්ති විඳින පිංවතුන්ලා දකිනකොට, පෙර පුණ්‍ය ශක්තියේ ස්වභාවය යි අපි දකින්නේ. ලෞකික සම්මා දිට්ඨියේ අර්ථයන්ගේ ජීවමාන සාධකයනුයි ඔබ දකින්නේ. මෙවැනි සැප විඳින පිංවතුන් බෞද්ධ වේවා, අබෞද්ධ වේවා ඔවුන් පින ගැන වටිනා පාඩමක් සමාජයට කියලා දෙනවා.

පිංවත් ඔබ අනුන් විඳින සැපයට ඊර්ෂ්‍යා කරන්න එපා; ද්වේෂ කරන්න එපා. එවැනි අකුසලයන්ට අන්‍යයන්ව ද පොළඹවන්න, උසිගන්වන්න එපා. පුද්ගලයෙක් විඳින සැපයට හේතුව ධර්මානුකූලව හඳුනාගෙන, ඔබත් සැපයට අදාළ සංස්කාරයන් ජීවිතයට එකතු කරගන්න.

කල්ප විනාශයක දර්ශන මාත්‍රයක්....

බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ කුසල් සංස්කාරයන්ට අදාළ ධර්මයන් නො දන්නා නිසා ම මිථ්‍යා දෘෂ්ටිය පෝෂණය කරමින්, කර්මය-කර්මඵල විශ්වාසයන්ට පහරදෙමින්, දානයේ, ශීලයේ ආනිශංස කෙරෙහි විශ්වාසයෙන් බැහැර වෙමින්, තෙරුවන්ට ගරු නො කරන, සද්ධර්මයක් ශ්‍රවණය නො කරන, පන්සලකට, ආරණ්‍යයකට නො යන, සම්මා සම්බුද්ධ ශාසනයේ වටිනාකම ගැන දශමයක්වත් නො දන්නා පිංවතුන්, මිථ්‍යා දෘෂ්ටියේ ඵලයන්, ධනාත්මක වටිනාකම් හැටියට සමාජගත කිරීමේ මාරපාක්ෂික ක්‍රියාදාමයන්, පිංවත් ඔබ විසින් නුවණින් හඳුනාගැනීම, ඔබේ සම්මා දිට්ඨියේ අර්ථයන් දියුණුකොට ගැනීමට ඔබට පහසුවක් වෙනවා.

සම්මා සම්බුද්ධ ශාසනයට හිතැති ගිහි පිංවත් ඔබ, ඔබේ ජීවිතයේ ප්‍රමුඛතාවය, මේ උතුම් සම්මා සම්බුද්ධ ශාසනයේ අර්ථයන්ගේ පෝෂණය උදෙසා ම ලබාදෙන්න. සමාජයේ ජීවත්වෙන ලොකු කුඩා කවුරුන් වේවා, ඔහු තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවක් නැති කෙනෙක් නම්, පන්සලකට, ආරණ්‍යයකට නො යන කෙනෙක් නම්, ශීලයට වටිනාකමක් නො දෙන, සංඝරත්නයට දන් නො දෙන කෙනෙක් නම්, සම්මා සම්බුද්ධ ශාසනයේ ආරක්ෂාවට මූලිකත්වය නො දෙන කෙනෙක් නම්, පිංවත් ඔබ කරුණාකර ඔහු සමඟ නො ගැටෙන්න. ඔහු තුළින් මිථ්‍යා දෘෂ්ටිකභාවයේ හැඩරුව හඳුනාගන්න. එම පිංවතුන්ගේ අදහස්වලට වටිනාකමක් දෙන්න එපා. එවැනි පිංවතුන්ලාව මඟහැර යන්න ය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

ඔබ නො දන්නාභාවය නිසා ම, ආවේගශීලීභාවය නිසා එවැනි මිථ්‍යා දෘෂ්ටික අදහස්වලට අනුකූලත්වය දැක්වුවහොත් ඔබ තුළත් නැති ලෝභ සිත් ඇතිවෙනවා; නැති ද්වේෂ සිත් ඇතිවෙනවා; නැති මෝහ සිත් ඇතිවෙනවා. අවසානයේ අනුන්ගෙන් පළිගැනීමට ගොස් තමන් සකස් කරගන්නා අකුසල් හේතුවෙන් තමා නො දැනුවත්ව තමාගෙන් ම පළිගන්නවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "මහණෙනි, යම් දවසක් එනවා, මහා සාගරය වියළී සිඳී යනවා. මහපොළොව අළු දුහුවිලි ගොඩක් වෙනවා. මේ සියල්ල ම මේ ආකාරයෙන් වියළී, සිඳී ගියත්, සත්වයාගේ කර්මය නම් සිඳී, වියළී නිමාවට පත් නො වෙනවා"ය කියලා.

භික්ෂුවක් උතුම් සමාධියෙන් පසුවෙනකොට, උන්වහන්සේට ලෝකයේ එක් විනාශකාරී ස්වභාවයක් අරමුණු වෙනවා. උන්වහන්සේට දේශසීමා, සීමාමායිම්, තාප්ප, වැටකඩොලු කිසිවක් නැති මහපොළොවක් අරමුණු වෙන්නේ. ගහක් කොළක්, කන්දක්, ගල්පරයක් නැති, ඇළක් දොළක්, ගංගාවක්, මහසාගරයක් නැති මහපොළොවකුයි අරමුණු වෙන්නේ. මුළු පරිසරය ම දුමෙන් වැහිලා. දුම තුළින් භික්ෂුවට පරිසරය විනිවිද පෙනෙනවා. තද කළු විෂම දුමක් නොවේ තිබෙන්නේ. ළා කළු සහ අළු පැහැති දුමක් පෙනෙන්නේ. තදින් පිච්චී ගිය කුට්ටි කුට්ටි කොටස් හැටියට ආකාශයේ කෑලි කඩාගෙන වැටෙනවා. ඒවා කැඩී ඒවා ආකාශය තුළ දී ම අළු දුහුවිලි බවට පත් වී පරිසරයට, මහපොළොවට එකතුවෙනවා. මෙම කඩාවැටෙන කුට්ටි භික්ෂුවට පෙනෙන්නේ, යම් ඝන දෙයක් හොඳට ම දැවුණාට පසුව සකස්වෙන අළු කුට්ටි ස්වභාවයට. එවැනි අළු කුට්ටි දහස් ගණනක් භික්ෂුවට දර්ශනය වෙනවා. පරිසරය තුළ වේගවත් ක්‍රියාකාරීත්වයක් සිද්ධවෙනවා, ස්වභාවිකව ම. අළු දුහුවිලි විනා, අඟුරු කැබැල්ලක දෙයක්වත් භික්ෂුවට අරමුණු වෙන්නේ නැහැ. පස් කැබැල්ලක්වත්, ගල් කැබැල්ලක්වත් අරමුණු වෙන්නේ නැහැ. සියල්ල පිළිස්සී ගොසින්. සියල්ල අළු දුහුවිලි ලෙසයි පෙනෙන්නේ. භික්ෂුවක්

උතුම් සමාධියෙන් දැකපු මේ දර්ශනය, අතීතයේ සිදු වූ කල්ප විනාශයක අවසාන ජවනිකාවක් කියලයි එම භික්ෂුව විශ්වාස කරන්නේ. භික්ෂුවක් දකින මේ කල්ප විනාශයේ දී, මුළුමහත් මහපොළොව ම සමතලා බිමක් බවට පත්වෙනවා. ගල්, කඳු පවා දැවී අළු බවට පත්වෙලයි තිබෙන්නේ.

මේ දර්ශනය දැකීමට පෙර භික්ෂුව සිතාගෙන සිටියේ යොදුන් අසූහාරදහසක් ගැඹුරු මහා සාගරයේ පිහිටි මහාමේරු පර්වතය, මහා සාගරය ම සිඳී, ගිනිගෙන විනාශ වුණාට පස්සේ, සිඳීගිය මහා සාගරය තුළ ගැඹුරු අගාධයක් ලෙසින් පෙනෙනවා ය කියලා. එහෙත් භික්ෂුව උතුම් සමාධියෙන් දකින්නේ, මුළු මහා සාගරය ම සිඳීගියත්, එම සිඳීගිය මහා සාගරයේ යොදුන් අසූහතරදහසක් වූ ගැඹුර, අළුවලින් පිරීගොස් තිබූ ආකාරයක්. මොකද ජලය සිඳුණු සාගරයක් භික්ෂුවට අරමුණු වෙන්නේ නැහැ. සමතලා පොළොවක් පමණයි අරමුණු වෙන්නේ. ඒ කියන්නේ ජලය සිඳී ගිය මහා සාගරයේ හිස් ස්වභාවය, මහාමේරුව ගිනිග ැනීම නිසා කඩාවැටෙන අළුවලින් පිරීගොස් මුළුමහත් පොළොව ම සමතලා බිමක් වශයෙනුයි භික්ෂුවට අරමුණු වෙන්නේ.

මෙතැනදී භික්ෂුව අත්දැකීමෙන් දකිනවා, මහාමේරු පර්වතයත්, මුළු මහපොළොවේ ස්වාභාවික පරිසරයත් ගිනිගෙන විනාශ වීමෙන් පසුව, බොහොම ඝන අළු තට්ටුවක් මහපොළොව මතුපිට සමතලා ආකාරයට පිහිටනවා කියලා. මහපොළොව සහ සිනේරු පර්වතයේ ගල්, වැලි, පස් සහිත රස පොළොවේ සාරය ඉරවල් හතක උෂ්ණත්වයෙන් පිච්චී, මහපොළොව මත ඇතිවන ඝන අළු තට්ටුවයි, ඉනික්බිති මහා වැසි පතිත වී ඇතිවෙන රසායනික හෝ ස්වාභාවික වෙනත් ක්‍රියාවලියක් නිසා, රසැති යෝගට් එකක් සේ මහපොළාව මත මිදෙන්නේ. මෙවන් හේතුඵල ධර්මයන්ගේ විස්මිත යථාර්ථයක් වූ කල්ප විනාශයකුයි තම සමාධියෙන් එම භික්ෂුව දර්ශනය කර ගත්තත් එම දර්ශනය එම භික්ෂුවට තවත් එක් අතීත පංචඋපාදානස්කන්ධයක් පමණක් ම යි. දැක්කා කියන තැන එම භික්ෂුව නැවතිලා, එය හුදු හේතුඵල

ධර්මයක්. බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා! ඔබ වහන්සේ ම යි මාර්ගය වූයේ.

භික්ෂුව අතීත කල්ප විනාශයන් පිළිබඳව යම් චිත්‍රයක් ඔබට සටහන් කළේ, මේ සංස්කාරයන්ගේ අනිත්‍යභාවය මතුකොට පෙන්වන්න. කල්ප විනාශයේ උෂ්ණත්වය, දුම, කැලි පිපිරී මහාමේරුව අළු කුට්ටි වශයෙන් මහපොළොව මතට කඩා වැටීම කියන කාරණය භික්ෂුවට සිහිපත් වෙන්නේ, ඒ කටුක, වියළි, උණුසුම් පරිසරය තුළ පිංවත් ඔබත් මමත් පිච්චි පිච්චී අමනුෂ්‍යයන් හැටියට වින්දා වූ දුක යි. කෝටි ප්‍රකෝටි කීයක් සත්වයින් මේ දුක්ගිනිවලට පිච්චෙමින්, මැරෙමින්, ඉපදෙමින් දුක්විඳින්න ඇති ද? පිච්චීම වැඩිවෙනකොට අකුසල මූලයන් වැඩිවෙනවා. අකුසල මූලයන් වැඩිවෙනකොට මරණය වේගවත් වෙනවා. නැවත නැවත මේ ක්‍රියාවලිය ම සිදුවෙනවා. කල්පයක් තුළ කරගත්තා වූ මහාමේරු පර්වතය වැනි අකුසල් කන්දක් සත්වයාට කල්ප විනාශයක දී විපාක දෙනවා. පිංවත් ඔබ කලකිරෙන්න. අසාධාරණ ලෝකයක් මේක. මනුෂ්‍යකමක් නැති ලෝකයක් මේක. කෘතවේදීත්වයක් නැති ලෝකයක් මේක. අසත්පුරුෂ මාරයාට අයිති ලෝකයක් මේක. සශ්‍රීකභාවය, ධනවත්භාවය, රූමත්භාවය, උගත්භාවය, කුලවත්භාවය පෙන්වලා, ඒවා කෙරෙහි කාමච්ඡන්දයන් සකස්කොට දීලා, අකුසලයට යොමුකරලා, කල්ප ගණන් සුගතිය-දුගතිය අතර දෝලනය කරලා, අවසානයේ පුච්ච පුච්චා මරාදමනවා.

වධකයා කලණ මිතුරු වෙස්ගෙන ඒවි. පරිස්සමෙන්....

තෘෂ්ණාවෙන් පෝෂණය වුණ විඤ්ඤාණය නමැති වදකයා කල්‍යාණ මිතුරෙක් සේ ඔබව පෝෂණය කරනවා. තමා තුළින් ම සතුරා, වධකයා පෝෂණය කරමින් සතුරා හැටියට දකින්නේ බාහිර රූපයක් ම යි. භික්ෂුව ඔබට උදාහරණයක් දක්වනවා. කෙනෙක් පිංවත් ඔබට චෝදනාවක් කරනවා. ඔබ ඔහුත් සමඟ සන්ධුවට යනවා. අනුන්ගේ ක්‍රියාවක් ඔබේ කර පෙන්වා ඔබව අකුසලයට යොමු කළේ ඔබ තුළ සැඟවී සිටි වධකයා ම යි. වධකයා නිරතුරුව ම ඵස්සය ළඟ නැවතී ඵස්සය තෘෂ්ණාවෙන් තෙත්කර දෙනවා. දැන් ඔබ සැප වේදනාවත්, දුක් වේදනාවත්, උපේක්ෂා සහගත වේදනාවත් තුරුල්කර ගන්නවා. වධකයා දුක්, සැප, උපේක්ෂා වධයන් දෙමින් භවයෙන් භවයට පටිච්ච සමුප්පන්නව ගමන් කරනවා. භික්ෂුවගේ ගිහිකාලයේ 'වදකය' මට බොහෝ ම කාරුණික, මෛත්‍රී සහගත සුරතල් අදහස් ඉදිරිපත්කර තිබෙනවා.

"දැන් ම පැවිදිවෙන්න එපා. කසාදයක් බැඳලා දෙදෙනා ම එකට පැවිදිවෙන්න. අවුරුදු හැට පිරුණාට පස්සේ පැවිදිවෙන්න. පැවිදිවෙන්න අවශ්‍ය නැහැ. හොඳින් ජීවත්වුණාම ඇති. කසාද බැඳලා දරුවෙක්ව පැවිදි කරවන්න." තමා තුළ ම සැඟවී සිටි වධකයා භවගමනේ පටිච්ච සමුප්පන්නව, මාව වධයට පමුණුවන්න මොන තරම් සුරතල් වදන් කියලා තිබෙනවා ද? ආදරය පෙන්වලා වධකයා කල්ප කොච්චරකට ඔබව පුච්චලා දමන්න ඇති ද?

එක්තරා තීරණාත්මක රාත්‍රියක දී වධකයා භික්ෂුවට බොහෝම ලස්සන අදහස් දෙනවා. එම අදහසේ ආදරය, ළෙන්ගතුබව, කරුණාව හොඳින් තවරලයි තිබුණේ. වධකයා භික්ෂුවට කියනවා, "නිවීම උදෙසා ඔබ ජීවිතය මරණයට දමන්න එපා. ඔබ මේ ව්‍යායාමයේ දී අපවත් වුවහොත් ඔබට නිවන අහිමිවේ" ය කියලා. භික්ෂුව මේ වෙලාව වෙනකොට වධකයාව හඳුනාගෙනයි සිටින්නේ. ඒ හඳුනාගැනීම තුළින් වධකයා බැසගෙන සිටිනවා ය කියලා භික්ෂුව අවබෝධයෙන් ම දන්නවා. බොහෝ ම සියුම්ව අතුරේ යන ගමනක්. ඥාන දර්ශන තුළින් රූපය කෙරෙහි තෘෂ්ණාව බිඳදැමූ තැනදී වධකයාට, ඒ කියන්නේ විඤ්ඤාණයට බැසගැනීමට ඇති මව්භූමිය අහිමි කළා වෙනවා. එතැනදී පිරිනිවීමත් සමඟම වධකයාට නිවීයන්නයි සිද්ධවෙන්නේ.

කොයි තරම් ලස්සන, සුන්දර ධර්මයක් ද? කල්ප කෝටි ගණන් පටිච්ච සමුප්පන්නව ගලාගෙන පැමිණි දුකක්, එක සිතුවිල්ලකින් නිවාදමනවා. සත්වයාට සැපයට මඟ කියන මෙවන් ධර්මයක් මේ ලෝකය තුළ නොමැති බව නුවණින් දකින්න. මේ උතුම් ධර්මය එක දිනක් හෝ ලෝක සත්වයාට යහපත පිණිස, සැපය පිණිස සුරක්ෂිතව තැබීමට ඔබත් ධර්මය තුළින් ම කැපවෙන්න. ක්‍රමානුකූලව බෞද්ධ ජනතාව ශ්‍රද්ධාවෙන් බැහැරව යන විට හේතුඵල ධර්මයන් නිසා ම මේ උතුම් බිමේ අන්‍ය ආගමික පිංවතුන්ගේ ගහනය වැඩිවෙනවා. අනාගතයේ මේ පිංබිමේ පහළවෙන පාලක පිංවතුන්ලාට අන්‍ය ආගමික පිංවතුන්ලාගේ සහයෝගයෙන් තොරව පවතින්න බැරිව යනවා. උතුම් සද්ධර්මයට හිතැති පාලක පිංවතුන් අන්‍ය ආගමික පිංවතුන්ගේ සහයෝගයෙන් දුර්වල කර දමනවා. මේවා හේතුඵල ධර්මයන්. කා සමඟවත් ගැටෙන්න, චෝදනා කරන්න අවශ්‍ය නැහැ. උතුම් සද්ධර්මයේ අර්ථයන්ගේ ආරක්ෂාව උදෙසා පිංවත් ඔබ කවදාකවත් කිසිවෙක් සමඟ ද්වේෂයක් ඇතිකරගන්න එපා. ධර්මය උදෙසා කවදාකවත් ගල් කැබැල්ලක්වත් අතට ගන්න එපා. අධර්මයෙන් ධර්මය ජයගන්න හදන්න එපා.

සසුන රැක්කොත් එහෙමයි,
සසුන නැසුවොත් මෙහෙමයි....

පිංවත් ඔබ සම්මා දිට්ඨියේ අර්ථයන් තුළ ශක්තිමත් වෙන්න. හේතුඵල ධර්මයන් නිසා ම ඔබට ලැබෙන ආයුෂ, වර්ණය, සැපය, බලයට ඇලෙන්න එපා. ආයුෂ, වර්ණය, සැපය, බලයට ඊර්ෂ්‍යාකරන්න එපා; ද්වේෂ කරන්න එපා. ඒ හේතුවෙන් පළිගන්න එපා. සම්මා දිට්ඨියේ අර්ථයන් තුළ සිටිමින් ම ඉහත අර්ථයන් විග්‍රහ කරගන්න දක්ෂ වෙන්න.

මාර්ගඵල ලැබීමට පෙරාතුව මේ ධර්මයන් අපි දැනගත යුතු යි. එසේ නො වුණහොත් මාර්ගඵලත්, ධර්මයත් දෙක ම අපට අහිමි වෙනවා. ලෝකය නැවත හටගන්න මුල්කාලයේ පටන් පාලක පන්තියත්, පූජක පක්ෂයත්, ව්‍යාපාරික, ගොවි, කම්කරු පන්තියත් මේ ලෝකයේ සිටියා. ඒ ඒ පන්තීන්ට පෙර පින සහ පව් නිසා ලැබෙන සැපයේ විවිධත්වය සම්මා දිට්ඨියේ අර්ථයන් තුළින් දකින්න ඕන. කම්කරු පන්තියේ මහත්මයෙකුට රටක පාලකයෙක් වෙන්න අවශ්‍ය කුසලයේ මාර්ගය උතුම් සම්මා සම්බුද්ධ ශාසනයේ අර්ථය තුළයි තිබෙන්නේ. එම නිසා සැපයට කැමති වීමෙන් ඔබ ඔබේ ආරක්ෂක ඉලක්කය කරගත යුත්තේ සම්මා සම්බුද්ධ ශාසනය යි.

භික්ෂුව මේ සටහන ලියන්නේ ලෞකික සම්මා දිට්ඨියේ අර්ථයන් ඔබට පැහැදිලි කර දීමට යි. ඒ තුළින් අනතුරු නුවණින් දැකලා ධර්ම මාර්ගය තුළ අප්‍රමාදීභාවය ඇතිකරගන්න. එක රැයකින් හුඟක් දේවල් වෙනස්වෙලා යන්න පුළුවන්;

විනාශවෙලා යන්න පුළුවන්. කොසොල් රජතුමාගේ දරුවෙක් වූ විඩූඩභ කුමාරයා ශාක්‍ය වංශය සමඟ ඇතිකරගත් වෛරයක් නිසා ශාක්‍ය වංශයෙන් පළිගන්න හමුදා සේනාවන් අරගෙන කිඹුල්වතට යනවා. මේ කාරණය දිවැසින් දැකලා, බුදුරජාණන් වහන්සේ තමන් උපන් ශාක්‍ය වංශය කෙරෙහි කරුණාවෙන් විඩූඩභ කුමාරයා සේනාව සමඟ ගමන් කරන අතරමඟට වැඩම කරලා, මෛත්‍රී ආනිශංස පහදා දීලා විඩූඩභ කුමාරයා සහ සේනාව ආපසු හරවා ඇරියා. නැවත කාලයක් ගියාට පස්සේ විඩූඩභ කුමාරයාට පරණ වෛරය මතක් වෙලා ශාක්‍ය වංශය විනාශකර දැමීමට සේනාව අරගෙන කිඹුල්වතට යනවා. දෙවැනි වරත් බුදුරජාණන් වහන්සේ අතරමඟට වැඩම කරලා කුමාරයාට ද්වේෂයේ ආදීනව පහදලා දීලා ආපසු හරවා යැවුවා. නැවත කාලයක් ගියාට පස්සේ විඩූඩභ කුමාරයාට ශාක්‍ය වංශය කෙරෙහි පරණ වෛරය මතක් වෙලා සේනාව අරගෙන කිඹුල්වතට යනවා. තුන්වැනි වතාවේ බුදුරජාණන් වහන්සේ දිවැසින් බලනවා, දෙවතාවක් ම විඩූඩභ කුමාරයාට අවවාද කරලත් ඇයි මේ විදිහට ඔහු ශාක්‍ය වංශිකයන්ව සමූල ඝාතනය කරන්නට යන්නේ කියලා. බුදුරජාණන් වහන්සේ දකිනවා ශාක්‍යයන්ගේ අතීත ප්‍රාණඝාත අකුසල කර්මයක් විපාක දීමටයි සූදානම් වෙන්නේ කියලා. බුදුරජාණන් වහන්සේ හේතුඵල දැකලා තුන්වැනි වතාවේ විඩූඩභ කුමාරයා නවත්වන්න වැඩියේ නැහැ. විඩූඩභ කුමාරයා ද්වේෂයෙන් මුළු ශාක්‍ය වංශය ම මරා විනාශකොට දැම්මා.

බුදුරජාණන් වහන්සේ කාලය, දීපය, දේශය, කුලය, මව යන පස්මහ බැලුම් බලා උපන් ශාක්‍ය වංශයත්, බුදුරජාණන් වහන්සේ ජීවමානව සිටිය දී ම විනාශ වී ගියා නම් එතැන තමයි අප ඉගෙනගත යුතු ධර්මය. සියලු සංස්කාරයෝ අනිත්‍ය යි. එක ම විසඳුම ධර්ම මාර්ගය තුළ අප්‍රමාදීභාවය යි. අප්‍රමාදී නො වුවහොත් අපව විනාශවෙලා යාවි. ඒ දෙසටයි හේතුඵල ධර්මයන් ක්‍රියාත්මක වෙන්නේ.

භික්ෂුවක් උතුම් සමාධියෙන් පසුවෙද්දී සග්‍රීක දිව්‍යතලයක ජීවත්වන දිව්‍යාංගනාවක් අරමුණු වෙනවා. ඇය සුදෝසුදු ප්‍රභාෂ්වර දිව්‍යාංගනාවක්. සුදු පාට හැර වෙන වර්ණයක් ඇගේ දිව්‍ය ශරීරයේ නැහැ. ඇය ප්‍රභාෂ්වර සුදු දිලිසෙන වස්ත්‍රයකිනුයි සැරසී සිටින්නේ. එය හරියට මඟුල් දිනයට මනාලියන් අඳින දිගු සුදු ගවුමක් වගෙයි. ඇගේ කෙස්කළඹ දණහිසින් පහළට වැටී තිබෙනවා. ඒ කෙස්කළඹ සිනිඳු, දිලිසෙන සුදෝසුදු කෙස්කළඹක්. හිසකෙස්වල කළු පැහැයක් නැහැ. ඒත් ඒ කෙස්කළඹේ කාන්තිය, ජීවය පිරිලා. ඇගේ ඇසේ කළු ඉංගිරියාවත් සුදු පැහැතියි. ඇසෙන් ආලෝකය පිටවෙනවා. එයත් සුදු පැහැතියි. ඇය හිරුරැස් සේ දීප්තිමත් සුදෙන් බබළන දිව්‍යාංගනාවක්; පංච කල්‍යාණියක්. ඒ දිව්‍යාංගනාව වෙන කවුරුත් නෙමෙයි, විහාරමහා දේවියගේ දිව්‍ය උපත යි. ඇය මෙවන් අසිරියක් ලබන්නේ ගැමුණු පුතාට සම්මා සම්බුද්ධ ශාසනය ආරක්ෂා කරගන්න දුන් ගුරුහරුකම් නිසා ම යි; ආරක්ෂා කොටගත් සම්මා සම්බුද්ධ ශාසනයේ අර්ථය ජීවිතයට එකතු කොටගත් නිසා ම යි. මේ මොහොතේ සග්‍රීක දිව්‍යතලයක දිව්‍යසැප අත්විඳින දුටුගැමුණු දිව්‍ය කුමරු, විහාරමහා දේවී සුදෝසුදු දිව්‍යාංගනාව ඔබට පෙන්වන ආදර්ශය වන්නේ සියලු මනුෂ්‍යයන්ට මෛත්‍රිය කරුණාව දක්වමින්, ශාසනික අර්ථයන් ද රැකීමේ දක්ෂතාවය පිංවත් ඔබට ද සග්‍රීක දිව්‍යසැපයට හේතුවක් වන බව යි.

භික්ෂුව මේවා ඔබට සටහන් කරන්නේ, සම්මා සම්බුද්ධ ශාසනයේ අර්ථයන් ආරක්ෂා කරලා ඔබටත් සග්‍රීක දෙවියන් දිව්‍යාංගනාවන් අතරට යන්න කියලා ආරාධනා කරන්න යි. එසේ නො වී, සම්මා සම්බුද්ධ ශාසනය යනු කුමක්ද යන්න හරිහැටි නො දන්නාකම හේතුවෙන් ම, පංච නීවරණයන්ට යටවීමෙන් හෝ අප අතින් උතුම් ශාසනික අර්ථයන් දුර්වල වීමට උපක්‍රම, ක්‍රමවේදයන් සකස් වුණොත් ඉන් ඔබට සිදුවන හානියත් සුළුපටු නැහැ. භික්ෂුවට මැවිලා පෙනෙනවා, මුළු ශරීර අභ්‍යන්තරය ම පිච්චෙමින් මතුවෙන, ලොකු කළයක් වැනි ගිනි ජාලාවක් තම

කිඹුල් කටක් වැනි කටින් නිරතුරුව ම පිටකරමින්, පිච්චීමේ මරණීය වේදනාව, සෑම තත්පරයක දී ම අත්විඳින දේවදත්ත නිරිසතා නිරිඳුක් විඳින අවීචි මහා නිරයේ තව ඕනෑ තරම් ඉඩකඩ ඉතිරි වී තිබෙනවා ය කියන කාරණය.

තෘෂ්ණාවේ ආධිපත්‍යයට එරෙහිව අභියෝග කිරීම පිණිස....

පිංවත් ඔබ විවේකීව සිටින විට සිතත් සමඟ පිළිසඳරේ යෙදෙන්න. මොකක්ද මේ ජීවිතය? අම්මලා, තාත්තලා, ආච්චිලා, සීයලා මැරිලා යනවා. පුතාලා, දුවලා, මුණුබුරෝ, මිණිබිරියෝ ලොකු මහත් වෙනවා. මම කවදා මැරෙයි ද? කොයි ආකාරයෙන් මැරෙයි ද? මැරිලා නැවත කොතැනක ඉපදෙයි ද? සතර අපායකට වැටුණොත් කල්ප කීයක් එම දුක විඳින්න වේවි ද? එදාට මට අද වගේ අම්මෙක්, තාත්තෙක්, දුවෙක්, පුතෙක්, බිරිඳක්, සැමියෙක් කොයින් ද? එදාට තිරිසන් සතෙක් මගේ අම්මා වුණොත්, ප්‍රේතයෙක් මගේ තාත්තා වුණොත්, ගසක අත්තක්, පොළොවක තුඹසක්, තණපිටියක තණගොල්ලක්, කැලයක දියකඩිත්තක් මගේ නිවස වුණොත්, ප්‍රේත ගුබ්බෑයමක් මගේ නවාතැන වුණොත් මොන අවාසනාවක් ද? එය මොන දුකක් ද? මේ දුකේ නැවතීම කොතැන ද? නැවතීමේ ආරම්භය කොතැන ද?

පිංවත් ඔබ විවේකීව සිටින විට මේ ආකාරයෙන් සිතත් සමඟ පිළිසඳරේ යෙදෙන්න. එය හොඳ ප්‍රවේශයක් වේවි, මේ දුක නැවතීමේ ආරම්භයක් මතුකොටගන්න.

දුකේ ආරම්භය තෘෂ්ණාව ය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. පටිච්ච සමුප්පන්න ක්‍රියාවලිය තුළ ගමන් කරන සමස්ත සත්ව ප්‍රජාවේ ම නිර්මාණකරු වෙන්නේ තෘෂ්ණාව යි. තෘෂ්ණාව කියන එක ම කාරණයෙන් දුක ලෝකයට බැඳිලා තිබෙනවා. එස්සය අසල නිතර ගැවසෙමින්, ආස්වාදයේ රසයට

මුවාවෙමින් තෘෂ්ණාව විසින් ලෝකය නැවත නැවත නිර්මාණය කරනවා.

වරෙක බ්‍රහ්මයෙක්, තවත් වරෙක දෙවියෙක්, තවත් වරෙක මනුෂ්‍යයෙක්, තවත් වරෙක සතර අපායේ සත්වයෙක්. අනේකවිධ අපූරු රූරටා තෘෂ්ණාව විසින් ලෝකය තුළ උපද්දනවා. දුක විවෘත වූ ලෝකය තුළ, දුකට හේතුව වූ තෘෂ්ණාව සැඟවී ජීවත්වෙනවා.

පිංවත් ඔබ ලබන සෑම ආස්වාදයේ රසයක් අභියස දී ම එහි ආදීනවය මතුකොටගන්න ඔබ දක්ෂ නම්, එය තෘෂ්ණාවේ පැවැත්මට අභියෝගයක් වෙනවා. දුක ඇති කිරීමට හේතුව වන තෘෂ්ණාව, ලෝකයේ පැවැත්ම සඳහා තනිව ම දරදිය අදිනවා. තෘෂ්ණාවේ ආධිපත්‍ය බිඳදැමීමේ එක ම මාර්ගයට ආර්ය අෂ්ටාංගික මාර්ගය කියලා කියනවා. ආර්ය අෂ්ටාංගික මාර්ගයට පිවිසෙන නිවැරදි දොරටුව වන්නේ සම්මා දිට්ඨිය නමැති දොරටුව යි. සම්මා දිට්ඨියට පිවිසෙන නිවැරදි දොරටුව වන්නේ කල්‍යාණ මිත්‍ර ආශ්‍රය, සද්ධර්ම ශ්‍රවණය, නුවණින් මෙනෙහි කිරීම යි. දුක නැතිකොට දැමීමට තෘෂ්ණාවේ ආධිපත්‍යයට එරෙහිව අභියෝග කරන ඔබට ඉහත නිවැරදි ප්‍රවේශය අත්‍යවශ්‍ය වෙනවා. අවිද්‍යාවේ අඳුර, තෘෂ්ණාවේ හැඩරුව නිතර ඔබෙන් වසන් කරනවා. අවිද්‍යාව යනු අඳුර යි. අඳුර තුළින් ඔබ දකින්නේ අඳුර පමණක් ම යි.

අවිද්‍යාවේ අඳුරින් ගොරහැඩි වූ ලෝකය නැවතීමක්, නිමාවක්, අවසානයක් නොමැතිව තවත් කල්ප විනාශයන් දසදහස් ගණනක් පසුකොට ගලාගෙන යනවා. විද්‍යාව යනු ප්‍රඥාවේ ආලෝකය යි. ආලෝකය තුළ පිංවත් ඔබ දකින්නේ සත්‍යයයි, යථාර්ථයයි, සම්මා දිට්ඨියෙන් මෝදුකොට දෙන ප්‍රඥාවේ ආලෝකයයි, ක්‍රමානුකූලව සම්මා විමුක්තියෙන් විකසිත වී, ලෝකයෙන් පිංවත් ඔබව නිදහස්කොට දමයි.

ලෝකය යනු කැඩෙන, බිඳෙන, විසිරෙන අර්ථය යි. කුමක්ද කැඩෙන්නේ, බිඳෙන්නේ, විසිරෙන්නේ එය ලෝකය යි. රූපයයි කැඩෙමින්, බිඳෙමින්, විසිරෙමින් පවතින්නේ. නාමධර්මයනුයි කැඩෙමින්, බිඳෙමින්, විසිරෙමින් පවතින්නේ. මොහොතක් පිංවත් ඔබ දෙස හොඳින් බලන්න. ඇසත්, ඇස නිසා සකස්වෙන ඵස්ස, වේදනා, සංඥා, චේතනා, විඥාන ධර්මයන් කැඩෙමින්, බිඳෙමින්, විසිරෙමින් ගමන් කරනවා නේ ද? ලෝකය ඔබ ම යි. ඔබ යනු ලෝකය ම යි. තෘෂ්ණාව හිස්කරන ප්‍රඥාවේ ආලෝකය, තමා තුළින් ලෝකය දකින කැඩපත යි. තෘෂ්ණාවෙන් තෘෂ්ණාවට බැඳී පවතින දුක, සමස්ත සත්ව ප්‍රජාවට ම මෙතරම් තියුණු අභියෝගයක් එල්ල කොට තිබියදීත්, සමහර පිංවතුන්, ස්වාමීන් වහන්සේලාව මුණගැසුණහම අසන ඒකාකාරී ප්‍රශ්න මාලාවක් තිබෙනවාඃ

"ඔබ වහන්සේගේ නම මොකක්ද?

ගම කොහෙද? කවදාද පැවිදිවුණේ? ගිහි කාලේ මොකක්ද කළ රැකියාව? කසාද බැඳලද හිටියේ....?"

මෙවැනි නොවැදගත් ප්‍රශ්නවලට උත්තර දෙන්න ගියහම හරි ම පීඩාවක්.

අතීතයේ එක් තරුණයෙක් බුදුරජාණන් වහන්සේ හමුවන්න ඇවිල්ලා බොහොම වටිනා ප්‍රශ්නයක් අහනවා. ඒ ප්‍රශ්නය තමයි, "භාග්‍යවතුන් වහන්ස, මම නිතර ම දුකෙන් ජීවත්වෙනවා. මගේ ඥාතියෙක්, හිතවතෙක් අසනීප වුණහම, මියගියහම මට හරියට දුක ඇතිවෙනවා. ඒ නිසා මම හඬනවා; වැලපෙනවා; ශෝකවෙනවා" කියලා.

බුදුරජාණන් වහන්සේ මේ තරුණයාගෙන් පෙරළා ප්‍රශ්න කරනවා.

"තරුණය, ඔබේ ගමේ ඔබේ ළඟ ම ඥාතිවරයෙක් කලුරිය කරනවා. ඔබ එම මළගෙදරට ගිහිල්ලා මොකද කරන්නේ? කියලා.

"භාග්‍යවතුන් වහන්ස, මට එම ඥාතිවරයාගේ මරණය දරාගැනීමට නො හැකිව, වේදනාවෙන් හඬාවැටෙමින් වැලපෙනවා" කියලා තරුණයා පිළිතුරු දුන්නා.

බුදුරජාණන් වහන්සේ නැවත තරුණයාගෙන් ප්‍රශ්නයක් අහනවා, "තරුණය, ඔබේ ගමේ ඥාතිවරයෙක්, හිතවතෙක් නොවන කෙනෙක් කලුරිය කරනවා. ඔබ ඒ මළගෙදරට ගිහිල්ලා මොකද කරන්නේ? කියලා. තරුණයා පිළිතුරු දෙනවා, "මට එම මළගෙදර දී, දුකක් වේදනාවක් සකස් වෙන්නේ නැහැ. මොකද, ඔහු මගේ ඥාතියෙක් නොවන නිසා." "එහෙමනම් තරුණය, දුක කියන කාරණය ඔබ තුළ සකස් වෙන්නේ රූපය කෙරෙහි ඔබ ඇතිකොටගත් තෘෂ්ණාව නිසා ම යි. ඥාතිවරයා කෙරෙහි ඇති තෘෂ්ණාව නිසා ඔබ අඬනවා; දුක්වෙනවා. ඥාති නොවන අය කෙරෙහි ඔබේ තෘෂ්ණාවක් නොමැති නිසා ඔබ දුක්වෙන්නේ නැහැ. දුක ඇතිවෙන්නේ තෘෂ්ණාව නිසා ම යි" කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

ඔබ ශීලයෙන් දුර්වල අය සමඟ ගැටේ ද? එසේ නම් වරද ඒ අයගේ නොවේ

සයුරට වැටුණ කෙනා පිහිනා දූපතක් පිහිටකොට ගන්නවා සේ, තමා තමාව පිහිටකොට, පිළිසරණකොට ගන්න; ධර්මය පිළිසරණකොට ගන්න. එවිට පිංවත් ඔබ නුවණින් විමසා බලන්නේ ශෝක, වැලපීම්, දුක්, දොම්නස් ඇති වෙන්නේ කුමක් නිසා ද කියලයි. එවිට ඔබ නුවණින් දකිනවා. රූපය ආත්මය කොටග න්නවා, රූපය මගේ කොටගන්නවා, රූපය තුළ මා සිටිනවා ය කියලා ගන්නවා. නමුත් එය වෙනස්වෙන කොට, විපරිණාම වෙනකොට, ශෝක, පරිදේව, දුක්, දොම්නස් ඇතිවෙනවා, වේදනාව ආත්මය කොටගන්නවා, වේදනාව තුළ මා සිටිනවා ය කියලා ගන්නවා. වේදනාව වෙනස් වී යනකොට, විපරිණාම වෙනකොට, ශෝක, පරිදේව, දුක්, දොම්නස් හටගන්නවා. රූප, වේදනාවන්ගේ අනිත්‍ය, දුක්ඛ, අනාත්මභාවය දියුණු කළ ප්‍රඥාවෙන් දකින පිංවතා, දුක ප්‍රහාණය කොට දමනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

දුක තුනී කරගැනීමට යන ගමනේ දී දුක නැතිකරන මාර්ගය වන ආර්ය අෂ්ටාංගික මාර්ගයට නිවැරදි ආකාරයෙන් ප්‍රවිෂ්ටවීම අත්‍යවශ්‍ය කරුණක් වෙනවා. ආර්ය අෂ්ටාංගික මාර්ගයට පිවිසෙන ප්‍රධාන දොරටුව වන සම්මා දිට්ඨියෙන් බැහැරව වෙනත් ප්‍රවේශයන් ඔස්සේ ඔබ මාර්ගයට අවතීර්ණ වීමට ගියහොත්, දුක නැතිකිරීම වෙනුවට, දුක වැඩිකර ගැනීමට තමයි පිංවත් ඔබට සිදුවෙන්නේ. වර්තමාන සමාජයේ බෞද්ධ ජනතාව තුළ මේ අනතුර බොහෝ ම තදින් ක්‍රියාත්මක වෙන බවක්

පෙනෙනවා. මෙම අනතුර මතුවෙන්නේ කල්‍යාණමිත්‍ර ආශ්‍රයේ ඇති දුර්වලතාවයන් නිසා ම යි. බුදුරජාණන් වහන්සේ ඉහත අනතුර මතුකොට පෙන්වන බොහෝ ම වටිනා ධර්මයක් දේශනා කොට තිබෙනවා. එම ධර්මය තමයි, යමෙක් ශීලයෙන් පරිපූර්ණ වුව ද, ඔහු තුළ චිත්ත විශුද්ධිය සහ ප්‍රඥා විශුද්ධිය නැතිනම් ඔහු මරණින් මතු දුකට වැටෙයි කියලා. තෘෂ්ණාව ගැන, දුක ගැන කතාකරන කොට ඉහත වටිනා ධර්මය තුළ වර්තමාන සමාජයට සිතන්න ගොඩක් දේවල් තිබෙනවා. මෙතනදි චිත්ත විශුද්ධිය සහ ප්‍රඥා විශුද්ධිය කියලා දේශනා කරන්නේ, ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ප්‍රඥාවට අදාළ අංග දෙක වන සම්මා දිට්ඨිය සහ සම්මා සංකප්පයනුයි.

වර්තමාන සමාජයේ සම්මා දිට්ඨියෙන් සහ සම්මා සංකප්පයන්ගේ අර්ථයෙන් බැහැරව ශීලය ජීවිතයට එකතුකර ගැනීමේ දැඩි වෑයමක් පෙනෙන්නට තිබෙනවා. මෙතනදි සම්මා දිට්ඨිය කියන්නේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව, කර්මය-කර්මඵල විශ්වාසය, පටිච්ච සමුප්පන්නව නැවත උපතක් ඇතැයි විශ්වාසය, දන් දුන්නොත් සිල් රැක්කොත් එහි ආනිශංස තිබෙනවා ය කියන විශ්වාසය, අම්මා තාත්තාගේ ගුණයන් පිළිබඳ විශ්වාසය, ඕපපාතිකව ඉපදෙන සත්වයන් සිටිනවා ය කියන විශ්වාසය, මාර්ගඵලලාභී උතුමන් සිටියා ය කියන විශ්වාසය. ඒ වගේ ම සම්මා සංකප්පයන් කියලා කියන්නේ, අවිහිංසා සංකප්පය, අව්‍යාපාද සංකප්පය, නෙක්ඛම්ම සංකප්පය. ඉහත මාර්ග අංග දෙකේ අර්ථයෙන් පෝෂණය වුණ ශීලය යි, සම්මා සතිය තුළ පිංවත් ඔබව ශක්තිමත්කොට දෙන්නේ.

බුදුරජාණන් වහන්සේ ශීලයට අදාළව ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අංග තුනක් වෙන් කරනවා, සම්මා වාචා, සම්මා කම්මන්තෝ, සම්මා ආජීවෝ කියලා. වර්තමාන සමාජයේ බහුතරයක් පිංවතුන්ලා, ආර්ය අෂ්ටාංගික මාර්ගයේ, සම්මා දිට්ඨිය නමැති ප්‍රධාන දොරටුව මඟහරිනවා. ඒ නිසා ම, සම්මා සංකප්ප කියන දෙවැනි දොරටුවත් මඟහැරෙනවා. ප්‍රධාන දොරටු

දෙකෙන් ම මඟහැරලා සම්මා වාචා, සම්මා කම්මන්තෝ, සම්මා ආජීවෝ කියන ශීලයට අයත් අංගයන්ට, අතුරු ප්‍රවේශයකින් ප්‍රවිෂ්ට වෙනවා. දැන් ඔහු තුළ ශීලයේ අර්ථයන් වැඩෙන්නේ, සම්මා දිට්ඨියේ සහ සම්මා සංකප්පයන්ගේ අර්ථයන්ගෙන් තොරව යි. මෙන්න මේ ක්‍රියාදාමය වර්තමාන සමාජය තුළ හොඳින් විද්‍යමාන වෙනවා. සම්මා දිට්ඨියෙන් තොර ශීලයේ ආස්වාදය නිසා ම ඉහත අනතුරින් පින්වත් ඔබව තවතවත් සියුම්ව දුක දෙසට කොටුකරනවා.

සමහරක් පිංවතුන් මාංශ-නිර්මාංශ ප්‍රශ්නය නිසා සමාජය තුළ තර්ක විතර්ක කරනවා. තමන්ගේ මතයට එකඟ නො වන අයට චෝදනා කරනවා; ද්වේෂ කරනවා; මානසිකව හිංසාවට පත්කරනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කළ උතුම් ධර්මය සමඟ ගළපා දකින්නේ නැහැ. නමුත් මේ පිංවතුන් සිල්පද පහ හොඳින් ආරක්ෂා කරන පිංවතුන්. ඒ පිළිබඳව කිසි ම සැකයක් නැහැ. එම පිංවතුන් ශීලයෙන් පරිපූර්ණ යි. නමුත් සම්මා දිට්ඨියෙන්, සම්මා සංකප්පයන්ගෙන් එම ශීලය පෝෂණය වෙලා නැහැ. ඒ නිසා ම චිත්ත විශුද්ධියත් ප්‍රඥා විශුද්ධියත් ඒ පිංවතුන්ලා තුළ නැහැ.

බුදුරජාණන් වහන්සේ බොහෝ ම පැහැදිලිව දේශනාකොට තිබෙනවා, බුදුරජාණන් වහන්සේ නමක් පහළවෙන්නේ දඹදිව පමණක් ය කියලා. නමුත් සමහර පිංවතුන් සිටිනවා, බුදුරජාණන් වහන්සේගේ උපත, බුද්ධත්වය, පිරිනිවීම ඉන්දියාවේ සිදු වූ බව දැඩිව ප්‍රතික්ෂේප කරනවා. නමුත් මේ පිංවතුන් සිල්පද පහ හොඳින් ආරක්ෂා කරන පිංවතුන්ලා. මොකද මේ වෙලා තිබෙන්නේ? එම පිංවතුන්ලාගේ ශීලය සම්මා දිට්ඨියෙන් පෝෂණය වෙලා නැහැ. ඒ නිසා ම චිත්ත විශුද්ධිය, ප්‍රඥා විශුද්ධිය සකස්වීමක් නැහැ.

සමහර බෞද්ධ පිංවතුන්ලා සිටිනවා, ඒ අය කියන්නේ පන්සලේ, පල්ලියේ, කෝවිලේ දැල්වෙන්නේ එක ම පහනයි කියලා. ඒ පිංවතුන්ලාට තේරුමක් නැහැ, පන්සලේ, පල්ලියේ,

කෝවිලේ එක ම පහන දැල්වුණ ද, ඒ පහන් දල්වන පිංවතුන්ගේ අරමුණු, විශ්වාසයන් වෙනස් බව. පන්සලේ පහන දල්වන්නේ නික්ලේශී බුදුරජාණන් වහන්සේ අරමුණුකොට; නිවන් මාර්ගය අරමුණු කොට; පහන් දැල්ලේ අනිත්‍යභාවය අරමුණුකොට. නමුත්, පල්ලියේ, කෝවිලේ පහන් දල්වන්නේ ඒ ආගම්වල විශ්වාසයන්, අරමුණු මුල්කරගෙන. එම නිසා මේ පිංවතුන් තුළ සකස්වෙන චේතනාවන් එකිනෙකට වෙනස් වෙනවා. ඒ පිංවතුන්ලා සර්ව ආගමක් ගැනයි කතා කරන්නේ. සියලු ම ආගම් එකයි කියලා, පන්සලත්, පල්ලියත්, කෝවිලත් තුන ම සරණ යනවා. නමුත් මේ පිංවතුන් සිල්පද හොඳින් ආරක්ෂා කරන බෞද්ධ පිංවතුන්. මොකක්ද මේ වෙලා තිබෙන්නේ? තමන්ගේ ශීලය සම්මා දිට්ඨියෙන් පෝෂණය වෙලා නැහැ. ඒ නිසා ම චිත්ත විශුද්ධිය, ප්‍රඥා විශුද්ධිය දුර්වලයි.

සමහරක් පිංවතුන් සිටිනවා, තමන් හොඳින් සිල්පද ආරක්ෂා කරමින්, තමන්ගේ ශීලය හුවා දක්වමින් අනුන්ව හෙලා දකිනවා; විවේචනය කරනවා. වර්තමානයේ සමහරක් ගිහි පිංවතුන්ලා සිටිනවා, තමන්ගේ ශීලය වර්ණනා කරමින් ස්වාමීන් වහන්සේලාව හෙලා දකිනවා. ස්වාමීන් වහන්සේලාට වඳින්නේ නැහැ; ගරු කරන්නේ නැහැ. පන්සලට යන්නේ නැහැ. ඒ වගේමයි සමහර ස්වාමීන් වහන්සේලාත් සිටිනවා, තමන්ගේ ශීලය හුවා දක්වමින්, අනෙක් ස්වාමීන් වහන්සේලාව හෙලා දකිනවා; කොන් කරනවා. ශීලයෙන් දුර්වල පුද්ගලයා තුළින් අපි දකින්න ඕනේ ඔහුගේ ශීලයේ දුර්වලභාවය නො ව, ධර්මය යි. එහෙම වුණොත් පමණයි අපට පුළුවන් වෙන්නේ ඔහු ඉදිරියේ ආදර්ශවත් වෙන්න; අපි රකින ශීලයේ ගුණාත්මකභාවය මතුකොට ගන්න. මෙහිදී උපසම්පදා ස්වාමීන් වහන්සේලා බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ උතුම් ප්‍රාතිමෝක්ෂ ශීලයට අදාළව ඉහත කාරණය ගළපා ගතයුතු වෙනවා.

පිංවත් ඔබ ශීලයෙන් දුර්වල අය සමඟ ගැටෙනවා නම්, එය ශීලයෙන් දුර්වල අයගේ වරදක් නො වේ, පිංවත් ඔබ සිල්වත්ය කියලා ගත්තා වූ දෘෂ්ටියේ වරදයි. පිංවත් ඔබ සිල්වත් ය කියලා ගන්නා දෘෂ්ටියෙන් මිදෙන්න. එවිට ප්‍රශ්නය සමථයකට පත් වේ. දිනක් භික්ෂුව කැලෑ මාර්ගයක පිණ්ඩපාතයට වඩින විට, තුවක්කුවක් කරේ තියාගෙන දඩමස් වර්ගයක් පොහොර උරයක දමාගත් දඩයක්කරුවෙක් මුණගැසුණා. භික්ෂුව ඔහුට, "තෙරුවන් සරණයි මහත්තයෝ" කියාගෙන වැඩියා. කැලයේ වැඩසිටි එක් ස්වාමීන් වහන්සේ නමක් සතෙකුට වෙඩිල්ලක් තැබූ ගම්වැසියෙක්ව අල්ලාගෙන ගසක බැඳලා, වනජීවී නිලධාරීන්ට භාරදීලා, ගමේ ප්‍රශ්නයක් ඇතිකරගත් කතාවක් භික්ෂුව ගම්මානයකදී අසා තිබෙනවා. අපේ ශීලයේ පරිපූර්ණ බව නිසා ම, අපි දුසිල්වත්භාවය සමඟ ගැටුමට යනවා. ඇයි මේ විදියට සිද්ධවෙන්නේ? තමාගේ ශීලය සම්මා දිට්ඨියෙන්, සම්මා සංකප්පයන්ගෙන් පෝෂණය වෙලා නැහැ. ඒ නිසා ම ඒ පිංවතුන්ලා තුළ චිත්ත විශුද්ධිය, ප්‍රඥා විශුද්ධිය සකස්වෙලා නැහැ.

භික්ෂූන් වහන්සේ නමක් සමඟ කටයුතු කරන විට උපේක්ෂා සහගත වන්න

දිනක් පිණ්ඩපාත මඩුවේ පිණ්ඩපාතය පිළිගන්නකොට භික්ෂුවට අවශ්‍ය ප්‍රමාණයට වඩා පිණ්ඩපාතය ලැබිලයි තිබුණේ. එම නිසා එක් උපාසිකාවක් පූජා කරන්න හදපු පලතුරක්, "අද අවශ්‍ය වෙන්නේ නැහැ මෑණියෝ" කියලා ප්‍රතික්ෂේප කළා. ඒ අම්මා පලතුරත් අරගෙන ඒ මොහොතේ ම ගෙදර ගියා. භික්ෂුව පින් අනුමෝදන් කරන තුරුවත් හිටියේ නැහැ. ඒ අම්මා නැවත කවදාවත් පිණ්ඩපාත මඩුවට දානය ගෙනාවේ නැහැ. නමුත් මේ අම්මා හොඳින් සිල්පද ආරක්ෂා කරන අම්මා කෙනෙක්. ඇපල් ගෙඩියක් පාත්‍රයේ තිබියදී, තවත් ඇපල් ගෙඩියක් පිළිගන්න එක තේරුමක් නැහැ. ඒත් ඒ අම්මාට ඒ ගැන වැටහීමක් නැහැ. භික්ෂුවට ඒ මොහොතේ එය පැහැදිලිකොට දෙන්නත් බැහැ. ඒ නිසා පිංවතුන්ලා, ස්වාමීන් වහන්සේලා සමඟ කටයුතු කරනකොට, උපේක්ෂාවෙන් ඒ දේ කරන්න. ස්වාමීන් වහන්සේ නමක් වචනයකින්, ඉරියව්වකින් යමක් ප්‍රකාශ කළොත්, යම් හේතුවක් නිසා ම යි එහෙම කරන්නේ. එහෙම නැතිව අපේ ලොකුකමකට නො වේ. කුමකට ලොකුකමක් පෙන්වන්න ද?

හෙට උදෑසන ගමට පිණ්ඩපාතයට වැඩියහම, ගමේ පිංවතුන් කීවොත්, "අපි ඔබ වහන්සේට දානෙ දෙන්නේ නෑ" කියලා, භික්ෂුව පෙරළා කුටියට වැඩම කරලා ගිලන්පසකින් පමණක් දවස ගෙවන්න ඕනේ. උදේ දානයට, දවල් දානයට රුපියල් පන්දාහක්, රුපියල් දහදාහක්, රුපියල් පහළොස්දාහක් ආදී වශයෙන් මිලගණන් නියම කරන සමාජයක, පිංවතුන්ලාගේ

දෙපතුල ළඟට ඇවිත්, පිංවතුන්ලාගේ සිඟමනෙන් ජීවත්වන පිරිසක් අපි. නමුත් මෙය සටහන් තබන භික්ෂුව පිංවතුන්ලාගෙන් අනුකම්පාවක් බලාපොරොත්තු වෙන්නේ නැහැ. මොකද, භික්ෂුව දන්නවා අනුකම්පාව කියලා කියන්නේ, ඵස්සය හේතුවෙන් සකස්වෙන, අනිත්‍යභාවයට පත්වෙන, අයාලේ යන සිතක් පමණක්ය කියලා.

මේ උතුම් සම්මා සම්බුද්ධ ශාසනය කියන්නේ, ස්වාමීන් වහන්සේලාගේ උරුමයක් පමණක් නො වෙයි; භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා කියන සිව්වනක් පිරිසේ ම එකතුව යි. ඒ නිසා ශාසන චර්යාවන්හීදී අපට වෙන්වෙන්ව කටයුතු කරන්න බැහැ. ඒ නිසා අප සිව්පිරිස, උපේක්ෂාවෙන් අපි අපි දෙස බලන්න දක්ෂ වෙන්න ඕනේ. වැරැද්දක් සිද්ධවෙනවා නම්, අපි අපිට ආදර්ශවත්ව කටයුතු කරන්න දක්ෂ වෙන්න ඕනේ. අපි අනුමත නො කරන දෙයක් අපි අතර සිද්ධවෙනවා නම්, ඒ ගැන නො ගැටුණු සිතින් විමසා නිවැරදි කරගන්න දක්ෂ වෙන්න ඕනේ. අපේ අදහස් එකිනෙකට වෙනස් නම්, එකතු වී කටයුතු කරන්නට බැරි නම්, සමගියෙන් වෙන් වී යන්න ඕනේ. එසේ නො වී අපි අපි ගැන ගැටෙන ස්වභාවයන්ට ගියොත්, ශාසනයේ ශක්තිය බිඳවැටීමට අප උපකාර කළා වෙන්න පුළුවන්. කවදාවත් අපි හැමෝට ම එක ම විදිහේ අදහස් පිහිටන්නේ නැහැ. එය ධර්මතාවයක්.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ධාතු ධාතු වශයෙන් සත්වයා එකතු වෙනවා, බෑඳී යනවා කියලා. ධුතාංග ධර්මයන්ට කැමති පිංවතුන්ලා මහාකාශ්‍යප මහ රහතන් වහන්සේට එකතුවෙනවා. දිවෙස් ධර්මයන්ට කැමති පිංවතුන්ලා, අනුරුද්ධ මහ රහතන් වහන්සේට එකතු වෙනවා. විනයට කැමති පිංවතුන්ලා, උපාලි මහ රහතන් වහන්සේගේ ඇසුරට එකතු වෙනවා. අසත්පුරුෂ ධර්මයන්ට කැමති අය, දේවදත්ත හාමුදුරුවන්ගේ ඇසුරට කැමති වෙනවා. ඉහත ධර්මතාවය නිසා මනුෂ්‍ය අපිට එක ම විදිහකට සිතන්න, දකින්න බැහැ.

අදහස්වලින් වෙනස් අපි වෙන්විය යුත්තේ එකිනෙකාට චෝදනා කරගැනීමෙන්, ගැටීමෙන් නො වේ; සමගියෙන් ම යි. නමුත් සමාජයේ බහුතරයකට ඉහත දක්‍ෂතාවය නැහැ. එම නිසා ම සිව්පිරිස එකිනෙකා අතර භේදයන් ඇතිකර ගන්නවා. නමුත් මේ හොඳින් සිල්පද ආරක්‍ෂා කරගන්න පිංවතුන්. ඇයි මෙහෙම වෙන්නේ? තමන්ගේ ශීලය සම්මා දිට්ඨියෙන් පෝෂණය වෙලා නැහැ. ඒ නිසා ම චිත්ත විශුද්ධිය, ප්‍රඥා විශුද්ධිය සකස් වී නැහැ. ඒ හේතුව නිසා ම ඒ අය මරණින් මතු දුකට පත් වේ ය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

සමහරක් පිංවතුන් සිටිනවා, ඒ අය හොඳින් සිල්පද ආරක්‍ෂා කරගන්න බෞද්ධ පිංවතුන්. නමුත් මේ අය දුප්පත්. කවුරුන් හෝ කණ්ඩායමක් ඇවිත්, "අපි ඔබගේ පවුලට රුපියල් ලක්‍ෂයක ස්ථිර තැන්පතුවක් පොතේ දමලා දෙන්නම්, එහෙම නැතිනම් අත්ට්‍රැක්ටරයක් අරගෙන දෙන්නම්, ඔබලා බුදුදහම අතහැරලා, අපේ ආගමට එන්න" කියලා කිව්වොත්, අනේ මේ දුප්පත්, අහිංසක පිංවතුන්, බුදුදහම අතහැරලා පුංචි ලාභයක් වෙනුවෙන් වෙනත් ආගමකට යනවා. නමුත් මේ අය සිල්පද ආරක්‍ෂා කරගන්නවා. ඇයි මෙහෙම වෙන්නේ? ඒ අයගේ ශීලය සම්මා දිට්ඨියෙන් පෝෂණය වෙලා නැහැ. ඒ නිසා ම චිත්ත විශුද්ධි, ප්‍රඥා විශුද්ධි සකස්වෙලා නැහැ. මේ අය මරණින් මතු දුකට වැටෙනවා ය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. භික්ෂුව වැඩසිටි ගම්මානයක, මෙවැනි පවුල් කිහිපයක් හිටියා. ඒ අය මුලින් හොඳ බෞද්ධයින්. නමුත් දැන් ඒ පවුල්වල අය ස්වාමීන් වහන්සේ නමක්ව දකින්නේ යක්‍ෂයා හැටියට යි. මෙවැනි දුර්වල දෘෂ්ටීන්ට ශීලය විසින් කුමන රැකවරණයක් දෙන්න ද?

ශීලයෙන් පරිපූර්ණ වූ පමණින් භවයේ සුරක්ෂිත වේ ද?

භික්ෂුව ගම්මානයක වැඩ සිටිනකොට, එම ගමේ එක් කණ්ඩායමක් කිසි ම දිනක පිණ්ඩපාත මඩුවට පිණ්ඩපාතය ගෙනාවේ නැහැ. ඒ ගැන ගමේ කැපකරුගෙන් විමසනකොට ඒ මහත්තයා කියනවා, "හාමුදුරුවෝ ගමේ කුලයෙන් අඩු අයගේ පිණ්ඩපාතය පිළිගන්න නිසා ඒ අය පිණ්ඩපාතය පූජා කරන්නේ නැහැ" කියලා. මේ කණ්ඩායමට කුලයෙන් උසස් අය කියලයි කියන්නේ. මේ කණ්ඩායම ගමේ පන්සලට දානෙ පූජා කරන්නෙත් නැහැ. ගමෙන් පිට, නගරයේ තෝරාගත් පන්සලකට තමයි දානය පූජා කරන්නේ. නමුත් මේ පිංවතුන්ලා සිල්පද පහ හොඳින් ආරක්ෂා කරගන්නා පිංවතුන්. ඇයි මෙහෙම වෙලා තියෙන්නේ? තම ශීලය සම්මා දිට්ඨියෙන් පෝෂණය වෙලා නැහැ. ඒ නිසා ම සම්මා සංකප්පයන් වැඩිලා නැහැ. ඒ නිසාම චිත්ත විශුද්ධිය, ප්‍රඥා විශුද්ධිය වැඩිලා නැහැ. මෙවැනි අය මරණින් මතු දුකට වැටේ ය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

සමහර පිංවතුන් සිටිනවා, ඒ අය සිල්පද පහ ආරක්ෂා කරගන්නවා. බෞද්ධ පිංවතුන්. නමුත් ඒ අය මහා සංඝරත්නයට දානය පූජා කරන්නේ නැහැ; මහා සංඝරත්නය උදෙසා පූජා කරන දානයේ ආනිශංස පක්ෂය දන්නේ නැහැ. සමහර පිංවතුන්ලා ස්වාමීන් වහන්සේලාව අඩු තක්සේරුවට ලක්කරනවා. එම පිංවතුන්ලා මහලු නිවාසවලට, ළමා නිවාසවලට, රෝහල්වල රෝගීන්ට, දුගීමගී අයට තමයි දන්දෙන්නේ. මේ අයට දන්දෙන්න එපා ය කියන එක නෙවෙයි මේ කියන්නේ. මහා සංඝරත්නය

අරමුණුකොට පූජා කරන දානයේ අග්‍රභාවය අපි දකින්න අවශ්‍යයි. වර්තමාන සංඝ සමාජයේ යම් ස්වාමීන් වහන්සේ නමකගේ දුර්වලතාවයක් තිබුණොත්, මහා සංඝරත්නය අරමුණුකොට එම හිස්තැන් පුරවාගැනීමට අපි දක්ෂ වෙන්න ඕනේ. නමුත් එසේ නො වන්නේ මේ පිංවතුන්ගේ ශීලය, සම්මා දිට්ඨියෙන් පෝෂණය වෙලා නැති නිසා. ඒ නිසා ම චිත්ත විශුද්ධිය, ප්‍රඥා විශුද්ධිය වැඩිලා නැහැ. මේ අය මරණින් මතු දුකට වැටීමේ අවදානම තිබෙනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

වර්තමාන සමාජයේ සමහරක් පිංවතුන්ලා සිටිනවා, එම පිංවතුන්ලා හොඳින් සිල්පද ආරක්ෂා කරනවා; දන් දෙනවා; අනුනට කරදරයක් නො වී යහපත් ජීවිත ගතකරනවා. ඉහත කාරණා තුළින් පමණක් තමන් ධර්මය තුළ සිටිනවා ය කියලා සතුටු වෙනවා. එම පිංවතුන් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අර්ථයන් ගැන දන්නේ නැහැ. සම්මා දිට්ඨිය කියන්නේ මොකක්ද කියලා ඇහුවොත්, "දන්නේ නැහැ" කියනවා. සම්මා වායාමෝ කියන්නේ කුමකට ද කියලා ඇහුවොත්, "දිනපතා ව්‍යායාම කිරීම" කියලයි කියන්නේ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, යමෙක් සිල්පද පහ ආරක්ෂා කරගත්තා ය කියලා, දන් දුන්නා ය කියලා ඔහු බෞද්ධයෙක් වෙන්නේ නැහැ ය කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, බෞද්ධයා කියන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අර්ථයන් ජීවිතයට එකතු කොටගෙන මාර්ගයේ ගමන් කරන පිංවතා ය කියලා. ඇයි ඉහත සඳහන් කළ තත්වයන්ට පිංවතුන්ලා පත්වෙන්නේ? තමන්ගේ ශීලය සම්මා දිට්ඨියෙන් පෝෂණය වෙලා නැති නිසා. ඒ නිසා ම චිත්ත විශුද්ධිය, ප්‍රඥා විශුද්ධිය දුර්වල යි. මේ අය මරණින් මතු දුකට වැටේ ය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

සමහරක් පිංවතුන්ලා සිටිනවා, එම පිංවතුන් හොඳින් සිල්පද පහ ආරක්ෂා කරනවා. නමුත් ආර්ය අෂ්ටාංගික මාර්ගය ගැන උනන්දුවක් දක්වන්නේ නැහැ; තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව, ආර්ය කාන්ත ශීලය, පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය ගැන

උනන්දුවක් දක්වන්නේ නැහැ. මේ පිංවතුන් සතියකින්, දෙකකින්, මාසයකින් යුත් පාඨමාලාවකින් අනුනට ලිඛිත සහතිකයකින් සෝවාන් ඵලය, සකෘදාගාමී ඵලය ප්‍රදානය කරනවා. ඇයි සමාජය තුළ මෙහෙම වෙන්නේ? එම පිංවතුන් ශීලයෙන් පරිපූර්ණ වුවත් එම ශීලය සම්මා දිට්ඨියෙන් පෝෂණය වෙලා නැහැ. ඒ නිසාම එම පිංවතුන් තුළ චිත්ත විශුද්ධිය, ප්‍රඥා විශුද්ධිය දුර්වල යි. මෙවැනි අය මරණින් මතු දුකට වැටීමේ අවදානම තිබෙනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

චිත්ත විශුද්ධියෙන්, ප්‍රඥා විශුද්ධියෙන් දුර්වල නම්....

සමාජයේ සමහරක් පිංවතුන්ලා සිටිනවා, ඒ අය හොඳින් සිල්පද පහ ආරක්ෂා කරනවා. නමුත් මේ අය ප්‍රකාශ කරන්නේ, අපට නො පෙනෙන අනෙක් ග්‍රහලෝකවල මේ මොහොතේත් බුදුරජාණන් වහන්සේලා වැඩ සිටිනවා කියලා; මේ මොහොතේත් කොහේ හෝ ග්‍රහලෝකයක බුදුරජාණන් වහන්සේ නමක් සද්ධර්මය දේශනා කරනවා කියලා; අපි සියලු දෙනා ම යම් දවසක නිවන් අවබෝධ කරගන්නේ බුද්ධත්වයට පත්වෙලා ය කියලා; ඒ නිසා ම අපි සියල්ලෝ ම බෝධිසත්වයෝ ය කියලා. මෙවැනි විකාර ධර්මයක් බුදුරජාණන් වහන්සේ දේශනා කොට නැහැ. ඇයි මෙවැනි අදහස් සමාජය තුළ පැතිරෙන්නේ? එම පිංවතුන්ලා ශීලයෙහි පරිපූර්ණ වුවත් එම ශීලය සම්මා දිට්ඨියෙන් පෝෂණය වී නැති නිසා. එම නිසා ම චිත්ත විශුද්ධිය, ප්‍රඥා විශුද්ධිය වැඩිලා නැහැ. එම පිංවතුන් මරණින් මතු දුකට වැටේය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

සමාජයේ සමහරක් පිංවතුන්ලා සිටිනවා, ඒ අය හොඳින් සිල්පද පහ ආරක්ෂා කරනවා. නමුත් තමන්ගේ අම්මාට, තාත්තාට සලකන්නේ නැහැ. ගෙදර නොවටිනා කාමරයක, නොවටිනා පහසුකම් සහිතව තමයි දෙමාපියන් ජීවත් වන්නේ.

එහෙම නැතිනම් මහලු නිවසක, නේවාසිකාගාරයක මුදල් දී නවත්වනවා. නැතිනම් සේවකයන් හැටියට දෙමාපියන්ට සලකනවා. අම්මා, තාත්තා කියන කුසල් නිධිය සුව සේ භාරගන්න

දක්ෂ නැහැ. නමුත් මේ පිංවතුන් ශීලයෙන් පරිපූර්ණ පිංවතුන්. ඇයි මෙහෙම වෙලා තියෙන්නේ? තමාගේ ශීලය සම්මා දිට්ඨියෙන් පෝෂණය වෙලා නැහැ. ඒ නිසා ම චිත්ත විශුද්ධිය, ප්‍රඥා විශුද්ධිය දුර්වල යි. මෙවැනි අය මරණින් මතු දුකට වැටීමේ අවදානම තිබෙනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

තවත් සමහර පිංවතුන්ලා සිටිනවා, එම පිංවතුන් සිල්පද පහ හොඳින් ආරක්ෂා කරන බෞද්ධ පිංවතුන්. නමුත් මේ අය කථා කළොත් උපන් මව්බිමට බනිනවා. මව්බිමේ දුර්වලතාවයන්මයි දකින්නේ; අගුණයක් ම යි කියන්නේ. මේ උතුම් මව්බිමේ ස්ථාපිතව තිබෙන සද්ධර්මයේ අර්ථය දකින්නේ නැහැ. උපන් මව්බිමේ දුර්වලතාවයන් දකිමින්, කොහේ හෝ වෙනත් රටක් වර්ණනා කරනවා. භික්ෂුවට මතකයි, වරක් එක් බෞද්ධ තරුණයෙක්, රටේ යුද්ධය පැවති අවස්ථාවේ කිව්වා, මේ රටෙන් බටහිර රටකට පැනගන්න තිබෙනවා නම්, ඒක තමයි මම බලාපොරොත්තු වන නිවන කියලා. මේ තරුණයා සිල්පද ආරක්ෂා කරගන්න තරුණයෙක්. මේ ලෝකධාතුව තුළ යම් උතුම් පුණ්‍ය බිම්කඩක් තිබෙනවා නම්, ඒ උතුම් බිම්කඩ මේ ධර්මද්වීපයම යි. ජීවමාන බුදුරජාණන් වහන්සේ හැටියට වන්දනා කරන්න, දැකබලා පින් රැස්කොට ගන්න, උතුම් පූජාවස්තූන්ගෙන් යුත් බිම්කඩක් මේ ලෝකධාතුව තුළ තිබේ නම්, ඒ උතුම් බිම්කඩ මේ ධර්මද්වීපයමයි. දිව්‍යතල, බ්‍රහ්මතලවල ජීවත්වන සම්මා දිට්ඨියට පත් දෙවියන්, බ්‍රහ්මයන් නිතිපතා දොහොත්මුදුන් තබා වන්දනා කරන උතුම් බිම්කඩක් මේ ලෝකධාතුව තුළ තිබේ නම්, ඒ උතුම් බිම්කඩ මේ ධර්මද්වීපය ම යි. දිව්‍යතලවල පින පිරිහී, දිව්‍ය ආයුෂ පිරිහීයන දෙව්වරු, දිව්‍යාංගනාවන් නැවත පින් කිරීමට උපත ලැබීමට ප්‍රාර්ථනා කරන උතුම් බිම්කඩක් මේ ලෝකධාතුව තුළ තිබේ නම්, ඒ උතුම් බිම්කඩ මේ ධර්මද්වීපය ම යි. මෙවන් උතුම් පිංබිමක උපත ලබලා, මව්බිමේ වටිනාකම නො දැක, ලෝකයේ වෙනත් රටවල් ගොඩක් වර්ණනා කරනවා. ඒ පිංවතුන් වර්ණනා කරන සමහර රටවල ධර්මයේ නිවැරදි අර්ථයන් නැහැ. මහායාන

ක්‍රමවේදයන්ගෙන් පෝෂණය වුණ මිථ්‍යා දෘෂ්ටික ලක්ෂණයි, සමහරක් රටවල බහුලව දක්නට ලැබෙන්නේ. මෙවැනි රටවල් ප්‍රත්‍යන්ත දේශයන්, ධර්මයේ අර්ථයන් නො පිහිටන දේශයන් හැටියටයි බුදුරජාණන් වහන්සේ හඳුන්වන්නේ.

රැකියාවන් සඳහා විදේශ රටවල සේවය කිරීම කියන කාරණය මෙයට අදාළ වෙන්නේ නැහැ. මව්බිමේ අගුණයන් දකිමින්, ලෝකයේ අනෙක් රටවල ගුණයන් දකින පිංවතුන්ලා හොඳින් සිල්පද පහ ආරක්ෂා කරන පිංවතුන්ලා. ඇයි මෙහෙම වෙලා තිබෙන්නේ? තමන් රකින ශීලය සම්මා දිට්ඨියෙන් පෝෂණය වෙලා නැහැ. ඒ නිසා ම චිත්ත විශුද්ධිය, ප්‍රඥා විශුද්ධිය දුර්වල යි. මෙවැනි අය මරණයෙන් මතු දුකට වැටෙයි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. විදේශගතව සේවය කරන පිංවතුන්ලා, තමන් ජීවත්වන ආගන්තුක රටේ සිටිමින්, උපන්බිමේ උතුම්භාවය නිරතුරුව ම නුවණින් දකින්න. මේ ලෝකධාතුවේ මනුෂ්‍යයකුට ලබන්න තිබෙන ශ්‍රේෂ්ඨ ම සැපයක් වන සම්මා දිට්ඨියට පත්වීම නමැති සැපය, විදේශ රටක සිටිමින් වුව ද එවිට ඔබට ලැබිය හැකිවෙනු ඇත.

සමාජයේ ජීවත්වන සමහරක් පිංවතුන්ලා සිටිනවා, එම පිංවතුන්, හොඳින් සිල්පද පහ ආරක්ෂා කරනවා. නමුත් මේ අය ජ්‍යොතිෂ, යන්ත්‍ර-මන්ත්‍ර, ගුරුකම්, බලිතොවිල්, දේවාල සරණ කොට ගෙනයි ජීවත්වන්නේ. ඇයි මෙහෙම වෙන්නේ? මේ පිංවතුන්ලා ආරක්ෂා කරන සීලය සම්මා දිට්ඨියෙන් පෝෂණය වෙලා නැහැ. ඒ නිසා ම චිත්ත විශුද්ධිය, ප්‍රඥා විශුද්ධිය දුර්වලයි. මෙවැනි අය මරණින් මතු දුකට පත්වෙනවා ය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

භික්ෂුව මේ වස් සමයේ වැඩසිටින කුටියේ කැපකරුගේ කුඹුරේ අද ගොයම් කපනවා. කළුවර වැටෙන්න ආසන්න මොහොතේ, ගොයම් පාගන මීහරකුන්ට කෑගසන හඬ ගම්මානය දෙසින් යාන්තමට ඇසෙනවා. මේ ගම්මානවල තවමත්

මීහරකුන්ට ගොවිතැන් කටයුතුවල දී වටිනාකමක් තිබෙනවා. පසුගිය කන්නය අවසානයේ දී, ගමේ ගෙදරක හදපු මීහරකෙක් විකුණලා, මීහරකා ලොරියට පටවනකොට එයාගේ ඇස්වලට කඳුළු ආවා ලු. මස්කඩේ මුදලාලි මීහරකාට රුපියල් හැටදාහක් ම ගෙවලා. අකුසලයට කොච්චර නම් වටිනාකමක් තිබෙනවාද. කුඹුරේ පස පෙරලලා, කුඹුර මඩකරලා, ගොයම පාගලා, අවුරුද්දක් කන්න වී ටික ගෙදරට ඇදලා දීලා, අවසානයේ දී එම සතා මසට විකිණෙනවා නම් පිංවතුන්ලා අකුසලයට කොච්චර නම් බියවෙන්න ඕනේ ද.

ඉහත සටහන පුරාවට, සම්මා දිට්ඨියේ දුර්වලතාවයෙන් ඇතිවෙන විශ්වාසයන් ගැනයි සටහන් කළේ. යමෙක් සීලයෙන් පරිපූර්ණ වුව ද, ඔහු චිත්ත විශුද්ධියෙන්, ප්‍රඥා විශුද්ධියෙන් දුර්වල නම්, මරණින් මතු දුකට වැටෙයි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මෙම කාරණයේ දී මරණින් මතු දුකට වැටෙනවා ය කියන්නේ, එක්කෝ සතර අපායට වැටෙනවා. නැතිනම් මිථ්‍යා දෘෂ්ටික, දිව්‍ය-මනුෂ්‍ය ජීවිත ලබනවා. එහෙමත් නැතිනම් කුලහීන භාවයට, අල්පේශාක්‍යභාවයට, නූගත් භාවයට පත්වෙනවා. එහෙමත් නැත්නම් අඳ, ගොළු, බිහිරිභාවයට, විරූපීභාවයට, මන්දබුද්ධික භාවයට පත්ව දුප්පත්, පොහොසත් පවුල්වල ඉපදෙන්න පුළුවන්.

සම්මා දිට්ඨිය නමැති නිවැරදි දොරටුවෙන් ඇතුළු වෙන්න

සම්මා දිට්ඨියෙන් පෝෂණය වූ ශීලය පිංවතුන්ලාට හරි ම පහසු දෙයක්. පිංවත් ඔබගේ ජීවිතය සරල කරනවා; සැහැල්ලු කරනවා. ශීලය අපි ආභරණයක් කර නො ගත යුතු යි. සම්මා දිට්ඨියෙන් පෝෂණය නො වූ ශීලය, යමෙකුට ආභරණයක් කරගන්න පුළුවන්. එය ඔහුව නොමඟ යවන අනතුරුදායක ක්‍රියාවක් වෙන්න පුළුවන්.

සම්මා දිට්ඨියෙන් පෝෂණය වුණු ශීලය කියන්නේ බලයක්; සමාධියට, ප්‍රඥාවට ගොඩවීම සඳහා වන බලයක්.

මෙය සටහන් තබන භික්ෂුව යම් මොහොතක උතුම් පැවිදිභාවයට පත්වුණා ද, ඒ මොහොතේ පටන් ශීලයට හුඟාක් කැමති කෙනෙක්. භික්ෂුවගේ ශීලයට දෙවියන් වන්දනා කරනවා කියන කාරණය භික්ෂුව අත්දැකීමෙන් දන්නවා. මේ සටහන් තබන මොහොතේ භික්ෂුවට තමන්ගේ ගිහිකාලය මතක්වෙනවා. එම ගිහිකාලයේ සිල්පද රැකීම්වලට වඩා සිල්පද බිඳීම් වැඩියි. නමුත් ඒ සිල්පද බිඳීම්වලට සත්ව ඝාතනය, සොරකම, බොරුකීම කොහෙත්ම අයිතිවුණේ නැහැ. නමුත් වර්තමානයේ සිට අතීතයේ ගිහිජීවිතය දෙස බැලීමේ දී මම වඩාත් ගරුකරන්නේ, රැකුණු සිල්පදවලට වඩා බිඳුණු සිල්පදවලට යි. බිඳුණු සිල්පද නිසාමයි, මම ගිහි ජීවිතයේ දී කාමයන්ගේ ආදීනවයන් අත්දැකීම් තුළින් ම අවබෝධ කරගත්තේ. එසේ නොවුණා නම් තවමත් මම සදාචාරයේ නාමයෙන් අඳුරේ අතපතගාන මනුෂ්‍යයෙක්.

ගිහිජීවිතයේ දී මට හැකියාවක් තිබුණා, සිල්පදයක් බිඳිමින්, බිඳුණු සිල්පද මත හිඳිමින්, බිඳුණු සිල්පදය විදර්ශනා නුවණින් දකින්න. කිසිදු ගුරු උපදේශයකින් තොරවයි එය සිදුවුණේ. එය මම සංසාරයේ ලබපු පුහුණුවක්. මම සංසාරයේ ශක්තිමත් තැනකින් නතරකොට තිබෙනවා. ඒ අතීත සංසාරයේ පුරුද්දයි, මම ගිහිජීවිතයේ දී මතුකරගත්තේ. නමුත් පිංවත් ඔබ ඉහත කාරණාව අදාළ කරගන්න යන්න එපා. එය ඔබට අනතුරුදායක ක්‍රියාවක් වේවි. මොකද, අපි එකිනෙකාගේ ඉන්ද්‍රිය ධර්ම වැඩී ඇති ආකාරය වෙනස්. එම නිසා වර්තමානයේ පිංවත් ඔබ සම්මා දිට්ඨිය නමැති නිවැරදි දොරටුවෙන් නිවන් මාර්ගයට ඇතුළු වී, ආර්ය අෂ්ටාංගික මාර්ගය ශක්තිමත් කොටගන්න. එවිට ක්‍රමානුකූලව ඔබේ ඉන්ද්‍රිය ධර්මයන් තියුණු කරලා දේවි.

පිංවත් ඔබ කෑම මේසයේ වාඩිවෙලා, බත් පිඟානට බෝංචි ව්‍යංජනයෙන් හැන්දක් පමණක් බෙදාගෙන හැමදා ම අනුභව කළොත් කවදාවත් පිංවත් ඔබට බෝංචි ව්‍යංජනය එපාවෙන්නේ නැහැ; අප්‍රිය වෙන්නේ නැහැ. නමුත් කෑම මේසයේ දී ඔබේ බත් පිඟානට බෝංචි ව්‍යංජනයෙන් හැඳි පහක් හයක් බෙදාගෙන අනුභව කළොත්, බොහොම ඉක්මනින් ඔබට බෝංචි එපාවෙනවා; අප්‍රිය වෙනවා. ඉහත බෝංචි ව්‍යංජනයේ කථාව අවසානයට මෙහි සටහන් කළේ, පිංවත් ඔබට විවේකීව ගොඩක් දේවල් ධර්මානුකූලව සිතන්න යි.

මම නම් ගිහිකාලේ කොයි දෙයත් නුවණින් දකිමින්, චපල තෘෂ්ණාවේ ගුණමකුබව හඳුනාගනිමින්, වැඩිපුර අනුභව කරපු කෙනෙක්. ඒ නිසා ම යි රසයන්ට අදාළ සියල්ල එපා වුණේ; සංහිඳී ගියේ. මේ සටහන් තබන භික්ෂුව රැඩිකල් භික්ෂුවක්. 'රැඩිකල්' කියන වචනය භික්ෂුවකට සුදුසු නො වෙන්න පුළුවන්. එහෙත් මොනයම් නුසුදුසු වචනයක් වුව ද, ඒ වචනය ධර්මයෙන් පෝෂණය වී ඇතිනම්, වචනයකට අපි බයවිය යුතු නැහැ. රැඩිකල් කියන වචනය භික්ෂුව පාවිච්චි කළේ සම්මතයෙන් පිට යමින්, සම්මතය තුළ ශක්තිමත් වූ භික්ෂුවක්

නිසා යි; ගිහිජීවිතයේ දී, අත්‍යවශ්‍ය මොහොතක සිල්පද බිඳිමින්, ශීලයෙන් පරිපූර්ණ පැවිද්දක් ලැබූ භික්ෂුවක් නිසා යි; ජීවිතය මරණයට දමමින්, පංචඋපාදානස්කන්ධයට ඇති තෘෂ්ණාව සිඳලූ භික්ෂුවක්, අකුසලය විදර්ශනා නුවණින් දැක, කුසලය මතුකොට ගනිමින්, කුසලයත්, අකුසලයත් දෙක ම විදර්ශනා නුවණින් දැක්ක භික්ෂුවක්, ගිහිජීවිතය තුළ දී ම පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය අත්දැක්ක භික්ෂුවක් නිසා යි.

දෙවන කොටස

විශේෂ ලිපි

මේ ලිපිමාලාව ඔබට පුදන පිංවත් ස්වාමීන් වහන්සේ විසින්,
ජීවිත යථාර්ථය දෙස සවිඥානිකව බලමින්,
විශේෂ දිනයන්, විශේෂ සිද්ධීන් අරමුණු කර පිංවත් ඔබ වෙනුවෙන්
තබන ලද සටහනක් මෙතැන් සිට කොටස් කිහිපයකින්
යුතුව ඔබට පිරිනැමේ.

(මේ ලිපිමාලාව ඔබට පුදන පිංවත් ස්වාමීන් වහන්සේ විසින්, ජීවිත යථාර්ථය දෙස සවිඥානිකව බලමින්, නව වසරකට ප්‍රවේශයක් ලැබීම පිණිස 2015 වසර අවසානයේ දී පිංවත් ඔබ වෙනුවෙන් තබන ලද සටහනක් මෙතැන් සිට කොටස් කිහිපයකින් යුතුව ඔබට පිරිනැමේ.)

තමන්ගේ ආයු කාලයෙන් තවත් වසරක් ගෙවී යනවා නේ ද? එසේනම්....

(නව වසරට ප්‍රවේශයක් - 1)

2015 පරණ වසරට සමුදෙන්න, 2016 නව වසර පිළිගන්න තව දවස් කීපයයි තිබෙන්නේ. උදාවෙන නව වසරේ දී මනුෂ්‍ය සමාජය ඉදිරියේ ඇති ප්‍රධාන ම අභියෝගය බවට පත්වන්නේ මනුෂ්‍යයා වේගයෙන් රෝගීභාවයන්ට ගොදුරුවීමත්, මනුෂ්‍යයාගේ පරමායුෂ වේගයෙන් හීනවීයාමත් කියන කාරණාවන් දෙකයි. උදාවෙන නව වසරේ දී ධර්මානුකූල ප්‍රවේශයක් තුළින් ඉහත අභියෝග දෙක යම් පමණකට හෝ ජයගැනීමට මාර්ගයයි, මේ සටහන තුළින් භික්ෂුව කියන්නට උත්සාහ ගන්නේ.

මේ මොහොතේ මනුෂ්‍යයාගේ පරමායුෂ අවුරුදු හැත්තෑවක් පමණ වෙනවා. කල්ප දසදහස් ගණනකට පස්සේ අල්ප ආයුෂ සහිත මනුෂ්‍ය සමාජයක් බිහිවෙලා තිබෙන්නේ අතීත අකුසල් සංස්කාරයන්ගේ විපාකයක් නිසා ම යි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ 80 වැනි වියේ දී පිරිනිවී යනවා. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ 120 වැනි වියේ දී පිරිනිවී යනවා. මේ ගෞතම සම්මා සම්බුද්ධ ශාසනයේ අපි සියලුදෙනා ම අවුරුදු 120කට අඩු ආයුෂයක උරුමය ලබන්නේ දීර්ඝායුෂයට අදාළ කුසල් සංස්කාරයන්ගේ දුර්වලතාවය නිසා ම යි. අතීතයේ පැවති කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ දී මනුෂ්‍යයාගේ පරමායුෂ අවුරුදු විසිදාහක්. කකුසඳ, කෝණාගම බුදුරජාණන් වහන්සේලාගේ ශාසනවල මනුෂ්‍යයන්ගේ පරමායුෂ අවුරුදු තිස්දාහක්. පටිච්ච සමුප්පන්නව ඔබත් මමත් අතීත සම්මා

සම්බුද්ධ ශාසනවල උපත ලබා, ඒ සා දීර්ඝ පරමායුෂ අත්විඳලා තිබෙනවා. සත්ව හිංසාවෙන් වැළකිලා, සත්ව ඝාතනයෙන් වැළකිලා, මිච්ඡා ආජීවයෙන් වැළකිලා අලෝභ, අද්වේෂ, අමෝහ කුසල් මූලයන්ගේ ශක්තිය නිසා ම යි, එවැනි දීර්ඝ පරමායුෂ මනුෂ්‍යයාට අතීතයේ ලැබුණේ.

පිංවත් ඔබ භික්ෂුවගෙන් ප්‍රශ්නයක් විමසන්න පුළුවන්, ගෞතම බුදුරජාණන් වහන්සේ අවුරුදු අසූවේ දී පිරිනිවී යන්නේ උන්වහන්සේ සතු ශීල පාරමිතාවේ, දාන පාරමිතාවේ ශක්තිය දුර්වල නිසා ද කියලා. බුදුරජාණන් වහන්සේ අවුරුදු අසූවේදී පිරිනිවී යන්නේ උන්වහන්සේ සතු ශීල පාරමිතාවේ, දාන පාරමිතාවේ දුර්වලතාවයක් නිසා නො ව, උන්වහන්සේ බෝධිසත්ව අවධියේ දී පිරූ ශීල පාරමිතාවේ, දාන පාරමිතාවේ ශක්තියට වඩා අල්පායුෂයන්ට අදාළ අකුසල් සංස්කාර, බෝධිසත්ව ජීවිතය තුළින් සිදු වී තිබෙනවා ය කියන කාරණයයි ධර්මානුකූලව අපිට දකින්න සිද්ධවෙන්නේ. කෙනෙකුගේ උපතත්, මරණයත් තීරණය කරන්නේ සංස්කාර විසින් ම යි.

බුදුරජාණන් වහන්සේ ආයු සංස්කාරය අතහැරීමට මොහොතකට පෙරාතුව ආනන්ද ස්වාමීන් වහන්සේ අමතා ප්‍රකාශ කරනවා, "ආනන්ද, සතර ඍද්ධිපාද ධර්මයන් යානාවක් සේ පුහුණුකොට ඇති බුදුරජාණන් වහන්සේට කල්පයක් ආයුෂ වැඩ සිටින්නට පුළුවන්"ය කියලා. මෙතන දී ආයුෂ කල්පයක් කියන්නේ එම කාලයේ පරමායුෂ වන අවුරුදු 120යි. නමුත් ආනන්ද ස්වාමීන් වහන්සේ මාරයාගේ ග්‍රහණයට ඒ මොහොතේ යට වී සිටි නිසා, "භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේ කල්පයක් ආයුෂ වැඩසිටීවා!" කියලා ඉල්ලීමක් නො කළ නිසා ම බුදුරජාණන් වහන්සේ අවුරුදු අසූවේදී පිරිනිවී යන මොහොතේදී පිංවත් ඔබට ප්‍රශ්නයක් මතුවෙන්න පුළුවන්, සියල්ල සිද්ධ වෙන්නේ සංස්කාරයන්ට අදාළ ව නම් අවුරුදු 120ක් වැඩසිටීමට හැකියාව තිබූ බුදුරජාණන් වහන්සේ අවුරුදු අසූවේදී පිරිනිවන් පෑවේ ඇයි ද කියලා. තව පිංවතෙක් ප්‍රශ්න කරන්න පුළුවන්, බුදුරජාණන්

වහන්සේට සංස්කාර දෙකක් ක්‍රියාත්මකව තිබුණාද කියලා. සිදුහත් කුමාරයා උපත ලබනවිට ම අවුරුදු 120ක පරමායුෂයක් සහිතවයි උපත ලබන්නේ. බුදුරජාණන් වහන්සේට අවුරුදු 120ක් වැඩසිටීමේ අවස්ථාව හොඳටෝ ම තිබුණා. නමුත් බුදුරජාණන් වහන්සේ එම සංස්කාරය නිෂේධකර දමනවා.

මේ ලෝකධාතුවේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේලාටත්, මහ රහතන් වහන්සේලාටත් පුළුවන්කම තිබෙනවා, තමන්ට අවශ්‍ය නම් තමන්ගේ පිරිනිවීම නියමිත කාලයට පෙරාතුව සිදුකරගන්න. මේ හැකියාව තිබෙන්නේ පංචඋපාදානස්කන්ධය අනිත්‍ය වශයෙන් දැක්ක උත්තමයන්ට ම පමණයි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේට අතීත සංස්කාරවලට අදාළව අවුරුදු 120ක් වැඩ සිටින්නට හැකියාව ලැබී තිබුණත් උන්වහන්සේ අවුරුදු 80 වයසේ දී තීරණය කරනවා දැන් බුදුරජාණන් වහන්සේ වැඩසිටියා ඇති ය කියලා. බුදුරජාණන් වහන්සේලා මෙවැනි තීරණයක් ගන්න මූලික ම හේතුව වෙන්නේ භික්‍ෂු, භික්‍ෂුණී, උපාසක, උපාසිකා සිව්වනක් පිරිස ධර්ම විනයෙන් පිරිහීමත්, තෙරුවන්ට අකීකරුවීමත් කියන කාරණාවන් නිසා ම ය.

බුදුරජාණන් වහන්සේ නමක් වේවා, රහතන් වහන්සේ නමක් වේවා තමන් තීරණය කළොත් නියමිත කාලයට පෙර පිරිනිවන් පානවා කියලා, උන්වහන්සේලා අතීතයේ විපාක නො දුන් බලවත් අකුසලයක් ජීවිතය ඉදිරියට මතුකරගෙන, එම අකුසලයට නිදහසේ ක්‍රියාත්මක වීමට ඉඩකඩ විවර කර එම අකුසල් විපාකය තුළින් පිරිනිවීම සකස්කර ගන්නවා. එම අකුසල් විපාකයෙන් මිදීමට උත්සාහ ගන්නේ නැහැ.

බුදුරජාණන් වහන්සේ චුන්දකර්මාර නමැති රන්කරුවාගේ නිවසේ දානයට වැඩමකර අපත්‍ය ආහාරයක් වැළඳීම නිසා උන්වහන්සේගේ උදරාබාධය උග්‍ර අතට හැරුණත් උන්වහන්සේ ඒ උදරාබාධයට කිසිදු ප්‍රතිකාරයක් නො කළේ මරණීය විපාකයන් කරා එම අකුසලය මතුකර ගැනීම සඳහා යි. බුදුරජාණන්

වහන්සේට අවශ්‍ය නම් තිබුණා, චුන්දකර්මාරගේ දානේ ගෙදර දී අප්‍රත්‍ය ආහාරයක් වළඳන්නේ නැතිව සිටින්න. දානේ ගෙදරට වැඩිය අනෙක් සියලුම ස්වාමීන් වහන්සේලාට එම අපත්‍ය ආහාරය වළඳන්න එපා ය කියලා, බුදුරජාණන් වහන්සේ එම ආහාරය අපත්‍ය බව දනගෙන ම වැළඳුවා. බුදුරජාණන් වහන්සේට අවශ්‍ය නම් තිබුණා, වැළඳුණ උදරාබාධයට ප්‍රතිකාර ලබාගන්න. මෙම උදරාබාධය මීට පෙර වැළඳුණ මොහොතේ උන්වහන්සේ අධිෂ්ඨාන ශක්තියෙන් තමයි, රෝගය යටපත් කරගෙන සිටියේ. එසේ නැතිව ඖෂධවලින් නො වේ. මොකද, උන්වහන්සේ මේ වන විට තීරණය කර තිබුණා, දැන් උන්වහන්සේ වැඩසිටියා ඇතිය කියලා.

ඒ වන විට භාග්‍යවතුන් වහන්සේ සතුටු නො වන ආකාරයෙන් ශාසන අර්ථයන් දුර්වල වන දිශාවටයි ගමන් කරමින් තිබුණේ. උන්වහන්සේ දැක්කා, මේ උදරාබාධය අකුසල් විපාකයක්. එම අකුසල් විපාකය නිදහසේ පිරිනිවීම වෙනුවෙන් උන්වහන්සේ යොමුකර ගත්තා. අතීත අකුසලයන් උවමනාවෙන්ම මතුකරගෙන, එම අකුසල් විපාකයෙන් ශාරීරික ආබාධයන් මතු වී පැමිණෙන විට එම ආබාධයන්ට ප්‍රතිකාර නො කර ස්වයං පිරිනිවීමකට එම අකුසලය යොමුකර ගන්නවා.

පිංවත් ඔබ ඉහත සටහන නුවණින් දකින්න, අකුසලයත් ආයුෂයත් අතර මොන තරම් සම්බන්ධයක් තිබෙනවා ද කියලා. කල්ප දසදහස් ගණනකට පස්සේ ඔබත් මමත් අවුරුදු 70 වැනි අල්පායුෂයක් සහිත උපතක් ලැබුවේ අතීත දීර්ඝායුෂයන්ට අදාළව සංස්කාරයන්ගේ අඩුභාවය නිසා ම ය. ඔබ වර්තමානයේ අත්විඳින මේ අල්ප ආයුෂ සහිත මනුෂ්‍ය ජීවිතයේ ඉදිරියේ තිබෙන අනතුර මෙතැනින් නවතින අනතුරක් නො වේ. මනුෂ්‍යයා දිනෙන් දින ශීලයෙන් දුර්වල වනවිට, මිච්ඡා ආජීවය වැඩි වනවිට ක්‍රමානුකූලව තවතවත් ආයුෂ හීනභාවයට පත් වී අනාගතයේ වැඩි ඈතකට නො යාම මනුෂ්‍යයාගේ පරමායුෂ අවුරුදු දහයක් වෙනවා ම ය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

ලබන්නා වූ නව වසරේ දී රෝගීභාවය සහ අල්ප ආයුෂයි මනුෂ්‍ය ජීවිතය ඉදිරියේ තිබෙන බරපතළ ම අනතුර බවට පත්වෙන්නේ. මේ කෙටි ආයුකාලය තුළ මනුෂ්‍යයා තම ජීවිතය බරපතළ සිල්පද බිඳීම් සහ අකුසල් මූලයන් කරා යොමුකර ගනිමින් මෙම කෙටි ආයුෂ කාලය දීර්ඝ අනාගත භවදුකකට යොමුකර ගැනීමයි. වර්තමාන සමාජය දෙස බැලීමේ දී පිංවත් ඔබට හොඳින් ම පෙනෙනවා, මනුෂ්‍ය සමාජය, අනිත්‍ය වූ, තමන් වසඟයේ තබාගැනීමට නොහැකි ධනයක්, බලයක්, වත්පොහොසත්කමක් අයිතිකර ගන්න බලවත් ව සිල්පද බිඳීම යන අකුසල මූලයන් කරා යනවාය කියන කාරණය.

පිංවත්, සද්ධර්මයට කැමති ඔබ, ලබන්නා වූ නව වසරේ දී වැඩි අවධානයක් යොමු කළ යුත්තේ, "තමන්ට ලැබෙන ආයුෂ කාලයෙන් තවත් වසරක් ගෙවී ගියා. ඉතිරිව ඇති කෙටි ආයුෂය තුළ මම කෙසේ ද කුසල් වැඩෙන පිංකම් කරමින් අඩු ආයුෂ අනතුරෙන් මිදී, දීර්ඝ ආයුෂ ලබන, සතර අපා අනතුරෙන් මිදුණ දෙවියෙක්, දිව්‍යාංගනාවක් වෙන්නේ?" කියන කාරණය ධර්මානුකූලව මතුකර දකින්නට. වර්තමාන සමාජය තුළ අතීත දානයන්ට අදාළව සැපය විපාක දීමේ උච්ච ස්වභාවයකුත්, ශීලයට අයත් සත්ව ඝාතනය, සත්ව හිංසාවන්, මිච්ඡා ආජීවයන් සහ සම්මා සංකප්පයන්ගේ දුර්වලතාවන් හේතුවෙන් විපාකයට පැමිණෙන රෝගීභාවය සහ අල්ප ආයුෂ කියන කාරණා දෙක ම එකට බද්ධ වී දෙයාකාරයකින් ක්‍රියාත්මක වන බවත් පෙනෙනවා. අතීත සිල්පද බිඳීම නිසා අඩු ආයුෂත්, අතීත දානයන්ගේ ආනිශංස හේතුවෙන් අඩු ආයුෂය තුළ සැප ලැබීමත් කියන කාරණා දෙකම ක්‍රියාත්මක වෙනවා.

පින නිසා ලැබුණු දේ පවට නම් බිලි නො දෙමු

(නව වසරට ප්‍රවේශයක් - 2)

මේ මොහොතේ ජාති, ආගම් භේදයකින් තොරව මනුෂ්‍යයා අත්විඳින විසිතුරු දෑ, ප්‍රණීත දෑ, සුඛෝපභෝගී නිවාස, සුඛෝපභෝගී යානවාහන, නේක විධ ආහාරපාන, නොයෙකුත් විලාසිතාවන්ගේ සිරුරට සුවපහසු ඇඳුම්, පැළඳුම්.... මේ මනුෂ්‍යයාට ලැබී තිබෙන විසිතුරු ප්‍රණීතභාවය කියන්නේ මනුෂ්‍යයාගේ අතීත භවයන්හි දානයේ සංස්කාරයන්ගේ ඵලය යි.

අපි පුංචි කාලයේ වෙළඳසැලකට ගියොත් එම වෙළඳසැලේ විකිණීමට තිබුණේ, එක බෝතලයක බුල්ටෝ ද තව බෝතලයක නාරංබික්, තව බෝතලයක විස්කිරිඤ්ඤා, තව බෝතලයක කළු සුරුට්ටු, පෙට්ටි සුරුට්ටු ආදිය යි. ඔයිට වඩා දෙයක් අතීතයේ වෙළඳසැලක මුදල් කවුළුවක් මත තිබුණේ නැහැ. අතීතයේ ඇඳුමක් ගන්න වෙළඳසැලකට ගියොත් එහි තිබුණේ කාකි රෙදිවලින්, චීත්ත රෙදිවලින්, පිජාමා රෙදිවලින් මැසූ ඇඳුම්-පැළඳුම් පමණයි. අවුරුද්දට එක වතාවයි, දෙමාපියන්ගෙන් ඇඳුම් කට්ටලයක් ලැබුණේ. එයත් සරල ඇඳුමක්. නමුත් වර්තමාන සමාජයේ දරුවන්ගේත්, වැඩිහිටියන්ගේත් රස විඳීමේ ශක්තියත්, ලැබීමේ ශක්තියත් ඊට වඩා හාත්පසින් ම වෙනස්. වෙළඳපොළකට ගියොත් දරුවෙකුට, වැඩිහිටියෙකුට "කුමක්ද මිලදීගන්නේ?" කියන ප්‍රශ්නය මතුවෙනවා. විවිධත්වය, රසය, සුඛෝපභෝගී භාවය, විසිතුරු බව, එකිනෙකට වෙනස් සුඛෝපභෝගී නිවාස රටාව, සුඛෝපභෝගී යානවාහන, අධිපහසුකම් සහිත වෛද්‍ය

සේවය, තාක්ෂණික උපකරණයන්ගේ දියුණුව.... මේ සියලු සැපයට අදාළ සම්පත් මනුෂ්‍ය සමාජයට ලැබෙන්නේ, පෙර ජීවිතවල දානයන්ට අදාළ සංස්කාරයන්ගේ උත්කෘෂ්ටභාවය නිසා ම යි. යම් සිල්වත් භික්ෂුවක් මේ මොහොතේ දේශනාකරන ධර්මයන් සශ්‍රීක දිව්‍යතලයක වැඩසිටින දෙවියෙක් දිව්‍යශ්‍රෝතවලින් අසන්නේ එම දෙවියන්ගේ පින නිසා. භික්ෂුව මේ මොහොතේ ලියන මෙම සටහන, පිංවත් ඔබ කියවන මේ සටහන මේ මොහොතේ ම ඈත දුරැරටක ජීවත්වන බෞද්ධ පිංවතෙක් බොත්තමක් ඔබලා අන්තර්ජාලයෙන් කියවන්නේ පින නිසා ම යි.

මනුෂ්‍ය සමාජය තුළ වර්තමානයේ මතු වී පැමිණෙන තාක්ෂණයට අදාළ, සැපයට අදාළ, රසයට අදාළ සියලු ම ධර්මතාවයන්, මනුෂ්‍යයාගේ ම පෙර ජීවිතවල දානයන්ගේ ඵලය යි. නමුත් එම දානයේ ඵලය මනුෂ්‍ය සමාජයට සැප විපාකයන්ව පැමිණෙන්නේ අතීත ශීලයේ දුර්වලභාවයන්ට අදාළ අකුසල් සංස්කාරයන්ගේ විපාකයන් සමඟ මුසුවෙලයි. ඒ නිසයි, දිවට රසය ලැබුණත්, ශරීරයට සැපය ලැබුණත්, මනසට මිහිර ලැබුණත්, ජීවිතයට අඩු ආයුෂ ලැබී ඇත්තේ. අපි සියලුදෙනාම පෙර ජීවිතයන්හි දී විසිතුරු ආකාරයට දන් පූජා කළාට, සත්ව ඝාතනයට, සත්ව හිංසාවට, මිච්ඡා ආජීවයන්ට, මිච්ඡා සංකප්පයන්ට අදාළ අකුසල් සිදුකරගෙන තිබෙනවා. මේවා දුර්වල කරගෙනයි, පිංවත් ඔබ දන් පූජා කරගෙන තිබෙන්නේ.

මෙන්න මේ ධර්මානුකූල නිවැරදි ප්‍රවේශය ඔබගේ ජීවිතය තුළින් මතුකර දැකීමට පිංවත් ඔබට මේ ලබන්නා වූ නව වසරේදී පුළුවන්කම ලැබුණොත්, එය අඩු ආයුෂ අනතුරෙන් මිදීමට ඔබට ගොඩාක් උපකාරී වෙනවා. මෙම අනතුර අඳුනාගැනීමට අදක්ෂ පිංවතා තම ජීවිතවලට අතීත දානයන්ගේ ඵලය වශයෙන් ලබාදෙන සැපය, රසය, මිහිර විඳින්නට පරමායුෂය තව තව අඩුකර ගැනීමට අවශ්‍ය ප්‍රධාන ම සාධක වන ලෝභ, ද්වේෂ, මෝහ ධර්මයන් වර්ධනය කරගන්නවා. දානයේ ආනිශංස හේතුවෙන් ජනතාවට සැප, රස, මිහිර ලැබෙන විට, ඒවා භුක්ති විඳීමේදී,

ඒවා අයිතිකර ගැනීමට යාමේ දී රැස්වෙන අකුසල මූලයන් නිසා ඔබ තබන සෑම පියවරක දී ම ඔබගේ ආයුෂය හීනකර ගැනීමේ ක්‍රියාන්විතයකට ඔබ හවුල්වෙනවා. මේ ක්‍රියාන්විතය තමයි පියවරෙන් පියවර මනුෂ්‍යයාගේ පරමායුෂ අවුරුදු 10යි කියන තැනට අරගෙන යන්නේ.

පිංවත් මහත්මයෙක් භික්ෂුවගෙන් ප්‍රශ්නයක් ඇසුවා "ස්වාමීන් වහන්ස, නවීන තාක්ෂණයේ දියුණුව කොහොමද පිනේ ඵලයක් වෙන්නේ?" කියලා. නවීන තාක්ෂණය හේතුවෙන් වෛද්‍ය ක්ෂේත්‍රයට සහ අනෙකුත් අත්‍යවශ්‍ය ක්ෂේත්‍රවලට පැමිණෙන නවීන තාක්ෂණික උපකරණ කියන්නේ, මනුෂ්‍යයාගේ දැනීමේ ඵලය යි. මේ ඕනෑම තාක්ෂණික උපකරණයක් සොයාගන්නේ, නිෂ්පාදනය කරන්නේ මනුෂ්‍යයාගේ දැනුම තුළින්. මනුෂ්‍යයාගේ දැනුම කියන්නේ ධර්මානුකූලව අතීත කුසල් සංස්කාරයන්ගේ ඵලයක්. යම් පිංවතෙක් නූගත්භාවයට පත්වන්නේ, අතීත අකුසල් සංස්කාරයන්ගේ ඵලයක් නිසා. එහෙමනම් නවීන තාක්ෂණය කියන්නේ මනුෂ්‍යයාගේ දැනුමේ ඵලයක්. දැනුම කියන්නේ අතීත කුසල් සංස්කාරයන්ගේ, පිනේ ඵලයක්.

මනුෂ්‍යයාගේ අතීත පින නිසා ම ලැබෙන නවීන තාක්ෂණය හේතුවෙන් ඔබට ලැබෙන කාලයේ ඉතිරිය, නැතිනම් විවේකය, පිංවත් ඔබ පෙරළා උපයෝගි කරගන්නේ නැවත අකුසල මූලයන් වර්ධනය කරගැනීමට යි. ඒ කියන්නේ පින ගින්දරක් බවට පත්කර ගන්නවා.

එක පිංවත් මහත්මයෙක් සිටිනවා, ඔහු සිල්පද බිඳින, අනුනට හිරිහැර කරන, මිච්ඡා ආජීවයෙන් ජීවත්වන අයෙක්. ඔහු බරපතළ හදිසි අනතුරකට ලක්ව මරණාසන්න වෙනවා. නමුත් මනුෂ්‍යයාගේ පින නිසා ම මතුවී තිබෙන නවීන වෛද්‍ය පහසුකම් හේතුවෙන් එම මහත්මයා මරණයෙන් බේරෙනවා. ඔහු මරණෙන් බේරෙන්නෙත් ජීවත්වීමට අදාළව තිබුණා වූ අතීත කුසල් ශක්තියක් නිසා. පෙර පින නිසා ඇතිවූ තාක්ෂණයෙන්

ඔහු ජීවිතය බේරාගත්තත්, එලෙස බේරාගත් තම ජීවිතය නැවත යොමු කරන්නෙත් මිච්ඡා ආජීවයට ම යි; ශිල්පද බිඳීම දෙසටමයි. බලන්න, පින ගින්දරක් බවට පත්කර ගන්නවා. පින වැරදි ආකාරයෙන් කළමනාකරණය කරන නිසා ම අනාගතයේ අඩු ආයුෂයට අදාළ සංස්කාර නැවත රැස්කර ගන්නවා. එම නිසා ලබන්නා වූ නව වසරේ දී පිංවත් ඔබ දක්ෂවෙන්න, නවීන වෛද්‍ය තාක්ෂණයේ විශේෂඥ දැනුම හේතුවෙන් මරණයෙන්, රෝගීභාවයෙන් බේරුණ ඔබේ ජීවිතය, ඔබව මරණයෙන් බේරාදීමට උපකාරී වූ පින උදෙසා ම, කුසලය උදෙසා ම යොමුකරගන්න.

වර්තමානයේ රටේ නවීන තාක්ෂණික ක්‍රමවේදයන්ගෙන් බිහිවුණ අධිවේගී මාර්ග තිබෙනවා. මේ අධිවේගී මාර්ග පහසුකම් බිහිවෙන්නේ ජනතාවගේ පිනේ ශක්තිය නිසා. සමහර ගම්මානවල පාරවල් තිබෙනවා, මඩවගුරු වගේ. ඒවා එම ජනතාවගේ අකුසල් විපාකයන්. ජනතාවගේ පින නිසා ම යි අධිවේගී මාර්ග බිහිවෙන්නේ. එම අධිවේගී මාර්ගවල ගමන්කිරීම නිසා ජනතාවට ලැබෙන කාලයේ ඉතිරිය, විවේකය ජනතාව නැවත යොමුකරන්නේ අකුසල මූලයන් වර්ධනය උදෙසා යි. මොන පිංවතා ද, අධිවේගී මාර්ගයේ මාතරට ගිහිල්ලා, ලැබුණ පැය දෙකේ ඉතිරිය කුසල් ධර්ම වැඩීමට යොමුකරන්නේ? ඒ කාලයේ ඉතිරියත් යොදාගන්නේ තව අකුසල් මූලයන් රැස්කර, තව තව ආයුෂ හීනකර ගන්නා දිශාවට ම යි. බලන්න, දානමය පින විපාකයට පැමිණෙන විට අකුසල් වැඩිකර ගනිමින් පින ගින්දරක් බවට පත්කර ගන්නවා. එම නිසා පිංවත් ඔබ දක්ෂවෙන්න, පින නිසා ම ලැබුණ නවීන තාක්ෂණික උපකරණ සහ ක්‍රමවේදයන් තුළින් ඔබ ලබන්නා වූ කාලයේ ඉතිරිය පංචනීවරණ වැඩෙන, කාමච්ඡන්දය වැඩෙන දිශාවට නො ව, කුසල් ධර්මයන් වැඩෙන පිංකම් දිශාවට ම ලබන්නා වූ නව වසරේ දී යොමුකරගන්න.

වර්තමානයේ පිංවතුන්ලාට බොහෝ ම ලස්සන, විසිතුරු, වර්ණවත් ශරීර අලංකාරයක් ලැබිලා තිබෙනවා. එකිනෙකට වෙනස් මෝස්තරවලින් ඇඳුම්-පැළඳුම්, ස්වර්ණාභරණ, සුවඳවිලවුන්, පාවහන්.... බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, කැමති කැමති දෙය පූජා කරන්නාට කැමති කැමති දෙය ලැබෙනවාය කියලා; විසිතුරු දෙය පූජා කරන්නාට විසිතුරු විසිතුරු දෙය ලැබෙනවා ය කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "ආනන්ද, මම කුමාර කාලයේ යම් සළුවක් පෙරෙව්වා නම්, යම් ඇතිරිල්ලක් පරිහරණය කළා නම්, ඒ සඳුන් සුවඳ ගැල්වූ සුසිනිඳු සළුවක් ම යි; ඇතිරිල්ලක් ම යි. මම ශරීරය ධෝවනය කළා නම්, ඒ සුවඳ සඳුන් ගැල්වූ ජලයෙන් ම යි කියලා. මේවා පෙර දාන පාරමිතාවන්ගේ විපාකයන් ම යි. වර්තමාන සමාජය ඇඳුමෙන්, පැළඳුමෙන්, ශරීර අලංකරණයෙන් මේ ලබන විසිතුරුභාවය, ප්‍රසන්නභාවය කුමක ඵලයක් ද? අතීතයේ විසිතුරු දෙය පූජා කිරීමේ හෙවත් දානයේ ඵලයක් ම යි. එහෙම නැතිව ජේ. ආර්. ජයවර්ධන මහත්මයා මේ රටට නිදහස් ආර්ථිකය ගෙන ඒමේ ඵලයක් නම් නො වෙයි. අද මේ මනුෂ්‍යයන් ලබන විවෘත සැපය ධර්මානුකූල හේතුවක්. නමුත් වර්තමාන සමාජය, පෙර පින නිසා ලැබුණ මේ විසිතුරුභාවය, ඇඳුම්-පැළඳුම්, ආභරණ, සුවඳ විලවුන් ආදිය ප්‍රයෝජනයට ගන්නේ බලවත් ආකාරයට අකුසල් මූලයන් වැඩෙන ආකාරයෙන් ම යි.

තමන්ට නොගැළපෙන, ශීලාචාරකමට නොගැළපෙන ඇඳුමෙන්, පැළඳුමෙන් වර්තමාන සමාජය උඩුදුවලා තිබෙනවා. බුදුරජාණන් වහන්සේ ගිහි පිංවතුන්ලාට ඇඳුම්-පැළඳුම් සඳහාත් ප්‍රත්‍යවේක්ෂාව දේශනා කර තිබෙනවා. පිංවත් ඔබ ඇඳුමක් ඇඳිය යුත්තේ සිය ශරීරයේ අලංකාරය, මදය, හැඩය, වර්ණය ලෝකයාට පෙන්වන්න නො වේ; තමන් තුළවත්, අනුන් තුළවත් කාමච්ඡන්දයන් ඇතිකිරීමට නො වේ. "මා මේ ඇඳුම අඳින්නේ අව් වැසි පිනි වලින්, මැසි මදුරුවන්ගෙන් ආරක්ෂා වී, ශරීරයේ ලැජ්ජාභය ඇති තැන් වසාගැනීම සඳහා යි" කියලා. නමුත් ඇඳුමක් තුළින් ලැබිය යුතු මේ ධර්මානුකූල අර්ථය, වර්තමාන සමාජයෙන් අනතුරක් දෙසට ගමන් කරනවා. සමහරක් පිංවතුන්

ඇඳුමක් අඳින්නේ ශරීරයේ හැඩය, වර්ණය බාහිර සමාජයට උළුප්පා පෙන්වන ආකාරයට ම යි. මෙවැනි නොගැළපෙන ඇඳුම් ඇඳගෙන මහපාරේ යන පිංවතුන්ලා ධර්මානුකූලව නම් හඳුන්වන්න වෙන්නේ 'ඇවිදින අකුසල් සාප්පු' වශයෙනුයි. මේ අය නොදැනුවත්භාවය නිසා ම, සමාජයට අකුසලය 'නොමිලේම' විකුණනවා. මේ ගැන ධර්මානුකූලව අර්ථ දැක්වුවොත්, 'සැඟවිය යුතු දේවල් සැඟෙව්වේ නැතිනම්, නො සැඟවිය යුතු දේවල් සැඟවී යනවා ය යන්නයි. වර්තමාන සමාජයේ සමහරක් පිංවතුන්ලා තුළින් සැඟවිය යුතු, ලැජ්ජාව-භය ඇති තැන් ක්‍රමානුකූලව ප්‍රදර්ශනය වෙන විට, නො සැඟවිය යුතු දේවල් වන ශීලාචාරකම, ලැජ්ජාව-බිය, නැතිනම් හිරිඔතප් සමාජයෙන් සැඟවී යනවා. වර්තමාන සමාජය ක්‍රමානුකූලව මේ අනතුර කරා ගමන් කරනවා.

අලුත් අවුරුද්දෙත් ඔබ පරණ චරිතය ම ද?

(නව වසරට ප්‍රවේශයක් - 3)

නව වසරක් ලබන වෙලාවේ පිංවත් ඔබ, මෝහය කියන කාරණය පිළිබඳවත් සැලකිල්ලක් යොමු කරන්න ඕනේ. මෝහය කියන්නේ සම්මා දිට්ඨියේ අර්ථයන්ගෙන් බැහැරවීම යි. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවේ ඇති දුර්වලතාවයන් නිසා ම, උදාවන සෑම වසරක දී ම, ගෙවුණු වසරට වඩා අන්‍යශීලව්‍රතයන්, ජ්‍යොතිෂ යන්ත්‍ර-මන්ත්‍ර, ගුරුකම්, කොඩිවින ආදිය ජනතාව විසින් වැළඳගැනීමේ ප්‍රවණතාවක් සමාජය තුළ තිබෙනවා.

නව වසර කියන්නේ පිංවත් ඔබට නිවැරදි වීමට ලැබෙන අලුත් අවස්ථාවක්. නව වසරක උදාවකින් නිවැරදි වීමට ලැබෙන අවස්ථාවෙන් පිංවත් ඔබ ප්‍රයෝජනයක් නො ගෙන, පරණ අවුරුද්දේ වැරදි පුරුදු ම ජීවිතයට එකතුකොට ගන්නවා නම්, අවුරුද්ද අලුත් වුවත් පිංවත් ඔබ පැරණි පුද්ගලයා ම වෙනවා.

භික්ෂුව වැඩසිටින පළාතේ ගුරුකම් මහත්මයෙක් සිටිනවා. ඔහුගේ දේවාලයට සහනයක් පතා පැමිණෙන සෑම පුද්ගලයෙක්ගේ ම ඔහු අතින් අල්ලනවා. පැමිණෙන සේවාදායකයාගේ ශරීරයේ යම් දෝෂයක් තිබෙනවා නම්, ගුරුකම් මහත්මයා අතින් අල්ලන කෙනාව වෙව්ලනවා; වැටෙනවා. දෝෂයක් නැතිනම් වෙව්ලන්නේ, වැටෙන්නේ නැති ලු. මෙම ගුරුකම් මහත්මයාගේ දේවාලයට ගිහින් පැමිණි ගමේ මහත්මයෙක්, උදේ පිණ්ඩපාත මඩුවේ දී අසනවා, “ස්වාමීන් වහන්ස, එහෙම වෙන්නේ කොහොම ද?” කියලා.

හේතූන් කිහිපයක් නිසා ම ගුරුකම් මහත්මයා අතින් අල්ලනකොට යම් පුද්ගලයෙක් වෙව්ලන්න, වැටෙන්න පුළුවන්. ගුරුකම් මහත්මයා ශ්‍රද්ධාවෙන්, ශීලයෙන්, කුසල මූලයන්ගෙන් දුර්වල, අන්‍යශීලව්‍රත වඩන කෙනෙක් නිසා, ඔහුගේ ශරීරයට එවැනි ම අමනුෂ්‍යයෙක්ගේ බලපෑම හේතුවෙන් වගේ ම, ඔහුගේ සේවාදායක ආතුරයා ද අකුසල් මූලයන්ගෙන් කිළිටි අයෙක් නිසා මෙවැනි දෙයක් වෙන්න පුළුවන්. දෙවැනි කාරණය, යම් පුද්ගලයෙක් මා තුළ අමනුෂ්‍ය දෝෂයක් තිබෙනවා ය කියන කාරණය නිතර නිතර සිතීම නිසාත්, කට්ටඩි මහත්මයා තමන්ගේ අතින් අල්ලන විට එකී මානසික තත්ත්වය මත වෙව්ලන්න, වැටෙන්න පුළුවන්. තුන්වැනි කාරණය, සාම්ප්‍රදායික නිල වෙදකම කියලා ප්‍රතිකාර ක්‍රමයක් තිබෙනවා. දේවාලයේ කපුමහත්මයා වංචාකාරී ලෙස තමන් ඉදිරියට පැමිණෙන සේවාදායකයාගේ අතේ නිලයක් අල්ලා වෙව්ලන්නට හැර මනුෂ්‍යයෙක්ව වට්ටවන්නත් පුළුවන්. නමුත් මේ තුන් ආකාරයෙන් කොයි ආකාරයට එය සිදුවුවත් එය අයිති වෙන්නේ මෝහයට යි; අකුසල් මූලයන්ට යි. එකතු කරගන්නේ අමූලිකා ශ්‍රද්ධාවට අයත් ධර්මතාවයන් ම යි. අලුත් අවුරුද්දක් ලැබුවත්, කට්ටඩි මහත්තයාගේ දේවාලයේ පෝලිම තව තව වැඩිවෙන බව නම් භික්ෂුවට විශ්වාසයි.

පිංවත් ඔබ අවුරුද්ද අලුත් වෙද්දී, පරණ වැරදි, අසද්ධාවේ පුරුදු ජීවිතයෙන් ඉවත් කොටගෙන අලුත් අවුරුද්දේ දසකුසල් ධර්මයන් සහිත නැවුම් භාවයෙන් යුත් අලුත් ජීවිතයක් පටන් ගන්න දක්ෂ වෙන්න. එසේ නොවුණහොත් අලුත් අවුරුද්ද අලුත් වුවද පිංවත් ඔබ පරණ ම ය.

මෝහය නිසා ම, සමහරක් පිංවතුන් අලුත් අවුරුද්දක් ලැබුවත් ජීවිතයට එකතු කොටගන්නා පරණ පුරුද්දක් තමයි, මත්වතුර කියන කාරණය. ධර්මයේ සැබෑ සැපය වන ප්‍රීතිය, පස්සද්ධිය ප්‍රතික්ෂේප කොට, සමාජය කැමැත්තෙන් ම ජීවිතයට එකතු කොටගන්නා මත්වීම අයිතිවන්නේ මෝහයට, මෝඩකමට, හීනමානයට, දුශ්ශීලභාවයට, රෝගීභාවයට, අපකීර්තියට,

අසමගියට යි. බලන්න, එක මත්වතුර වීදුරුවකින් ජීවිතයට මොන තරම් දේවල් එකතුකොට ගන්නවා ද කියලා. මත්වතුර වීදුරුවක ඔච්චර දේවල් මුහුවෙලා තිබෙනවා නම්, මත්වතුර කෙරෙහි මොන තරම් පිළිකුලකින් ද ඔබ බලන්න ඕනේ.

අසත්පුරුෂ, මත්වතුර දන්දෙන්නාට මිල අධික මත්වතුර පෙරළා ලැබෙනවා. එය ධර්මතාවයක්. පිංවත් ඔබ, සමාජයේ දැක ඇති මහා සංසරත්නයට දන් පූජා කරන්න අකමැති පිංවතුන්ලා සමාජයේ අසත්පුරුෂ මිතුරන්ට අතදිගහැර වියදම්කොට මත්වතුර සාද පවත්වනවා. යාළුවන්ට මත්වතුර බොන්න දෙන්නට, තමන් බොන්නට වියදම් කරන්නට කිසි ම ලෝභකමක් නැහැ. හැබැයි ගෙදර නෝනාට, දරුවන්ට හොඳින් සලකනවා. මෙවැනි මහත්වරු මැරෙන වෙලාවේ අවසාන චුති සිතට, කළා වූ පිං සිතුවිල්ලක් ඇතිවුණොත් නැවත මනුෂ්‍යයෙක් වෙලා උපදිනවා. ඉපදිලා පෙර ජීවිතයේ මත්වතුර දානයක් නිසා තරුණ කාලයේ ම ඉස්තරම් වර්ගයේ මත්වතුර ලැබීමට අවස්ථාව ලබනවා. භික්ෂුව පොඩිකාලයේ වෙළඳපොළේ තිබුණේ ගල් අරක්කු, රා පමණයි. නමුත් මොකක්ද මේ වර්තමානයේ මතුවී පැමිණෙන මිල අධික මත්වතුර සංස්කෘතිය? අතීත මත්වතුර දන්දීමේ ආනිශංසය යි.

කුමන රජයක් ඇවිත්, මතට නැවතීම තබන්නට උත්සාහ කළත්, මත්වතුර විකුණන කඩ දිනෙන් දින විචිත්‍ර වන්නේ, ව්‍යාප්ත වෙන්නේ රා පොල්කට්ට, කසිප්පු වීදුරුව, ගල්-පොල් වීදුරුව දන්දීමේ, බෙදාගෙන බීමේ හේතුඵල ධර්මයන් නිසාමය; ඔබගේ උපන්දින සාදයේ දී, මංගල සාදයේ දී, මළගෙදර දී, තැබෑරුමේදී, ප්‍රියසාදයේ දී මත්වතුර දන්සැල් පැවැත්වීමේ හේතුඵල ධර්මයන් නිසා ම ය. අසත්පුරුෂ මත්වතුර දානයන්ගේ ඵලයෙන් ලබන අසත්පුරුෂ ආනිශංසය වන්නේ මත්වතුරත්, බේබදුකමත්, රෝගීභාවයත්, සතර අපායත් පමණි. ලබන්නා වූ නව වසරේ දී පිංවත් ඔබට මේ වසරේ දී මත්වතුර බීම නවත්වනවා ය කියලා අධිෂ්ඨානයක් ඇතිකොට ගැනීමට බැරි නම්, කරුණාකර මම මේ වසරේ අනුනට මත්වතුර පොවන, අසත්පුරුෂ, මත්වතුර දෙන,

අසත්පුරුෂ මිත්‍රයෙක් වෙන්නේ නැහැය කියන අධිෂ්ඨානයටවත් එන්න දක්ෂවෙන්න.

එම අධිෂ්ඨානය, ලබන්නා වූ අලුත් අවුරුද්දේ දී මත්වතුර බොන ඔබේ අකුසල් මූලයන් දශමයක් හෝ අඩුවෙන්න හේතුවෙන්නට පුළුවන්. ඔබේ මළගෙදර වේවා, ඔබගේ මඟුල්ගෙදර වේවා, ඔබේ සාදයක දී වේවා, තැබෑරුමේ දී වේවා, ඔබේ නිවසේ දී වේවා ඔබ අසත්පුරුෂ මත්වතුර දානයන් අනුනට දෙන අයෙකු නම්, තමන් මත්වතුර බොන්නේ අනුනට මත්වතුර දානයක් දෙන අයෙක් නම්, ඔබ සතුටින්, විනෝදයෙන් හිතමිතුරන්ට අතදිග හැර මුදල් වියදම්කොට දෙන මත්වතුර දානයක් යනු ලෝකයේ අසත්පුරුෂ ම දානයක් බව ධර්මානුකූලව මතක්කොට සිටිනවා. අතීත අසත්පුරුෂ මත්වතුර දානයක් නිසා වයින් ස්ටෝර්ස් වෛවර්ණ භාවයෙන් පිරී ගියත්, ඒවා මිලදීගන්න, හේතුඵල ධර්මයන් නිසා ම අතීත අසත්පුරුෂ මත්වතුර දානයක් අනුනට ලබාදුන් පුද්ගලයන් ම පෝලිම් ගැසී සිටියත්, මත්වතුර යනු මෙලොව පරලොව දුකේ සැබෑ ම සංකේතයක් බව නව වසරේදී නුවණින් දකින්න දක්ෂවෙන්න.

ලබන්නා වූ අලුත් අවුරුද්දේ දී අසත්පුරුෂ මත්වතුර දානයන් දීම නවතා දමා, පැතිරයන නව මත්වතුර සංස්කෘතිය යම් පමණකින් හෝ සීමා කරගැනීමට දක්ෂවෙන්න. ඔබේ ජීවිතයට අදාළ සතුටුදායක මොහොතක එම සතුට අනුවණින් සමරන්නට ඔබත් අනුනට අසත්පුරුෂ මත්වතුර දානයන් පූජා කළත්, එම අසත්පුරුෂ මත්වතුර දානයේ ඵලයක් ලෙස, මීළඟ ජීවිතයේ ඔබ යම් හෙයකින් මනුෂ්‍යයෙක් වුවහොත් තරුණ කාලයේ දී ම මිල අධික, ඉස්තරම් මත්වතුර බොන බේබද්දෙක් වීමට හොඳටෝම ඉඩකඩ විවරව ඇත.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ප්‍රණීත දෙය දන්දෙන පිංවතා, ප්‍රණීත දෙය ම ඵලය වශයෙන් ලබනවා, නීරස දෙය දන්දෙන පිංවතා නීරස දෙය ම ඵලය වශයෙන් පෙරළා

ලබනවා ය කියලා. ඉහත ධර්මතාව තුළ යම් කෙනෙක් විෂ සහිත දෙය අනුනට දන් දෙනවා නම්, ඔහු පෙරළා විෂ සහිත දෙය ම ලබනවා. ලබන්නා වූ නව වසරේ දී පිංවත් ඔබ තේරුම් ගන්න, හන්දියක් ගානේ පිහිටා ඇති මත්වතුර තැබෑරුම්, හැඩවැඩ වෙමින්, විසිතුරු වෙමින්, මිල අධික මත්වතුර බිහිවෙමින් සමාජය තුළ ඇතිවෙන මේ මත්වතුර සංස්කෘතිය, සතුට බෙදාගැනීමේ නාමයෙන්, ලෝභකමින් තොරව, අසත්පුරුෂ මත්වතුර දානයන් අනුනට පිදීමේ හේතුඵල ධර්මයක් ය කියලා. ලබන්නා වූ නව වසරේ දී අසත්පුරුෂ වූ මත්වතුර, හිතවත්භාවය වෙනුවෙන් දන්දීම නවතා, මත්වතුර බීම උදෙසා, දන්දීම උදෙසා සකස්වෙන ඔබේ අනිත්‍යභාවයට පත්වන්නා වූ සිත ඔබ දන්දෙන්න. එය මෙලොව ශ්‍රේෂ්ඨ ම ධර්ම දානයක් වෙනු ඇත. පරණ පුරුදුවලින් මිදුණු අලුත් අවුරුද්දක් ඔබට, ඔබේ පවුලට, ඔබේ සෞඛ්‍යයට උදාවෙනු ඇත.

ආයු බෝ වන්න, නව වසරේ මේ ගැනත් සිතන්න

(නව වසරට ප්‍රවේශයක් - 4)

එළඹෙන වසරේ දී විශේෂයෙන් ම දෙමාපියන් මේ කාරණාව ගැන අවධානය යොමු කළොත් ඉතා ම වටිනවා. මන්ද දෙමාපියන්, දරුවන් නිසා බරපතළ ආකාරයට අකුසල් මූලයන් සකස්කර ගන්නා බව පෙනෙන්නට තිබෙනවා. වෙස්සන්තර ජාතකයේ ජූජක බමුණා, ජාලිය සහ ක්‍රිෂ්ණජිනා දරුවන් දෙදෙනාව පහරදෙමින් අරගෙන ගියා වගේ, නිරතුරුව ම කේන්තියෙන් දරුවන්ට පහරදෙන දෙමාපියන් සමාජයේ සිටිනවා. දරුවන්ට පහරදෙනවා කියන කාරණය මනුෂ්‍ය ධර්මවලට ගැළපෙන කාරණයක් නම් නෙවෙයි. මේ සටහන් තබන භික්ෂුව මේ ලෝකයේ දකින්න අකමැති ම දෙයක් තිබෙනවා. ඒ තමයි දරුවන් හඬනවා දැකීම. භික්ෂුව උදේ 6.30ට ගම්මානවල පිණ්ඩපාතයේ වඩිනකොට දරුවන්ව පාසල් ගමනට සූදානම් කරන්න ගිහිල්ලා දරුවන්ට ගහන අම්මලා ගොඩාක් දැකලා තිබෙනවා.

පාසල් යන වයසේ දරුවන් සිටින අම්මලාගෙන් සියයට පනහක් ම, පාසල් දිනවල උදෑසන, දරුවන් නිසා ම, විසිරුණු සිතකින් ම යි ගතකරන්නේ. දෙමාපියන් තුළ වැඩෙන පංචනීවරණයන් නිසා ම, උදෑසන කාලයේ දෙමාපියන් තුළ ධර්මයක් වැඩෙන්නේ නැහැ. ලබන්නා වූ නව වසරේ දී දෙමාපියන් දක්ෂවුණොත්, දරුවන් පාසල් යාමට සූදානම් කරන පැය දෙක තුළ සතියෙන් සිහියෙන් යුතුව එම කටයුතු කරන්න, දිනකට රැස්වන අකුසල් මූලයන් ගොඩාක් අවම කරගන්න පුළුවන්කම

තිබෙනවා. දෙමාපියන්, දරුවන් සමඟ කටයුතු කිරීමේ දී, අම්මා තාත්තා කියන මනෝභාවයෙන් මිදී, ඔබත් දරුවෙක්ගේ මනෝභාවය තුළ සිටිමින් දරුවා ඉදිරියේ කටයුතු කරන්න. 'මම අම්මා, ඔබ දරුවා' කියන මනෝභාවයෙන් මේ ප්‍රශ්නය විසඳා ගන්න බැහැ. දෙමාපියන්, දරුවෙක්ගේ මනෝභාවය තුළ සිටිමින් කටයුතු කිරීමේ දී, දරුවාගේ අකීකරුකම්, ප්‍රමාදභාවයන් ඉදිරියේ ඔබ ගැටෙන්නේ, කේන්තිගන්නේ නැහැ. මන්ද, ඔබ දරුවා දෙස බලන්නේ දරුවාගේ ම මනෝභාවයෙන් නිසා, අකීකරුභාවයන්, ප්‍රමාදීභාවයන් ඔබට ද අදාළ ධර්මයන් ලෙසින් ඔබ දකිනවා.

භික්ෂුව ධර්මය දේශනා කරන විට, සාකච්ඡා කරන විට, සමහරක් කුඩා දරුවන් දඟ කරනවා; හඬනවා. භික්ෂුව ඒ මොහොතේ මනසින් තමන්ගේ ළමා කාලයට යනවා. එවිට ප්‍රශ්නය ඉවරයි.

නමුත් පිංවතුන් ධර්මය ශ්‍රවණය කරන වෙලාවට දරුවන්ව තැන්පත්ව තබාගන්න දක්ෂවෙන්න ඕනේ. දරුවන් දඟකළොත් අනෙක් පිංවතුන්ලාගේ ධර්මශ්‍රවණයට බාධාවීම නිසා, දරුවාට අකුසල් සිද්ධවෙන්න පුළුවන්. මේ ලබන්නා වූ නව වසරේ දී, පිංවත් දෙමාපියන්, දරුවන් නිසා සකස්වන අකුසල් මූලයන් අවමකොට ගෙන, දීර්ඝායුෂයට අදාළ සංස්කාරයන් ජීවිතයට එකතුකොට ගැනීමට දක්ෂවෙන්න.

ඒ වගේ ම වර්තමාන සමාජයේ පිංවතුන්ලා, අතීත පිනේ ඵලයන් ලෙසින් ලද සිය ජනප්‍රියභාවය බලවත් ආකාරයට අකුසල් මූලයන් වර්ධනය කරගැනීමට හේතු කරගන්නවා. දේශපාලන, ව්‍යාපාරික, කලා, මාධ්‍ය, අධ්‍යාපන, වෛද්‍ය, ක්‍රීඩා ක්ෂේත්‍රවල ජනප්‍රියභාවය යම් පිංවතෙකුට ලැබෙන්නේ, අතීත දානයේ සහ ශීලයේ ඵලයන් නිසා ම යි. දානය සහ ශීලය යන ශක්තීන් දෙකේ ම එකතුවේ ඵලයන් හේතුවෙන් පිංවතුන්ලාට ජනප්‍රියභාවය ලැබෙන නිසා, ජනප්‍රිය පිංවතා ස්වභාවයෙන් ම වේගවත් වෙනවා. මේ වේගය තුළින් ඔහු පෙරළා ලෝභ, ද්වේෂ, මෝහ ධර්මයන් ජීවිතයට එකතුකොට ගන්නවා.

යම් පිංවතෙක්ට සිය ක්ෂේත්‍රයේ ජනප්‍රියභාවය වැඩිවෙන්න වැඩිවෙන්න ඔහු අයකරන මිල වටිනාකම, වැඩිකොට ගන්නවා. තමන් මේ අධික මිලට විකුණන්නේ දානයේ ශීලයේ ඵලය බව ඔහු දකින්නේ නැහැ. දානයට, ශීලයට කළගුණ සලකන්නේ නැහැ. දානයේ, ශීලයේ ඵලයන්ට කළගුණ සලකන්නේ නැතිව, අතීත දානයේ, ශීලයේ ඵලය වන ජනප්‍රියභාවය ඉහළ මිලට විකුණන පිංවතුන්, තමන් රැස්කරගත් පෙර ජීවිතවල දානයට, ශීලයට අදාළ සංස්කාර විකිණී අවසන් වුණාට පසුව, ජනප්‍රියභාවයෙන් පිරිහිලා යනවා. ලබන්නා වූ නව වසරේ දී සෑම ක්ෂේත්‍රයක ම ජනප්‍රියභාවයට පත්වූ පිංවතුන්ලා දානයෙන්, ශීලයෙන් ශක්තිමත්ව, ඔබගේ ජනප්‍රියභාවය ඉදිරියේ සකස්වන අකුසල් මූලයන්ට නිරතුරුව ම රතු එළිය දල්වාගෙන කටයුතු කිරීමට දක්ෂවෙන්න. ජනප්‍රියභාවය ඉදිරියේ පිංවත් ඔබ, අකුසල් මූලයන්ට කොළ එළිය දැල්වුවොත්, පිංවත් ඔබ ලෝභ, ද්වේෂ, මෝහයන්ගේ අවාසනාවන්ත සිරකරුවෙක් වේවි.

පිංවතුන්ලා දවසේ පැය අටක් ම ගතකරන කාර්යාල ජීවිතයේ දී, රාජකාරි ජීවිතයේ දී රාජකාරි බහුලවීම, කලකිරීම්, නොසලකාහැරීම්, ආයතන ප්‍රධානියා ඉදිරියේ ලකුණු දාගැනීම්, කේළාම්කීම්, තරගකාරීත්වයන් හේතුවෙන් නිරතුරුව ම අකුසල් මූලයන් සකස් කරගන්නවා. සමාජයේ පවතින ධර්මතාවයන් අපට වෙනස් කරන්නට බැහැ. අපි දක්ෂවෙන්න ඕනේ, ධර්මයන්ට අදාළව වෙනස්වෙන්න. පිංවත් ඔබ උදෑසන රැකියාවට යනකොට “අද මම කේන්තිය ඉදිරියේ සතිය සිහිය ඇතිකර ගන්නවා”ය කියලා අධිෂ්ඨානයක් තමා තුළින් ම ඇතිකොටගෙන රැකියාවට පිටත්ව යන්න. එය ඔබට ශක්තියක් වේවි, අකුසල් මූලයන් අවමකරගන්න.

මඟතොටේ දී බස්රථයට, දුම්රියට ගොඩවෙන්න ගිහින් පිංවත් ඔබ මොන තරම් අකුසල් මූලයන් ඇතිකොට ගන්නවා ද? වාඩිවී යන ආසනය පිළිබඳ ලෝභ සිත් ඇතිවෙනවා. තදබදය නිසා ද්වේෂ සිත් ඇතිවෙනවා. මේවාට දොස් තබමින් මෝහ

සිත් ඇතිකොට ගන්නවා. මහා මාර්ගයේ වාහනයක් පදවාගෙන යනකොට මාර්ග සංඥා පුවරුවක රතුඑළියක් දැල්වුණොත් පිංවත් ඔබ ගැටෙනවා. නැවත කොළ එළිය දැල්වෙන තුරු මොන තරම් අකුසල් මූලයන් ඇතිකොට ගන්නවා ද? නව වසරේ පිංවත් ඔබ අකමැති දේ ඉදිරියේ හොඳින් සතිය, සිහිය පිහිටුවාගෙන හැසිරෙන්න. ඔබ අකමැති දෙය ඉදිරියේ සතිය, සිහිය දුර්වල වුණොත්, ඒ නිමේෂයේ දී ම අනාගත භවගමනේ අඩු ආයුෂයට අයත් අකුසල් මූලයන් සකස්වෙන බව නුවණින් දකින්න. මාර්ග සංඥා පුවරුවක රතු එළිය වැටෙද්දී, එම රතු එළිය ගැන අවබෝධයෙන් සිටිමින් 'අනිත්‍යයි, අනිත්‍යයි' වශයෙන් සිතන්න. එවිට කහ එළිය වැටේවි. කහ එළිය වැටෙන විට ගමනට සූදානම් වෙන්න. කහ එළිය වැටෙද්දිත් අනිත්‍ය සිතන්න යන්න එපා. එහෙම වුණොත් පසුපසින් ඇති වාහන ඔබට නළාව නාද කරාවි. අන්තයන්ට නො යා හැමවිට ම ධර්මයන්ට ඒම පිණිස පිංවත් ඔබ නව වසරේ දී අධිෂ්ඨානයක් ඇතිකරගන්න.

එදිනෙදා ගෘහ ජීවිතයේ දී පිංවතුන් අතින් සිදුවන අකුසල මූලයන් කෙරෙහි නිරතුරුව ම අවධානයෙන් සිටීමට මේ නව වසරේ දී අධිෂ්ඨානයක් ඇතිකරගන්න. පිංවත් ඔබ එළවළුවක් ගන්න වෙළඳසැලට යනවා. එළවළු වෙළඳසැලේ වම්බටුත් තිබෙනවා; තලනබටුත් තිබෙනවා. පිංවත් ඔබ සෙම අමාරුව තිබෙන කෙනෙක් නම්, ඔබ වම්බටුවලට ගැටිලා, තලනබටුවලට ඇලෙනවා. අකුසල මූලයක් සකස්වුණා. පිංවත් ඔබ එළවළු කඩයට ගිය විට, ඔබට දියවැඩියාව තිබෙනවා නම් කරවිලවලට ඇලෙනවා; බතලවලට ගැටෙනවා. අකුසල මූලයක්. පිංවත් ඔබ රූපලාවණ්‍ය ගැන වෙහෙසෙන අයෙක් නම්, එළවළු කඩේ දී ඔබ කැරට්වලට ඇලෙනවා; බතලවලට ගැටෙනවා. අකුසල මූලයන් සකස්වුණා. ඔබ මාළුකඩයට ගිහින් එහි කෙළවල්ලා මාළු දැකලා ඒවා උෟෂ්ණයි කියලා ගැටිලා අකුසල් මූලයන් සකස්කර ගන්නවා. පළතුරක් ගන්න පළතුරු කඩයට ගිහින්, "මේ පළතුරුවලට කාබයිට් ගහලා" කියලා ගැටෙනවා. අකුසල්

මූලයන් සකස්වුණා. අපි නො සිතුවත්, අපටත් නො දැනී ඉතා ම සියුම් ලෙස මේ අකුසල් සිත් අප තුළ සකස්වෙනවා.

පිංවත් ඔබ නිවසේ තිබෙන කණ්ණාඩි මේසය ගැන සිතන්න. එම කණ්ණාඩි මේසය මත තිබෙන පවුඩර් පෙට්ටිය, සුවඳ විලවුන් කුප්පිය, පනාව ගැන සිතන්න. මේවා නිසා ඔබ රූපය, හැඩය, වර්ණය නිත්‍යභාවයෙන් ගැනීමෙන් දිනකට මොන තරම් අකුසල් මූලයන් රැස්කර ගන්නවා ද? මුහුණේ තවරගන්න පවුඩර් ටික, සුවඳ විලවුන් ටික මොහොතක් තුළ දහඩියෙන් සේදී ගියත්, ඔබ රූපය කෙරෙහි ඇතිකොටගත් ලෝභ සිත, රූපය වැහැරී යනකොට ඇතිවන ද්වේෂ සිත ඔබව භවයේ දුකට රැගෙන යනවා. පිංවත් ඔබ ගෙදරදොර පිරිසිදු කරන කොට, රෙදි සෝදන, මදිනකොට, ආහාර පිසිනකොට, සූදානම් කරගන්නකොට, ගෙමිදුල මල්ගස් නඩත්තු කරනකොට, රූපවාහිනියක්, පත්තරයක් බලනකොට මොන තරම් නම් ලෝභ, ද්වේෂ, මෝහ සිත් ඇතිකර ගන්නවාද? එළවළු පන්සීයක්, මාළු පන්සීයක් ගන්න වෙළඳසැලට ගියත් ලෝභ සිතක්, අකුසල් මූලයක් නම් ඇතිවෙන්නේ, පිංවත් ඔබ ලබන්නා වූ නව වසරේ දී පරෙස්සම් වෙන්න ඕනේ. එළවළුවක්, පළතුරක් ගන්න ගියා වේවා, ඇඳුමක් මිලට ගන්න ගියා වේවා, ඔබ තුළ රූපය කෙරෙහි, නිරෝගීභාවය කෙරෙහි, මිල කෙරෙහි, සෞඛ්‍යාරක්ෂිතභාවය කෙරෙහි සිතක් ඇතිවෙන මොහොතේම එම සිත අනිත්‍යයි කියලා දකින්න. වම්බටු දැකලා, වම්බටු අනිත්‍යයි කියලා සිතෙනකොට ම අනිත්‍යයි කියලා දකින්න. භික්ෂුව මෙහෙම සටහන් කළා කියලා, ඔබ එළවළු කඩේට ගිහින් මුදලාලි ඉස්සරහා ඇස්දෙක පියාගෙන අනිත්‍ය දකින්න යන්න එපා. එම චර්යාවන් මෝහයටයි ගැනෙන්නේ. නව වසරේ දී පිංවත් ඔබ අන්තයන්ට යන්න එපා; ධර්මයට එන්න. පිංවත් ඔබට අවශ්‍ය නම් කණ්ණාඩි මේසයත් පාවිච්චි කරන්න, පවුඩර්, සුවඳ විලවුන් අවශ්‍ය නම් පාවිච්චි කරන්න, රූපය, ලස්සන, සුවඳ, වර්ණය අනිත්‍ය වශයෙන් දකිමින්....

භික්ෂුවගේ ගිහි ජීවිතයේ පාසල් යන කාලයේ අම්මා පවුඩර් දැම්මට පස්සේ කවදාවත් පවුඩර් මුහුණේ තවරලා නැහැ. සිනහවෙන් ම තමයි මුහුණු සරසාගත්තේ.

පිංවත් ඔබ තුළින්, එළවළුවක් ගන්න ගියත්, මාළුවක් ගන්න ගියත්, ගෙදර අතුපතුගාන්න, පිරිසිදු කරන්න ගියත්, රැවුල කපාගන්න ගියත් මෙතරම් අකුසල මූලයන් රැස්වෙනවා නම්, පිංවත් ඔබට දැන් සැකයක් නැහැ නේ ද, මනුෂ්‍යයාගේ පරමායුෂ අඩුවෙන්නේ අකුසල් මූලයන් වැඩීම නිසා ම ය කියලා?

පන්සල, ආරණ්‍යය කුසලයට ම මිස අකුසලයට නම් නො යොදන්න

(නව වසරට ප්‍රවේශයක් - 5)

පිංවත් ඔබ, ලබන්නා වූ නව වසරේ දී පන්සල, ආරණ්‍යය, ස්වාමීන් වහන්සේලා, පිංකම් නිසා අකුසල් මූලයන් සකස්කර ගන්න එපා. පිංකම් සිදුකරන්න ඕනේ, කුසල් මූලයන් රකිමින්. පන්සලේ වැඩසිටින සාමණේර ස්වාමීන් වහන්සේ තමන්ගේ ආගමික කටයුත්ත සිදුකළා ය කියලා අකුසල මූලයන් ඇතිකර ගන්න එපා. අතීතයේ ජීවත්වුණ උග්ග ගෘහපතිවරයාත්, අනේපිඬු සිටුතුමාත් සාමණේර ස්වාමීන් වහන්සේලාට පසඟ පිහිටුවා වන්දනා කළා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ගිහි අනාගාමී උපාසකතුමාට වඩා, අද පැවිදි වූ සාමණේර ස්වාමීන් වහන්සේ ශ්‍රේෂ්ඨයි කියලා. පිංවත් ඔබ සාමණේර ස්වාමීන් වහන්සේලා තමාගේ ආගමික කටයුත්ත සිදුකළා ය කියලා ගැටුණොත් පිංවත් ඔබ අතීතයේ වැඩසිටිය උතුම් රහත්ඵල අවබෝධය ලැබූ නිග්‍රෝධ, සෝපාක, සංකිච්ච, දබ්බමල්ල පුත්ත වැනි සාමණේර අවධියේ දී ම උතුම් රහත්ඵල අවබෝධය ලැබූ සාමණේර රහතන් වහන්සේලා සමඟත් ගැටුණා වෙනවා. එවිට උතුම් සංඝරත්නය කියන අර්ථය ඔබ තුළ පිහිටන්නේ නැහැ.

සාමණේර ස්වාමීන් වහන්සේලාත් ලබන්නා වූ නව වසරේ දී දක්ෂවෙන්න ඕනේ, ගිහි පිංවතුන්ලා තමන්ට වන්දනා කරන්නේ, සිව්පසයෙන් ඇප උපස්ථාන කරන්නේ අතීතයේ වැඩසිටි නිග්‍රෝධ, සෝපාක, සංකිච්ච වැනි උතුම් සාමණේර රහතන්

වහන්සේලා අරමුණු කොටගෙන යි කියන කාරණය නුවණින් මතුකොටගෙන, සංකීර්ණ දශශීලය තුළ, සේඛියා ධර්මයන් තුළ හැකි පමණින් ශක්තිමත් වෙන්න. සමහර විට සාමණේර ස්වාමීන් වහන්සේට වන්දනා කරන ගිහි පිංවතා සෝවාන්ඵල අවබෝධය ලැබූ ගිහි පිංවතෙක් වෙන්න පුළුවන්. මෙවැනි අවබෝධාත්මක ගිහි වන්දනාවක දී සාමණේර ස්වාමීන් වහන්සේ ශීලයෙන් දුර්වල නම් උන්වහන්සේට එය අනතුරක් වෙනවා.

පිංවත් ඔබ, ලබන්නා වූ නව වසරේ දී කුමන පිංකමක් සිදුකළත් ඒ තුළින් කුසල් මූලයන් ශක්තිමත් කරගන්න දක්ෂවෙන්න. පිංවත් ඔබ දානයක් පූජා කරන විට එම දානයට තවත් කෙනෙක්ගෙන් කෙසෙල් ඇවරියක් හෝ අරගෙන, අනුන්වත් සහභාගිකරගෙන 'මගේ දානය' කියන ලෝභ සිත බිඳ දමන්න. පිරිකරක් පූජා කරන විට තවත් පිංවතෙකුගෙන් එම පිරිකරට රුපියල් දහයක් හෝ සම්මාදන් කරගෙන 'මගේ පිරිකර' කියන ලෝභ සිත දුර්වල කර දමන්න. කඨින පිංකමක් සිදු කරන විට අවම වශයෙන් තමන්ගේ ඥාතියෙක්වත් එම පිංකමට හවුල් කරගෙන 'මගේ කඨින පිංකම' කියන ලෝභ සිත දුර්වල කර දමන්න.

පිංවත් ඔබ, ලබන්නා වූ නව වසරේ දී පන්සලට, ආරණ්‍යයට පිං සිදුකර ගැනීමට ගිහිල්ලා මල් දමාගෙන ගිය පොලිතින් බෑගය, තෙල් දමාගෙන ගිය හිස් බෝතලය, හිස් හඳුන්කූරු පෙට්ටිය පන්සලේ භූමිය අපවිත්‍ර වෙන ලෙස දමා එන්න එපා. බුදුරජාණන් වහන්සේට පහන් ආලෝකය දල්වලා පහන් වැටේ තිබී අතේ ගෑවුණ දැලිකුණු සුදු බිත්තියේ පිසදමන්න එපා. මොන ම හේතුවක් නිසාවත් පන්සලට බලු පැටව්, පූස් පැටව් ගෙනත් දමන්න එපා. පන්සල්, ආරණ්‍ය භූමි තුළට නිකෙළෙස් සිතින් පැමිණෙන පිංවතුන්ලාගේ සිත් තුළ කෙළෙස් ඇතිවන ලෙස අසභ්‍ය ආකාරයට හැසිරෙන්න එපා. මේවා අටමහ අකුසල් ගණයටයි වැටෙන්නේ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ අටමහ කුසල් වශයෙන් පන්සල් කුටි පූජා කිරීම, බුදුපිළිම වහන්සේලා පූජා කිරීම, කඨින පිංකම් සිදුකිරීම, වැසිකිළි-කැසිකිළි පූජා කිරීම,

අෂ්ට පරිෂ්කාර පූජා කිරීම වැනි නිරතුරුව පිං වැඩෙන පිංකම් දේශනාකොට තිබෙනවා. අටමහා කුසල් සිදුකිරීමේ දී පිංකමෙන් පසුවත් නිරතුරුව පිං වැඩෙනවා. ඒ වගේ ම යි, යම් පිංවතෙක් පන්සල, ආරණ්‍ය පරිසරය අපිරිසිදු කරනවා නම්, අසභ්‍ය ලෙස හැසිරෙමින් තරුණ ස්වාමීන් වහන්සේලාගේ, ගිහි පිංවතුන්ගේ සිත් දූෂ්‍ය කරනවා නම්, බලු පැටව්, පූස් පැටව් ගෙනත් දානවා නම්, ස්වාමීන් වහන්සේලාව විවේචනය කරනවා නම්, සාංඝික දේපළ ගිහි පිංවතුන් විසින් පරිහරණය කරනවා නම් මේවා කරන පිංවතුන් සුවෙන් සිටියත්, ඒ පිංවතුන්ලාගේ ජීවිතවලට පව් එකතුවෙනවා. මේවා අටමහ අකුසල් ගණයටයි වැටෙන්නේ.

පිංවතුන් මහපාරෙදි දැකලා ඇති, සමහර මානසික රෝගී යාචක පිරිස් සිටිනවා. අවුරුදු ගණනාවකින් ඒ අය නාලා පිරිසිදුවෙලා නැහැ. මුළු ශරීරයේම කුණු බැඳිලා. දූවිලි කුණු තැවරුණ කිළුටු ඇඳුමක් තමයි ඇඳගෙන සිටින්නේ. හිසකෙස් ඝනව වැවිලා, අඳුරු පැහැයට පොකුරු ගැසිලා තිබෙන්නේ. කෙනෙකුට දකින්න අප්‍රසන්න යි. තමන්ගේ අපවිත්‍රභාවය ඔහුට දැනෙන්නේ නැහැ. මනුෂ්‍ය සමාජය තුළ ජීවත්වෙන මේ අපවිත්‍ර මනුෂ්‍යයා, පෙර ජීවිතයේ පන්සල, ආරණ්‍යය අපවිත්‍ර කළ අටමහා අකුසලයන්ගේ ම ඵලයක්.

මත් පානයත්, මත් දානයත් දුරින්ම දුරුකරන්න

(නව වසරට ප්‍රවේශයක් - 6)

පිංවත් ඔබ දකලා ඇති, සමහර මංගල උත්සව තිබෙනවා, උත්සවයට පැමිණෙන සියලුම අමුත්තන්ට ඇති තරම් අසත්පුරුෂ මත්වතුර දානයන් දෙනවා. නමුත් මඟුල් ගෙදර මනමාල මහත්මයා මත්වතුර බොන්නෙත් නැහැ, මනමාල මහත්මයාගේ දෙමාපියන් මත්වතුර බොන්නෙත් නැහැ. බලන්න, මොන තරම් අසත්පුරුෂ ධර්මයක් ද කියලා. තමන් සිල්පද ආරක්ෂා කොටගනිමින්, අනුන්ගේ සිල්පද උවමනාවෙන් ම බිඳ දමනවා. තමන් සිතුවත් තමන් සිල්පද ආරක්ෂා කොටගත්තා ය කියලා, අනුන් ශීලයෙන් දුර්වලකොට, අනුන් අකුසල් මූලයන් තුළට කොටුකිරීමෙන්, තමන් බලවත් අකුසල් මූලයන් රැස්කොට ගන්නවා. අසත්පුරුෂ මත්වතුර දන්සැල් දෙන මංගල උත්සවවල මනමාල පාර්ශ්වයන්, අමුත්තන්ගේ පාර්ශ්වයන් සහයෝගයෙන් යුතුව කරගන්නා සුභ ප්‍රාර්ථනාවක් තිබෙනවා. එම සුභ ප්‍රාර්ථනාව තමයි, "අපි අමුත්තන්ට මත්වතුර දානය දීලා ඔවුන්ගේ සිල්පද බිඳ දමා, අකුසල් මූලයන් ඇතිකරනවා, අමුත්තන් වන ඔබලා සුව සේ මත්වතුර දානයන් භුක්තිවිඳලා රෝගීභාවයත්, ආයුෂ හීනවීමත්, සිල්පද බිඳීමත් ජීවිතයට එකතුකොට ගන්න"ය කියලා. කොහොම ද මිත්‍රත්වයේ, ඥාතීත්වයේ මඟුල් ගෙදර දෙපාර්ශ්වයේ සුබ පතාගැනීම............?

මඟුල් උත්සවයේ, උපන්දින සාදයේ දී අනුන්ට මත්වතුර අසත්පුරුෂ දානයන් දීමෙන්, ඔබ අනුන්ගේ ශීලය දුර්වලකොට,

අනුන්ගේ අකුසල් මූලයන් තීව්‍ර කිරීම නිසා, මේවායේ විපාකයන් හැටියට ඔබලාට රෝගීභාවය, ආයුෂ හීනභාවය, විවාහ දිවියේ අසමගිය වගේ ම, මීළඟ ජීවිතයේ යම්හෙයකින් ඔබ මනුෂ්‍ය ප්‍රතිසන්ධියක් ලැබුවොත්, ඔබ උපත ලබන්නේ ද බේබදු තාත්තා කෙනෙකුට දාව වීමත්, ඔබත් තරුණ කාලයේ දී ම බේබද්දෙක් වීමත් ධර්මතාවයක් වෙනවා. තමන් මත්වතුර පානය නො කර, අනුනට අසත්පුරුෂ මත්වතුර දානයන් දෙන පුද්ගලයා අසත්පුරුෂ භාවයේ අංක එක වෙනවා. යම් පිංවතෙකුට තමන්ගේ මංගල උත්සවයට, උපන්දින ප්‍රියසාදයට මත්වතුර අවශ්‍ය යැයි සිතෙනවා නම්, භික්ෂුව ඔහුට සහතිකයක් දෙනවා. එම සහතිකය තමයි, ඔබ තවම තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවට පැමිණිලා නැහැ, ඔබ තවම අමූලිකා ශ්‍රද්ධාව තුළයි සිටින්නේ කියන සහතිකය.

මත්වතුර අයිති හීනමානයට යි; කෑදරකමට යි; පරාජිතභාවයටයි. අනුන්ට මත්වතුර දන්සැල් දෙන තැනැත්තා අයිති අසත්පුරුෂ භාවයේ අංක එකට ම යි. තමන් මත්වතුර බොනවාට වඩා, අනුන්ට අසත්පුරුෂ මත්වතුර දානයන් දීම බලවත් අකුසලයක් බවත්, පවත්නා නව විචිත්‍ර මත්වතුර සංස්කෘතිය තව තව ශක්තිමත් කිරීමේ හේතුඵල ධර්මයක් බවත් නුවණින් දකින්න දක්ෂවෙන්න. මංගල උත්සවයක දී, උපන්දින සාදයක දී මත්වතුර දන් දී සිය දෙනෙකුගේ සිල්පද බිඳිනවා ය කියන්නේ, සිය දෙනෙකු තුළ අකුසල් මූලයන් වඩනවා ය කියන්නේ මොන තරම් අකුසලයක් ද කියලා ධර්මානුකූලව දකින්න. නව වසරේ දී පිංවත් ඔබ දක්ෂවෙන්න, පසළොස්වක පොහොය දිනයට පන්සලේ ධර්ම ශාලාවේ සිල් සමාදන්වෙන උපාසක උපාසිකාවන් සිය දෙනෙක් රැස්කොටගන්නා කුසලය යම් සේ ද, ඔබ ප්‍රියසාදයක දී සිය දෙනෙකුට අසත්පුරුෂ මත්වතුර දන්දීමෙන් ලැබෙන අකුසලයේ පව ද, ප්‍රතිවිරුද්ධ අර්ථයෙන් ඒ තරමට ම බලවත් වෙන බව ධර්මානුකූලව ගළපාගන්න.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, “මහණෙනි, කාමයේ ආස්වාදයක් තිබෙනවා”ය කියලා. එහෙමනම් අසත්පුරුෂ

මත්වතුර දානය තුළත්, මත්වතුර පාවිච්චිය තුළත්, ආස්වාදයක් එම ජීවිතවලට ලැබෙනවා. නමුත් එම කෙටි මාර ආස්වාදය නිසා, දීර්ඝ වූ ආදීනවයන් රැසක් එම ජීවිතවලට එකතුවෙනවා. එම කෙටි කාමයේ ආස්වාදය උදෙසා පිංවත් ඔබ ජීවිතයට එකතුකොට ගන්නා දීර්ඝ ආදීනවයන් වන්නේ, පැතිර යන නව විචිත්‍ර මත්වතුර සංස්කෘතිය තව තව වර්ධනය වෙනවා. රෝගීභාවය, අපකීර්තිය, ආයුෂ හීනවීම, සතර අගතියට වැටීම මාර මත්වතුර ආස්වාදයේ දීර්ඝ ආදීනවයන් බවට පත්වෙනවා. ලබන්නා වූ නව වසරේ දී මත්වතුරේ ඇති කෙටි ආස්වාදයත්, එහි ඇති දීර්ඝ ආදීනවයන් ආදියත් කෙරෙහි පිංවත් ඔබ සතිය, සිහිය ඇතිකොට ගන්න දක්ෂවෙන්න. මත්වතුර බීමට, මත්වතුර දන්දීමට සකස්වෙන ඔබගේ සිත දන් දී පිංවත් ඔබ ශීලයන් ආරක්ෂා කොටගෙන උතුම් විදර්ශනාමය, දානමය කුසලයකුත් ජීවිතයට එකතුකොට ගන්න දක්ෂවෙන්න. මත්වතුර වීදුරුවක් අනුන්ට දන්දෙන්නා, අකුසල් ගැලුමක් දන්දුන්නා වෙනවා. මත්වතුර වීදුරුවක් බොන පිංවතා අකුසල් ගැලුමක් බොන කෙනෙක් බවටයි පත්වෙන්නේ.

පිටි කොටන්න ගිය කාලය ඉතිරිවුණා ඉතිරි කරපු කාලයේ කෝ පිං පිරුණා

(නව වසරට ප්‍රවේශයක් - 7)

නවීන තාක්ෂණික උපකරණ ගෙදරදොර පරිහරණයට පැමිණීම නිසා ම, එදිනෙදා ජීවිතයේ දී, පිංවත් ඔබට මොන තරම් කාලයේ ඉතිරියක් ලැබී තිබෙනවා ද.

භික්ෂුවට මතකයි, අපි පොඩි කාලයේ අවුරුදු ළංවෙනකොට කැවුම් හදන්න අම්මා සමඟ ගල්වංගෙඩියේ හාල් කොටනවා; පිටි හලනවා. හාල් කිලෝ දෙකක් දියේ දමලා පිටි කොටන්න එදා පැය තුන හතරක කාලයක් ගතවෙනවා. වර්තමානයේ එම කටයුත්ත, තාක්ෂණය විසින් පැය භාගයකින් කරගැනීමේ හැකියාව ලැබිලා තිබෙනවා.

ඔබගේ ම පෙර පින නිසා ම, මේ තාක්ෂණයේ භාවිතයෙන් ඔබට ලැබෙන කාලයේ ඉතිරිය ඔබ පෙරළා යොදාගන්නේ ලෝභ, ද්වේෂ, මෝහ අකුසල් මූලයන් වර්ධනය කොටගැනීම උදෙසා ම යි. තාක්ෂණය නිසා මෙතරම් කාලයේ ඉතිරියක් පිංවත් ඔබට ලබාදී තිබියදීත්, අද උදෑසන පිණ්ඩපාත මඩුවට පැමිණි අම්මා කෙනෙක් භික්ෂුවට කියනවා, "මේ මාසයේ වැඩ වැඩි නිසා, සිල් සමාදන් වෙන්න යන්නේ නැහැ"ය කියලා. අතීත පින නිසා පිංවත් ඔබට කාලය ඉතිරිකොට දෙනකොට, පෙරළා ඔබ තවතවත් වගකීම් කර මතට ගන්නවා. අතීත පින විසින් වර්තමානයේ ඔබට ලබාදෙන කාලයේ ඉතිරිය පෙරළා පින්කිරීම උදෙසා යොමුකොට ගන්නේ නැහැ. පින කියන්නේ මොන තරම් උත්කෘෂ්ට දෙයක් ද. අතීත මනුෂ්‍යයාගේ පින විසින්

සකස්කොට දුන් දැනුමේ ඵලයෙන් බිහිවෙන තාක්ෂණය විසින් ලෝකය සරලකොට, පහසුකොට තිබියදීත්, පිංවත් ඔබ ජීවිතය අකුසල් මූලයන්ගෙන්, කාමච්ඡන්දයන්ගෙන් බරකොට ගන්නවා. ඇයි පිංවත් ඔබ පිනට මේ තරම් අසාධාරණයක් කරන්නේ?

ඔබ ම කරගත්තා වූ අතීත පින විපාක දෙනකොට, පිනට මේ සා අසාධාරණයක් ඔබ කරනවා නම්, වර්තමානයේ නැවත පිං කරන එකේ අර්ථයක් නැහැ. පින විසින් ඔබට කාලය ඉතිරිකොට දෙනකොට, ඔබ එම කාලය නැවත නැවත අකුසල් මූලයන් වැඩීම උදෙසා යොමුකොට, පින කියන අර්ථයට බලවත් අසාධාරණයක් කරනවා.

පිංවත් ඔබට අතීත පින නිසා ම, මෙච්චර කාලය ඉතිරියක් කර දී තිබියදීත්, ඔබට බුදුන් වඳින්නට, පන්සල් යන්නට, සිල් සමාදන් වෙන්නට, අනුන්ට යහපතක් කරන්නට, පිරිත් ගෙදරක, බණ ගෙදරක යන්නට වේලාවක් නැහැ කියනවා. පින ඔබ දුක උදෙසා ම ආයෝජනය කරනවා.

ලබන්නා වූ නව වසරේ දී, පිංවත් ඔබගේ ගේදොර කටයුතු පිණිස තාක්ෂණය නිසා ලැබෙන කාලයේ ඉතිරියෙන් අවම වශයෙන් කුසල් මූලයන් වැඩෙන පිංකම් උදෙසා පැයක්වත් යොමුවීමට දක්ෂවෙන්න. එසේ නො වුණොත්, පින විපාකයට පැමිණෙද්දී අකුසලයට අතවනන අවාසනාවන්තයින් වීමේ අනතුරටයි සමාජය ගමන් කරන්නේ. මෙහි අනාගත ඵලය තවදුරටත් ආයුෂ හීනවීමත්, රෝගීභාවයත් පමණක් ම යි.

මේ, මා ඔබට දුන් අලුත් අවුරුදු තෑග්ග යි

(නව වසරට ප්‍රවේශයක් - අවසන් කොටස)

පිංවතුන්ලා ලබන්නා වූ නව වසරේ දී පිංකම් සිදුකරන විට, ස්වාමීන් වහන්සේලා භේදවන ආකාරයට පිංකම් සිදුකරන්න එපා; ගිහි පිංවතුන්ලා භේදවෙන ආකාරයට පිංකම් සිදුකරන්න එපා; පන්සල්-පන්සල් ගැටෙන ආකාරයට පිංකම් සිදුකරන්න එපා.

භික්ෂුව දැකලා තිබෙනවා, සමහර පන්සල්වල එකිනෙකාට විරුද්ධ දායක කණ්ඩායම් දෙකක් තිබෙනවා. මේ පාර්ශ්වයන් දෙක පන්සලේ තරගෙට පිංකම් සිදුකරනවා. මෙවැනි ක්‍රියාවන්ගෙන් යම් පිනක් වැඩුණත් පිනට ඔරොත්තු නො දෙන ආකාරයට අකුසල් මූලයන් වැඩෙනවා. මේ ලෝකයේ සම්‍යක්දෘෂ්ටික දෙවියන් දිවෙස් හෙළන ස්වභාවයන් දෙකක් තිබෙනවා. එකක් තමයි තව්තිසාවේ සුදම් සභාව. දෙවැනි සභාව තමයි පන්සලේ, ආරණ්‍යයේ දායක සභාව. දායක සභාවේ සමගිය, ශාසනයේ ආරක්ෂාවටත් ගමේ සමගියටත් අත්‍යවශ්‍ය සාධකයක් වෙනවා. මෙය සටහන් තබන භික්ෂුව, ගමේ පන්සල වන කලපළුවාව ශ්‍රී සුදර්ශනාරාම පුරාණ විහාරස්ථානයේ දායක සභාවේ සභාපති හැටියට පත්වුණේ, වයස අවුරුදු තිස්හයේ දී පමණ. දායක සභාවේ අනෙක් සියලු ම නිලධාරීන් මට වඩා වයසින් වැඩියි. අපි බොහෝ ම සමගියෙන් කටයුතු සිදුකළා. මේ සමගිය වර්තමානයේ ගමේ පන්සලේ තිබෙනවා ද කියන්න භික්ෂුව දන්නේ නැහැ. මේ වෙලාවේ භික්ෂුවට සිහිපත් වෙනවා, ගෞරවණීය බතලවත්තේ නායක ස්වාමීන් වහන්සේව.

උන්වහන්සේ බොහෝ ම නිහතමානී, ඉන්ද්‍රිය සංවරයෙන් යුත් නායක ස්වාමීන් වහන්සේ නමක්. බතලවත්තේ නායක ස්වාමීන් වහන්සේ මාව වයස අවුරුදු තිස්හයේ දී පමණ දායක සභාවේ සභාපති හැටියට පත්කළත්, මා පාසල් වයසේ දී පන්සල් වත්තේ ක්‍රිකට් ගහන්න ගිහිල්ලා, පන්සල් වත්තේ තැඹිලි කඩන්න ගිහිල්ලා උන්වහන්සේගෙන් දෙපාරක් ම ගුටිකාලා තිබෙනවා. ඒ ගුටිකෑම මතක් වෙනවිට අද භික්ෂුවට සතුටක් දැනෙනවා. ඒ අකීකරු භාවයයි, කීකරු භාවයට අවශ්‍ය සිහිය, සතිය මා තුළ ඇතිකොට දුන්නේ.

ඉහත සටහන් කළ කරුණුවලින් පිංවත් ඔබට හොඳින් ම වැටහෙනවා ඇති, පිංවත් ඔබ එදිනෙදා කරන සෑම කටයුත්තකදීම ලෝභ, ද්වේෂ, මෝහ අකුසල මූලයන් සිදුකර ගන්නවා ය කියන කාරණය. එම නිසා ලබන්නා වූ නව වසරේ දී පිංවත් ඔබ දක්ෂවෙන්න, කුසල මූලයන් වැඩෙන ආකාරයට එදිනෙදා ඔබේ කටයුතු සිදුකරන්න; කුසල් මූලයන් වැඩෙන ආකාරයට ඔබ කරන දාන, ශීල, භාවනා පිංකම් සිදුකරගන්න.

අකුසල් මූලයන් වැඩෙන ආකාරයට ඔබ පිංකම් කළොත් පින අනාගතයේ දී විපාකයට එන්නේ දුර්වල, රෝගී, අඩු ආයුෂ සහිත උපත්වලින්. දුශ්ශීලභාවය සහ අකුසල් මූලයන් නිසා අනාගත ලෝකයේ බිහිවන මෘග සංඥාවන්ගෙන් යුත් අඩු ආයුෂ සහිත මනුෂ්‍ය ප්‍රජාව කෙරෙහි බිය ඇතිකරගෙන, නව වසරට කුසල් මූලයන් වඩන අධිෂ්ඨානයෙන් පියවර තබන්න. නව වසර ධර්මයේ අර්ථයන් වැඩෙන, ධර්මානුධර්ම ප්‍රතිපදාවේ යෙදෙන වසරක් බවට පත් කරගන්න.

පිංවත් ඔබ සමාජයෙන් ඇසෙන දෘෂ්ටි, මතවාද, අදහස් නිසා නිරතුරුව ම බරපතළ ලෝභ, ද්වේෂ, මෝහ අකුසල් මූලයන් සකස් කරගන්නවා. ඉන්ද්‍රිය අසංවරයෙන් යුත් පුද්ගලයින්, අයෝනිසෝ මනසිකාරයෙන් යුත් පුද්ගලයින්ගේ අදහස්, ප්‍රකාශයන්, ක්‍රියාවන් නිසා ඔබ දිනකට මොන තරම් අකුසල මූලයන් ඇතිකර ගන්නවා ද? ලබන්නා වූ නව වසරේ දී පිංවත් ඔබ ඇසෙන් දකින, කනෙන්

අසන දෙය ප්‍රත්‍යවේක්ෂාවෙන් යුතුව ජීවිතයට එකතු කරගන්න. යමක් දකින විට, අසන විට මේ දකින, අසන දෙයින් මා අකුසල් සිතක් ඇතිකර ගන්නවා ය කියන සතිය, සිහිය ඇතිකරගෙන අනුනගේ ඉන්ද්‍රිය ධර්මයන්ගේ දුර්වලභාවය හේතුවෙන් ඔබ ඔබේ ඉන්ද්‍රිය ධර්මය දුර්වල කරගන්න එපා. එය අනාගතයේ අඩු ආයුෂ ඇති උපතකට හේතුවෙනවා. වර්තමාන සමාජයේ මනුෂ්‍යයා තුළ කුසල මූලයන්ගේ දුර්වලභාවයෙන් දානයේ පින විපාකයට පැමිණෙන නිසා, මනුෂ්‍යයා තුළ සකස්වෙන වර්ණය, සැපය, බලය, ඉන්ද්‍රිය අසංවරභාවය තුළිනුයි පෝෂණය වෙන්නේ. එම නිසා ධර්මයට කැමති පිංවතුන්ලාට, ලැජ්ජාව-භය ඇති පිංවතුන්ලාට, මනුෂ්‍යකම, සාධාරණය ගරුකරන පිංවතුන්ලාට අසන්න, දකින්න වෙන්නේ ඔබලා අකමැති දේවල්මයි. මේවා හේතුඵල ධර්මයන්. දක්ෂ පිංවතා ලබන්නා වූ නව වසරේ දී ඔබ දකින, ඔබ අසන, ඔබ සිතන දෙය තුළින් ධර්මයක්මයි, කුසලයක්මයි, මතුකරගත යුත්තේ. පිංවත් ඔබ තුළ ඉහත ශක්තිය දුර්වල නම් මෙවැනි අනතුරු මඟහැරයාමෙන් දුරුකර ගැනීමට ඔබ දක්ෂවෙන්න ඕන.

පිංවත් ඔබ, ලබන්නා වූ නව වසරේ දී මොන ම හේතුවක් නිසාවත් වේගයෙන් දුවන කෝච්චිවල එල්ලෙන්න යන්න එපා, දුවන කෝච්චිවල එල්ලෙන්න ගියොත් ඔබ අනතුරට පත් වේවි. දුවන කෝච්චියක් දැක්කම, දුවන කෝච්චිවලට සුව සේ දුවන්න ඉඩහැරලා පිංවත් ඔබ මන්දගාමී වන්න. වේගයෙන් දුවන කෝච්චි කවදාහරි දවසක පීලි පනිනවා. එය ධර්මතාවයක්. පීලි පනිනවාය කියන්නේ සම්මා දෘෂ්ටියෙන් මිථ්‍යා දෘෂ්ටියට පනිනවා ය කියන කාරණය යි.

මෙම සටහන අවසන් කරන මොහොතේ භික්ෂුව දෑස්දෙක පියාගෙන ගෙවී ගිය වසර දෙස හැරී බැලුවා. භික්ෂුවට අරමුණු වෙන්නේ හිස්බවක් පමණයි. ඇල්පෙනිති තුඩක තරම්වත් සටහනක් එහි නැහැ. ගෙවීගිය වසරේ භික්ෂුව ධර්මය සටහන් කළා; ධර්මය දේශනා කළා; ධර්ම සාකච්ඡා කළා; දායක පිංවතුන් ඇසුරු කළා. ඒත් භික්ෂුවට අරමුණු වෙන්නේ හිස්බවක්

පමණක් ම යි. සටහන් කළ, දේශනා කළ, ඇසුරු කළ කිසිවක්, කිසිවෙක් ජීවිතයට ඇලිලා නැහැ. ධර්මයේ සුන්දර අත්දැකීමක් පිංවතුන්ලාට අලුත් අවුරුදු තෑග්ගක් වශයෙන් සටහන් තබමින් ලිපිය අවසන් කරනවා. දැන් වේලාව රාත්‍රී 8.30 යි. උඳුවප් මහේ පරිසරය හරි ම ලස්සනයි. බාල්කයේ එල්ලෙන ලන්තෑරුමේ එළිය හරි ම සෞම්‍යයයි. අරමුණක් නැති භික්ෂුවගේ වර්තමාන ජීවිතය හරි ම නිහඬ යි.

සිංහල බෞද්ධකම ධර්මයෙන් අර්ථ ගැන්වූ අවුරුදු උදාවකට....

(සිංහල අලුත් අවුරුද්ද නිමිත්තෙන් තැබූ තවත් විශේෂ සටහන)

පිංවත් මහත්මයෙක් භික්ෂුවගෙන් ප්‍රශ්නයක් විමසුවා, "ස්වාමීන් වහන්ස, සතිය, සිහිය කියන්නේ කුමක්ද?" කියලා. පිංවත් ඔබ ආසනයක වාඩිවෙලා බුදුගුණ භාවනාව මෙනෙහි කරමින් සිටිනවා ය කියලා හිතන්න. මොහොතකින් ඔබේ සිත බාහිර අරමුණක් කරා ඇදී යනවා. ඔබ ඇස්දෙක පියාගෙන සිටියත්, ඔබේ සිත දැන් තිබෙන්නේ වෙනත් රූපයක් ඔස්සේ ඇදීගිහින්. දැන් ඔබ සිටින්නේ ඇතිකොටගත් සැබෑ අරමුණ කෙරෙහි අසිහියෙන්. තමා අසිහියෙන් සිටින බව දැනගෙන, ඔබ නැවතත් බුදුගුණ භාවනාව සඳහා සිත යොමුකරනවා. භාවනාව කෙරෙහි යොමුකර ගන්නා වූ සිත නැවත නැවත එම අරමුණ කෙරෙහි තැන්පත් කරගන්නවා. දැන් ඔබ තුළ සතියත්, සිහියත් දෙක ම තිබෙනවා.

තවත් පිංවත් මහත්මයෙක් භික්ෂුවගෙන් ප්‍රශ්නයක් විමසුවා, "ස්වාමීන් වහන්ස, ධර්මය, අධර්මය කියන්නේ කුමක්ද?" කියලා. පිංවත් ඔබ, අනිත්‍ය දෙය අනිත්‍ය වශයෙන් දකිනවා නම්, දුක දෙය දුක වශයෙන් දකිනවා නම්, අසුබ දෙය අසුබ වශයෙන් දකිනවා නම්, අනාත්ම දෙය අනාත්ම වශයෙන් දකිනවා නම්, එය ධර්මය වෙනවා. පිංවත් ඔබ අනිත්‍ය දෙය නිත්‍ය වශයෙන්, දුක දෙය සැපයක් වශයෙන්, අසුබ දෙය සුබ වශයෙන්, අනාත්ම දෙය ආත්මීය වශයෙන් දකිනවා නම්, එය අධර්මය වෙනවා.

යම් පිංවතෙක් භික්ෂුවගෙන් ඇසුවහොත් "සිංහල බෞද්ධයා කියන්නේ කවරෙක් ද?" කියලා, භික්ෂුව මෙහෙම පිළිතුරක් තමයි දෙන්නේ. සැබෑ ම සිංහල බෞද්ධයා කියන්නේ අන්‍ය ජාතීන්, අන්‍ය ආගමික පිංවතුන් කායිකව, මානසිකව පීඩාවට පත්කරමින් කටයුතු කරන ජාතිවාදියෙක් නො වේ. ඒ වගේ ම යි, "සිංහල ජාතිය, බෞද්ධකම තිබුණා ය කියලා බඩ පිරෙනවද?" කියමින් ජාතිය, බෞද්ධකම දෙවැනි තැනට දමා, ධනය, බලය පසුපස හඹායන ජාතිද්‍රෝහියෙක් ද නො වේ. සැබෑ ම සිංහල බෞද්ධයා යනු, සම්මා දිට්ඨියෙන් පරිපූර්ණ වූ, ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කරන පිංවතා යි; තමනුත් සම්මා දිට්ඨියෙන් භවගමනේ ආරක්ෂා වී, මෙලොව, පරලොව සැපයන් සාක්ෂාත් කොටගෙන, අනුනට මෙලොව, පරලොව සැපයන් ආරක්ෂා කරදීමට අවශ්‍ය උපකාරක ධර්මයන් සලසන පිංවතා යි.

සිංහල අලුත් අවුරුද්දක් ළඟළඟ ම පැමිණෙන මොහොතේ පිංවත් ඔබට සතිය, සිහිය ගැනත්, ධර්මය, අධර්මය ගැනත්, සැබෑම සිංහල බෞද්ධයා යන අර්ථය ගැනත් සටහනක් තැබුවේ, සතියෙන්, සිහියෙන් තොරව, අධර්මය පසුපස යමින්, සිංහල බෞද්ධකමේ අර්ථයන් මුවහත් කිරීමට අසාර්ථක උත්සාහයක යෙදෙන සමාජය ගැන කරුණාවෙන් ම යි.

සමාජය දෙස මොහොතක් දෑස් හැර බලන්න. හැමෝම සුදෝසුදු ඇඳුම් අඳින්න හරි ම දක්ෂ යි. හැමෝම තුනුරුවන්ට පසඟ පිහිටුවා වඳින්න හරි ම දක්ෂ යි. හැමෝම පිංකම් කරන්න, දන්දෙන්න හරි ම දක්ෂ යි. නමුත් හැමෝම ද්වේෂයට පෙරළා ද්වේෂ කරනවා; වෛරයට පෙරළා වෛර කරනවා. හැමෝම පළිගැනීමට පෙරළා පළිගන්නවා. "මම නැවතුණා. ඔබත් නවතින්න" කියන අර්ථවත් පූර්වාදර්ශයක් සමාජයට දෙන්න කව්රුවත් ම ඉදිරිපත් වෙන්නේ නැහැ. "ඔබ මට ද්වේෂ කළා. මම ඔබට ද්වේෂ කරන්නේ නැහැ" කියලා "ඔබ මට වෛර කළා. මම ඔබට වෛර කරන්නේ නැහැ" කියලා "ඔබ මගෙන් පළිගත්තා. මම ඔබෙන් පළිගන්නේ නැහැ" කියලා සිංහනාදයක්

කරන්න සැබෑ ම සිංහල බෞද්ධයෙක් නැති සිංහල ජාතියට තවත් සිංහල අවුරුද්දක් අනිද්දාට උදාවෙනවා.

තෘෂ්ණාව නමැති මධුවිතට ද්වේෂය, වෛරය, පළිගැනීම කටගැස්මක් වී සිංහලකම, බෞද්ධකමේ අර්ථයන් ඇසට පෙනිපෙනී දුර්වල ව යන මොහොතක, පිංවත් ඔබ සියලුදෙනා ම සිංහල බෞද්ධකමේ සැබෑ ම අර්ථය ආර්ය අෂ්ටාංගික මාර්ගයම බව හඳුනාගතහොත් එය සිංහල බෞද්ධ ජාතියට නැවුම් ශක්තියක් වගේ ම අර්ථවත් අවුරුදු උදාවක් ද වෙනවා.

සිංහල අවුරුදු මේසයේ කැවුම්, කිරිබත්, මුං, අතිරස වැනි කැවිලිපෙවිලි තිබෙනවා වගේ ම, අවුරුදු මේසයට වාඩිවෙන පිංවත් ඔබේ ජීවිතය තුළ සම්මා දිට්ඨියේ අර්ථයන් තිබෙන්නට ඕනේ.

පිංවත් ඔබ සිංහල බෞද්ධයෙක් වෙලා උපත ලැබුවේ පෙර කුසල සංස්කාරයක් නිසා ම යි. මේ සටහන් තබන භික්ෂුව උපත ලැබුවෙත් සිංහල බෞද්ධයෙක් වශයෙන්. නමුත් භික්ෂුව දක්ෂවුණා, සිංහල බෞද්ධයෙක් වශයෙන් උපත ලබා, සිංහල බෞද්ධකමේ අර්ථය වන ආර්ය අෂ්ටාංගික මාර්ගය උපයෝගි කොටගෙන ආර්ය ජාතියට පත්වෙන්න. දැන් භික්ෂුවගේ ජාතිය සිංහල ජාතිය නො වේ; ආර්ය ජාතිය යි. ආර්ය ජාතිය කියලා කියන්නේ, මේ ලෝකය හටගත්ත දා පටන් තිබුණ සෑම ජාතියක් ම අනිත්‍යයි කියන ධර්මතාව අවබෝධ කොටගත් ජාතිය යි. නැවත ජාතියක් කෙරෙහි උපාදානය නැති ජාතිය ආර්ය ජාතිය යි.

මේ සටහන් තබන භික්ෂුව ආර්ය ජාතිකයෙක් බවට පත්වුණේ සිංහල බෞද්ධ ජාතිකයෙක් වශයෙන් උපත ලැබුව නිසා ම යි. භික්ෂුව පිංවත් ඔබට සිංහල බෞද්ධ ජාතිය ගැන සටහන් තබන්නේ, සිංහල බෞද්ධයෙක් වශයෙන් ඉපදුණ පිංවත් ඔබටත්, ඔබේ පිංවත් උපතේ ඇති ශ්‍රේෂ්ඨභාවය මතුකොට දීමටයි; පිංවත් ඔබටත් ආර්ය ජාතියේ උපතක් සකස්කොට දීමට උපකාරක ධර්මයන් සකස් කොටදෙන සිංහල බෞද්ධ ජාතිය, මේ මිහිතලය

මත වැඩිපුර එක දවසක් හෝ රැකේවා කියන කැමැත්ත නිසා ම යි. එසේ නැතිව සිංහල බෞද්ධ ජාතිය සදාකාලික ය කියන අර්ථය තුළ සිටිමින් නො වේ.

සියලු සංස්කාරයෝ අනිත්‍ය බව ඇත්ත. මේ අනිත්‍ය ධර්මය නිසා ම යි, යහපත් දෙය, සැපය සකස් කොටදෙන දෙය, දුක නැතිකරන දෙය අපි වැඩිපුර එක දවසක් හෝ ආරක්ෂා කොට ගැනීමට උත්සාහ ගත යුත්තේ. සිංහල අවුරුද්දක් සැමරීමට බලාපොරොත්තුව සිටින මොහොතේ, සිංහල බෞද්ධ ජාතිය ක්‍රමානුකූලව හීන වී යන කාරණය හේතුඵල ධර්මයක් ම බව පිංවත් ඔබ දකින්න ඕනේ. සිංහල බෞද්ධ ජනතාව තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් බැහැරට යනකොට, ඒ අය මරණින් පසුව අන්‍ය ආගමික පවුල්වලයි උපත ලබන්නේ. මේ හේතුඵල ධර්මය නිසා සිංහල බෞද්ධ ජනගහණය හීන වී යමින්, අන්‍ය ආගමික ජනගහණය වැඩිවෙනවා. වර්තමානයේ අන්‍ය ආගමික තරුණයන් අතර තිබෙන සටන්කාමී ස්වභාවයන් ඇසෙනකොට භික්ෂුවට සිහිපත් වෙන්නේ, අතීතයේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් බැහැර ව, සටන්කාමී ව මියගිය සිංහල බෞද්ධ ජනතාව යි. පිංවත් සිංහල බෞද්ධ ඔබ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් බැහැර ව ගියොත්, මරණින් පසු ඔබ මනුෂ්‍ය ජීවිතයක් ලැබුවත්, මිථ්‍යා දෘෂ්ටික පවුලක සාමාජිකයෙක් වශයෙනුයි ඔබ උපත ලබන්නේ. බොහොම නිරවුල් හේතුඵල ධර්මයක්.

සිංහල බෞද්ධ ජනගහණය හීනවෙනවා ය කියලා, පිංවත් ඔබ ජාතිවාදියෙක් වෙලා වැඩක් නැහැ. මොකද, ජාතිවාදී ඔබත් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් බැහැරව, මිථ්‍යා දෘෂ්ටික භාවයට අදාළ සංස්කාරයනුයි රැස්කොට ගන්නේ.

සිංහල අලුත් අවුරුද්දේ ආරම්භය සියලු වැඩ අතහැර නොනගතයෙනුයි පටන් ගන්නේ. සියලු ම කාර්යන්ගෙන් මිදී තෙරුවන්ගේ ආශිර්වාදය ලබා, බෝධි පූජා, බෝධි වන්දනා, පිරිත් සජ්ඣායනා, බණ භාවනා තුළින් අලුත් අවුරුද්දේ උදාවට සැරසෙන්න පිංවත් ඔබට මාර්ගය කියලා දෙන්නේ පින වැඩෙන,

කුසලය වැඩෙන, දුක තුනීවන මාර්ගය හෙවත් ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ඔබව ශක්තිමත් කොට, නව අවුරුදු උදාවට යොමුකිරීමට ම ය. 'නොනගතය' කියන අර්ථය සෑම අලුත් අවුරුදු උදාවකට ම පෙර පිංවත් ඔබට ආර්ය අෂ්ටාංගික මාර්ගය පිළිබඳව මතක්කොට දෙනවා. සිංහල අලුත් අවුරුදු උදාවට පෙර ඔබ ගතකරන නොනගත කාලය, ගමේ විහාරස්ථානය මුල්කොටගෙන, ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩෙන ආකාරයට ගතකිරීමෙන් ලබාදෙන ආදර්ශය, මුළු අවුරුද්ද පුරාවට ම, ඔබේ ජීවිතයේ මුල්තැන ලැබිය යුත්තේ සද්ධර්මයේ අර්ථයන්ට කියන පණිවුඩය ඔබට ලබාදෙනවා. නොනගත කාලයට විහාරස්ථානයට යන ඔබ බෝමළුවේ වාඩිවෙලා, ඔබට මේ උතුම් සිංහල බෞද්ධ ජීවිතය ලබාදුන් සම්මා දිට්ඨියට, ආර්ය අෂ්ටාංගික මාර්ගයට හදවතින් ම වන්දනාව පුදකරන්න; සිංහල බෞද්ධ ජාතියේ උපන් ඔබ, ආර්ය ජාතියේ උපදිනවා ය කියන අධිෂ්ඨානය ඇතිකර ගන්න.

සිංහල අවුරුද්ද සමඟ බැඳී පවතින නැකත් චාරිත්‍ර පිංවත් ඔබ ප්‍රතික්ෂේප කරන්න යන්න එපා. නැකත කියන කාරණය තුළින්, අප්‍රමාදීභාවය කියන කාරණාව මතුකොටගන්න, පිංවත් ඔබ දක්ෂවෙන්න. සද්ධර්මයට අනුව ජ්‍යොතිෂ්‍යය කියන්නේ තිරශ්චීන ධර්මයක් බව ඇත්ත. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, සමාජයත් සමඟ බැඳී පවතින ධර්මතාවයන් වෙනස් කරන්න යන්න එපාය, කියලා. නැකතට අවුරුදු උදාව ඔබට කියලා දෙන්නේ, ලැබුවා වූ අවුරුද්ද පුරාවට ඔබ කරන සෑම ක්‍රියාවක් ම අප්‍රමාදී ව, නියමිත වේලාවට, නියමිත කාලයට කරන්න කියන පණිවුඩය යි. ධර්මානුකූලව උදාවුණු අලුත් අවුරුද්දේ ලෞකික අපේක්ෂාවන් සාර්ථකකොට ගන්නත්, ආයුෂය, වර්ණය, සැපය, බලය අත්‍යවශ්‍ය වෙනවා. යහපත් අවුරුද්දක් සඳහා ආයුෂ, වර්ණය, සැපය, බලයේ අවශ්‍යතාවය, නැකතට ආහාර අනුභවය තුළින් මතුකොට දෙනවා. පවුලේ සමගිය උදෙසා කණ්ඩායමක් වශයෙන් ආහාර ගැනීමත්, සිතෙන සිතෙන, දකින දකින වේලාවට ආහාර ගැනීමකින් තොරව, සුදුසු නිවැරදි වේලාවට පමණක්

ආහාර ගන්න ය කියන පණිවුඩය, වැඩිපුර ආහාර ගැනීම නිසා ම රෝගී ව සිටින වර්තමාන සමාජයට හොඳ ආදර්ශයක් වෙනවා. ආහාර අනුභව කිරීමේ නැකත උදාවෙන තුරු ම කුසගින්නේ සිටීම නිසා ම, අනුන්ගේ කුසගින්නේ වේදනාව පිංවත් ඔබ අත්දැකීමෙන් ම දැනගැනීම නිසා, නැකතට ආහාර අනුභවය පිංවත් ඔබේ දන්දීමේ ශක්තිය ද වැඩි කරනවා.

සම්මා සම්බුද්ධ ශාසනය කියන්නේ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා කියන සතර පිරිසේ ම එකතුව යි. ශාසනයේ සැබෑ ම අර්ථය කියන, භික්ෂු, භික්ෂුණී කියන කණ්ඩායම් දෙක පෝෂණය වෙන්න නම් අනිවාර්යෙන් ම උපාසක, උපාසිකා කියන කණ්ඩායම් දෙකට ශක්තිමත් ආර්ථිකයක් තිබෙන්නට අවශ්‍ය යි. උපාසක, උපාසිකා කියන අය ආර්ථිකයෙන් පිරිහී ගියොත් භික්ෂු, භික්ෂුණී කියන කණ්ඩායම් දෙක සිව්පසය හීනවීම හේතුවෙන් අභියෝගයන්ට ලක්වෙනවා. ඒ වගේ ම යි, කාමයන් තුළ ජීවත්වෙන ගිහි පිංවතුන්ලාගේ ආර්ථික ශක්තිය පිරිහී ගියොත් ධර්ම මාර්ගයට විවේකීව යොමුවීමටත්, දන්දීම, පිංකම් කිරීම වැනි කටයුතුවලටත් බාධා සිද්ධවෙනවා.

මේ හේතුන් නිසා සිංහල අවුරුද්දේ නැකතට ගනුදෙනු කිරීම තුළින්, එකිනෙකා කෙරෙහි විශ්වාසයෙන් හෙවත් බොරුවෙන් තොරව කෙරෙන ගනුදෙනු කිරීම, සම්මා ආජීවයන්ට අදාළව යහපත් ආර්ථිකයක් ගොඩනඟා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව පිංවත් ඔබට පණිවුඩයක් ලබාදෙනවා. සිංහල අලුත් අවුරුද්දේ නැකතට හිසතෙල්ගෑම සහ ස්නානය, බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ, "නිරෝගී බව ජීවිතයේ පරම ලාභය යි" කියන ධර්මතාවයේ අර්ථය පිළිබඳව වසර ආරම්භයේ දී ම පිංවත් ඔබට පණිවුඩයක් ලබාදෙනවා. සිංහල අලුත් අවුරුද්දේ වැඩිහිටියන්ට ගරු කිරීම, වන්දනා කිරීම, සිදු වූ වැරදි ඇතොත් කමාකරගැනීම සම්මා දිට්ඨියේ ම උතුම් අර්ථයක් වෙනවා. දැන් පිංවත් ඔබට තේරුම්යනවා ඇති, සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර සියල්ලක් ම කාමයන් සමඟ ජීවත්වෙන ගිහි පිංවතුන්ලාට ආර්ය අෂ්ටාංගික

මාර්ගය ශක්තිමත් කොටගැනීම උදෙසා ම, ගිහි ජනතාවගේ ලෞකික ආධ්‍යාත්මික දියුණුව උදෙසා ම ඇති කළ ධර්මතාවයක්ය කියලා.

පිංවත් ඔබ, නැකතට ආහාර ගන්න අවස්ථාවේ දී, " මම මේ වසරේ දී පමණ දැන නියමිත වේලාවේ දී පමණක් ආහාර ගන්නවා"ය කියන චිත්තයක් ඇතිකොට ගතහොත්, නැකතට ගනුදෙනු කරන වේලාවට, "මම මේ වසරේ හොර බොරු වංචාවෙන් තොරව, සම්මා ආජීවයට යටත් ව ගනුදෙනු සිදුකරනවා"ය කියන චිත්තය ඇතිකොට ගතහොත්, "මට යමෙක් උපකාර කළහොත් පෙරළා ඔහුට උපකාර කරනවා ය කියන චිත්තයක් ඇතිකර ගතහොත් එම චිත්තය ඇතිකරගත් මොහොතේ ම ඔබ තුළ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව, සම්මා දිට්ඨිය ඇතිවෙලා. මේ මොහොතේ ඔබ ශීලයෙන් පරිපූර්ණ යි. අකුසල් මූලයන් බැහැරවෙලා, කළා වූ කුසල් තව තව ශක්තිමත් කරගැනීමේ සම්මා ව්‍යායාමයක යි ඔබ නිරත වෙන්නේ. අකුසලය බැහැරකොට, කුසලය තුළ සම්මා සතිය සකස්වෙලා, පංචනීවරණ බැහැරව, සමාධිමත්ව නිවැරදිව සිතන්න දක්ෂභාවය ඔබට ලැබිලා, සිංහල අලුත් අවුරුද්දේ ඔබ ඇතිකර ගන්නා එක යහපත් චිත්තයක මුළු ආර්ය අෂටාංගික මාර්ගය ම පෝෂණය වෙනවා. එම නිසා පිංවත් ඔබ සිංහල බෞද්ධයා යනු ආර්ය අෂටාංගික මාර්ගයේ ම අර්ථය බව හඳුනාගෙන, ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩෙන ආකාරයට ම සිංහල අවුරුද්ද ජීවිතයට එකතුකොට ගැනීමට දක්ෂවෙන්න.

සිංහල බෞද්ධ ජාතිය ලෝකයේ ප්‍රෞඪ ජාතියක්. ආඩම්බර වෙන්න කාරණයක් නො වෙයි. සම්මා දිට්ඨිය තුළින් කර්මය-කර්මඵලය විශ්වාසය ඇති පිංවතා දන්නවා, තමා මෙවන් ප්‍රෞඪ ජාතියක උපත ලැබුවේ හේතුඵල ධර්මයක් නිසා ම ය කියලා. ඔහු එම ප්‍රෞඪ ජාතියේ උප්පත්තිය ලැබීම උපයෝගි කරගන්නේ තමාගේත් ජාතියේත් විනාශය සඳහා නො ව තවතවත් සම්මා දිට්ඨියේ අර්ථයන් වැඩෙන දිශාවට ම ය.

සිංහල බෞද්ධයෙක් හැටියට ඉපදුණු පිංවත් ඔබගේ උපතත් මංගල්‍යයක් ම යි. මොකද, පිංවත් ඔබ දුර්ලභ සම්මා දිට්ඨිය දෝතින් දරාගෙන යි උපත ලබලා තිබෙන්නේ. උතුම් සම්මා දිට්ඨියේ අර්ථයන් ජීවිතයට එකතු කොටගෙන ජීවත්වෙන ඔබේ ජීවිතයත් මංගල්‍යයක් ම යි. උපතත් මංගල්‍යයක් නම්, ජීවත්වීමත් මංගල්‍යයක් නම්, අනිවාර්යෙන් ම ධර්මයේ අර්ථයෙන් ජීවිතය පෝෂණය කොටගත් සිංහල බෞද්ධයාගේ මරණයත් මංගල්‍යයක්ම වෙනවා. එය පිරිනිවීමක් වෙන්න පුළුවන්; භවගමන කෙටිකරගත් මාර්ගඵලලාභී මරණයක් වෙන්නත් පුළුවන්; සශ්‍රීක කාම ලෝකයක් වෙන්නත් පුළුවන්. එය සිංහල බෞද්ධකමේ සැබෑ ම අර්ථයක් වෙනවා.

පිංවත් ඔබ යමක් රකින්න නම්, යමක් ආරක්ෂා කොට ගන්න නම් මුලින් ම එහි වටිනාකම දකින්න ඕනේ. පෙර කී සටන්කාමී ස්වභාවයෙන් යුතු කණ්ඩායම් හැරුණු විට, මේ මුළු ලෝකයේ ම ජීවත්වෙන ජනතාව තුළ මෙන් ම අන්‍ය ආගමික පිංවතුන් තුළ, මේ මොහොතේ තිබෙන්නා වූ යම් තරමක හෝ ගුණාත්මක භාවය, සදාචාරාත්මක ස්වභාවය, සිල්වත්භාවය ඇතිවී තිබෙන්නේ සිංහල බෞද්ධ ජාතිය නිසා ම යි. සද්ධර්මයේ උතුම් අර්ථයන්ගෙන් පෝෂිත සිංහල බෞද්ධ ජන සමාජය ලෝකයට මතුකොට පෙන්වන දානය, ශීලය, සමාධිය, මෛත්‍රිය වැනි උතුම් ධර්මතාවයන් හමුවේ අන්‍ය ආගම් ද තම ආගම්වල ගුණාත්මක භාවයන් වැඩිකර ගනිමින් සිටියි. බුද්ධාගමේ ගුණාත්මක අර්ථයන්ට සාපේක්ෂව අන්‍ය ආගම්වල ගුණාත්මක භාවය වැඩිකර නො ගතහොත් එම රටවල බුද්ධිමත් ජනතාව ඉදිරියේ එම ආගම් ප්‍රශ්නකිරීම්වලට ලක්වනු ඇත. මේ හේතුව නිසා ම, වර්තමානයේ අන්‍ය ආගම් ද දානයට, ශීලයට, සමාධියට, මෛත්‍රියට අදාළ ධර්මයන් තම ආගම්වල ගුණාත්මක භාවය වැඩිකරගැනීම සඳහා උපයෝගි කරගෙන ඇත. මේ සියල්ල ලෝකය තුළ සිදුවන්නේ උතුම් සද්ධර්මයේ අර්ථයන් තුළින් ලෝකයට මතු වී එන සත්‍යතාවයන් නිසා ම ය. නමුත් යම් දවසක ලෝකයට බුද්ධාගම ආරක්ෂා කොටදෙන මේ සිංහල

බෞද්ධ ජාතිය, සැබෑ සිංහල බෞද්ධ අර්ථයන්ගෙන් බැහැර ව ගියොත්, සම්මා සම්බුද්ධ ශාසනයේ අර්ථයන් ද විනාශ වී යනු ඇත. එවිට ලෝකයේ අන්‍ය ආගම්වලට තරග කිරීමට ගුණාත්මක තරගකරුවෙක් නැති නිසා ඔවුන්ගේ ආගම්වල ගුණාත්මක භාවයද අතහැර දමනු ඇත. මෙම පරිසරය බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ, මනුෂ්‍යයා තුළ මෘග සංඥාව මතුවීමේ ආරම්භය ද වනු ඇත.

පිංවත් ඔබ මේ මොහොතේ සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර රකිමින් ආරක්ෂා කොටගෙන ජීවත්වන සිංහල බෞද්ධ ජාතිය, වර්තමානයේ සමස්ත ලෝකයේ ම ජනතාව තුළ මානසික සංහිඳීමක් ඇතිකොට දී තිබෙන බව නුවණින් දකින්න. ලෝකය තුළ තුන්වැනි ලෝක යුද්ධයක් තවමත් පමා වී තිබෙන්නේ මේ උතුම් සිංහල බෞද්ධ ජාතිය ලෝකයට දායකකර දී ඇති උතුම් සද්ධර්මයේ අර්ථයන් නිසා ම බව නුවණින් දකින්න දක්ෂවෙන්න. සම්මා දිට්ඨියට පත් සශ්‍රීක දිව්‍යතලවල ජීවත්වන ශක්‍ර දෙවියන් ඇතුළු දිව්‍ය බලමුළු නිතිපතා වන්දනා කරන, දිව්‍යතලවලින් චුතවන දෙවියන්, දිව්‍යාංගනාවන් නැවත ඉපදීමට ප්‍රාර්ථනා කරන, දිව්‍යතලවල දිව්‍ය බලමුළුවලට අලුතින් සශ්‍රීක දෙවියන්, දිව්‍යාංගනාවන් ඕපපාතිකව බිහිකොටදෙන මනුෂ්‍යයාට භව නිරෝධයට, භවයේ සැපයන්ට පාර පෙන්වාදෙන මේ උතුම් සිංහල බෞද්ධ ජාතියේ වටිනාකම ඔබ තේරුම්ගත යුතු යි. සිංහල ජාතික ඇඳුම් පළඳින කොයි කවුරුත් තමන් නියෝජනය කරන සිංහල බෞද්ධ ජාතියේ වටිනාකම තේරුම්ගත යුතු ය.

ලෝක ධාතුවේ මුළු දිව්‍ය, බ්‍රහ්ම, මනුෂ්‍ය ප්‍රජාව තුළ ම කුසලයේ සැපය, මානසික සංසිඳීම ආරක්ෂා කොටදෙන සිංහල බෞද්ධ ජාතියේ වටිනාකම මේ සිංහල අලුත් අවුරුද්දේ තේරුම්ගතහොත් එය මුළු ලෝක ධාතුවේ ම සත්ව ප්‍රජාවට යහපතක් ම වනු ඇත. එහෙත් ලෝභ, ද්වේෂ, මෝහ අකුසල් මූලයන්ගෙන් ජීවිතය පදම්කොටගත් සමාජයට එය දුර්ලභ ම කාරණයක් වනු ඇත.

මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ධුතාංගධාරී භික්ෂූන් වහන්සේලා අතරින් අග්‍රස්ථානයට පත්වුණු මහ රහතන් වහන්සේ වෙනවා. උන්වහන්සේ තරම් ධුතාංග ශීලය රැකි භික්ෂුවක් සම්මා සම්බුද්ධ ශාසනයේ තවත් නැහැ. දිනක් බුදුරජාණන් වහන්සේ මහා කාශ්‍යප මහ රහතන් වහන්සේට කියනවා, "කාශ්‍යප, ඔබ දැන් වයෝවෘද්ධ යි. ඔබට දැන් වෙහෙස වෙන්න බැහැ. එම නිසා ඔබ දැන් ඔය පාංශුකූල සිවුර අතහැරලා පහසු සිවුරක් දරන්න. පිණ්ඩපාතයේ වැඩමකිරීම අතහැරලා, ආරණ්‍යගතව ජීවත්වෙන්න" ය කියලා. ඒ වෙලාවේ කාශ්‍යප මහ රහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේට කියනවා, "භාග්‍යවතුන් වහන්ස, මම ආදර්ශවත් නො වුණොත් වෙන කවුරුන් සංඝ සමාජයට ආදර්ශවත් වෙන්න ද" කියලා. එසේ බුදුරජාණන් වහන්සේගේ ඉල්ලීම නිහතමානීව ප්‍රතික්ෂේප කරනවා. මේ සා ධුතාංග ශීලයෙන් පරිපූර්ණව ජීවත් වූ මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේගේ පිරිනිවීමෙන් අනතුරුව, සියලු සංස්කාරයෝ අනිත්‍යයි, මට වැදගත් වෙන්නේ මාගේ ධුතාංග ශීලය යි කියලා කැලයට වැඩමකොට ධුතාංග ශීලය රැකීමට ගියේ නැහැ. උන්වහන්සේ බොහෝ ම උද්‍යෝගයෙන්, ක්‍රියාශීලීව, අජාසත්ත රජතුමාගේ අනුග්‍රහය ලබාගෙන සම්මා සම්බුද්ධ ශාසනයේ ආරක්ෂාව උදෙසා පළමුවැනි ධර්ම සංගායනාව පැවැත්වුවා. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ එදා පළමුවැනි ධර්ම සංගායනාව නො පවත්වන්න, මේ වන විට සම්මා සම්බුද්ධ ශාසනයත්, සිංහල බෞද්ධ ජාතියත් අතුරුදහන් වෙලා. සියලු සංස්කාරයෝ අනිත්‍යභාවයට පත්වෙන නිසාමයි, ලොවට වැඩ ඇති, සත්වයාට සෙත ඇති, සත්වයාගේ දුක නැතිකරන ධර්මතාවයන් පිංවත් ඔබ මේ මහපොළොව මත එකදිනක් හෝ වැඩිපුර ආරක්ෂා කරගත යුත්තේ. සිංහල බෞද්ධ පිංවත් ඔබට ද මේ උතුම් සිංහල බෞද්ධකම ලෝකයට ආරක්ෂා කරදෙන්න, ඔබේ සිංහල බෞද්ධකම තවතවත් ධර්මයෙන් ගුණාත්මක භාවයට පත්කොට ගැනීමට අනිද්දාට තවත් සිංහල අලුත් අවුරුද්දක් උදාවෙනවා.

(වෙසක් උත්සවය නිමිති කරගනිමින් පිංවත් ස්වාමීන් වහන්සේ විසින් තැබූ සටහනක් මෙතැන් සිට කොටස් දෙකකින් යුක්තව පළකෙරේ.)

අබුද්ධෝත්පාද කාලයන්ගේ කටුක බව ගැන සිතා මේ තෙමඟුල අර්ථවත් කරගන්න

පිංවත් මහත්මයෙක් භික්ෂුවගෙන් ප්‍රශ්නයක් විමසුවා, "ශ්‍රද්ධාවේ සහ අමූලිකා ශ්‍රද්ධාවේ වෙනස කුමක්ද?" කියලා. එම ප්‍රශ්නයට බොහෝ ම සරලව පිළිතුරක් දෙනවා නම් මෙහෙමයිඃ යම් පිංවතෙක් ඇවිත් භික්ෂුවට දානයක් පූජා කරනවා. ඔහු දානය සතුටු සිතින් පූජා කරලා, පිං අනුමෝදන් වෙලා සතුටු සිතින් නිවසට යනවා. අතරමඟ දී ඔහුගේ හිතවතෙක් මුණගැහිලා ඔහුගෙන් අහනවා, "ඔබ කොහේද ගියේ?" කියලා. එවිට දානය පූජා කළ පිංවතා කියනවා, "මම අසවල් ස්වාමීන් වහන්සේට දානයක් පූජා කරන්න ගියා"ය කියලා. එවිට එම හිතවතා කියනවා, "අපෝ! ඇයි ඒ හාමුදුරුවන්ට දන්දුන්නේ? ඒ හාමුදුරුවෝ දුශ්ශීල යි; බොරු කියනවා" කියලා. තම හිතවතාගේ කථාව අහලා, දන් පූජාකරගත් පිංවතා දානය නිසා ඇතිකරගත් චිත්ත ප්‍රීතිය නැතිකොටගෙන ස්වාමීන් වහන්සේ කෙරෙහි සැකයක් ඇතිකොට ගන්නවා. මොකක්ද මෙතැනදි සිද්ධවුණේ? අනුන්ගේ කථාවක් අහලා ඔහු වෙනස්වුණා. මෙය අමූලිකා ශ්‍රද්ධාවේ ලක්ෂණයක්.

තවත් පිංවත් මහත්මයෙක් සිටිනවා. ඔහුත් භික්ෂුවට දානයක් පූජා කරලා, පිං අනුමෝදන් වෙලා සතුටු සිතින් නිවසට යනවා. අතරමඟ දී ඔහුගේ හිතවතෙක් මුණගැසිලා අහනවා, "ඔබ කොහේද ගියේ?" කියලා. එවිට එම පිංවතා කියනවා,

"මම අහවල් ස්වාමීන් වහන්සේට දානයක් පූජා කරන්න ගියා"ය කියලා. එවිට ඒ මිත්‍රයා කියනවා, "අපෝ! ඒ හාමුදුරුවන්ට දන්දීලා වැඩක් නැහැ. ඒ හාමුදුරුවෝ දුශ්ශීල යි; බොරු කියනවා" කියලා. තම හිතවතාගේ මේ කථාව අහලා දන් පූජා කළ පිංවතා කියනවා, "ස්වාමීන් වහන්සේ දුශ්ශීල වුවත්, බොරු කීවත් මට වැඩක් නැහැ. මම උතුම් මහා සංසරත්නය අරමුණුකොටයි ස්වාමීන් වහන්සේට දන් පූජා කළේ" කියලා. තම හිතවතාගේ නොමනා කථාව අහලා ඔහු වෙනස්වුණේ නැහැ. උතුම් සංඝයා කියන අර්ථය තුළ සිටිමින්, තම කුසල් සිත තව තව වර්ධනය කරගත්තා. අනුන් කීවා ය කියලා, පතක පොතක තිබුණා ය කියලා ඔහු තෙරුවන් කෙරෙහි ඇතිකරගත් විශ්වාසය දුර්වල කරගත්තේ නැහැ. එය උතුම් ශ්‍රද්ධාවේ ලක්ෂණයක් වෙනවා. නිරතුරුව ම අනුන් නිසා, තණ්හා, මාන, දිට්ඨි නිසා වෙනස්වෙන අමූලිකා ශ්‍රද්ධාවත්, විශ්වාසයේ අවබෝධයෙන් සරණගිය උතුම් ශ්‍රද්ධාවත්, අමූලිකා ශ්‍රද්ධාවෙන්, උතුම් ශ්‍රද්ධාවෙන් සකස්වෙන කුසල් සහ අකුසල් සංස්කාරයන්ගේ අනිත්‍යභාවය අවබෝධයෙන් ඇතිකොට ගන්නා අචල ශ්‍රද්ධාවත් මූලික ම ලක්ෂණයන් වෙනවා.

තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවේ අර්ථය මුල්කොටගත් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අර්ථය ලෝක සත්වයාට දේශනාකොට වදාළ, ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ උපත, සම්මා සම්බුද්ධත්වයට පත්වීම, පිරිනිවීම යන තෙමඟුල සිදු වූ තවත් වෙසක් පුර පසළොස්වක පොහොය දිනයක් අදහෙට ම උදාවෙනවා.

භික්ෂුව මේ සටහන තබන රාත්‍රියේ පරිසරය වෙලාගෙන පවතින අඩඅඳුර, ලොව ම සඳරැසින් බබලවන්නට මෝදුවන වෙසක් සඳ, අඳුරු වලාවකට මැදිව ඇති බවක් භික්ෂුවට හැඟී යනවා. සම්මා සම්බුද්ධ ශාසනය ගැන සටහන් තබනකොට, භික්ෂුවට මතක්වෙන්නේ, අබුද්ධෝත්පාද කාලයක අඳුරු අර්ථය මොන තරම් කටුක ද කියන කාරණය යි. කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ ශාසනය අතුරුදන් ව ගොස් අවුරුදු ලක්ෂ දහයකට

වැඩි දීර්ඝ අබුද්ධෝත්පාද කාලය අවසන් කරලයි, ගෞතම බුදුරජාණන් වහන්සේගේ පහළවීම සිද්ධවෙන්නේ. උතුම් ශ්‍රී සද්ධර්මයෙන් උපන් සමාජමය සංසිඳීම තුළ, සම්බුද්ධ ශාසනයේ රැකවරණය තුළින් උපන් ගුණාත්මක භාවයන්ගේ සරණින් පිංවත් ඔබට අබුද්ධෝත්පාද කාලයන්හි කටුක බව නො දැනී ගිහින් තිබෙන්නේ.

එම නිසා පිංවත් ඔබ, මේ උතුම් වෙසක් පොහොය දිනයේ, විෂම අබුද්ධෝත්පාද කාලයන්හි කටුක දුක, අකුසල්ම උපදවන මිථ්‍යා දෘෂ්ටීන් ගැන නුවණින් මෙනෙහි කරන්න. දීර්ඝ අබුද්ධෝත්පාද කාලයන්හි මිච්ඡා ශාස්තෘවරු දේශනා කරන මිච්ඡා මාර්ගයන් මොන තරම් අධර්මයක් ද. ලෝකය මැව්වේ මහා බ්‍රහ්මයා ය, ඊශ්වර දෙවියාය යැයි කියා ගිනිපූජා පවත්වමින්, සතුන්ගේ බෙලිකපා යාගහෝම පුදපූජා කරමින්, ගස්, ගල්, ඉර, හඳ, තාරකා වන්දනා කරමින්, යකුන්, යක්ෂණියන්, අමනුෂ්‍යයන් පුදමින්, වන්දනා කරමින්, ගෝව්‍රත, සුනඛව්‍රත රකිමින් විමුක්තිය සෙවූ මිච්ඡා ශ්‍රාවකයින් ධර්මයේ නාමයෙන් සතර අපායන්ට ගාල්කරවන දීර්ඝ අබුද්ධෝත්පාද කාලයන්හි මිච්ඡා ශාස්තෘවරුන්ගේ, මිච්ඡා ධර්මයන්ගේ, මිච්ඡා ශ්‍රාවකයින්ගේ මෝහ මූලික ධර්මතාවයන් නුවණින් දකින්න. පිංවත් ඔබත්, මමත් මෙවැනි දීර්ඝ අබුද්ධෝත්පාද කාලයන්හි උපත ලබා, මෙවැනි මිථ්‍ය දෘෂ්ටීන්ගේ වහලුන් බවට පත් වී සිටි ආකාරය මෙනෙහි කරන්න. බුද්ධොත්පාද කාලයන් තුළත් දේවදත්ත, කෝකාලික වැනි මිච්ඡා ශ්‍රාවකයන් නිසා අවීචි මහා නිරයන්ට වැටුණු අජාසත්ත රජතුමන් ඇතුළු අවාසනාවන්තයින් කොතෙක් සිටින්නට ඇති ද?

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, අබුද්ධෝත්පාද කාලයන්හි සතරඅපායන් පිරී ඉතිරී යනවා ය කියලා. සතරඅපායන් පිරී ඉතිරී යනකොට දිව්‍යතලවල දිව්‍ය විමාන පාළුවී යනවා ය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. අබුද්ධෝත්පාද කාලවල පාළුවට යන දිව්‍ය විමාන නැවත පිරී ඉතිරී යන්නේ

සම්මා සම්බුද්ධ ශාසනයක් ඇතිවීමත් සමඟ ම යි. අබුද්ධෝත්පාද කාලයක විෂම චර්යාධර්මයන් සමඟ ගනිද්දී බුද්ධෝත්පාද කාලයක් යනු මොන තරම් අසිරිමත් දෙයක් ද. දුක හඳුනාගෙන, දුක යටපත් කොටගෙන, සැපය මතුකොට ගනිමින්, අවසානයේ දුකත් සැපත් දෙකේ ම අනිත්‍යභාවය දකිමින් ලෝකයෙන් නිවීයන ධර්ම මාර්ගය මොන තරම් අර්ථවත් ද. මේ උතුම් ධර්ම මාර්ගයට පිංවත් ඔබට පිවිසීමට අවශ්‍ය නම් ඔබ අනිවාර්යෙන් ම බුදුරජාණන් වහන්සේව හඳුනාගන්න ඕනේ; ධර්මරත්නය, සංඝරත්නය හඳුනාගන්න ඕනේ; දකින්න ඕනේ. තුනුරුවන් දැකිය හැක්කේ උතුම් සම්මා දිට්ඨියේ අර්ථයන් ජීවිතයට එකතුකොට ගැනීමෙන් පමණ ම යි. පිංවත් ඔබ කොතෙක් බුදුරජාණන් වහන්සේගේ පිළිම වහන්සේලා දැක්කත්, ඔබ කොතෙක් බුදුරජාණන් වහන්සේ දේශනා කළ සද්ධර්මය ශ්‍රවණය කළත්, පිංවත් ඔබ උතුම් සම්මා දිට්ඨියේ අර්ථයන් ජීවිතයට එකතුකොට නො ගත් පිංවතෙක් නම් ඔබ සැබවින් ම බුදුරජාණන් වහන්සේ නො දැක්ක කෙනෙක් බවට යි පත්වෙන්නේ. උතුම් සම්මා දිට්ඨියේ අර්ථයන් තුළින් පමණක් ම යි, පිංවත් ඔබට තෙරුවන් හඳුනාගන්න, දකින්න පුළුවන්කම ලැබෙන්නේ. උතුම් සම්මා දිට්ඨියේ අර්ථයන්ගෙන් ගිලිහුණු ලෝකය මිථ්‍යාදෘෂ්ටියේ ග්‍රහණයට යි යොමුවෙන්නේ.

මිහිඳු මහ රහතන් වහන්සේ මේ පිංවත් දේශයට උතුම් සද්ධර්මය දායාදකොට දීමෙන් අනතුරුව, අතීතයේ ජීවත් වූ පාලකයන්ගේ සහ ජනතාවගේ සම්මා දිට්ඨියේ අර්ථයන්ගේ දුර්වලභාවයන් නිසා ම, රාජ්‍ය අනුග්‍රහයක් අර්ථවත්ව උතුම් සම්මා සම්බුද්ධ ශාසනයට නො ලැබීම නිසා ම, භික්ෂූන් වහන්සේලාගේ උතුම් උපසම්පදාව දුර්වල වී ශාසනය අතුරුදන් වීම අතීතයේ අවස්ථා කිහිපයක දී ම මේ පිංවත් දේශය තුළ සිදුව තිබෙනවා. සම්මා දිට්ඨියේ දුර්වලභාවයන් නිසා ම ඇතිවන හේතුඵල ධර්මයන් නිසා මෙවැනි ශාසනික අර්ථයන්ගේ අතුරුදන්වීම් සිදුවුවත්, උතුම් ශාසනික අර්ථයන් ආරක්ෂා කරන සම්‍යක්දෘෂ්ටික දෙවිවරුන්ගේ උපකාරක ධර්මයන් නිසා ම අපේ ගෞරවණීය නායක ස්වාමීන් වහන්සේලාගේ අප්‍රතිහත

ධෛර්යෙන් බුරුමය, තායිලන්තය වැනි ථේරවාදී බෞද්ධ රටවලින් නැවත උපසම්පදාව ලබාගෙන, නැවත සම්මා සම්බුද්ධ ශාසනයේ සැබෑ ම අර්ථයන් මේ පිංවත් දේශය තුළ ස්ථාපිත කිරීම කළ බව පිංවත් ඔබ හොඳින් ම දන්නවා. ඉහත කාරණා තුළින් පිංවත් ඔබ තේරුම්ගත යුතු යි, රටක පාලක පිංවතුන් සහ ජනතාව සම්මා දිට්ඨියේ අර්ථයන්ගෙන් දුර්වල වුවහොත් එම පිංවතුන්ලා සම්මා සම්බුද්ධ ශාසනය දුර්වල කිරීමේ බලවත් පාපකර්මයේ හවුල්කරුවන් බවට පත්වෙනවා ය කියන කාරණය.

පිංවත් ඔබ, බුදුරජාණන් වහන්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂ ගණනාවක් තම රුධිරයෙන්, කඳුළින්, දහඩියෙන්, ජීවිත පරිත්‍යාගයෙන් කළ දසපාරමී ධර්මයන්ගේ ඵලයෙන් අවබෝධකොට වදාළ උතුම් සද්ධර්මයේ අර්ථයන් දුර්වල කිරීම පිණිස උපකාරක ධර්මයන් නො කරනවා ය කියන අධිෂ්ඨානය, මේ උතුම් වෙසක් දිනයේ දී ඇතිකොටගන්න දක්ෂවෙන්න. එය පිංවත් ඔබ සැබෑ ම උතුම් තෙමඟුලක් උදෙසා කරන පූජෝපහාරයක් වෙනවා.

සම්මා දිට්ඨියේ අර්ථයන්ගේ දුර්වලභාවය නිසා උදාවෙන අබුද්ධෝත්පාද කාලයන්හි ඇති විෂම බව, දුක් බව, අකුසලය නිසා සකස්වෙන සතරඅපා දුකේ කටුක බව පෙන්වාදෙන උපමාවක් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. පිංවත් ඔබට යම් පුද්ගලයෙක් කියනවා, "මම ඔබට දිනකට කසපහරවල් තුන්සීයක් ගහනවා. දිනකට කසපහරවල් තුන්සීය බැගින් අවුරුදු තුන්සීයක් එම දඬුවම දෙනවා. අවුරුදු තුන්සීයක් ගෙවීයන දින මම ඔබට උතුම් සෝවාන් ඵලය ලබාදෙනවා" කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, එහෙම වුණත් අවුරුදු තුන්සීයක් එම තියුණු ශාරීරික දුක විඳලා ඔබ සෝවාන් ඵලය ලබාගන්න කැමති වෙන්න ය කියලා. මේ උතුම් වෙසක් දිනයේදීත් සතුටින්, විනෝදයෙන්, විහිළුවෙන්, සිංදුවෙන්, බයිලාවෙන් ගතකිරීමට බලාපොරොත්තු වෙන පිංවතුන්ලාට බුදුරජාණන් වහන්සේ පෙන්වාදෙන ඉහත උපමාව හොඳ ධර්මාවවාදයක් වෙනවා.

මෙම කටුක දුක පිංවත් ඔබට හෙළිකොටදෙන කැඩපත වන්නේ උතුම් සම්මා දිට්ඨියේ අර්ථය යි.

භික්ෂුව පිංවත් ඔබෙන් ඇසුවහොත් සම්මා දිට්ඨියේ අර්ථය කුමක්ද කියලා, පිංවතුන් සමහරක් දෙනා දෙන පිළිතුර වන්නේ සම්මා දිට්ඨිය කියන්නේ යහපත් දැක්ම කියලයි. බුදුරජාණන් වහන්සේගේ ධර්මයට අදාළව සම්මා දිට්ඨියේ අර්ථය කියන්නේ 'යහපත් දැක්ම' නො වෙයි. නමුත් අන්‍යාගමික පිංවතුන්ලා තමන්ගේ සම්මා දිට්ඨිය හැටියට ප්‍රකාශ කරන්නේ යහපත් දැක්ම කියන කාරණය යි. බුදුරජාණන් වහන්සේ දේශනා කළ සම්මා දිට්ඨියේ අර්ථයන් හතක් තිබෙනවා.

එම අර්ථයන් වන්නේ,

- තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව,
- යහපත් දෙයක් කළොත් යහපත් විපාකයක්, අයහපත් දෙයක් කළොත් අයහපත් විපාකයක් තිබෙනවා ය කියන විශ්වාසය,
- හේතුඵල ධර්මයන්ට අදාළව නැවත උපතක් තිබෙනවා ය කියන විශ්වාසය,
- දන්දීමෙන්, සිල් රැකීමෙන් ආනිශංස තිබෙනවා ය කියන විශ්වාසය,
- අම්මා තාත්තාගේ ගුණයන් පිළිබඳව විශ්වාසය,
- ඕපපාතික සත්වයන් උපදිනවා ය කියන විශ්වාසය,
- අතීතයේ රහතන් වහන්සේලා වැඩසිටියා ය කියන විශ්වාසය යනාදි යි.

ඉහත සම්මා දිට්ඨියේ අර්ථයන් සියල්ල ම බුදුරජාණන් වහන්සේ දේශනාකොට ඇත්තේ බුද්ධරත්නය, ධර්මරත්නය, සංඝරත්නය මුල්කොටගෙන ය; පිංවත් ඔබගේ කුසල් පක්ෂය වැඩෙන ආකාරයට ම ය.

පිංවත් ඔබට මෙතැනදී විග්‍රහ කර පෙන්වන්නේ භවයේ සැපය උදෙසා හේතුවෙන ලෞකික සම්මා දිට්ඨිය පිළිබඳව යි. ලෞකික සම්මා දිට්ඨියේ මුල් ම අර්ථය වන තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන්, පිංවතුන් තුළ සංසාර බිය පිළිබඳවත්, කාමයන්ගේ නිසරුභාවය පිළිබඳවත් දැක්මක් ඇතිකොට දෙනවා. සතරඅපාය කෙරෙහි ඇතිකරවන බිය නිසා ම පිංවතුන් දුක පිළිබඳව යථා ස්වභාවය නුවණින් දකින්න පටන් ගන්නවා. යහපත් ක්‍රියාවන් විපාක දෙන සුගතිභූමීන්, අයහපත් දේ විපාක දෙන දුගතිභූමීන් ඔබ හඳුනාගන්නවා. ඔබ තුළ සකස්වෙන සෑම සැප වේදනාවක් ම අතීතයේ ඔබ කළ යහපත් දෙයක ප්‍රතිඵලයක් බවත්, ඔබ තුළ සකස්වෙන සෑම දුක් වේදනාවක් ම අයහපත් දෙයක ප්‍රතිඵලයක් බවත් ඔබ හඳුනා ගන්නවා. මෙතැනදී පිංවත් ඔබ අයහපත් දෙයින් වැළකිලා යහපත් දෙයයි ජීවිතයට තෝරාගන්නේ. පටිච්ච සමුප්පන්නව නැවත උපතක් කෙරෙහි පිංවත් ඔබ තුළ ඇති විශ්වාසය ඔබව පොළඹවනවා, අකුසලයෙන් වැළකිලා කුසලය තුළ ශක්තිමත් වෙන්න. මොකද, ඔබ දන්නවා, අකුසල් සිදුකළොත්, සිල්පද දුර්වල කරගත්තොත්, දන්දීම දුර්වල කරගත්තොත් ඊළඟ උපත දුර්වල උපතක් වෙනවා ය කියන කාරණය. කුසලයේ සැපයත්, අකුසලයේ දුකත් ඔබට විවරකොට දෙන බුදුරජාණන් වහන්සේගේ මුල් ම පාඩමයි, උතුම් සම්මා දිට්ඨිය.

ලස්සන වෙසක් සැරසිල්ලෙන් ද අර්ථවත් ධර්මයක් ම දකින්න

පාසල් දරුවෙක් භික්ෂුවගෙන් ප්‍රශ්නයක් විමසුවා, "ඕපපාතික සත්වයන්ගේ උපත පිළිබඳ විශ්වාසය සම්මා දිට්ඨියේ ලක්ෂණයක් වෙන්නේ ඇයි? කියලා. පිංවත් ඔබ, ඕපපාතිකව සත්වයන් උපදිනවා කියලා විශ්වාස නො කරනවා නම් ඔබ දෙවියෙක් බ්‍රහ්මයෙක් ඉන්නවා ය කියලා විශ්වාස කරන්නේ නැහැ. දෙවියන්, බ්‍රහ්මයන් කෙරෙහි විශ්වාසය නැති නිසා ම, ඔබටත් දෙවියෙක්, බ්‍රහ්මයෙක් විය හැකි ය යන විශ්වාසය නැතිව යනවා. ඒ නිසා ම ඔබ කුසලයට පෙළඹෙන්නේ නැහැ. ඕපපාතිකව උපදින ප්‍රේතයන්, නිරිසතුන් ගැන ඔබට විශ්වාසයක් නැති නම් ඔබට ප්‍රේත ලෝකයක්, නිරයක් තිබෙනවා ය කියලා විශ්වාසය නැතිව යනවා. ඒ නිසා ම ඔබ අකුසලයට බිය නැතිවෙනවා. ඕපපාතික සත්ව උපත තුළිනුත් බුදුරජාණන් වහන්සේ ඔබ තුළ අකුසලය බැහැරකොට, කුසලය මතුකොට දීමට යි උත්සාහ ගන්නේ. අම්මා තාත්තාගේ ගුණයන් පිළිබඳ විශ්වාසය කියන කාරණය ගන්න. බුදුරජාණන් වහන්සේ ආනන්තරිය පාපකර්ම ගැන දේශනාකොට මුලින් ම සඳහන් කරන්නේ බුදුරජාණන් වහන්සේගේ ලේ සෙලවීම, දෙවැනිව රහතන් වහන්සේ මැරීම, තෙවැනිව සංඝ භේදය, හතරවැනිව අම්මා ඝාතනය කිරීම, පස්වැනිව තාත්තා ඝාතනය කිරීම, මෙතනදී බුදුරජාණන් වහන්සේ රහතන් වහන්සේ මැරීමත්, අම්මා තාත්තා මැරීමත් කියන කාරණයන් දෙක ම සම අකුසලයන් හැටියට පෙන්වා දී තිබෙනවා. අම්මා තාත්තාත්, රහතන් වහන්සේත් සම තැනක තියලයි බුදුරජාණන් වහන්සේ ආනන්තරිය පාප-කර්ම ගැන

දේශනා කරලා තිබෙන්නේ. එහෙමනම් පිංවත් ඔබ මේ උතුම් වෙසක් දිනයේ දී දැනගන්න ඕනේ, ඔබ කුඩා පාසල් දරුවෙක් වේවා, තරුණ කෙනෙක් වේවා, වැඩිහිටියෙක් වේවා තමන්ගේ දෙමව්පියන්ට පීඩා කරනවා නම්, හිංසා කරනවා නම්, සිත්වේදනා දෙනවා නම්, නො සලකා හරිනවා නම්, එය රහතන් වහන්සේ නමකට ඔබ කරන පීඩාවක්, හිංසාවක් තරමට ම බලවත් අකුසලයක් වෙනවා ය කියන කාරණය. උතුම් සම්මා දිට්ඨියේ අර්ථයන් ජීවිතයට එකතුකොට ගැනීමෙන් පමණක් ම යි, පිංවත් ඔබට දෙමව්පියන් නිසා සිදුවෙන බලවත් අකුසලයන්ගෙන් මිදෙන දිශාවට ගමන් කළ හැකිවෙන්නේ; අම්මා තාත්තා නමැති කුසල් නිධියෙන් සිත් සේ කුසල් ධර්මයන් එකතුකොටගත හැකි වෙන්නේ. අතීතයේ රහතන් වහන්සේලා ඇතුළු අධිගමලාභීන් සිටියා ය කියන විශ්වාසය ඔබ තුළ තිබුණොත් පමණ ම යි, පිංවත් ඔබටත් මේ උතුම් සම්මා සම්බුද්ධ ශාසනයේ දී ම රහතන් වහන්සේ නමක් වීමට හැකි ය යන විශ්වාසය ඇතිවෙන්නේ; ඔබටත් සෝවාන් ඵලයට පත්වෙන්න පුළුවන් ය කියන විශ්වාසය ඇතිවෙන්නේ. ඉහත සම්මා දිට්ඨියට අදාළ කාරණා තුළින් පිංවත් ඔබට තේරෙනවා ඇති, බුදුරජාණන් වහන්සේ පිංවත් ඔබ තුළ මුලින් ම තෙරුවන් කෙරෙහි විශ්වාසය ඇතිකොට, අවසානයේ උතුම් රහතන් වහන්සේ නමක්, සෝවාන් පුද්ගලයෙක් කියන ඉලක්කයට ඔබව යොමුකොට තිබෙනවා ය කියන කාරණය. පිංවත් ඔබ සම්මා දිට්ඨියේ අර්ථයන්ගෙන් බැහැරව ගියොත්, තෙරුවන් කෙරෙහි අවිශ්වාසය ඇතිකොට ගෙන, අවසානයේ ඔබව සතරඅපායට යොමු වීම යි සිද්ධවෙන්නේ. පිංවත් ඔබ, ශ්‍රද්ධාවේ සහ අශ්‍රද්ධාවේ වෙනස සහ පරතරය හඳුනාගෙන, ශ්‍රද්ධාව ඉලක්කකොට පෙන්වන සතරඅපාය කියන අර්ථයන් සිහිනුවණින් දකිමින්, නිවැරදි ආකාරයට සම්මා දිට්ඨියේ අර්ථයට ප්‍රවේශවීමට මේ උතුම් වෙසක් සතියේ දී අධිෂ්ඨානයක් ඇතිකොට ගතහොත් එය පිංවත් ඔබ විසින් බුදුරජාණන් වහන්සේට දක්වන ශ්‍රේෂ්ඨතම ආමිසමය, ප්‍රතිපත්තිමය පූජාව වෙනවා.

පිංවතුන්ලාගේ ඉන්ද්‍රිය ධර්මයන්ගේ ඇති වෙනස් භාවයන් නිසා ම, කෙනෙක් ප්‍රතිපත්ති පූජාවෙන් බුදුරජාණන් වහන්සේට පූජා පවත්වා සතුටුවෙන අතර තවත් පිංවතෙක් ආමිස පූජාවෙන් බුදුරජාණන් වහන්සේට පූජාවන් පවත්වා සතුටුවෙනවා. මෙතැනදී ප්‍රතිපත්ති පූජාවන් හැටියට ගැනෙන්නේ විදර්ශනා නුවණ, ප්‍රඥාව ඔබ තුළ මෝදුකොට දෙන භාවනාමය, ශීලමය, සද්ධර්ම ශ්‍රවණය කිරීම් තුළින් ඔබ ඇතිකොට ගන්නා විදර්ශනා නුවණින් බුදුරජාණන් වහන්සේට පූජෝපහාර දැක්වීම යි. නමුත් පිංවත් ඔබ ශීලමය, භාවනාමය, සද්ධර්ම ශ්‍රවණමය ක්‍රියාවන් තුළිනුත් ඇතිකොට ගන්නේ ආස්වාදයක් නම්, ඒවා ජීවිතයට එකතුකොට ගැනීම නිසා ඇතිවෙන කුසල් ආස්වාදයට ඔබ බැඳී යන්නේ නම්, එම කුසල් සංස්කාරයන්ගේ අනිත්‍යභාවය ඔබ විදර්ශනා නුවණින් නො දකින්නේ නම් ඔබ කළා වූ ප්‍රතිපත්ති පූජාව ද නැවත භවය සකස්කොට දෙන ආමිස පූජාවක් බවට ම පත්වනු ඇත. එම නිසා පිංවත් ඔබ සිල් සමාදන් වෙමින්, ශීලයේ ආනිශංස ජීවිතයට ලබමින් එම ආනිශංසයන්ගේ අනිත්‍යභාවය නුවණින් දකින්න. බුදුගුණ භාවනාව වඩමින්, මෛත්‍රී භාවනාව වඩමින්, ආනිශංස ජීවිතයට ලබමින් එම සංස්කාරයන්ගේ අනිත්‍යභාවය නුවණින් දකින්න. කාය, චිත්ත, ධම්ම, වේදනා සතර සතිපට්ඨාන ධර්මයන් වඩමින්, සප්ත බෝජ්ඣංග ධර්මයන් ජීවිතයට එකතුකොට ගනිමින්, සතර සතිපට්ඨාන ධර්මයන්ගේත්, සප්ත බොජ්ඣංග ධර්මයන්ගේත් අනිත්‍යභාවය නුවණින් දකින්න. පින්වත් ඔබ භාවනාවේ දී යම් ධර්මතාවයක අනිත්‍ය දකිනවා ද, එම අනිත්‍ය දකින සිතත් අනිත්‍ය වශයෙන් දැකීමට දක්ෂ විය යුතු යි. එසේ නො වුණහොත් ඔබ අනිත්‍ය වශයෙන් දැක්කා වූ සිතට බැඳී යනු ඇත.

පිංවත් ඔබ දක්ෂ නම් ඔබ වෙසක් මංගල්‍යය උදෙසා සිදුකරන ආමිස පූජාවන් තුළින් ද ප්‍රතිපත්ති පූජාවන් මතුකොට ගැනීමට ඔබට හැකි ය. පිංවත් ඔබ වෙසක් කූඩුවක් තැනීමේ දී, ප්‍රදර්ශනය කිරීමේ දී, දන්සලක් සංවිධානය කිරීමේ දී, මේ සෑම ක්‍රියාවක්

ම සිදුකිරීමට පෙරාතුව, තෙරුවන් සරණ පිහිටා, පංචශීලය සමාදන්ව එම ආමිස පූජාව ආරම්භ කරන්න. අතීතයේ සම්මා සම්බුද්ධ ශාසන ලක්ෂ ගණනක දී අද වගේ ම උතුම් තෙමගුල් සැමරීම උදෙසා ලක්ෂ ගණන් පහන් කූඩු, වෙසක් සැරසිලි, දන්සල්, බුද්ධ පූජාවන් පූජා කළ හැටි නුවණින් දකින්න. ඒ අතීත සම්මා සම්බුද්ධ ශාසන අනිත්‍යයට ගියා සේ ම අතීතයේ දී ආමිස පූජාවන් තුළින් රැස් කළා වූ කුසල් සංස්කාරයන් අනිත්‍ය වී ගිය හැටි නුවණින් දකිමින්, මේ මොහොතේ පිංවත් ඔබ ආමිස පූජාවන් තුළින් රැස්කොට ගන්නා කුසලයන් අනිත්‍ය වී යන හැටි නුවණින් දකින්න. බුදුරජාණන් වහන්සේ උදෙසා, ධර්මරත්නය, සංඝරත්නය උදෙසා, තුනුරුවන්ට ගෞරවය පුදකිරීම උදෙසා පිංවත් ඔබ තුළ සකස්වෙන සෑම ආස්වාදජනක සිතක් ම, කුසල් සිතක් ම සංස්කාරයන් බව දකිමින්, එම සංස්කාරයන් විපාක දී අවසන් වන ඒවා බව දකිමින්, පිංවත් ඔබ මේ උතුම් තෙමගුල සමරන සතියේ ඔබ සිදුකරන ආමිස පූජාව තුළින් ද උතුම් ප්‍රතිපත්ති පූජාවක් මතුකොට ගන්න දක්ෂවෙන්න. එවිට ලස්සන වෙසක් සැරසිල්ලක් තුළින් අර්ථවත් ධර්මයක් ද ඔබගේ ජීවිතයට එකතුකොට ගෙන, උතුම් සම්මා දිට්ඨියේ අර්ථයන් තුළින් ආර්ය අෂ්ටාංගික මාර්ගයට ඔබේ ජීවිතය සේන්දුකොට ගැනීමට හැකිවනු ඇත.

(දෙසැම්බර් 31 දා රාත්‍රිය විපරීත ලෙස ගෙවාදමමින් නව වසරකට සැරසෙන, මුළාව දෙසට යන සමාජයට යහමග දක්වීමේ චේතනා පෙරදැරිව පිංවත් ස්වාමීන් වහන්සේ වෙතින් මෙය ලියැවුණි.)

බුදු සිතක උපදිනා සිතිවිල්ලක් ඔබේ සිත තුළත් උපදවාගන්න

දෙසැම්බර් 31දා රාත්‍රියේ නගරයේ මෙන් ම ගමේත් ඇසට පෙනෙන, කනට ඇසෙන පැත්තට, සාමාන්‍ය ස්වභාවයට වඩා වෙනස් ස්වභාවයකුත් වර්තමාන සමාජය තුළ වර්ධනය වෙනවා. හෝටල්වල පෞද්ගලිකව වෙන්කරගත් ස්ථානවල නව වසර උදාව සමරන අයට අවුරුදු උදාවෙන්නේ අඳුරේ. ප්‍රඥාවේ ආලෝකයක් මේ අයට කොහොමටවත් නැහැ. ජල විදුලියේ, තාප බලාගාරයේ ආලෝකය පමණයි තිබෙන්නේ. එම ආලෝකයත් නිවාදමා, අඳුරේ තමයි අවුරුදු උදාවට අවතීර්ණ වෙන්නේ. ඒකෙන්ම පෙනෙනවා අවිද්‍යා සහගත සිත, ආලෝකයට ඇති අකමැත්ත. ආලෝකය නිවාදමා අඳුරට කැමතිවන්නේ අනුසය වශයෙන් ඉතිරිවෙලා තිබෙන හිරි ඔතප් දෙකත් ඒ රාත්‍රියේ නැති කරගන්න. හිරි-ඔතප් දෙක නැතිවුණ තැන තවත් නැතිවෙන්න දෙයක් තිබෙනවාද?

වසරක ආරම්භය මේ අය විසින් පටන්ගන්නේ ශීලයට ඍණාත්මක අගයක් දෙමින්. ශීලයෙන් ගිලිහුණ ජීවිතයක ලෝභ, ද්වේෂ, මෝහ අකුසල මූලයන් සරුසාර ලෙස වැඩෙනවා. මෙවන් සිත්වලින් ලබන්නා වූ වසරට කුමන ආධ්‍යාත්මික ශාන්තියක් ද? භෞතික දියුණුවක් නම් සැලසේවි. ඒ බව සමාජයෙන් හොඳින් පෙනෙනවා, සැකයකින් තොරව ම. එහෙත් එය සතුටු විය හැකි කාරණයක් නම් නො වේ.

පරලොව යහපත ගැන බලනකොට, ලබන්නා වූ වසරේ අවම වශයෙන් පංචශීලයවත් රැකගැනීමට අධිෂ්ඨානයක්

ඇතිකර නොගන්නා තැනැත්තා තමා තමාටවත් උපකාරයක් කර නො ගත් තැනැත්තෙක් වෙනවා. ඔහු කෙසේ අනුනට උපකාර කරන්නද? කෙසේ නම් අනුනට ආශිර්වාද කරන්නද? ඔහු කෙසේ නම් ධර්මයේ අර්ථයක් අත්දකින්න ද? ධර්මයේ අර්ථයන් අත්දකින්නේ නැති තැනැත්තා රාත්‍රී 12ට අවදි වී සිටියත් මෙලොව, පරලොව දෙකේ ඔහු ප්‍රමාදීභාවයට පත්වෙනවා. මේ අයෝනිසෝ මනසිකාරයෙන් යුතුව ඔබ සිදුකරන්නා වූ ක්‍රියාවන් නිසා ඔබට පැහැදිලි ව විවරව තිබෙන ධර්ම මාර්ගය ඔබ විසින්ම වසාගන්නවා. ඔබ මේ ජීවිතයේ සශ්‍රීකභාවය ලබන්න, පෙර ජීවිතයේ දී මොන තරම් දානමය, ශීලමය පිංකම් සිදුකරගෙන තිබෙන්න ඕනෙ ද? අතීත භවයන්හි දී මනුෂ්‍ය ජීවිතවල ඉපදී සිදුකරගත් කුසල් විපාකවල සැපය, මේ ජීවිතයේ දී අත්විඳිනකොට ඔබ ඒ සශ්‍රීකභාවය, මහේශාක්‍යභාවය, සෞභාග්‍යවත් ජීවිතය අත්විඳින්නේ, පිංවත් ඔබට අතීතයේ උපකාර වූ දානයට, ශීලයට මේ ජීවිතයේදී සෘණාත්මක අගයක් ලබාදෙමින් නේ ද? මේ සෘණාත්මක බව නේ ද, වර්තමාන සමාජයේ ඇසෙන අවිද්‍යාවේ කන් බිහිරි කරවන හඬ? ශීලය ම යි පිංවත් ඔබට උපකාර වූයේ, මේ උතුම් මනුෂ්‍ය ජීවිතය ලබන්නට. දානය ම යි ඔබට උපකාර වූයේ, මේ උතුම් මනුෂ්‍ය ජීවිතයේ ආයුෂ, වර්ණ, සැපය, බලය ලබන්නට. ඒ නිසා පිංවත් ඔබ, කෘතවේදී ව, සත්පුරුෂ භාවයෙන් යුතුව ඔබට උපකාර වූ ධර්මතාවයන් ගරුකරන්න. ඒවා ම ජීවිතයේ වටිනාකම් බවට පත්කරගන්න. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන්, කර්මය-කර්මඵල පිළිබඳ විශ්වාසයෙන් පිංවත් ඔබ ශීලමය, දානමය පිංකම්, උදාවෙන සෑම නව වසරක ම ඔබට මුණගැසෙන කල්‍යාණ මිත්‍රයා කරගන්න; ඔබට සුබපතන හිතවතා කරගන්න. ඒ කල්‍යාණ මිත්‍රයා ඔබට සුබපැතුවොත් පමණක්මයි, ඔබ ලැබූ උතුම් මනුෂ්‍ය ජීවිතය සුබ ජීවිතයක් වෙන්නේ; ලැබුවා වූ නව වසර සුබ වසරක් වෙන්නේ.

මේ කල්‍යාණ මිත්‍රයා ඔබ තුළ ම යි සැඟ වී සිටින්නේ. මොහු සැඟ වී සිටින්නේ ලෝභ, ද්වේෂ, මෝහ නමැති මාරධර්මයන්ට බියෙන්. එසේත් නැතිනම් මාරධර්මයන් කෙරෙහි ඇතිකරගත්

ඡන්දරාගය නිසා ඔබට සැඟවෙමින්. පිංවත් ඔබ දක්ෂවෙන්න ඕනේ, මේ බියෙන් ඔබේ කල්‍යාණ මිත්‍රයා මුදවාගන්න; ඉස්මතු කොටගන්න. එය කරන්න පුළුවන් වන්නේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව, කර්මය, කර්මඵල පිළිබඳ විශ්වාසය ඔබ තුළ ඇතිකර ගැනීම තුළින්. මේ කාරණා දෙකේ අර්ථයෙන් ඔබ සන්නද්ධ වෙනකොට ඔබේ කල්‍යාණ මිත්‍රයා ශක්තිමත් භාවයෙන් නැඟීසිටිනවා; ඔබව කුසල් මාවතට යොමුකරනවා; සතරඅපායෙන් මිදීමේ මාවතට ඔබව යොමුකරනවා. භික්ෂුව මේ දේවල් සටහන් කළත් මේවා අර්ථවත් ව ක්‍රියාත්මකවීම බොහොම දුර්වල යි. ඒ නිසා ඔබ අනුන් ගැන සිතන්න එපා. ඔබ තනිතනි ව ඉහත සටහන ජීවිතයට ගළපාගන්න. ලෝකය, ලෝකයේ ස්වභාවයෙන් පවතීවි. පිංවත් ඔබ ලෝකයෙන් මිදීමේ ස්වභාවයට එන්න. ලෝකයෙන් මිදීමේ ස්වභාවයට සැමවිට තිබෙන්නේ අඩු පෝළිම බව ඔබ සිතන්න ඕනේ. සෙනඟ වැඩි, පිරිස වැඩි පෝළිම හැමදාමත් ලෝකයේ පැවතීම දෙසටයි තිබෙන්නේ. ඒ කියන්නේ, දුක දෙසට. මාරයාගේ ලෝකයේ ව්‍යවහාර මුදල් තමයි, දුක. සමාජය අලුත් වටිනාකම් හැටියට සොයාගන්නා, ක්‍රියාත්මක කරන දේවල අවසාන ප්‍රතිඵලය දුකයි. ඇයි පිංවත් ඔබට බැරි, ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ සිතේ ඇති වූ සිතිවිල්ලක් ජීවිතයේ තීරණාත්මක අවස්ථාවක, ජීවිතයේ සුබ අවස්ථාවක ඔබේ සිතිවිල්ලක් කරගන්න? ඇයි ඔබට බැරි, අතීතයේ වැඩසිටියා වූ රහතන් වහන්සේ නමකගේ සිතෙහි ඇති වූ සිතිවිල්ලක් ඔබේ සිතිවිල්ලක් කරගන්න? එවන් උත්තමයකුගේ සිතෙහි ඇති වූ සිතිවිල්ලක් අපිට සිතන්න බැහැයි කියමුකෝ. එහෙමනම් ගිහි ජීවිත ගතකළ අනේපිඬු සිටුතුමන්, විශාඛාව වැනි ධර්මයෙන් ජීවිතය ජයගත් පිංවතුන්ගේ සිතෙහි ඇති වූ සිතිවිල්ලක් ඔබ ඔබේ සිතිවිල්ලක් කරගන්න. එහෙම සිතනකොට මොන තරම් සැනසිල්ලක් ද ජීවිතයට. මෙවැනි ශ්‍රද්ධාවෙන් සකස්වෙන සිතිවිල්ලකට පුළුවන්, ඔබට අප්‍රමාණ සැපයක් මෙලොව, පරලොව වශයෙන් ලබාදෙන්න. පිංවත් ඔබ, දෙසැම්බර් 31 රාත්‍රියේ රතිඤ්ඤාවක් පත්තුකරලා ඔබ ම එහි

පිපිරුමට බියෙන් ඈතට දුවනවා. නැතිනම් රතිඤ්ඤා කරල ඈතට විසිකරනවා. රතිඤ්ඤාව පත්තු වෙනකොට එහි පිපිරුම් හඬට බියෙන් ඔබ ම ඔබේ කන්දෙක වසාගන්නවා. ඒ කියන්නේ, ඔබ ම එම ක්‍රියාවෙන් පීඩාවට පත්වෙනවා. ඔබ පීඩාවට පත්වෙමින් අන්‍ය සත්වයින්වත් පීඩාවට පත්කරනවා. අවසානයේදී එකම රාත්‍රියේ දී සියල්ලෝ ම පීඩාවට පත්වෙලා. රතිඤ්ඤාව පත්තුකරන කෙනා තුළ සතුටක් ඇතිවෙනවා තමයි. එම සතුටත් කාමච්ඡන්දයන් ගණයටයි වැටෙන්නේ. කාමච්ඡන්දයන් කියලා කිව්වේ පංචනීවරණයෙන් එක ධර්මතාවයක්. මාරයා විසින් සත්වයා සතරඅපායෙන් එතෙරවීම වැළැක්වීම සඳහා දමන මරතොණ්ඩුව තමයි, කාමච්ඡන්දය කියන්නේ. නව වසරක උදාවට පිංවතුන්ලා නොදැනුවත් භාවය නිසා ම මාරයාගේ මරතොණ්ඩුවක් සියතින් ම ගෙලට දමාගෙන.

තෙරුවන් සරණ ගිය පිංවත් ඔබ, ජීවිතයේ සෑම විශේෂ අවස්ථාවක දී ම ජීවිතය පටන්ගන්න ඕනේ, තෙරුවන් ගුණය කෙරෙහි හිත පිහිටුවලා; ශීලයේ අර්ථයෙහි සිත පිහිටුවලා. එතැනයි, ඔබේ ජයග්‍රාහී ගමනක ඇරඹුම. ආගන්තුකව පැමිණෙන වටිනාකම් ඉදිරියේ පිංවත් ඔබට ඔබේ බෞද්ධකම අමතක වෙනවා. 'සතිය, සිහිය අඩුයි'. තරංගයට වැටීමට යි කැමති. තරංගයෙන් මිදීමට කැමති නැහැ. තරඟයට වැටුණු කෙනාට ජය, පරාජය දෙකෙන් එකක් උරුම යි. තරඟයෙන් මිදුණ කෙනා මේ දෙකෙන් ම මිදීමේ මාර්ගයට යි අවතීර්ණ වෙන්නේ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, සත්වයා නිරතුරුවම යෝනිසෝ මනසිකාරය නැතිවීම හේතුවෙන් භවාශ්‍රවයන් වැඩෙන දිශාවටයි ගමන් කරන්නේ කියලා. අන්‍යයන්ටත්, තමන්ටත් පීඩා ගෙනදෙන නො කළයුතු දෙය, දුරු කළයුතු දෙය, මඟහැර යා යුතු දෙයින් මිදෙන්නට වීර්ය නොමැතිනම්, භෞතික වශයෙන් ඔහු කොතෙක් දියුණු වුව ද අඥාණවත් පෘථග්ජන භාවයේ පරාජය ම යි ඔහුට හිමිවන්නේ. නොවටිනා සැපයක් උදෙසා, ඔහු වටිනා අර්ථයක් අහිමිකර ගන්නවා. රතිඤ්ඤාවක

ආලෝකයට, හඬට මුළා වී එය විඳීමට යාමෙන් රැස්වන අකුසල් හේතුවෙන්, නිරයේ දිලිසෙන ගිනි ජාලාවකට වැටුණහොත් කවදා කෙලෙස නම් ගොඩඑන්න ද? එදාට ඔබේ කඳුළු පිසදැමීමට, දුක නැති කිරීමට කිසිවෙක් නොමැත. රතිඤ්ඤාවකට ඔබේ ඇඟිල්ලක් පිළිස්සුණොත් ඔබ මොන තරම් වේදනාවක් විඳිනවාද? එහෙමනම් නිරයේ ගිනිජාලා තුළ සත්වයා විඳින වේදනාව ඔබ ම සිහිකොට ගන්න. මෙම දුක ඔබට, මට නුහුරු දෙයක් නො වේ. ඒ සාංසාරික පුරුද්ද නිසා තමයි, අපි තවමත් ගින්දරට, අඳුරට කැමති. දක්ෂයා ගින්දරත්, අඳුරත් නිවැරදිව හඳුනාගෙන, ගින්දරත්, අඳුරත් උරුම සතරඅපායෙන් මිදීමේ මාවතට යි ගමන් කරන්නේ. පිංවත් ඔබ ජීවිතයේ සෑම සිහිකටයුතු අවස්ථාවක දී ම සිල්පදයක් රැකීමෙන් ලබන අප්‍රමාදීභාවය ජීවිතයට ලබාදෙන්න; දානයක් පූජාකර ගැනීමෙන් ඔබ ලබන නිර්ලෝභී සතුට ම ජීවිතයට ලබාදෙන්න; තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් ඔබ ඇතිකරගන්නා ආත්ම විශ්වාසය ම ඔබේ ජීවිතයට ලබාදෙන්න. මීට විරුද්ධ මාර්ගයේ ගමන් කොට ඔබ ඔබෙන් පළිගන්න එපා. පෙර ජීවිතවල දී ඔබ ඔබේ ම ශක්තියෙන් ගොඩනගාගත් කුසල් ශක්තිය අකුසලයේ දුකින් යටපත් වෙන්න දෙන්න එපා.

වසරක් උදාවෙන්නේ වසරක අවසානය ද, මරණය ද දෝතින් දරාගෙන ය. නමුත් මරණය නො දකින ඔබ, වසරේ ආරම්භය ප්‍රීතියෙන් සමරයි. ඉපදී දින 365කින් මැරෙන අවුරුද්දක ආරම්භය උදෙසා, භවයට යන අකුසල් රැස්කර ගැනීම ගැන අපි අවධානය යොමුකළ යුතු ය. වසරක උදාව ළංවෙනකොට සමාජය හුඟක් කතා කරන්නේත්, ජනතාව දැනුවත් කරන්නේත්, අනතුරු හඟවන්නේත් ආරක්ෂාකාරී ලෙස රතිඤ්ඤා පත්තුකරන ලෙසය. මෙහිදී ආරක්ෂාව යනු ශරීරය ගිනි අනතුරුවලින් වළක්වා ගැනීමේ ආරක්ෂාව යි. අතපය පිළිස්සුණ හොත් එය සතියකින්, මාසයකින් සනීප වේවි. එහෙත් මෙහි අකුසල් ස්වභාවයන් ගැන අවධානය යොමු නො කර, නැවත නැවත එම ක්‍රියාවන් කිරීමෙන් මරණින් මතු නිරයේ ගිනි ජාලාවකට වැටුණහොත් කල්ප ගණන් එම දුක ඔබට විඳීමට සිදුවනු ඇත.

පිංවත් ඔබ, වසරක් උදාවෙන මොහොතේ පන්සලේ, නිවසේ, බුදුකුටියේ පහන් ආලෝකය දල්වා, දසදිශාවට ම මෛත්‍රිය පතුරවමින් පෙනෙන නො පෙනෙන සියලු සත්වයින්ට මෛත්‍රිය කොට වසර ආරම්භ කරන්න. එවිට දෙවියන්, අමනුෂ්‍යයින් පවා ඔබට ප්‍රිය වේවි. එය ඔබට මෙලොව, පරලොව දෙකට ම යහපත පිණිස වේවි. අත් පිළිස්සෙන්නේවත්, ඇස් අන්ධවන්නේවත්, අපාගතවෙයි කියලාවත් බියක් ඇතිවෙන්නේ නැහැ. සම්බුදු වදනක් ක්‍රියාත්මක කළා ය කියන ආත්ම තෘප්තිය ම යි ඇතිවන්නේ. එම ආත්ම තෘප්තිය, සතරඅපායෙන් ඔබ්බට ඔබව ඔසවා තැබීමට වසර පුරාවට ඔබට මාර්ගය පෙන්වාදේවි. අපිට කියන්න පුළුවන් ද, ලෝකය පුරාවට ඇතිවෙමින් පවතින දේශගුණික විපර්යාසයන් හේතුවෙන් අපේ ජීවිත කුමන මොහොතක විනාශ වී යයි ද කියලා? ඒ අවදානම ජයගැනීම උදෙසායි, ඔබ ක්‍රියාකළ යුත්තේ. ඔබ නිරතුරුව ම ජීවත්වීම යි අභියෝගයක් හැටියට දකින්නේ. ඔබ අභියෝගයක් හැටියට දැකිය යුත්තේ උපත යි. මේ අභියෝගයෙන් මිදෙන්න උත්සාහ ගන්නා පිංවතා උපරිම වශයෙන් ජීවිත හතකට එය සීමාකර ගන්නවා. මෙන්න මේ ජයග්‍රහණය අත්කරගත් පුද්ගලයා යි 'ජීවිතය ජයගත්තා'ය කියන තැනැත්තා. එතැනින් මෙහා ජීවිතයක මොන ජයක්ද?

සමාජය මනින මිනුම් දඬුවලින්, සමාජ වටිනාකම්වලින් ජීවිතය ජයගත්තා ය කියන සමහරක් නායකයින්, ප්‍රභූ පුද්ගලයින් ගැන ඔබ සිහිනුවණින් බලන්නකෝ. පිංවත් එම පිරිස් වෘත්තියෙන්, ව්‍යාපාරයෙන්, දැනුමෙන්, වත්පොහොසත්කම්වලින් ජයගන්න බව ඇත්ත. ඒත් ඒ ජය ඔවුන් ලබාගන්නේ ශ්‍රද්ධාව, ශීලය යන ධර්මයන් උගසට තියලා. ඊළඟ ජීවිතයේ දී මේ අයට, ලැබුවා වූ මහේශාක්‍ය භාවය නමැති මුදලත්, ඊට අදාළ පොළියත් දෙක ම ගෙවන්න වෙනවා. පෙර මනුෂ්‍ය ජීවිතවල ඉපදිලා, ශ්‍රද්ධාවත්, ශීලයත් උගසට තබා ජීවිත ජයගන්න අය තමයි, ඔය ප්‍රේත, තිරිසන් නිරයේ උපත ලබා, දුක නමැති මුදලත්, පොළියත් දෙකම සිය කැමැත්තෙන් ම ගෙවමින් ඉන්නේ. ඔබේ ඔය ඇස් ඉදිරිපිටම

ඉන්න තිරිසන් සතුන් කියන්නේ, පෙර ජීවිතවල හොඳ හොඳ මනුෂ්‍යයෝ ම තමයි. හොඳට හම්බකරලා, දේපළ රැස්කරලා, පංචකාම සම්පත් රිසි සේ භුක්තිවිඳල, ශ්‍රද්ධාව, ශීලය, දානය කියන දුකින් මිදෙන දිශාවට ඔබට පිහිටවෙන ධර්මයන් අමතක කරපු මනුෂ්‍යයෝ. මෙන්න මේ ගැන සිතන කෙනායි, සසර බිය ඇතිකර ගන්නේ. ඔහු මතවාද, දෘෂ්ටි, විචිකිච්ඡාව සකස්කර ගන්නේ නැහැ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කළ මාර්ගයට ම අවතීර්ණ වෙනවා. සමාජයේ ගුරුවරුන් අප්‍රමාණව සිටිනවා. අප්‍රමාණ පතපොත තිබෙනවා. මේවා ලෝකයේ පැවතිය යුතු ස්වභාවයන්. විවිධත්වය කියන්නේ අනිත්‍යය යි.

අනිත්‍ය තිබෙන්නේ ගැටෙන්න නො වේ; මඟහැරයන්න නොවේ; අවබෝධකොට ගැනීමට යි. පිංවත් ඔබට අවබෝධය කරා යෑමට පහසු ම මාර්ගය, ලොව්තුරා බුදුරජාණන් වහන්සේ තමාගේ එක ම ගුරුවරයා බවට පත්කොට ගැනීමයි. උන්වහන්සේ ම දේශනාකොට වදාළ සූත්‍ර, විනය ධර්මයන් ම පතපොත කරගැනීමයි. අතීතයේ වැඩසිටියා වූ උතුම් රහතන් වහන්සේලාගේ ම, අරිහත් භික්ෂූන් වහන්සේලාගේ ම, මාර්ගඵලලාභී උපාසක උපාසිකාවන්ගේ ම ජීවිත පරමාදර්ශී කොටගෙන ජීවිතය සකස්කර ගැනීම යි. ඉහත කාරණාව ම යි මුල්වෙන්නේ. මුල වරද්දවා ගතහොත්, මැද-අග දෘෂ්ටි කාන්තාරවල අතරමං වෙන්න පුළුවන්. බුද්ධෝත්පාද කාලයක අවසාන හෝරා කිහිපයේ ජීවත් වන ඔබ තර්ක-විතර්ක කරමින්, හරි-වැරදි සොයමින් තවතවත් සක්කාය දෘෂ්ටිය වැඩෙන දිශාවට යෑම නො වේ, කළ යුත්තේ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුද්ධ ඥානයෙන් මේ සංකීර්ණ වූ ලෝකය ඉතාමත් සරල කොට දේශනා කර තිබෙන ධර්ම මාර්ගයේ ම ගමන් කිරීම ය. ඔබේ ජීවිතයේ එළඹෙන සෑම වැදගත් අවස්ථාවක දී ම බුද්ධානුස්සතිය, ධම්මානුස්සතිය, සංඝානුස්සතිය, ශීලානුස්සතිය, ත්‍යාගානුස්සතිය, දේවතානුස්සතිය කියන මහානාම ශාක්‍යකුමරුන් උදෙසා බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ ධර්මය සිහිපත්කර ගන්නවා නම්, ඒ අනුව ජීවත්වෙනවා

නම්, සක්කාය දිට්ඨිය හීනවෙන දිශාවට ඉහත ධර්මයන් ජීවිතයට එකතුකර ගැනීමට ඔබ දක්ෂ නම්, භවගමනේ උපරිම ජීවිත 7ක් තුළ දී බව නිරෝධය සාක්ෂාත් කරගැනීමටත්, එතෙක් ආයුෂ, වර්ණ, සැප, බලයෙන් සශ්‍රීක මාර්ගඵලලාභී දෙවියෙක්, දිව්‍යාංගනාවක් ලෙස දිව්‍ය අසිරිය අත්විඳීමට ඔබට හැකිවනු ඇත. මේ සහතිකය ඔබට ලබාදෙන්නේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ම ය. භවගමනින් දුක ම උරුම කොටගෙන සක්කාය දිට්ඨියේ කුණු හැව, මමත්වයේ දැඩිභාවය, නාමරූප ධර්මයන්ගේ අනිත්‍යභාවය දකිමින් ම, මෙනෙහි කරමින් ම ගලවාදමන්න.

අතහැරීම ම පුරුදු කරමින්, හැකිතාක් දන්දෙමින් ඊට ශක්තිය ලබාගන්න. එළඹෙන (ඊළඟ) දෙසැම්බර් 31 රාත්‍රිය සතර අපා දුකෙන් මිදෙන, අවිහිංසාවේ රාත්‍රියක් කරගන්න. මාර පුතෙක්, දුවෙක් නො වී, සම්බුදු ඇකයට පියනඟන පුතෙක්, දුවෙක් වෙන්න. ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේත්, ධර්මයේත් ශක්තිය පිංවත් ඔබට යා යුතු ඉදිරිමඟ පිළිබඳ සතිය, සිහිය පිංවත් ඔබ තුළින් ම මතු කරදෙනු ඇත. එම සතිය, සිහිය විසින් ම ඔබට භවදුක ම උරුමකොට දෙන සක්කාය දිට්ඨිය, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස කියන බිහිසුණු රතිඤ්ඤාවන් පුස්වෙඩිල්ලක් බවට ඔබ තුළින් ම පත්කරනු ඇත. මේ වනවිටත් පිංවත් ඔබ සතරඅපායෙන් මිදී ඇතැයි ඔබ තුළ විශ්වාසයක් ඇතොත් එම විශ්වාසය සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස කියන ධර්මතාවයන් සමඟ නැවත නැවත ගළපා බලන්න. ඔබ නිහතමානී වෙන්න. එම නිහතමානී භාවය යනු ඔබ විසින් ඔබ උදෙසා ම ඇතිකර ගන්නා කල්‍යාණ මිත්‍රභාවයකි. අතීතයේ සෑම බුද්ධෝත්පාද කාලයකදීම අපට වැරදුණු එක ම තැන ඔතන බව මෙනෙහි කරන්න. 'මම' දෙවැනි තැනට දමා, බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ ධර්ම මාර්ගය ම මුල් තැනට ගන්න. එවිට 'මම' ධර්මයේ හිමිකරු, අයිතිකරු කියන මමත්වයේ දැඩිභාවය නො ව, මම ද ධර්මයේ ම කොටසක් ය යන නිහතමානී භාවය ඔබ තුළ ඇතිවනු ඇත. සාරිපුත්ත මහෝත්තමයන් වහන්සේ වරක් සිංහනාදයක් කරනවා, "මම හරියට හරක් රැළක සිටින අඟ

කැඩිච්ච ගොනෙක් වගෙයි" කියලා. ඒ කියන්නේ, අඟ කැඩිච්ච ගොනා සැමවිට ම රැළේ පැත්තකට වෙලා සිටින්නේ. නායකයා වෙන්න, පළමුවැනියා වෙන්න එන්නේ නැහැ. සිංහසෙය්‍යාවෙන් සිංහනාද කරන්න පුළුවන්, නිහතමානී භාවය ජීවිතය තුළින් ඇතිකරගත් උත්තමයාටමය. මේ යථාර්ථය සමඟ ඔබේ ජීවිතය හොඳින් ගළපා බලන්න. එය ම පිංවත් ඔබේ ජීවිතයට කමටහනක් වේවි, මඟ නො මඟ වටහාගැනීමට.

(පිංවත් ස්වාමීන් වහන්සේ ඉකුත් ජනාධිපතිවරණය (2015) අවසන් වී නොබෝ දිනකින්, එහි ප්‍රතිඵලය ධර්මයේ ඇසින් විවරණය කළ ලිපිය.)

මැතිවරණයක සැඟ ව ඇති මාරධර්ම

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ ලෝකයේ දුර්ලභ කාරණාවන් 5ක් තිබෙනවා ය කියලා. ලොව තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමකගේ පහළවීම පළමු දුර්ලභ කාරණය වෙනවා. ගෞතම බුදුරජාණන් වහන්සේ දඹදිව පහළවන විට, මනුෂ්‍යයාගේ පරමායුෂ අවුරුදු එකසිය විස්සක් වුණා. ගෞතම බුදුරජාණන් වහන්සේට පෙරාතුව බුද්ධත්වයට පත් වූ කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයේ මනුෂ්‍ය පරමායුෂ අවුරුදු විසිදහසක් වෙනවා. එතකොට පිංවතුන් ගණනය කර බලන්න, අවුරුදු විසිදහසක පරමායුෂ අවුරුදු 120ක් දක්වා අඩුවෙන්න අවුරුදු දසලක්ෂයකට වැඩි කාලයක් ගතවෙනවා. නැවත මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ ශාසනය ඇතිවෙන්නේ, මනුෂ්‍යයාට පරමායුෂ අවුරුදු අසූදහසක් වෙන කාලයේ දී. ඒ කියන්නේ, මෛත්‍රී බුදුරජාණන් වහන්සේ පහළවෙන්න තවත් අවුරුදු ලක්ෂ 25කට වඩා ගතවෙනවා. බුදුරජාණන් වහන්සේ නමකගේ පහළවීම මොන තරම් දුර්ලභ කාරණයක් ද....

දෙවැනිව බුදුරජාණන් වහන්සේ දේශනා කරන උතුම් ශ්‍රී සද්ධර්මය අසන්නට ලැබීම දුර්ලභයි, තුන්වැනිව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා දුර්ලභව පහළවෙන තථාගතයන් වහන්සේ නමක් දේශනා කරන ධර්ම, විනය නිවැරදිව දේශනා කරන සංඝරත්නය පහළවීම දුර්ලභ දෙයක් ය කියලා. හතරවැනිව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, බුදුරජාණන් වහන්සේ දේශිත ධර්ම, විනය දැනගත්තත්, ධර්මානුධර්ම ප්‍රතිපදාවට අනුව ජීවත්වෙන පුද්ගලයා දුර්ලභය කියලා. පස්වෙනුව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, කෘතඥ, කෘතවේදී, කෙළෙහිගුණ දත් පුද්ගලයා දුර්ලභ ය කියලා.

ඉහත කාරණා පහෙන් පිංවතුන්ලාට හොඳින් වැටහෙනවා, ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළවීම යම් සේ දුර්ලභ ද, මනුෂ්‍යයා තුළ කෘතවේදී බව, කෘතඥතාවය ඒ තරමටම දුර්ලභ දෙයක් ය කියලා. එම නිසා, පිංවත්, සමාජ වගකීම් දරන සෑම ගිහි පිංවතෙක් ම, ශාසනික වගකීම් දරන සෑම ගිහි පිංවතෙක් ම, ශාසනික, සාමාජීය යුතුකමක් ඉටුකිරීමෙන් පෙරළා සමාජයෙන් කෘතඥතාවය, කෘතවේදීභාවය බලාපොරොත්තුවීම දුකට ම හේතුවන ධර්මතාවයක් ය කියලා දැනගත යුතු යි. මොකද කෘතඥතාවය, කෘතවේදීභාවය ලෝකයේ බුදුරජාණන් වහන්සේ පහළවීම තරමට ම දුර්ලභ දෙයක් වන නිසා.

සමාජය දෙස බැලීමේ දී, ගිහි පිංවතුන්ලා ශාසනික, සමාජීය යුතුකම් ඉටුකිරීමේ ඉලක්කයන් සපුරාගැනීම සඳහා හඹායන ගමනේ දී, ශීලයෙන් දුර්වලවීම සහ අකුසල් මූලයන් රැස්වීම බරපතළ ආකාරයෙන් සිදුකොට ගන්නවා. ලෝකයේ කෘතවේදීභාවය, කෘතඥතාවය දුර්ලභ දෙයක් ය කියලා නොදන්නා බව නිසා ම, මේ සෑම ගිහි පිංවතෙක් ම අවසානයේ, දුර්වල කරගත් ශීලයන්, අකුසල මූලයන්ගේ උරුමයන් දෝතින් දරාගෙන කලකිරීම තුරුළුකර ගන්නවා. භික්ෂුව පිංවත් ඔබට මේ සටහන් තබන්නේ, ලෝක ධර්මතාවයන් පිළිබඳව. කෘතවේදීභාවය, කෘතඥතාවය දුර්ලභ වූ ලෝකය තුළ, සමාජ වගකීම් දරන ගිහි, පැවිදි පිංවතුන් දක්ෂවෙන්න ඕනේ, වගකීම් දරන කාලය තුළ, ආස්වාදයට යට නො වී, ඉහත ධර්මතාවයන් නුවණින් හඳුනාගෙන, සිල්පද තුළින්, කුසල් මූලයන් තුළින් තමාගේ ආරක්ෂාව සහතික කොටගෙන සමාජ යුතුකම් ඉටුකරන්න.

මේ ලෝකයේ සුර-අසුර කියලා සත්ව කොට්ඨාස දෙකක් තිබෙනවා. සුර පක්ෂයේ නායකත්වය දරන්නේ තව්තිසාවේ ජීවත්වෙන ශක්‍රයා ප්‍රමුඛ සම්මා දෘෂ්ටියට පත් දෙවියන් විසින්. අසුර පක්ෂයේ නායකත්වය දරන්නේ මිත්‍යා දෘෂ්ඨික වේපචිත්ති කියන අසුර නායකයා ප්‍රමුඛ මිත්‍යා දෘෂ්ඨික දෙවිවරු විසින්. බුදුරජාණන් වහන්සේ නමක් පහළ වුණු කාලයේ මනුෂ්‍යයෝ

තෙරුවන් සරණ පිහිටලා කුසල් ධර්මයන් වැඩීම නිසා දිව්‍යතලවල සම්මා දිට්ඨියට පත් සුර පක්ෂයේ බලය ශක්තිමත් වෙනවා. මොකද, පිං කරලා මියයන මනුෂ්‍යයෝ සශ්‍රීක දෙවියන් හැටියට දිව්‍යතලවල උපදින නිසා. සම්මා සම්බුද්ධ ශාසනයේ අර්ථයන් හීනවෙනකොට මනුෂ්‍යයන්ගේ සහ දෙවියන්ගේ දුශ්ශීලභාවයන්, අකුසල මූලයන් නිසා මිථ්‍යා දෘෂ්ටික අසුර බලය, ඒ කියන්නේ මාරපාක්ෂික බලය ශක්තිමත් වෙනවා.

බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩසිටිය කාලයේ දිව්‍යතලයේ සුර-අසුර යුද්ධයක් සිද්ධවෙනවා. මෙය අවිආයුධවලින් කෙරෙන යුද්ධයක් නො ව, දෙපාර්ශ්වයේ ආධ්‍යාත්මික ශක්තියෙන් කෙරෙන යුද්ධයක් වශයෙන් හැඳින්වීම සුදුසුයි කියලා භික්ෂුවට හිතෙනවා. මේ සුර-අසුර යුද්ධයේ දී ශක්‍රයාගේ නායකත්වයෙන් යුධ වැදුණු සුර දිව්‍ය පිරිස, අසුර නායක වේපචිත්ති අසුරයා සහ මිථ්‍යා දෘෂ්ටික අසුර සේනාව අතින් පරාජයට පත්වෙනවා. අසුරයින්ට පරාජය වී ශක්‍රයා පලායනවා. වේපචිත්ති අසුර නායකයා, ශක්‍රයා ජීවග්‍රහයෙන් අල්ලා ගැනීමට මාතලී දිව්‍ය රියදුරා පදවන අජානීය අශ්වයන් යෙදූ දිව්‍ය රථය පසුපස හඹාගෙන පැමිණියා. ඒ මොහොතේ ශක්‍රයා තමන් දිවිහිමියෙන් ආරක්ෂා කරගත් උතුම් ශීලය ආවර්ජනා කොට, තම නොකැළැල් ශීලය ගැන සත්‍යක්‍රියා කොට, උපක්‍රමශීලී ව අසුර පිරිස පරාජය කොට අසුර පුරයට එළවා දමනවා.

පිංවත් ඔබ නුවණින් දකින්න. බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩසිටි කාලයේදීත්, ශක්‍රයා පළමුව මිථ්‍යා දෘෂ්ටික අසුර බලය හමුවේ පරාජයට පත්වෙනවා. දෙවනුව තමයි තම ශීලයේ සත්‍යක්‍රියා බලයෙන් අසුර බලය පරාජය කොට දමන්නේ. බුදුරජාණන් වහන්සේ ජීවමානව සිටියදීත් අසුර බලය, මාරබලය මේ තරම් ශක්තිමත් වුණා නම්, මනුෂ්‍යයා අකුසලයට, දුශිල්වත්භාවයට කොටු වී ජීවත්වන වර්තමානයේ මාර බලය, අසුර බලය ගැන කුමන කථාවක් ද. වර්තමාන ලෝකය තුළ සිදුවෙමින් පවතින්නේ මේ ඛේදවාචකයේ අර්ථය යි. මාරපාක්ෂික

අසුර කොටස් නිරතුරුව ම උත්සාහ ගන්නේ සම්මා සම්බුද්ධ ශාසනයේ උතුම් අර්ථයන් වැඩෙන දිශාවට, පෝෂණය වන දිශාවට යා නොදී උතුම් සද්ධර්මයේ අර්ථයන් විනාශකොට දැමීමයි. වර්තමානයේ ශාසනික, සාමාජීය වගකීම් දරන සෑම පිංවතෙක්ම, මේ මාරපාක්ෂික ධර්මයන්ගේ හැඩරුව, අභියෝගය නිවැරදිව හඳුනාගෙන කටයුතු නො කළොත්, එය අනාගත සම්මා සම්බුද්ධ ශාසනයේ ආරක්ෂාවට බරපතළ අනතුරක් වෙන්න පුළුවන්. මේ මාරපාක්ෂික ධර්මයන්ට මුහුණදිය හැකි එක ම ආයුධය උතුම් ශීලය යි; උතුම් කුසලයේ ශක්තිය යි. මොකද, සුර-අසුර යුද්ධයේදී ශක්‍රයා දෙවැනි අවස්ථාවේ දී අසුරයින් පරාජය කොට, අසුර පුරයට එළවා දමන්නේ, ශීලයේ ශක්තිය තුළින් ම නිසා.

දිනක් මුගලන් මහ රහතන් වහන්සේ ආකාශයේ සක්මන් කරමින් සිටියදී, පවිටු මාරයා උන්වහන්සේගේ කුසට රිංගා ගන්නවා. උන්වහන්සේට දැනෙනවා, තම උදරය පුරවාදමනවා වගේ, තම කුස මෑ ඇට පිරවූ ගෝනියක් වගේ බරයි කියලා. උන්වහන්සේ පොළෝතලය මතට බැහැලා කුටියට ගොඩවෙලා නුවණින් මෙනෙහිකොට බලනවා, කුසට කුමක්ද සිද්ධවුණේ කියලා. ඒ වෙලාවේ උන්වහන්සේ දකිනවා, පවිටු මාරයා සිය කුසට රිංගාගෙන කියලා. මාරයාව හඳුනාගත් මුගලන් මහ රහතන් වහන්සේ පවිටු මාරයාට කියනවා, තථාගත ශ්‍රාවකයන් වහන්සේලාව නො පෙළා පිට ව යන්න කියලා. ඒ අවස්ථාවේ දී මාරයා පලායනවා. බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩසිටිය කාලයේ, එක් වස් සමයක මාරයා ගමේ වැසියන්ට ආවේශ වී, බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ පන්සියයක් ස්වාමීන් වහන්සේලාට පිණ්ඩපාතය ලැබීම දුර්වලකොට දමනවා. වරක් මුගලන් මහ රහතන් වහන්සේ, තමන් කකුසඳ බුදුරජාණන් වහන්සේගේ කාලයේ දූසි මාරයා වශයෙන් ඉපිද සංඝයාට එරෙහිව කළ මාරාවේශයන් ගැන සඳහන් කරනවා. දිනක් කකුසඳ බුදුරජාණන් වහන්සේ ස්වාමීන් වහන්සේලාව කැඳවලා දේශනා කරනවා,

"මහණෙනි, අද මේ ගමේ වැසියන්ට මාරයා ආවේශ වෙනවා. ජනතාව මාරාවේශවෙලා භික්ෂූන් වහන්සේලාව ආහාරයෙන් ප්‍රමාදයට, මදයෙන් ලොල්භාවයට පත්කරන්න උත්සාහ කරනවා. ඒ නිසා මහණෙනි, පටික්කුල සංඥාවෙන් ආහාරය පිළිගන්න. ප්‍රත්‍යවේක්ෂාවෙන් පිණ්ඩපාතය වළඳන්න. මාරාවේශය නිසා ගිහි පිංවතුන් ප්‍රණීත ආහාර පූජාකරාවි. ඔබලාව පංච නීවරණයන්ට පත්කරාවි. ඒ නිසා නුවණින් දකිමින් පිණ්ඩපාතය පිළිගන්න" කියලා. ස්වාමීන් වහන්සේලා බුදුරජාණන් වහන්සේ දුන් අවවාදය පිළිඅරගෙන මාරාවේශය පරාජය කොට දමනවා.

ආයෙමත් දවසක කකුසඳ බුදුරජාණන් වහන්සේ, ස්වාමීන් වහන්සේලාව කැඳවලා දේශනා කරනවා, "අද මේ ගමේ පිංවතුන්ලාට මාරාවේශයක් සිද්ධවෙනවා. මාරාවේශය නිසා ජනතාව ඔබලාට බනින්න, ගහන්න, චෝදනා කරන්න, පීඩා කරන්න, පිණ්ඩපාතය නො දෙන්න පුළුවන්. එම නිසා දස දිශාවට මෛත්‍රී සංඥාව පතුරවමින් ජීවත්වෙන්න" කියලා. බුදුරජාණන් වහන්සේගේ පෙරදැනුම්දීම නිසා ම ස්වාමීන් වහන්සේලා, මාරාවේශ වූ ගිහි පිංවතුන්ලා මොන තරම් පීඩාවන් කළත්, ඒ සියල්ල ම මාරාවේශයක් බව දකිමින් ම මෛත්‍රී සංඥාවෙන් ම ජීවත්වෙමින් මාරාවේශය පරාජය කොට දමනවා. අවසානයේ මේ දූසි මාරයා ම, කකුසඳ බුදුරජාණන් වහන්සේගේ අග්‍රශ්‍රාවක, විදුර මහ රහතන් වහන්සේට ගලකින් ගසා හිස තුවාලකොට දමනවා. ඒ 'හපන්කමත්' කළාට පස්සේ, දූසි මාරයා කකුසඳ බුදුරජාණන් වහන්සේ පසුපසත් හඹාගෙන එනවා, බුදුරජාණන් වහන්සේට පීඩා කරන්න. එවිට කකුසඳ බුදුරජාණන් වහන්සේ නාගාවලෝකනයෙන්, ඒ කියන්නේ ඇතෙකු සේ මුළු කය පෙරළා බැලීම හේතුවෙන්, දූසි මාරයා දෙව්බවින් චුත ව, උසසඳ නිරයෙහි මිනිසෙකුගේ කය බඳු, මාළුවෙකුගේ හිස බඳු නිරිසතෙක්ව උපදිනවා කියලා, මුගලන් මහ රහතන් වහන්සේ දේශනා කරනවා.

ලෝකයේ පවතින අසුර බලය, මාර බලය බුදුරජාණන් වහන්සේලාටත්, සද්ධර්මයටත්, සංඝරත්නයටත් පීඩා කරමින් මේ

උත්සාහ ගන්නේ උතුම් සද්ධර්මයේ බලය හීනකොට දැමීමටය. මාර බලවේගයන් මේ මොහොතේ දී ද, සම්මා සම්බුද්ධ ශාසනය විනාශකොට දැමීමට ජනතාවට මාරාවේශවීම සාමාන්‍ය සිද්ධියක් බවට පත් වී ඇත. මනුෂ්‍යයා දුශ්ශීලභාවයට පත්වෙමින්, අකුසල මූලයන් වඩමින්, මාරාවේශයට අවශ්‍ය සාධක පූර්ණය කරගැනීමේ ව්‍යායාමයක් අප ඉදිරියේ ඇත.

උතුම් ශාසනික අර්ථයන් හීනකොට දැමීමට මාරාවේශයන් සිද්ධ වූ පැහැදිලි අවස්ථාවක් හැටියට පසුගියදා නිමාවට පත් වූ මැතිවරණය හැඳින්විය හැකි ය. හිටපු නායකතුමාට පැහැදිලිව තවත් වසර දෙකක් නීත්‍යනුකූලව රාජ්‍ය බලය භුක්තිවිඳීමට හැකියාව තිබියදී, එතුමා වසර දෙකකට පෙරාතුව මැතිවරණයකට යන්නේ මාරාවේශයක් නිසා ම ය. එතුමා ඒ තීරණය ගැනීමට මුල්කරගන්නේ ජ්‍යොතිෂ්‍යය යි. ජ්‍යොතිෂ්‍යය මුල්කරගත් තැනදීම එතුමා තුළින් බුද්ධරත්නය, ධර්මරත්නය, සංඝරත්නය කෙරෙහි විශ්වාසයත්, කර්මය-කර්මඵල කෙරෙහි විශ්වාසයත්, තමන් ජීවිත කාලය තුළ දී ම සිදුකළ කුසල් දහම් පිළිබඳ, පිංකම් පිළිබඳ විශ්වාසයත් එතුමා තුළින් බැහැරට යනවා. චිරශ්ත්‍රීන ධර්මයක් වන ජ්‍යොතිෂ්‍යය කෙරෙහි විශ්වාසය කොට, ධර්මයට අදාළ උතුම් විශ්වාසයන්ගෙන් එතුමා බැහැරට යනකොට, එතුමා තුළ සකස්වෙන්නේ මිථ්‍යා දෘෂ්ටික භාවයට අදාළ ධර්මතාවයන්. දැන් පිංවත් ඔබට තේරෙනවා ඇති, හිටපු නායකතුමා සහ ඊට අනුබල දුන් පිංවතුන් අවශ්‍ය කාලයට පෙරාතුව මැතිවරණයකට යන්නේ මාරාවේශයක් නිසා ම ය කියලා. ඒ මාරාවේශයෙන් ගත් මැතිවරණ තීරණය නිසා ම, මැතිවරණයට පැවති කාලයම මාරාවේශයෙන් පීඩාවට පත් වූ මාසයක් බවට පත්වුණා. දේශගුණික විපත්තීන් නිසා, අධික වැස්ස, ගංවතුර හේතුවෙන් මරණ, අවතැන්වීම්, චෝදනා, විවේචන, මිල ඉහළයෑම් නො සිතූ ආකාරයට සිද්ධවුණා. මනුෂ්‍යයන් කුසල් මූලයන් ගැන මොහොතකටවත් නො සිතා, චෝදනා කරගත්තා; මඩගසා ගත්තා. ස්වාමීන් වහන්සේලාත් අකුසල මූලයන් හරිහරියට රැස්කරගත්තා.

තමන් මාරාවේශයකට ලක් වූ අයෙක් ය කියලා දකින්න කාටවත් ම සතිය, සිහිය තිබුණේ නැහැ. ශාසන පරිහානියට උපකාරක ධර්ම සකස්කොට, මේ සියලු කොටස් මාරාවේශයට පත්කරලා, ජනතාව අවුස්සලා, මැතිවරණ දිනයේදීත්, ඊට පෙරදිනත්, ඊට පසුදිනත් සියල්ලෝ ම සන්සුන්ව තැබීමට මාරයා උපක්‍රමශීලී වුණා. භික්ෂුව මේ තබන්නේ දේශපාලන සටහනක් නො වේ. සම්බුද්ධ ශාසනය ඉදිරියේ ඇති මාරාවේශයන් පෙන්වාදෙන ධර්මානුකූල විග්‍රහයක් පමණයි. පිංවත් ඔබ නුවණින් දකින්න. මැතිවරණය ප්‍රකාශ කිරීමත් මාරාවේශයක් නම්, මැතිවරණය පැවති කාලයත් මාරාවේශයක් නම්, මැතිවරණයේ ප්‍රතිඵලයත් මාරයාට ම අයිති ප්‍රතිඵලයක් වෙනවා. කුසලයෙන්, ශීලයෙන් දුර්වල තැන සොයලා, ඒ අයව මාරාවේශයකට ලක්කරලා මාරයා මේ ඉදිරියට පැමිණි ගමන ධර්මය තුළින් දකින්න වෙන්නේ ප්‍රශ්නාර්ථයක් තුළ සිටිමින් ම යි. නමුත් සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍ය යි. එය ධර්මතාවයක්.

බුදුරජාණන් වහන්සේ පිරිනිවීගොස් වසර 2500ක් ගිය තැනදී ජීවමාන බුදුරජාණන් වහන්සේ හැටියට දකලා සිත පහදාගෙන වඳින්න, පුදන්න යම් පූජනීය වස්තූන්ගෙන් පිරි බිම්කඩක් මේ ලෝකධාතුව තුළ තිබෙනවා නම්, ඒ ශ්‍රී මහා බෝධීන් වහන්සේ, ස්වර්ණමාලි සෑ සමිඳුන් වහන්සේ, දන්ත ධාතූන් වහන්සේ, ශ්‍රීපාදයන් වහන්සේ, ථූපාරාම සෑ සමිඳුන් වහන්සේ, සෝමාවතී සෑ සමිඳුන් වහන්සේ ඇතුළු පූජනීය වස්තූන්ගෙන් පූජිත මේ උතුම් දේශය ම යි; මේ උතුම් බිම්කඩ ම යි.

දිනපතා සම්මා දිට්ඨියට පත් බ්‍රහ්මයින්, දෙවියන් දසදහස් ගණනක් වන්දනා කරන බිම්කඩක් මේ ලෝකධාතුව තුළ තිබෙනවා නම්, ඒ උතුම් බිම්කඩ ඔබ දෙපා තබාගෙන සිටින මේ උතුම් දේශය යි. මුළු රටේ ම බැංකුවල තිබෙන සල්ලි ටික මහනුවර නගර මධ්‍යයට ගෙනල්ලා, රටේ ම ජනතාවට මහනුවර නගරයට එන්න කියලා ප්‍රදර්ශනය කළොත්, ඒ මුදල් දකලා ජනතාව තුළ කාමච්ඡන්දයක් ම යි, බියක් ම යි සකස්වෙන්නේ.

නමුත් දන්ත ධාතූන් වහන්සේ වැඩ සිටින කුටියක්, ශ්‍රී දන්ත ධාතූන් වහන්සේව පිටතට වැඩම කරලා ජනතාවට දන්ත ධාතූන් වහන්සේව ප්‍රදර්ශනය කරන්න පටන්ගන්න මොහොතේ මුළු රටට ම මල් වැසි වසිනවා. ජනතාව තුළ සතුටක්, ප්‍රමෝදයක්මයි ඇතිවෙන්නේ.

මහනුවර නගර මධ්‍යයේ කොඩිගසක් එල්ලලා, එම කොඩිගසේ කෝටිගණනක සල්ලි එල්ලලා, ජනතාවට එම සල්ලි ගස ප්‍රදර්ශනය කළොත් ජනතාව තුළ කාමච්ඡන්දයක්මයි, බියක් ම යි සකස්වෙන්නේ. නමුත් ඇසළ පෙරහැරට දළදා මාලිගාවේ කප් සිටුවන දවසට, පෙරහැර අවසාන වී දිය කපන දවසට මුළු රටට ම මල් වැසි වසිනවා. සම්මා සම්බුද්ධ ශාසනය ම යි මුල් වෙන්නේ, සම්මා සම්බුද්ධ ශාසනයේ ආරක්ෂාව ම යි, චිරස්ථිතියයි, පැවැත්මයි මුල් වෙන්න ඕනේ. ආර්ථිකය නෙමෙයි. මුදල් නෙමෙයි.

ස්වර්ණමාලි මහා සෑ සමිඳුන් වහන්සේගේ සෑ මළුවේ කෝටිගණනක් සල්ලි කොළ ඇතිරුවත්, ජනතාව එම සල්ලි දැකලා කාමච්ඡන්දයක් ම යි, බියක් ම යි සකස්කොට ගන්නේ. නමුත් අපේ ගෞරවණීය ස්වාමීන් වහන්සේ නමක් මහ සෑ සමිඳුන් අභියස මහ සෑ වන්දනාවක් සිදුකරද්දී, මහා පහන් පිංකමක්, මහා මල් පිංකමක් සිදුකරද්දී, ආකාශය පුරාවට විවිධ වර්ණයෙන් පරිපූර්ණ, පිනට කැමති දෙවිවරු ලක්ෂ ගණනක් වැඩසිටිමින් සතුටු වෙනවා. හරියට ආකාශයේ බුදුරැස් විහිදෙනවා වගේ. සම්මා සම්බුද්ධ ශාසනය ම යි, උතුම් ශාසනයේ අර්ථයමයි, චිරස්ථිතිය ම යි, පැවැත්ම ම යි මුල්විය යුත්තේ. ආර්ථිකය නෙමෙයි. මුදල් නෙමෙයි.

සල්ලි ගෝනියක් ඔබ ගෙදර තබාගෙන සිටියත්, එම සල්ලි ගෝනිය නිසා ඔබ තුළ කාමච්ඡන්දයක් ම යි, බියක් ම යි සකස්වෙන්නේ. නමුත් ඔබ සවසට නා පිරිසිදුවෙලා මල් ටිකක් නෙළලා, බුදු පහන පත්තු කරලා, වන්දනාවක් කරන මොහොතක්

පාසා මේ ලෝකයේ ලැබිය හැකි උතුම් ම සැනසිල්ලක් ලබනවා. සම්මා සම්බුද්ධ ශාසනය ම යි මුල්වෙන්නේ; උතුම් වෙන්නේ; ශ්‍රේෂ්ඨ වෙන්නේ. ආර්ථිකය නෙමෙයි. මුදල් නෙමෙයි.

මේ රට දියුණුවෙන් දියුණුවට පත්වෙලා, මේ රටේ සෑම මනුෂ්‍යයෙක් ම කෝටිපතියෙක් වෙලා මැරෙන්න පුළුවන්. කෝටිපතියෙක් වෙලා මැරුණාට පසුව, ඔහු වැටෙන්නේ සතරඅපායට නම්, ඒ කෝටිපතිකමින් ඇති ඵලක් නැහැ. සම්මා සම්බුද්ධ ශාසනය ම යි මුල්විය යුත්තේ. ශාසනයේ චිරස්ථිතියයි, ආරක්‍ෂාව ම යි මුල්විය යුත්තේ. ආර්ථිකය නෙමෙයි. මුදල් නෙමෙයි.

මේ උතුම් බිම්කඩේ ශ්‍රේෂ්ඨභාවය මේ රටේ සෑම නායක පිංවතෙක් ම දැනගැනීම අත්‍යවශ්‍ය කාරණයක් වෙනවා. ශාසනික අර්ථයන්ගේ යම් පිබිදීමක් සිදුවන සෑම අවධියක දී ම ඊට අදාළ පිංවතුන්ලාගේ දුර්වලතාවයන් තුළින් මාරාවේශයට නතුකර ගැනීමට මාරයා නිරතුරුව ම මානබලමින් සිටින්නේ. එම නිසා අතීතයේ කළ මහා පිනකින් මේ උතුම් දේශයේ නායකත්වයට පත්වෙන සෑම පිංවතෙක් ම ශක්තිමත්ව, තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන්, ශීලයෙන් පරිපූර්ණ භාවයට පත්වීමෙන්, මාරාවේශයන්ගේ ග්‍රහණයට හසුනොවී මේ උතුම් සම්මා සම්බුද්ධ ශාසනයේ අර්ථයන් තව එක දිනක් හෝ අනාගත ලෝකයට ආරක්‍ෂාකොට තබා රැස්කොටගන්නා වූ කුසලයෙන් අනුන්වත් සුවපත් කොට, තමනුත් දිව්‍ය සම්පත් සලසාගන්න දක්‍ෂවෙන්න ඕනා. සම්මා සම්බුද්ධ ශාසනයේ පැවැත්මට, චිරස්ථිතියට, වර්ධනයට කැමති කුමන පක්‍ෂයක නායකයෙක් වේවා ඉහත කාරණාවන් නුවණින් දැකීම තුළින් ශාසනික අර්ථයන් රැකීමට ඉදිරිපත් වීම, තමා විසින් තමාට ම කරගන්නා ශ්‍රේෂ්ඨ ම උපකාරය වෙනවා.

මාරාවේශයන් හරහා මාරයා මේ උත්සාහ කරන්නේ, බෞද්ධ පිංවතුන්ලාව ලෝභ, ද්වේෂ, මෝහ තුළින් භේදභින්න කොට,

එම භේදභින්න භාවය තුළින්, මිථ්‍යා දෘෂ්ටික බලවේගයන්ගේ ක්‍රියාකාරීත්වය ශක්තිමත් කොට, උතුම් සම්මා සම්බුද්ධ ශාසනයේ අර්ථය දුර්වල කිරීම විය හැකි ය. මේ සටහන කියවලා පිංවත් ඔබට ප්‍රශ්නයක් ඇතිවෙන්න පුළුවන්, භික්ෂුව තේ කෝප්පයේත් කිඹුලන් දකිනවා ය කියලා. නමුත් භික්ෂුව මාර බලවේගයන්ගේ සියුම්භාවය දකලා අත්දැකීමෙන් ම පිංවත් ඔබට කියනවා, තේ කෝප්පයක නො ව, වතුර උගුරක් තුළත් මාරයාට සියුම් කිඹුල් වේශයක් මවාගෙන සිටිය හැකි ය කියලා; වතුර උගුරක් තුළත් සියුම් කිඹුල් වේශයන් මවාගෙන කෙනෙකුගේ උදරයට රිංගාගත හැකි ය කියලා. මාරයාගේ මේ සියුම්භාවය අපට හඳුනාගැනීමට හැකිවන්නේ උතුම් සද්ධර්මයේ අවබෝධයන් තුළින් පමණක්මය. උතුම් සම්මා සම්බුද්ධ ශාසනය යනු මාරයාටත්, මාර බලවේග යන්ටත් ඇති ලොකු ම හිසරදය යි. මාරයාගේ මේ අභියෝගය පිංවත් ඔබට පරාජය කොට දැමීමට හැකිවන්නේ, මේ මොහොතේ පක්ෂ-විපක්ෂ සෑම නායකයෙක්මත්, ජනතාවත් තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවත්, ශීලයේ ආරක්ෂාවත්, අලෝභ ධර්මයන්ගේ ර කවරණයත් ජීවිතයට වහවහා එකතුකොට ගැනීමෙන් පමණක් ම ය. ඉහත සද්ධර්මයන්ගෙන් පිංවත් ඔබ පරිපූර්ණ වෙනකොට, මාරධර්මයන් මුළුගැන්වී උතුම් සද්ධර්මයේ චිරස්ථිතියත්, ඒ හේතුවෙන් ජනතාවගේ ආර්ථිකයේ දියුණුවත් ඇතිවීම ධර්මතාවයක් ම ය.

තෙවන කොටස

සතර සතිපට්ඨානය සඳහා ප්‍රවේශය සබ්බාසව සූත්‍රය

සතර සතිපට්ඨානය, කෙනෙකු විසින් අඛණ්ඩව වඩනු ලැබුවහොත් අවමය දින 7ක් හෝ උපරිමය වසර 7ක් තුළ රහත්භාවයට පත්වන්නේ යැයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක. එය ඝෝර, කටුක, භයානක සසර දුකෙන් මිදී යාමට ඔබ සතු හැකියාව පිළිබඳ බුදුරජාණන් වහන්සේ විසින් ලබාදුන් සහතිකයක් වැන්න. නමුත් භාවනාව වැඩීමට පිංවතුන් කළ යුතු පූර්වකෘත්‍යයක් ගැන සඳහන් අතිශයින් වටිනා සූත්‍රයක් වේ. ඒ වනාහි සබ්බාසව සූත්‍රය යි. මෙම ලිපිමාලාව සපයන පිංවත් ස්වාමීන් වහන්සේ විසින් සබ්බාසව සූත්‍රය මෙලෙස පැහැදිලි කරනුයේ, සතර සතිපට්ඨානය සම්බන්ධයෙන් පළවීමට නියමිත මීළඟ ලිපිමාලාවට ප්‍රවේශයක් ලෙසිනි. එබැවින් සතර සතිපට්ඨාන විග්‍රහයේ උපරිමය උකහාගැනීම උදෙසා මෙම සබ්බාසව සූත්‍රයේ විග්‍රහය අතිශයින් වැදගත් බව සලකන්නේ නම් මැනවි.

භාවනාවට පෙර - මෙසේ කළ යුතු ම ය
(සතර සතිපට්ඨානය සඳහා ප්‍රවේශය)

අපිරිසිදු වුණු ළිඳක් තියෙනවා. එම ළිඳෙහි පස්, මඩ, කොළරොඩු පිරිලා. පිංවතෙක් මේ ළිඳ පිරිසිදු කිරීමේ අරමුණින් ඉසිනවා. නමුත් ඔහු ළිං පතුලේ ඇති පස්, මඩ, කොළරොඩු ඉවත් කරන්නේ නැහැ. ඒ හේතුව නිසා ම, තාවකාලිකව ළිඳේ ජලය පිරිසිදු වුණත්, මොහොතකින් ජලය අපිරිසිදු වෙනවා. ආශ්‍රවයන්, කෙළෙස් ධර්මයන් තැන්පත් වූ සන්තානයක, එම අපිරිසිදු ආශ්‍රවයන් ක්‍රමානුකූලව ඉවත්කර ගැනීමෙන් තොරව, යම් පිංවතෙක් සමථ, විදර්ශනා භාවනාවන්ට යොමුවුණොත්, මොහොතක ආස්වාදයක් ලැබුවත්, ඉක්මනින් හිත විසිරී යනවා. එයත් හරියට අපිළිවෙළට පිරිසිදු කළ ළිඳ වගේ. පිංවත් ඔබට, සමථ විදර්ශනා භාවනාවන් වැඩීමට පෙර එදිනෙදා ජීවිතයේදී ආශ්‍රවයන් හීනකරගන්නා කාරණා හයක් සබ්බාසව සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

එම කාරණා හය වන්නේ දර්ශනයෙන් ප්‍රහාණය කළ යුතු ආශ්‍රවයන්, සංවරයෙන් ප්‍රහාණය කළ යුතු ආශ්‍රවයන්, ප්‍රත්‍යවේක්ෂයෙන් ප්‍රහාණය කළ යුතු ආශ්‍රවයන්, ඉවසීමෙන් ප්‍රහාණය කළ යුතු ආශ්‍රවයන්, මඟහැර යෑමෙන් ප්‍රහාණය කළ යුතු ආශ්‍රවයන්, දුරැකිරීමෙන් ප්‍රහාණය කළ යුතු ආශ්‍රවයන් කියලා. මේ කාරණා හයට පසුවයි, බුදුරජාණන් වහන්සේ සමථ-විදර්ශනාවෙන් ප්‍රහාණය කළ යුතු ආශ්‍රවයන් ගැන සඳහන් කරන්නේ.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ලෝක ධර්මයන්, ඒ කියන්නේ ඉපදීම-මරණය, කුසලය-අකුසලය, සුගතිය-දුගතිය, දුප්පත්-පොහොසත් බව, තෙරුවන්ගේ පහළවීම ගැන නුවණින් මෙනෙහි කිරීමට අදක්‍ෂ පුද්ගලයා තුළ නූපන්නා වූ ආශ්‍රවයන් උපදිනවා ය කියලා; ඉපදුණාවූ ආශ්‍රවයන් වැඩෙනවා ය කියලා. යම් පිංවතෙක් ලෝක ධර්මයන් නුවණින් මෙනෙහි කරමින් යෝනිසෝ මනසිකාරයෙන් යුතුව ජීවත්වෙන්නේ නම්, ඔහු දුක දෙය දුක වශයෙන් දැනගන්නවා; අසුබ දෙය අසුබ වශයෙන් දැනගන්නවා; අනිත්‍ය දෙය අනිත්‍ය වශයෙන් දැනගන්නවා. අනාත්ම දෙය අනාත්ම වශයෙන් දැනගන්නවා කියලා. මේ හේතුවෙන් අවිද්‍යාව මෝදුකොට දෙන ආශ්‍රවයන්ට ඔබ තුළින් නැගී සිටීමට ඇති අවස්ථාව හීන වෙනවා. බුදුරජාණන් වහන්සේ සබ්බාසව සූත්‍රයට අදාළව දේශනාකොට ඇති කාරණා හයෙන් පිංවත් ඔබ සිත පිරිසිදු භාවයට පත්කර නො ගෙන සමථ-විදර්ශනා භාවනා වැඩීමට ගියොත්, කෙටි ආස්වාදයක් සහ විසිරුණු සිතක උරුමය පමණයි ඔබට හිමිවන්නේ.

සමහරක් භාවනා කරන පිංවතුන්, නිරතුරුව ම අසන ප්‍රශ්නයක් තමයි, "ස්වාමීන් වහන්ස, භාවනා කිරීමේ දී නිතර සිත විසිරෙනවා. කුමක්ද ඊට කරන්නේ?" කියලා. ඊට කළ යුතු ප්‍රතිකර්මය තමයි සබ්බාසව සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත්තේ.

එම නිසා පිංවත් ඔබ, සමථ-විදර්ශනා භාවනා වැඩීමට පෙරාතුව පූර්වකෘත්‍යයක් ලෙස ඉහත කාරණා හය ජීවිතයට එකතු කරගන්න.

සබ්බාසව සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ දේශනා කරන මුල්ම කාරණය තමයි, දර්ශනයෙන් ප්‍රහාණය කළ යුතු ආශ්‍රවයන්, ඒ කියන්නේ සෝවාන් ඵල අවබෝධයෙන් ප්‍රහාණය වෙන ආශ්‍රවයන්. දර්ශනයෙන් ප්‍රහාණය කළ යුතු ආශ්‍රවයන් ඔබ සම්පූර්ණයෙන්ම ප්‍රහාණය කොට දමන්නේ සෝවාන් ඵලයට පත්වෙන මොහොතෙයි. එතෙක් 'මම'ය කියලා ගත්තා වූ දැඩි

දෘෂ්ටිය නිසා පටිච්ච සමුප්පාද ධර්මයන්ගෙන් බැහැරව ආත්මීය දෘෂ්ටියෙන් ජීවිතය දකිනවා. මා තුළ ආත්මයක් තිබෙනවා. එම ආත්මය තුළ මම සිටිනවා. මම ගිය ජීවිතයේ දී සිටියා. මරණයෙන් මතු මම සිටිනවා. අසනීපයක දී, දුකක දී, සතුටක දී මා තුළ දුක්, සැප විඳිනා කෙනෙක් සිටිනා බව දකිනවා. රූපය තුළ, වේදනාව, සංඥාව, චේතනාව, විඤ්ඤාණය තුළ මම සිටිනවා කියලා දකිනවා. මේ නිසාම රූපය මගේ කොටගෙන වේදනාවක් ඇතිකොට ගන්නවා. වේදනාව මගේ කොටගෙන සංඥාවක් ඇතිකර ගන්නවා. සංඥාව මගේ කොටගෙන චේතනාවක් ඇතිකර ගන්නවා. චේතනාව මගේ කොටගෙන විඤ්ඤාණය ඇතිකොට ගන්නවා. ඒ නිසා ම භවයට ගලාගෙන යන ආශ්‍රවයන් ඔබ ඇතිකොට ගන්නවා.

දර්ශනයෙන් ප්‍රහාණය කළ යුතු ආශ්‍රවයන් යටතේ සක්කාය දිට්ඨිය නැතිකොට ගැනීමට කැමති පිංවතා නිරතුරුව ම පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දකිමින් ජීවත්වෙනවා. ඔහු මුලින් ම 'මම' ය කියලා ගත්තා වූ රූපයේ අනිත්‍යභාවය දකිමින් ජීවත්වෙනවා. දැස් පියාගෙන හිඳිමින් රෝගයන්ට, ව්‍යාධීන්ට, මරණයන්ට තෝතැන්නක් වූ රූපය, පුපුරා යන සැරව ගෙඩියක් සේ දකිනවා. ඔහු තම රූපය අසූචි පිරවූ කළයක් වශයෙන් දකිනවා. ඔහු තම රූපය කුණුවී යන මස් ගොඩක් වශයෙන් දකිනවා. මෙවැනි උපක්‍රම තුළින් රූපය තුළ මම, මම තුළ රූපය, රූපය තුළ ආත්මයත්, ආත්මය තුළ රූපයත් තිබෙනවා ය කියන දෘෂ්ටියේ නිරුවත හෙළිකොට ගන්නවා. තම රූපය තුළින් නිරතුරුව ම ළදරුවෙක්, ලෙඩෙක්, මහල්ලෙක්, මළකඳක් මතුකොට දකින්න ඔබ දක්ෂ නම්, ඔබේ මියගිය ඥාතියාගේ රූපය ඔබේ පවුලේ සුසානභූමියේ පසත් සමඟ සංසන්දනාත්මකව දැකීමට ඔබ දක්ෂ නම්, ඒ දක්ෂභාවය ඇතිකොට ගන්නා මොහොතක් පාසා, සක්කාය දිට්ඨියට ඔබ අභියෝග කළා වෙනවා. පිංවත් ඔබ මේ සියල්ල සිදුකරන්නේ නුවණින් මෙනෙහි කිරීමෙන්. තව ම ඔබ එරමිනියා ගොතාගෙන භාවනාවට වාඩිවෙලා නැහැ. විවේකීව සිටින සෑම මොහොතකම, කැමති ඉරියව්වකින් ඉහත කාරණාව නුවණින් දකින්න.

වේදනාවත් සංඥාවත් හඳුනාගන්න

චතුරාර්ය සත්‍යය නොදැනීම නිසා, කුසල්-අකුසල් සංස්කාරයන් රැස්වන හැටි නුවණින් දකින්න. සංස්කාරයන් නිසා විඤ්ඤාණය සකස්වන හැටි නුවණින් දකින්න. විඤ්ඤාණය හේතුවෙන් නාමරූප සකස්වන හැටි නුවණින් දකින්න. නාමරූප හේතුවෙන් සළායතන සකස්වන හැටි නුවණින් දකින්න. පිංවත් ඔබේ රූපයට හිත යොමුකරලා, රූපයේ ඉපදීමට මූලික හේතුව අවිද්‍යාව වශයෙන් දකින්න. දෑස් පියාගෙන ඔබේ රූපය තුළින් අවිද්‍යාවේ අඳුර දකින්න.

අවිද්‍යාව නිරෝධය කළ තැනදී, සංස්කාර නිරෝධය වන සැටිත්, සංස්කාර නිරෝධය කළ තැනදී විඤ්ඤාණය නිරෝධය වන සැටිත්, විඤ්ඤාණය නිරෝධය කළ තැනදී නාමරූප නිරෝධය වන සැටිත්, නාමරූප නිරෝධය කළ තැනදී සළායතන නිරෝධය වන සැටිත් නුවණින් දකිමින් ජීවත්වෙන්න. දර නිසාම ඇවිලෙන ගිනිගොඩක් සිහියට නගාගෙන, ගිනිගොඩේ දර ඉවරවීම නිසා ගිනිගොඩ තුළින් ම ගින්දර නිවීයන හැටි නුවණින් දකිමින් "සංඛාර නිරෝධා විඤ්ඤාණ නිරෝධෝ" කියන ධර්මතාවය නුවණින් දකින්න. විඤ්ඤාණයේ බැසගැනීමෙන් සකස්වෙන මව්කුසේ කළල රූපයට සිත යොමුකරමින්, ක්‍රමානුකූලව මරණය කරා යන ජීවිතය, උපාදානය හේතුවෙන් නැවත භවය සකස්කොට ගන්නා හැටි නුවණින් දකින්න. මේ උපක්‍රමශීලී නුවණින් දැකීම, රූපය කෙරෙහි සක්කාය දිට්ඨිය සිඳගැනීම සඳහා ම ය. මෙසේ පටිච්චසමුප්පන්නව ඔබේ ජීවිතය දකිනකොට, රූපය තුළ මම සිටිනවා ය, රූපය තුළ ආත්මයක් තිබෙනවා ය කියන දෘෂ්ඨීන් ප්‍රහීණ වෙලා යනවා.

මීළඟට පංචඋපාදානස්කන්ධයට අදාළව වේදනාව කියන ධර්මතාවය නුවණින් දකින්න. වේදනාව යනු ඵස්සය හේතුවෙන් සකස්වෙන ඵලය යි. හේතුඵල ධර්මයන් වශයෙන් වේදනාව ඔබ නො දකින නිසා ම, වේදනාව තුළ මම සිටිනවා ය, මා තුළ විඳින කෙනෙක් සිටිනවා ය, වේදනාව තුළ ආත්මයක් තිබෙනවාය, ඒ ආත්මය තුළ මම සිටිනවා ය කියලා සිතනවා. ඒ නිසාම නිරතුරුව ම ඵස්සය හේතුවෙන් සකස්වෙන සෑම සැප, දුක්, උපේක්ෂා විඳීමකටම ඔබ බැඳී යනවා. පිංවත් ඔබ අතීතයේ අත්විඳි සෑම සැප, දුක්, උපේක්ෂා විඳීමක් ම මතකයට නගාගෙන, ඒ සෑම විඳීමක ම අනිත්‍යභාවය නුවණින් දකින්න. ජීවිතය තිබෙන්නට හැර වේදනාව හිස්කරන්න.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, අහසේ නන්වැදෑරුම් සුළං හමනවා. පෙරදිග සුළං, පැළදිග සුළං, උතුරුදිග සුළං, දකුණුදිග සුළං, දුහුවිලි සුළං, උණුසුම් සුළං, සිසිල් සුළං කියලා. එලෙසින් මේ සිරුරේ ද නන්වැදෑරුම් දුක්, සැප, උපේක්ෂා වේදනාවන් ඇතිවෙනවා කියලා.

ඔබ අත්විඳින සෑම සැප, දුක්, උපේක්ෂා විඳීමක ම "ඵස්ස පච්චයා වේදනා, ඵස්ස නිරෝධා වේදනා නිරෝධෝ" කියන ධර්මතාවයන් සිහියට නගාගන්න. වේදනාව හිස් දෙයක්, අනිත්‍ය වූ දෙයක්, අනාත්ම වූ දෙයක් බව නුවණින් දකින්න. අන්‍යයන්ගේ ජීවිතවලටත් මේ ධර්මතාවයන් ගළපා දකින්න. මහේශාඛ්‍ය ජීවිත ගතකරන මනුෂ්‍යයින්, සශ්‍රීක දෙවියන් ආදීන් අත්විඳින සැප වේදනාවන්ගේ අනිත්‍යභාවය නුවණින් දකිමින් දකින්න. වේදනාව කෙරෙහි ඇති සක්කාය දිට්ඨිය, වේදනාවේ අනිත්‍යභාවය දකිමින් තුනීකරගන්න.

මීළඟට පංචඋපාදානස්කන්ධයට අදාළව සංඥාව කියන කාරණාව නුවණින් දකින්න. සංඥාව කියලා කිව්වත්, හඳුනාගැනීම කියලා කිව්වත් එක ම අර්ථය යි. වේදනාව කියන හේතුව නිසා සකස්වෙන ඵලය සංඥාව යි. සංඥාව තුළ ඊට වඩා දෙයක් නැහැ. නමුත් තෘෂ්ණාව නිසා අපි සංඥාව මගේ කොට ගන්නවා;

සංඥාව තුළ මා සිටිනවා ය කියලා දකිනවා; සංඥාව තුළ ආත්මයක් තිබෙනවා ය, ඒ ආත්මය තුළ මා සිටිනවා ය කියලා දකිනවා. බුදුරජාණන් වහන්සේ සංඥාව කියලා කියන්නේ, හඳුනාගැනීම කියන අර්ථයට. සුදුපාට දෙයක් ඔබ සුදුපාටයි කියලා හඳුනාගන්නවා. රතුපාට දෙයක් ඔබ රතුපාටයි කියලා හඳුනාගන්නවා. නිල්පාට ඔබ, නිල්පාට වශයෙන් හඳුනාගන්නවා. මේ මගේ අම්මා, තාත්තා කියලා හඳුනාගන්නවා. ඔබ සිතන්න, පුද්ගලයන් සියදෙනෙක් අතර ඔබේ අම්මා ඉන්නවා කියලා. ඔබ එක ක්ෂණයකින් 'මේ මගේ අම්මා' කියලා සියලුදෙනා අතරින් අම්මාව හඳුනාගන්නවා. මේ කිරි, මේ ගිතෙල්, මේ වෙඬරු කියලා ඔබ හඳුනාගන්නවා. මේ පිරිමියෙක්, මේ කාන්තාවක් ය කියලා හඳුනාගන්නවා. මොහු චීන ජාතිකයෙක්, මොහු කළු ජාතිකයෙක් ය කියලා හඳුනාගන්නවා. මේ කෑගසන්නේ කාක්කෙක්, හරකෙක්, අලියෙක් ය කියලා හඳුනාගන්නවා.

පිංවත් ඔබ නුවණින් මෙනෙහි කරන්න. ඔබේ ජීවිත කාලය තුළ ඔබ ඇසෙන් යම් රූපයක් හඳුනාගත්තා නම්, කනෙන් යම් ශබ්දයක් හඳුනාගත්තා නම්, ඔබ නාසයෙන්, දිවෙන්, ශරීරයෙන්, මනසින් යම් හඳුනාගැනීමක් සිදුකළා නම්, ඒ සෑම හඳුනා ගැනීමක්ම අනිත්‍යභාවයට පත් වූ ධර්මතාවයක් නේද?

ඒ කිසි ම හඳුනාගැනීමක ඔබ තුළ මම කියා කෙනෙක්, මගේ කියා නිත්‍ය වූ කෙනෙක් සිටියා ද? ඒ කිසි ම හඳුනාගැනීමක් තුළ ආත්මයක් කියා දෙයක් තිබුණා ද? සංඥාව හිස් දෙයක්, අනාත්ම වූ දෙයක්, වේදනාව කියන ධර්මතාවය හේතුවෙන් සකස්වෙන අනිත්‍ය වූ ඵලයක් පමණක් ම යි. මේ කාරණාවන් නුවණින් දකිනකොට, සංඥාව කෙරෙහි ඔබ ඇතිකොටගත් මමත්වයේ දැඩිභාවය සියුම්වෙනවා. එවිට ඔබ අතීතයේ යමක් හඳුනාගත්තද, වර්තමානයේ යමක් හඳුනාගත්ත ද, එම රූපය හඳුනාගත් විගස ම 'අනිත්‍යයි' කියන අර්ථය ඔබ තුළින් මතුවෙනවා.

පිංවත් ඔබ සිතන්න, ඔබට ලස්සන නිල්පාට කමිසයක් තෑගි ලැබෙනවා කියලා. ඒ ලස්සන නිල්පාට කමිසය ඔබ ලස්සනයි,

නිල්පාටයි, අලුත්... වශයෙන් හඳුනාගන්නා මොහොතේ ම, දිරාගිය, පාට පිච්චී ගිය නිල්පාට පරණ කමිසයක් සිහියට නගාගන්න.

මේ රාත්‍රියේ භික්ෂුවට එකපාරට නරියකුගේ කෑගසන හඬක් ඇසෙනවා. ඒ හඬ නරියකුගේ බව භික්ෂුව හඳුනාගන්නවා. මොහොතකින් නරියාගේ හඬට බිය වූ මොනරකුගේ කෑගසන හඬ ඇසෙනවා. ඒ හඬ මොනරකුගේ බව භික්ෂුව හඳුනාගන්නවා. උදේ පටන් මේ රාත්‍රිය වන තුරු මොන තරම් ශබ්ද කනෙන් අසා, මනසින් සිතා හඳුනාගන්න ඇති ද. ඒ හැම හඳුනා ගැනීමක්ම නිරතුරුව වෙනස් වෙනවා. ඔබ යමක් හඳුනාගත්තද, එය නිරතුරුව ම වෙනස් ව යනවා. ඒ වෙනස්වීම දකින පිංවතා සංඥාවට බැඳී යන්නේ නැහැ. විවේකී ව සිටින සෑම මොහොතකම ඔබට අතීතයේ ඇතිවුණාවූ හඳුනාගැනීම්වල අනිත්‍යභාවය දකිමින් ජීවත්වෙන්න. එවිට සංඥාව කෙරෙහි පවතින මමත්වය දැඩිභාවය ඔබ තුළින් තුනී වී යනවා.

දර්ශනයෙන් දුරු කළ යුතු ආශ්‍රවයන් මෙසේ දුරු කරන්න

පංචඋපාදානස්කන්ධයට අදාළව සංඥාව හේතුවෙන් සකස්වෙන ඵලය තමයි, සංස්කාර. හඳුනාගන්නා දෙය ගැන සිතීම නිසා, සංස්කාර සකස්කොට ගන්නවා. සංස්කාර ධර්මයන් කුසල්, අකුසල් කියලා කොටස් දෙකකට බෙදෙනවා. පිංවත් ඔබ රැස්කොටගන්නා සෑම කුසල්, අකුසල් සංස්කාරයක් ම විපාක දීලා අනිත්‍යභාවයට පත්වෙනවා. විපාක දී අනිත්‍යභාවයට පත්වන සංස්කාරයන් අප 'මගේ' කර ගන්නවා. සංස්කාරයන් තුළ මම සිටිනවා ය කියලා දකිනවා. මා තුළ නො වෙනස්වන සංස්කාරයන් තිබෙනවා ය කියලා දකිනවා. ඒ සංස්කාරයන් තුළ ආත්මයක් තිබෙනවා ය කියලා දකිනවා. මේ හේතුවෙන් සංස්කාරයන් කෙරෙහි මමත්වයේ දැඩිභාවය ඇතිකොට ගන්නවා. පිංවත් ඔබ ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් යුත් රූපකාය සිහියට නගාගන්න. මේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් දස පාරමී ධර්මයන්ගේ කුසල් ශක්තියෙන් ලද ඵලයක් බව නුවණින් දකින්න. ඒ සා ශක්තිමත් කුසල් සංස්කාරයනුත් පිරිනිවන් මංචකයේ දී අනිත්‍යභාවයට පත් වී ගිය හැටි නුවණින් දකින්න.

පිංවත් ඔබ දේවදත්ත හාමුදුරුවන්ගේ පාපකාරී ජීවිතය නුවණින් දකින්න. මහ පොළොව පලාගෙන දේවදත්තයන් අවීචි මහා නරකාදියට වැටුණු හැටි නුවණින් දකින්න. මේ සා බලවත් අකුසල විපාකයක් ලැබුවත්, එම බරපතළ අකුසලයන් ද අනිත්‍යභාවයට පත් වී දේවදත්ත කල්ප ගණනාවකට පසු පසේ

බුදුරජාණන් වහන්සේ නමක් ව පිරිනිවී යන හැටි නුවණින් දකින්න. පිංවත් ඔබ ඔබේ මනුෂ්‍ය ජීවිතය, ඔබේ ප්‍රසන්න අඟපසඟ, අධ්‍යාපනය, රැකියාව, විවාහය, සමාජ තත්වය ආදිය කුසල්, අකුසල් සංස්කාරයන්ගේ ඵලයක් බව දකිමින් ඒවා නිරතුරුව ම වෙනස්වන හැටි නුවණින් දකින්න.

වර්තමාන සමාජයේ පිංවතුන්ලා විශාල වශයෙන් දානමය, ශීලමය පිංකම් සිදුකරනවා. මෙවැනි පිංකම් සිදුකිරීමේ දී සමහරක් පිංවතුන් පින කෙරෙහි ලෝභ සිත් ඇතිකරගෙන කටයුතු කරනවා. මෙවැනි කාරණා තුළ සැඟවී තිබෙන්නේ සංස්කාර තුළ මම සිටිනවා ය, මා තුළ සංස්කාර සිටිනවා ය කියන මෝහ මූලික අර්ථය යි. කුසල් සංස්කාරයන් නිසා ඉහළට මතුවන සක්විති රජුත්, ශක්‍රයාත් අකුසල් සංස්කාර හේතුවෙන් දුගතියට වැටිය හැකි නම් සංස්කාරයෝ අනිත්‍යයි කියලා ම දකින්න. පිංවත් ඔබ නිරතුරුව ම සශ්‍රීක දෙවියෙක්, දිව්‍යාංගනාවක් සිතෙන් මවාගෙන ඒ දිව්‍ය ජීවිත අනිත්‍ය වී යන හැටි නුවණින් දකින්න. සුරූපී කාන්තාවක්, පිරිමියෙක් සිතින් මවාගෙන කුසල් සංස්කාරයන් නිසා ලැබුණු සුරූපීභාවය, අනිත්‍යභාවයට පත්වන හැටි නුවණින් දකින්න. දුප්පත් මනුෂ්‍යයෙක් ලොතරැයියක් දිනුම් ඇදීමෙන් කෝටිපතියෙක් වෙනවා නුවණින් දකින්න. සංස්කාරයෝ නිරතුරුව ම ආත්මීයභාවයක් නැති, අනාත්ම ධර්මතාවයක් බව නුවණින් දකිමින් සංස්කාර කෙරෙහි ඇති මමත්වයේ දැඩිභාවය සියුම්කොට ගන්න. සංස්කාර යනු සංඥාව හේතුවෙන් සකස්වෙන ඵලයක් මිස, මගේ කොට ගැනීමට එහි ස්ථිර කිසිවක් නොමැති බව නුවණින් දකින්න.

පංචඋපාදානස්කන්ධ ධර්මයන්ට අදාළව බුදුරජාණන් වහන්සේ මීළඟට දේශනා කරන්නේ සංස්කාර හේතුවෙන් සකස්වෙන ඵලය වන විඤ්ඤාණය ගැන යි. විඤ්ඤාණය කියලා කියන්නේ විශේෂ වූ ඥාණයට. යමක් දැනගන්නවා ය කියන අර්ථයටත් විඤ්ඤාණය කියලා කියනවා. පිංවත් ඔබ යමක් හඳුනාගත්තා ද, ඒ හඳුනාගත් දෙය ගැන සිතනවා. ඔබ යමක් ගැනද සිතන්නේ, ඒ

සිතන දෙය ගැන දැනීමක් ඇතිකොට ගන්නවා. ඔබ කුමක් ගැන ද දැනගන්නේ, ඒ දැනගත් දෙයට බැඳී යනවා. පිංවත් ඔබ ආහාරයක් අනුභව කරනකොට එය තිත්ත නම්, තිත්ත බව දැනගන්නවා. එම ආහාරය පැණිරස නම්, පැණිරස බව දැනගන්නවා. යමක් සුවඳ නම් එය සුවඳ බව දැනගන්නවා. යමක් දුගඳ නම්, එය දුගඳ බව දැනගන්නවා. ඔබ යම් පිංවතෙක් ඇසුරු කරලා ඔහු හොඳයි හෝ නරකයි කියලා දැනගන්නවා. ආණ්ඩුව හොඳ ආණ්ඩුවක් ය හෝ දුර්වල ආණ්ඩුවක් ය කියලා දැනගන්නවා. නායකයා හොඳ හෝ නොහොඳ ය කියලා දැනගන්නවා. දොස්තර මහත්මයා හොඳ ය කියලා දැනගන්නවා. දැන් පිංවත් ඔබ නුවණින් දකින්න, ඔබ යම් රූපයක් කෙරෙහි එවැනි විශේෂ දැනීමක් ඇතිකර ගත්තා නම්, ඒ සෑම දැනීමක් ම අනිත්‍යයි නේද? තමන්ට හොඳයි කියලා ඡන්දය දීලා රජයක් පත්කර ගන්නවා. වසර 5කින් රජය නරකයි කියලා පරාජයකොට දමනවා. බුදුරජාණන් වහන්සේ විඤ්ඤාණය මැජික්කරුවෙක් ය කියලා දේශනා කරනවා. මරණාසන්න පුද්ගලයෙකුගේ චුතිසිතට දැනීමක් ඇතිවෙනවා, ඔහු ලබන්නේ සුගතියේ උපතක් ද, දුගතියේ උපතක් ද කියලා. මේ දැනීම නිසා ම යි සුගතියේ උපතේ දී පුද්ගලයා සතුටු සිතිනුත්, දුගතියේ උපතේ දී පුද්ගලයා ගැටෙන සිතිනුත් මියයන්නේ. පටිච්ච සමුප්පාද ධර්මයේ දී බුදුරජාණන් වහන්සේ 'සංස්කාර පච්චයා විඤ්ඤාණ' කියලා දේශනා කරනවා. සංස්කාර නිසා සකස්වෙන කර්ම ශක්තිය විඤ්ඤාණය කියලයි එයින් අදහස් වෙන්නේ. මේ කර්ම ශක්තිය ආයතන හය තුළින්, ආයතන මැරෙමින් ඉපදෙමින්, ඇතිවෙමින් නැතිවෙමින් භවය කරා ගමන් කරනවා. විඤ්ඤාණය පංචඋපාදානස්කන්ධයේ සෑම උපාදානස්කන්ධයක් අතරට ම වැදී සියුම් ආකාරයෙන් ක්‍රියාත්මක වන නිසාත්, විඤ්ඤාණය වේගයක් පමණක් වන නිසාත්, විඤ්ඤාණය මැජික් කරුවෙක් ය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. විඤ්ඤාණයේ වේගය කොතෙක්ද කියනවා නම්, මේ මොහොතේ මනුෂ්‍යයෙක්ව සිටින ඔබ, ඊළඟ නිමේෂයේ දී මරණයෙන් පසු දෙවියෙක්, තිරිසතෙක් බවට පත්කරනවා. යොදුන් ලක්ෂ ගණනක් ඈත තිබෙන දිව්‍ය

තලයක, නිරයක උපතක් තත්පරයක් තුළ දී සකස්කොට දෙන්න විඤ්ඤාණයේ වේගයට හැකියාව තිබෙනවා. කවදාහරි දිනයක පිංවත් ඔබ විඤ්ඤාණය අවබෝධ කරගතහොත් ඔබ අවබෝධ කරගන්නේ විඤ්ඤාණය යනු වේගයක් පමණක් ම බව යි. ඒ වේගය තුළ ඔබ දකින්නේ හිස්භාවය පමණක් ම යි. ඒ නිසා ම ඔබට විඤ්ඤාණය කෙරෙහි ඇති තෘෂ්ණාව සිඳී යනවා.

පිංවත් ඔබ දූන් නුවණින් දකින්න, ඔබේ ජීවිත කාලය තුළ ඔබ ඇසින් රූපයක් දූකලා, කනෙන් ශබ්දයක් අසලා, දිවෙන් නාසයෙන්, ශරීරයෙන්, මනසින් යම් දූනීමක් ඇතිකර ගන්නවා නම්, ඒ ඇතිකොට ගත්තා වූ සෑම දූනීමක් ම අනිත්‍යයයි නේද? ඒ දූනීම හිස් දෙයක් නේද? ඒ දූනීම තුළ ආත්මයක්, සත්වයෙක්, පුද්ගලයෙක් හිටියේ නැහැ නේද? පිංවත් ඔබේ ජීවිත කාලය තුළ ඔබ ඇතිකොටගත් සෑම විශේෂ දූනීමක් ම අනිත්‍යයි කියලා නුවණින් දකිමින් ජීවත්වෙන්න.

පංචඋපාදානස්කන්ධයට අදාළව රූප, වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ යන ධර්මතාවයන් පහ කෙරෙහි ඔබ 'මම ය', 'මගේ ය' කියන දෘෂ්ටීන් නුවණින් මෙනෙහි කිරීම තුළින් ම හීනකොටගන්න. දර්ශනයෙන් ප්‍රහාණය කළ යුතු ආශ්‍රවයන්, ඒ කියන්නේ සෝවාන් ඵල අවබෝධයෙන් ප්‍රහාණය වන සක්කාය දිට්ඨිය එවිට ඔබෙන් ප්‍රහාණය වෙලා යාවි.

ඉන්ද්‍රිය සංවරය උදෙසා

පංචඋපාදානස්කන්ධය අනිත්‍ය වශයෙන් නුවණින් මෙනෙහි නො කරන පුද්ගලයා නිරතුරුව ම ආත්මීය සංඥාව නිසා ම නැති ආශ්‍රවයන් ඇතිකර ගන්නවා වගේ ම ඇති ආශ්‍රවයන් වර්ධනය කරගන්නවා. පිංවත් ඔබ නිරතුරුව ම පංචඋපාදානස්කන්ධයේ ක්‍රියාකාරීත්වය පහත ආකාරයට නුවණින් දකිමින් ජීවත්වෙන්න. අධ්‍යාත්මික රූපයත්, බාහිර රූපයත්, විඤ්ඤාණයත් හේතුවෙන් එස්සය හටගන්නවා. එස්සය කියලා කියන්නේ දැක්කා, ඇසුණා, දැනුණා කියන අර්ථයට. ඔබට යමක් ද ඇසෙන්නේ, යමක් ද දැනෙන්නේ, යමක් ද දකින්නේ, එයට ඇලීම්, ගැටීම්, උපේක්ෂාවන් ඇතිකර ගන්නවා. ඒ කියන්නේ විඳීම සකස්කර ගන්නවා. ඔබ යමක් ද විඳින්නේ, ඒ ගැන හඳුනාගැනීමක් සකස්කර ගන්නවා. ඔබ යමක් ද හඳුනාගන්නනේ, හඳුනාගන්නා දේ ගැන සිතනවා. ඔබ කුමක් ද සිතන්නේ, ඒ සිතන දේ ගැන දැනීමක් ඇතිකර ගන්නවා. දැන් පිංවත් ඔබ නුවණින් විමසා බලන්න, ඔබ සෑම නිමේශයක් තුළ දී ම ඉහත ක්‍රියාපටිපාටිය තුළ නේද ජීවත්වෙන්නේ? මේ ක්‍රියාපටිපාටිය යි පංචඋපාදානස්කන්ධය කියලා කියන්නේ.

මේ ක්‍රියාපටිපාටියේ අනිත්‍යභාවය, හිස්භාවය, හේතුඵල ධර්මතාවය දැකීම සක්කාය දිට්ඨිය සිඳගැනීමේ මූලික ම කමටහන වෙනවා. විවේකයක් ලද සෑම නිමේෂයක දී ම ජීවිතය තුළින් ඇතිකරගත් විඳීම් හඳුනාගැනීම්, සිතීම්, දැකීම්වල අනිත්‍යභාවය නුවණින් දකින්න දක්ෂවෙන්න. ඕනෑ ම මනුෂ්‍යයෙකුගේ, ඕනෑම සත්වයෙක්ගේ වචනයක්, ක්‍රියාවක්, ඉරියව්වක් අනිත්‍ය වන පංචඋපාදානස්කන්ධයක් වශයෙන් දකින්න. ඔබේ ජීවිතයටත් එම

ධර්මතාවයන් ගළපා බලමින් ජීවත්වෙන්න. සතුටින්, විනෝදයෙන්, දුකෙන්, පීඩනයෙන් ජීවත්වෙන මනුෂ්‍යයින් දෙස බලන්න. එම පිංවතුන් පංචඋපාදානස්කන්ධයට ම බැඳිලයි ජීවත්වෙන්නේ. ඔය සෑම දුකක් ම, සැපක් ම අනිත්‍ය වූ පංචඋපාදානස්කන්ධයක්ය කියලා දකින්න දක්ෂවෙන්න. එවිට පිංවත් ඔබ තුළ මම ය කියල ගත්තා වූ දෘෂ්ටිය ක්‍රමානුකූලව හීන වී යනවා. ඉහතින් භික්ෂුව සටහන් කළේ සබ්බාසව සූත්‍රයට අදාළව දර්ශනයෙන් ප්‍රහීණය කළ යුතු ආශ්‍රවයන් ගැන යි.

මීළඟට බුදුරජාණන් වහන්සේ සබ්බාසව සූත්‍රයට අදාළව දේශනා කරනවා, සංවරයෙන් ප්‍රහීණය කළයුතු ආශ්‍රවයන් කියලා. රූපය කියන්නේ සතරමහධාතුවක්. සතරමහධාතුවක් කියන්නේ වේගයක්. සතරමහධාතුවට බැසගත් විඤ්ඤාණය කියන්නේ වේගයක්. වේගයන් දෙකක් එක්වුණ තැනදි ඇතිවන කැළඹීමේ ස්වභාවය යි, චංචල ස්වභාවය යි ඉන්ද්‍රිය අසංවරය කියන්නේ. කුමක්ද ඔබ සංවර කරගන්නේ ඇසෙන් රූපයක් දැකලා, දැක්කා වූ රූපය ගැන සිතලා සිත අසංවර කරගන්නේ නැහැ. කනෙන් ශබ්දයක් අහලා ඇසුණා වූ ශබ්දය ගැන සිතලා සිත අසංවර කරගන්නේ නැහැ. නාසයෙන් ගඳසුවඳත්, දිවෙන් රසයත්, ශරීරයෙන් ස්පර්ශයත්, මනසින් සිතුවිල්ලත් නිසා මේවා ගැන සිතල සිත අසංවර කරගන්නේ නැහැ.

පිංවත් ඔබ නිරතුරුව ම දකින්න ඕන, ඇස, කන, නාසය කියන්නේ සතරමහධාතුවක් පමණක් ම යි, රූපයේත් විඤ්ඤාණයේත් එස්සයේත් සකස්වෙන නාමධර්මයනුයි ඔබව අසංවර කරන්නේ කියලා. එම නිසා ඇසෙන් රූපයක් දකින තැන, කනෙන් ශබ්දයක් ඇසෙන තැන, මනසට සිතුවිල්ලක් දැනෙන තැන හොඳින් අවදියෙන් සිටින්න. දැක්කා ය කියන තැන ඔබ නැවතුණොත් ඇස, කන, නාසය නිසා ඔබ කවදාකවත් ඉන්ද්‍රිය අසංවරය ඇතිකර ගන්නේ නැහැ. පිංවතෙක් භික්ෂුවගෙන් ඇසුවා, දිනපතා පුරුදු කළ හැකි හොඳ පුරුද්දක් කියලා දෙන්න කියලා. භික්ෂුව ඔහුට කිව්වේ, පිංවත් ඔබ ඇසෙන් රූපයක් දකින

මොහොතේ ම එම රූපය අනිත්‍යයි කියලා දකින්න, කනෙන් ශබ්දයක් ඇසෙන මොහොතේ ම එම ශබ්දය අනිත්‍යයි කියලා දකින්න, මුලින් ම ඔය කාරණා දෙක පුරුදු වෙන්න ය කියලා.

පිංවත් ඔබ සමාජයේ ජීවත්වෙන අසංවර ජීවිත දෙස හේතුඵල ධර්මයන්ට යටත්ව නුවණින් දකින්නේ නැහැ. ඒ නිසාම අනුන්ගේ අසංවරභාවය නිසා ඔබ නැති කෙලෙස් උපද්දවා ගන්නවා; ඇති කෙලෙස් වැඩිකර ගන්නවා. කතාබහෙන්, හැසිරීමෙන් අසංවර මනුෂ්‍යයින් නිසා, ඇඳුමෙන් පැළඳුමෙන් අසංවර මනුෂ්‍යයින් නිසා ඔබ මොන තරම් ඔබේ සිතුවිලි අසංවර කර ගන්නවා ද?

දිනක් අනුරුද්ධ මහ රහතන් වහන්සේ චාරිකාවේ වඩින විට සවස් වී අඳුර වැටුණා. උන්වහන්සේ රාත්‍රිය ගත කිරීමට තැනක් සොයමින්නුයි සිටියේ. ළඟපාතක ආරණ්‍යයක්, කුටියක් තිබුණේ නැහැ. අසල නිවසකට යාබදව තිබුණු කාමරයක එම නිවැසි කාන්තාවගේ අවසරයෙන් අනුරුද්ධ මහ රහතන් වහන්සේ රාත්‍රිය ගතකිරීම සඳහා තෝරාගන්නවා. මේ වෙලාවේ නවාතැන් සොයාගෙන යන තවත් ආජීවකයෙක් ගෙහිමි කාන්තාවගේ අවසරයෙන් මේ කාමරයේ ම නවාතැන් ගන්නවා. මේ වෙලාවේ නිවැසි රූමත් කාන්තාව අනුරුද්ධ මහ රහතන් වහන්සේට කියනවා, ඔය කාමරයේ දෙදෙනෙකුට රාත්‍රිය ගතකිරීමට ඉඩකඩ නැහැ. එම නිසා ගෙදර ඇතුළ් කාමරයක් හිස්ව තිබෙනවා, එයට වඩින්න කියලා. අනුරුද්ධ මහ රහතන් වහන්සේට නිවැසි කාන්තාව ගැන කිසි සැකයක් ඇතිවුණේ නැහැ. උන්වහන්සේ ඇයව දැක්කේ ශ්‍රද්ධාවන්ත කාන්තාවක් හැටියට. ඒ නිසා ම උන්වහන්සේ ගෙදර ඇතුළ් කාමරයේ වැඩසිටියා. රාත්‍රිය එළඹෙද්දි මේ නිවැසි රූමත් කාන්තාව අනුරුද්ධ මහ රහතන් වහන්සේ වැඩසිටින කාමරයට පැමිණ නටන්ට පටන්ගත්තා. ස්වාමීන් වහන්සේ දෑස් බිමට යොමාගෙන වැඩසිටියා. මේ සුරූපී කාන්තාව නැටුමෙන් ස්වාමීන් වහන්සේව අසංවර කරන්න බැරිවුණ තැනදි ඇඳුම් උනාදමා අඩනිරුවතින් නැටුවා. එයිනුත් ස්වාමීන් වහන්සේගේ හිත අසංවර කරන්න බැරිවුණ තැනදි

ඇය නිරුවතින් නැටුවා. ඒ මොහොතේත් අනුරුද්ධ මහ රහතන් වහන්සේ බිමට යොමුකරගත් දෑසිනුයි වැඩසිටියේ. ඉන්ද්‍රිය අසංවරභාවයට අදාළ ධර්මයන් ප්‍රහාණය කරසිටි අනුරුද්ධ මහ රහතන් වහන්සේගේ සංවර හැසිරීම දකලා එම කාන්තාව බියට පත්වුණා. ඇය අවසානයේ ඉන්ද්‍රිය අසංවරභාවය නිසා සිදුකළ මෝඩ ක්‍රියාව ගැන ස්වාමීන් වහන්සේගෙන් සමාව ඉල්ලුවා.

ඉහත සිද්ධිය වන විට උපසම්පදා ස්වාමීන් වහන්සේ නමකට කාන්තාවක් හුදකලාව සිටින නිවසක වැඩසිටීම අකැපයි යනුවෙන් විනය කාරණාවක් පනවා තිබුණේ නැහැ. ඉහත සිද්ධිය අනුරුද්ධ මහ රහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේට සැලකිරීමෙන් පසුවයි, කාන්තාවක් හුදකලාව සිටින නිවසක උපසම්පදා භික්ෂුවකට වැඩසිටීම තහනම් කර විනය කාරණාවක් උතුම් ප්‍රාතිමෝක්ෂයට එකතුවෙන්නේ. පිංවත් ඔබ ඔබේ ඉන්ද්‍රියන් අසංවරවෙන සෑම මොහොතක ම ඉන්ද්‍රිය අසංවරය නිසා සකස්වෙන අකුසල් නුවණින් දකිමින්, ඔබේ ජීවිතය තුළින් ඉන්ද්‍රිය අසංවරය නිසා සකස්වුණ අකුසල් දැක බිය ඇතිකරගන්න; අසංවර සිත යනු අකුසල් සංස්කාරයන් බව නුවණින් දකින්න.

රූපය ඉදිරියේ වහලෙක් නොවී, නිහඬ උපක්‍රමශීලී ගවේෂකයෙක් වෙන්න

පිංවත් ඔබ සිතන්න ඔබ සීමාව ඉක්මවා ශරීරය ඉස්මතුකර පෙන්වන ඇඳුමක් ඇඳගෙන ප්‍රසිද්ධ ස්ථානයක හැසිරෙනවා කියලා. එම ශරීරය මතුකර පෙන්වන ඇඳුම නිසා ඔබත් කාමච්ඡන්දයන් සකස් කරගෙන ආශ්‍රවයන් වැඩිකර ගන්නවා. ඔබේ නොගැළපෙන ඇඳුම නිසා අනුනුත් නැති ආශ්‍රවයන් ඇතිකර ගන්නවා. එම නිසා පිංවත් ඔබ දක්ෂවෙන්න, ඔබේ ඉන්ද්‍රිය සංවරභාවය තුළින් ඔබේ අසල්වැසියන්ටත් යහපතක් සලස්වන්න. එසේ නොවුණහොත් ඔබේ ඉන්ද්‍රිය අසංවරභාවය නිසා අනුන්ගේ ආශ්‍රවයන් වැඩෙන දිශාවටයි ගමන් කරන්නේ. වර්තමාන සමාජයේ ඉහත කාර්ය බොහෝ ම අපූරුවට අන්‍යෝන්‍ය එකමුතුවකින් යුතුව දෙපාර්ශ්වය ම ආශ්‍රවයන් වඩවාගන්නා බවක් පෙනෙන්නට තිබෙනවා.

වර්තමාන සමාජයේ සූපවේදයේ දියුණුභාවය හේතුවෙන් සකස්වෙන විවිධ රසයෙන්, ගුණයෙන්, පැහැයෙන්, හැඩයෙන් යුත් ආහාරයන් නිසා පිංවතුන් එම ආහාරයන් ඇසෙන් දැක, දිවෙන් රසවිඳ අප්‍රමාණ ආශ්‍රවයන් ඇතිකර ගන්නවා. එම ආහාරයන් නො ලැබුණ තැනදි ගැටෙන සිත් ඇතිකරගෙන නැති ආශ්‍රවයන් ඇතිකර ගන්නවා. එම ආහාරයන්ට ඇල්ම නිසා රෝගාබාධ ඇතිකර ගන්නවා. එම නිසා පිංවත් ඔබ රසය ඉදිරියේ ඇස, දිව, මනස සංවර කරගන්න. එසේ නො වුණහොත් ආහාරය නිසා නිරතුරුව ම පිංවත් ඔබ නැති ආශ්‍රවයන් ඇතිකර ගන්නවා. ඇති ආශ්‍රවයන් වර්ධනය කොටගන්නවා.

නවීන තාක්ෂණික ක්‍රමවේදයන් තුළින් සකස් වී ඇති සංගීතය හේතුවෙන් කනෙන් එම ශබ්දයන් අසා, මනස අසංවර කරගෙන අප්‍රමාණ ආශ්‍රවයන් ඇතිකර ගන්නවා. රාත්‍රී සංගීත සංදර්ශනයක්, සැණකෙළියක් සිහියට නගාගන්න. මේවා බරපතළ ආකාරයට නැති ආශ්‍රවයන් ඇතිකර දෙනවා. සමාජයේ පිංවතුන් ශීලයෙන් දුරස් වෙනකොට, මෛත්‍රී චින්තනයෙන් දුරස් වෙනකොට තමන් තුළින් සිල් සුවඳ, මෙත් සුවඳ නැති වී යනවා. එවිට ශරීරය සුගන්ධවත් කිරීම සඳහා සුවඳ විලවුන් භාවිතයට සමාජය හුරුවෙනවා. සුවඳ විලවුන් භාවිතය නිසා සුවඳ හමන වෙලාවට සැපවේදනාවක් ඇතිකොට ගන්නවා. දහදිය දමන වෙලාවට දුක්වේදනාවක් ඇතිකර ගන්නවා. මේ හේතුව නිසාම නිරතුරුවම ඉන්ද්‍රිය අසංවරය ඇතිකර ගන්නවා. නානාප්‍රකාර ඇඳුම් විලාසිතාවන් නිසා, නිරතුරුව ම රූපය ඉස්මතුකර පෙන්වීමට යාම නිසා ඉන්ද්‍රිය අසංවරය ඇතිකරගෙන නැති ආශ්‍රවයන් ඇතිකර ගන්නවා. එම නිසා පිංවත් ඔබ ඇඳුමක් තෝරාගත්විට ආශ්‍රවයන් ඇති නො වන ආකාරයට, හොඳින් සිහිනුවණින් ඔබ ඒවා පරිහරණය කළ යුතු යි. එසේ නොවුණොත් නැති ආශ්‍රවයන් ඇතිවෙනවා; ඇති ආශ්‍රවයන් වර්ධනය වෙනවා. පිංවත් ඔබ දුශ්ශීලභාවය නිසාත් නිරතුරුව ම ඉන්ද්‍රිය අසංවර කරගන්නවා. සිල්වත්භාවයේ කුසල් මූලයන්ගේ ඵලය හැටියටත් ඉන්ද්‍රිය සංවරය හඳුන්වන්න පුළුවන්.

ඉන්ද්‍රිය සංවරභාවය ගැන සටහන් තබනකොට අධිසංවරභාවය ගැනත් ප්‍රවේශම් වෙන්න ඕනා. සමාජය ඉදිරියේ, පිරිස ඉදිරියේදී සමහරක් පිංවතුන් 'අධිසංවරභාවයෙන්' හැසිරීමට උත්සාහ ගන්නවා; මේ හේතුව නිසා ම නැති ආශ්‍රවයන් ඇතිකර ගන්නවා. ඇති ආශ්‍රවයන් වර්ධනයකොට ගන්නවා.

දිනක් භික්ෂුව, කුටියට ආගන්තුකව පැමිණි ස්වාමීන් වහන්සේ නමක් සමඟ ගමට පිණ්ඩපාතය වැඩියා. උන්වහන්සේ තරුණ සාමණේර ස්වාමීන් වහන්සේ නමක්. එම මාර්ගය එකිනෙකට සමීපව නිවාස පිහිටි, නිතර වාහන ගමන් කරන තාරපාරක්.

භික්ෂුව වේගවත් ද නො වී, සෙමින් ද නො වී මධ්‍යම ප්‍රමාණයට පියවර තබමින් ඉදිරියෙන් වැඩියා. පිණ්ඩපාතයට වැඩිය යුතු අතුරුපාරට හැරෙන තැනට පැමිණ, භික්ෂුව පසුපස හැරී පසුපසින් වඩින එම ආගන්තුක ස්වාමීන් වහන්සේ දෙස බැලුවා. දෙදෙනාම එකට කුටියෙන් එළියට වැඩියත් උන්වහන්සේ භික්ෂුවට වඩා මීටර් 200ක් පමණ ඈතින් තමයි ඒ මොහොතේ වඩිමින් සිටියේ. භික්ෂුව උන්වහන්සේ තුළින් දැක්කේ පිරිස ගැවසෙන මාර්ගයේ වඩින විට උන්වහන්සේ අධිසංවරභාවයක් ඇතිකරගෙන ඇති බව යි. මේ අධිසංවරභාවය ද අපි තුළ නැති ආශ්‍රවයන් ඇති කොටදෙනවා; ඇති ආශ්‍රවයන් වර්ධනය කොටදෙනවා.

භික්ෂුව ගිහි ජීවිතයේ දී ධර්මයේ අර්ථයන් ජීවිතය තුළින් මතුකොටගත්තේ අභියෝගයන් තුළට නො බියව කිඳාබැසලයි. එකක් අතහැරලා දෙකක් දිනාගෙන, දිනාගත් දෙක ම අතහැරීමේ ශක්තියක් මට ගිහි ජීවිතයේ දී තිබුණා.

ඉන්ද්‍රිය අසංවරභාවය මට ගිහි ජීවිතයේ දී හොඳින් හුරුපුරුදු දෙයක්. ඉන්ද්‍රිය අසංවරභාවය තුළින් මතුකොටගත් අත්දැකීම් තුළින් ම යි මම ඉන්ද්‍රිය සංවරභාවය ඇතිකොට ගත්තේ. මගේ අසංවර ඉන්ද්‍රියනුත්, අනුන්ගේ අසංවර ඉන්ද්‍රියනුත් එකතුවුණ තැනදී ඇතිවන වේගවත්භාවය මම හොඳින් නුවණින් දැක්කා. නමුත් ඒ වේගය, රූපයේ වේගය හෝ විඤ්ඤාණයේ වේගය කියලා එදා මම දැනගෙන හිටියේ නැහැ. නමුත් පසුකාලයේ දී රූපයේ අනිත්‍යභාවයත්, විඤ්ඤාණයේ අනිත්‍යභාවයත් අවබෝධ කොටගැනීමට අතීතයේ අත්දැකීම් මට ගොඩාක් උපකාරී වුණා. ඒ නිසා ම යි භික්ෂුව සටහන් තැබුවේ අභියෝගයන්ට කිඳාබැසලයි ධර්මය මතුකොට ගත්තේ කියලා.

පිංවත් ඔබ රූපයන්ට නිරතුරුව ම බැඳීයන්නේ එම වර්ණ, ගන්ධ, ශබ්ද, රස, ස්පර්ශයන් පරිහරණය කිරීමේ දී ඒවා දෙස හොඳින් නුවණින් නො බැලීම නිසයි. ඔබ යමක් දකිනකොට, යමක් අහනකොට හොඳින් විවෘතව දකින්න; බලන්න; අසන්න.

පිංවත් ඔබ, රූපය අඳුරේ අතපතගාන්නෙක් නම් ඔබට කවදාකවත් අවිද්‍යාවෙන් වැසී ඇති රූපය තුළින් ප්‍රඥාවේ ආලෝකය මතුකොට ගැනීමට හැකියාව ලැබෙන්නේ නැහැ. විවෘතකොටගත් දෑස්, තියුණු දෑස් සමඟ ගවේෂණශීලී විදර්ශනාමය මනස මුහුවුණ තැනදී රූපයේ යථා ස්වභාවය මතුකොට ගැනීමට ඔබට පහසුවක් වෙනවා. පිංවත් ඔබ රූපය ඉදිරියේ වහලෙක් නොවී, නිහඬ උපක්‍රමශීලී ගවේෂකයෙක් වීමට දක්ෂවෙන්න. රූපය ඉදිරියේ නිහඬ ගවේෂකයෙක් වීමට දක්ෂ පිංවතා රූපය කෙරෙහි තෘෂ්ණාවෙන් ඇතිකොටගත් ඉන්ද්‍රිය අසංවරභාවය තුළින් ම වීර්යෙන්, ඉවසීම තුළින් ඉන්ද්‍රිය සංවරභාවයට අවශ්‍ය සාධක මතුකොට ගන්නවා. එසේ නො වුණහොත් ඉන්ද්‍රිය අසංවරභාවය නිසා ම නැති ආශ්‍රවයන් ඇතිකොට ගන්නවා; ඇති ආශ්‍රවයන් වර්ධනය කරගන්නවා.

ඔබත් මේවා නො දැන, නැති ආශ්‍රවයන් ඇතිකර ගත්තා ද?

මීළඟට බුදුරජාණන් වහන්සේ සබ්බාසව සූත්‍රයට අදාළව වීර්යෙන් ප්‍රහීණ කළ යුතු ආශ්‍රවයන් ගැන සඳහන් කරනවා. නිවන් අවබෝධයට අදාළ සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් තුළ වැඩිපුර ම කියැවෙන වචනය තමයි, 'වීර්ය' කියන වචනය. වීර්යෙන් තොරව ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩීමක් නැහැ. බුදුරජාණන් වහන්සේ ලෝකයට පහළ වෙන්නේ කාලය, දීපය, දේශය, කුලය, මව කියන පස්මහ බැලුම් බලලා, ඊට සුදුසු කාල පරාසයක.

වර්තමානයේ කවදාකවත් බුදුරජාණන් වහන්සේ නමක් පහළ වෙන්නේ නැහැ. අපි ජීවත්වෙන වර්තමානය විකෘතියක් බවට පත්වෙලයි තිබෙන්නේ. බුදුරජාණන් වහන්සේ උතුම් සම්බුද්ධත්වයට පත්වීමට පෙරාතුව සුජාතා සිටුදියණියගේ කිරිපිඬු දානය වළඳා, හිස් පාත්‍රය නේරංජනා ගඟේ ගලායන ජලය මත තබලා අධිෂ්ඨානයක් කරනවා, "මා නියත වශයෙන් සම්මා සම්බුද්ධත්වයට පත්වන්නේ නම් මේ පාත්‍රය උඩුගම්බලා යත්වා" කියලා. බෝධිසත්වයන්ගේ ප්‍රාර්ථනාව අනුව ම පාත්‍රය උඩුගම්බලා යනවා. නමුත් පිංවත් ඔබ වර්තමානයේ අපේ ප්‍රධාන ගංගාවක මෝය කටට ආසන්න ප්‍රදේශයකට උදයට ගිහිල්ලා පාත්‍රයක් ගඟ දියේ තබා අධිෂ්ඨාන කළොත් "උඩුගම්බලා යේවා" කියලා අනිවාර්යෙන් ම පාත්‍රය උඩුගම්බලා යනවා. මොකද, පාරිසරික විකෘතියන් නිසාත්, උදය වරුවට මුහුදෙන් ජලය ගලාගෙන ඒම නිසාත් ගංගාවල ජලය උඩු ප්‍රදේශයට ම යි ගමන් කරන්නේ.

බුදුරජාණන් වහන්සේ නමක් ලෝකයට පහළවෙන කාලය, දීපය, දේශය, කුලය, මව කියන ධර්මතාවයන්ට අදාළ කාලය වසර 2600ක් ගෙවීගිය තැනයි, අපි අද ධර්මයේ අර්ථයන් සොයමින් සිටින්නේ. මෙවැනි කාලවකවානුවක වීර්ය කියන කාරණය ධර්මය මතුකර ගැනීමට අත්‍යවශ්‍ය ම කාරණයක් වෙනවා.

පිංවතුන්ලා සමථ-විදර්ශනාව වැඩීමට පෙර, පාරිසරික හේතූන් නිසා සකස්වෙන ධර්මතාවයන් වන ශීතල, උෂ්ණත්වය, පින්න, සුළඟ, වැස්ස නිසා සකස්වෙන බාධාවන්ට මුහුණදීමට වීර්ය ඇතිකරගත යුතු වෙනවා. එසේ නො වුණහොත් ඉහත පාරිසරික බාධාවන් ඔබ ඉදිරියට පැමිණීමේ දී ඔබ ගැටෙන සිතක් ඇතිකරගෙන නැති ආශ්‍රවයන් ඇතිකර ගන්නවා; ඇති ආශ්‍රවයන් වර්ධනය කරගන්නවා. පිංවත් ඔබ එදිනෙදා ජීවිතයේ දී විවේකයක් ලද සැම මොහොතක ම මේ පාරිසරික හේතූන් නිසා සකස්වෙන බාධාවන් නුවණින් මෙනෙහි කිරීමට වීර්ය ගන්න. මොකද, වැස්ස, අව්ව, පින්න, සුළඟ කියන කාරණාවන් ඔබ හේතුඵල ධර්මයන් වශයෙන් නුවණින් නො දැක්කොත්, ඒවා නිසා ගැටෙන සිත් ඇති කොටගෙන නැති ආශ්‍රවයන් ඇතිකර ගන්නවා; ඇති ආශ්‍රවයන් වර්ධනය කරගන්නවා.

භික්ෂුවට මතකයි, ධර්ම දේශනාවක් අතරමඟ දී ධාරානිපාත වර්ෂාවක් ඇදහැලුණා. ඒ නිසා ම ධර්ම දේශනාව පවත්වන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. උතුම් සද්ධර්මයක් ශ්‍රවණය කිරීමට බලාපොරොත්තු වුණු දහස් ගණනක් තෙමී සිටි පිංවතුන් වැස්සට දොස් කියනවා, දෙවියන්ට බණිනවා, මාරයාට චෝදනා කරනවා භික්ෂුවට ඇසුණා. ඒ නිසා ම සමහරක් පිංවතුන් නැති ආශ්‍රවයන් ඇතිකරගත්තා.

භික්ෂුවට අද පිණ්ඩපාතයේ වඩින්න කුටියෙන් එළියට බසිනවිට කිසි ම වැසි සලකුණක් පෙනෙන්නට තිබුණේ නැහැ. නමුත් ගමන අතරමඟ දී අහස කළු කරලා පොද වැස්සක් වැටෙන්න පටන්ගත්තා. නමුත් භික්ෂුව වැස්ස කියන කාරණය

සිතෙන් අතහැරලයි තිබුණේ. ඒ නිසා ම භික්ෂුව ටිකක් තෙමුණත් වැස්සට බණින්න ගියේ නැහැ. කුඩය නො ගෙනාවා කියලා කුඩය සමඟ ගැටෙන්න ගියේ නැහැ. තේජෝ මනසිකාරය වඩමින් පොද වැස්සේ ම පිණ්ඩපාත මඩුවට වැඩියා. පිංවත් ඔබ නුවණින් විමසා බලන්න, ඔබේ ජීවිත කාලය තුළ පාරිසරික හේතූන් නිසා ඔබ කොච්චර නම් නැති ආශ්‍රවයන් ඇති කරගෙන තිබෙනවා ද? ඇති ආශ්‍රවයන් වර්ධනය කරගෙන තිබෙනවා ද කියලා. එම නිසා නැවත පාරිසරික හේතුවක් වුව ද ධර්මානුකූලව ගළපා ගැනීමට පිංවත් ඔබට වීර්ය අත්‍යවශ්‍ය කාරණයක් වනු ඇත.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, සුළඟට අධිගෘහිත දෙවියෙක් සිටිනවා. එම දෙවියන්ට කියන්නේ වාතවලාහක දෙවියන් කියලා. මේ වාතවලාහක දෙවියන් සිතනවා, දැන් අපි කම්සුව විඳිමුයි කියලා. වාතවලාහක දෙවියන්ට කම්සුව විඳිමුයි කියලා සිත පහළ වුණ හැටියේ ම දැඩි සුළඟ ඇති වෙනවා. වැස්සට අධිගෘහිත වැස්සවලාහක දෙවියන් සිටිනවා. වැස්සවලාහක දෙවියන් කම්සැප විඳීමට සිතක් ඇතිවූ සැණින් ම වැසි ඇති වෙනවා. හිරුට අධිගෘහිතව ජීවත්වන උෂ්ණවලාහක දෙවියන් කම්සුව විඳිනකොට සාමාන්‍ය නො වන දැඩි උණුසුමක් ඇති වෙනවා. ඒ වගේ ම යි, අබ්භවලාහක දෙවියන්ට කම්සුව විඳිමුයි සිතක් පහළ වී කම්සැප විඳිනවිට ආකාශය පුරා වලාකුළු වැඩි වශයෙන් පිහිටනවා. ඒ වගේ ම යි, ශීතලට අධිගෘහිත සීතවලාහක දෙවියන් කාමච්ඡන්දයන් විඳිනකොට අධික ශීත දේශගුණයක් ඇති වෙනවා. ඉහත දේශගුණික තත්වයන් ඇතිවීමට බලපාන එක හේතුවක් තමයි, ධර්මයට අදාළව භික්ෂුව ඉහතින් සටහන් කළේ.

පිංවත් ඔබ නුවණින් දකින්න, මනුෂ්‍යයින් වන ඔබ කම්සැප විඳින අවස්ථාවක්, මඟුල් ගෙදරක්, රාත්‍රී සැණකෙළියක්. දෙසැම්බර් 31 වැනිදා රාත්‍රිය ගන්නකෝ. ඔබ මෙවැනි අවස්ථාවල මොහොතක්වත් සිතනවා ද, මත්වතුර බීලා, කන් බිහිරි කරවන සංගීතය, නැටුම්, රතිඤ්ඤා හඬ ආදී මේවායින්

අසල්වැසියාට, රෝගියාට, කුඩා දරුවන්ට පීඩාවක් වෙනවා කියලා? කාමච්ඡන්දයන් විඳින දෙවියනුත් එහෙම තමයි. දෙවියන්ගේ ආස්වාදය ගැන සිතනවා මිස, එම ආස්වාදයන් නිසා පීඩාවට පත්වන සත්වයින් ගැන සිතන්නේ නැහැ. මේ චිත්තයන් හේතුවෙන් දෙවියන් නිරතුරුව ම අකුසල් මූලයන්මයි රැස්කර ගන්නේ. නැති ආශ්‍රවයන් ඇතිකර ගන්නවා. ඇති ආශ්‍රවයන් වර්ධනය කරගන්නවා.

මීළඟට කායික හේතූන් නිසා සකස්වෙන බඩගින්න, පිපාසය, කැක්කුම්, වේදනා, වීර්යයෙන් යුතුව ඉවසීමට ඔබ පුහුණුවිය යුතු වෙනවා. එසේ නො වුණහොත් ඉහත හේතූන් නිසා පිංවත් ඔබ ගැටෙන සිත් ඇතිකොටගෙන, නැති ආශ්‍රවයන් ඇතිකොට ගන්නවා. පිංවත් ඔබ ඔබේ ජීවිතය දෙස නුවණින් බලන්න. ඔබට අතීතයේ ඇතිවූ කුසගින්න, පිපාසය, වේදනා, කැක්කුම් නිසා ඔබ කොපමණ ගැටෙන සිත් ඇතිකොටගන්න ඇති ද? පිංවත් ඔබ, ගෙදර අම්මා, බිරිඳ බත් පිඟාන බෙදලා දෙන්න පරක්කු වුණා ය කියලා, බෙදා දුන්නු බත් පිඟාන රස නැතිය කියලා නොඉවසිලිමත්භාවය නිසා ම කොපමණ ගැටෙන සිත් ඇතිකොටගෙන තිබෙනවා ද? කුසගින්නක්, පිපාසයක් දැනුණහම, ආශ්‍රවයන් ඇති නොවන ලෙස වීර්යයෙන් යුතුව ඉවසීමට ඔබ පුරුදු වෙන්න. දක්ෂයා ආහාරය තුළින් ආයුෂය, වර්ණය, සැපය, බලය දියුණුකොට ගන්නවා. වඩාත් දක්ෂයා ආහාරයක් නො ලැබීම තුළින් ආයුෂය, වර්ණය, සැපය, බලය ඉක්මවා ගිය විදර්ශනා නුවණ මතුකොට ගන්නවා.

දකින්න, විශ්වාස කරන්න සංස්කාරයන්ගේ සාධාරණය....

පිංවත් ඔබ ආහාරයක් නො ලැබීයාම විදර්ශනා නුවණින් දකින්න දක්ෂ වුණොත් ඒ ලබන විදර්ශනා නුවණ නිසා ම කුසගින්න ඔබෙන් පලායනවා.

භික්ෂුව දිනක් උදේ පිණ්ඩපාතයට අදාළ නිවසට වඩිනවිට දැඩි සුළඟක් සමඟ ධාරානිපාත වර්ෂාවක් ඇදහැලුණා. ටික දුරක් වඩිනවිට කුඩය ඔසවාගෙන යන්න බැරි තරමට ම සුළඟ වැඩිවුණා. මුළු සිරුරත්, පාත්‍රයත් හොඳට ම තෙතබරිත වෙලා. වැස්සේ අඩුවක් නැහැ. භික්ෂුව තීරණය කළා, මෙහෙම තෙමිලා අදාළ නිවසට වඩින්න බැහැ. එම නිසා පිණ්ඩපාත ගමන නවතා නැවත කුටියට වැඩියා. වැස්සේ ම සිවුර හෝදලා කුටිය ඇතුළේ වැලට දැම්මා. උදේ 8.30 වන විට වැස්ස නැවතිලා. එදා පිණ්ඩපාත දානය හිමි අදාළ නිවසේ මහත්මයෙක් භික්ෂුව නොවැඩිය නිසා ත්‍රීවිල් රථයක් රැගෙන භික්ෂුව එම නිවසට වඩම්වන්න පැමිණියා. භික්ෂුව එම මහත්මයාට ප්‍රකාශ කළේ "දැන් කාලය ප්‍රමාද වැඩියි. දානය අවශ්‍ය නැහැ"ය කියලා. ඒ වෙලාවේ ඒ මහත්මයා ඇසුවා, "හාමුදුරුවනේ කුටියට දානය ගෙනත් දෙන්න ද?" කියලා. භික්ෂුව කීවා, "අවශ්‍ය නැහැ මහත්තයෝ" කියලා. එවිට ඒ මහත්මයා කුටියෙන් බැහැරව ගියා. නැවත කුටියට පැමිණියේ නැහැ. එදා දවස භික්ෂුව ධාරානිපාත සුළඟ සමඟ පැමිණි වර්ෂාවත්, පිණ්ඩපාතය නො ලැබීයාමත් හේතුඵල ධර්මයන්ට ගළපමින්, විදර්ශනා නුවණ ආහාරයක් කරගෙන කායික, මානසික පීඩාවකින් තොරව දවස ගෙවා දැම්මා.

පිංවත් ඔබ නුවණින් මෙනෙහි කර බලන්න, ශාරීරික වේදනාවන්, කැක්කුම් නිසා කොපමණ ඔබ ගැටෙන සිත් ඇතිකරගෙන, නැති ආශ්‍රවයන් ඇතිකොට ගන්නවා ද කියලා. සමහරක් පිංවතුන්ලා වේදනා, කැක්කුම් ඇතිවෙනවිට නොසන්සුන් භාවයත්, කේන්ති ගන්නා ස්වභාවයත් ඇතිකර ගන්නවා. සතරමහධාතුවේ කිපීම්වලට අදාළ වේදනා, කැක්කුම් හේතුඵල ධර්මයක් ම ය කියලා නුවණින් දකින්නේ නැහැ.

භික්ෂුව ධර්මදේශනා පවත්වන දිනවල උදරයේ ඇති වූ රෝගී තත්වයක් හේතුවෙන් පරීක්ෂණයක් කළ යුතු බව දොස්තර මහත්මයා දැනුම්දුන්නා. නමුත් රෝහල්ගතව එම පරීක්ෂණය කරගන්න විවේකයක් තිබුණේ නැහැ. මොකද, දවසක් හැර දවසක් ධර්මදේශනාවලට දින වෙන් කර තිබූ නිසා. රෝගී තත්වය වැඩි වූ නිසා පෙරදින රාත්‍රී ධර්මදේශනාවක් නිමාකර කුටියට පැමිණියා. දහවල් 12.00 සිට සවස 5.00 දක්වා වරින් වර උදරය විරේක කළා. ඊට අදාළ ඖෂධ පාවිච්චි කරලා පෙරදින දහවල් 12.00 සිට පසුවදා උදේ 9.00 දක්වා කිසිදු ගිලන්පසක්, දානයක් නොමැතිව උදරය විරේක කොට උදේ 9.00ට කළුබෝවිල රෝහලේ දී එම පරීක්ෂණය සිදුකළා. උදරයට අදාළව කිසිදු රෝගයක් තිබුණේ නැහැ. පරීක්ෂණයෙන් අනතුරුව දානය ගත්තා. එදින ම සවස හතරට පැවති ධර්මදේශනයේ දී පැය 3ක් ධර්මය දේශනා කර අනෙක් වැඩ සඳහා තවත් පැය දෙකක් එහි ගතකර රාත්‍රී 10.00ට කුටියට වැඩියා. වේදනා, කැක්කුම් ධර්මයට ගළපලා දකිනවිට, වේදනා, කැක්කුම් හිස් දෙයක්, හේතුඵල ධර්මයක් හැටියටයි අපි දකින්නේ. මේ තත්වය ඇතිකර ගැනීමට නම් වීර්යත් ඉවසීමත් පුරුදු කළ යුතු ම වෙනවා. ඔබ තුළ වීර්යත්, ඉවසීමත් නැතිනම් වේදනා, කැක්කුම් නිසා ම නැති ආශ්‍රවයන් ඇතිකර ගන්නවා; ඇති ආශ්‍රවයන් වර්ධනය කරගන්නවා.

ඒ වගේ ම යි, මැසිමදුරුවන්ගෙන්, සර්පයන්ගෙන් වන බාධාවන් වීර්යෙන් යුතුව ඉවසීමට දක්ෂභාවය ඇතිකරගත යුතු වෙනවා. පිංවත් ඔබ සිතන්න, එදිනෙදා ජීවිතයේ දී මැසිමදුරුවන්,

කැරපොත්තන්, කුඹින් නිසා ඔබ කොයිතරම් ආශ්‍රවයන් ඇතිකර ගන්නවා ද? එම සතුන් මැරීම නිසා, එම සතුන්ගෙන් බාධාවන් සිදුවීම් නිසා, එම සතුන්ට හිංසාවීම නිසා ඔබ මොනතරම් ආශ්‍රවයන් ඇතිකර ගන්නවා ද? බුද්ධ වන්දනාව කරන විට මදුරුවන් නිසා, බුද්ධ පූජාව තියනවිට කුඹින් නිසා මොනතරම් ගැටෙන සිත් ඇතිකර ගන්නවා ද?

දිනක් භික්ෂුව පිණ්ඩපාතය කරගෙන පෙරළා කුටියට වැඩමකොට, ආහාර සහිත පාත්‍රය මේසය මත තබා කුටියේ සහ අවට පිරිසිදු කිරීමේ කටයුතු අහවරකොට පැන් පහසු වී, පාත්‍රය අතට ගෙන බලනවිට පාත්‍රයේ ආහාරවලට රතු පාට ලොකු කුඹි ඇවිල්ලා. පාත්‍රය ඇතුළේ සිටි කුඹි එම ආහාර කොටස් සමඟ ඉවත් කරලා ඉතිරි දානය වැළඳුවා. කුඹින්ට බනින්න ගියේ නැහැ. තිරිසන් සතුන් නිසා අපි නැති ආශ්‍රවයන් ඇතිකර ගන්නවා. එය උතුම් මනුෂ්‍ය ජීවිතයටත් අගෞරවයක් වෙනවා. වීර්යෙන් යුතුව, ඉවසීමෙන්, හේතුඵල ධර්මයන්ට අනුව දකිමින් ජීවත්වෙන්න ඔබ පුරුදු විය යුතු වෙනවා.

පිංවත් ඔබ තම ගෙදර, කුටිය පිරිසිදුව පිළිවෙළට තබාගන්න. ඇඳුම්, පොත්පත් අනෙකුත් භාණ්ඩ පිළිවෙළකට තබාගන්න වීර්ය කියන කාරණය අත්‍යවශ්‍ය වෙනවා. ඉහත කාරණාවන් සිදුකර ගැනීමට ඔබ තුළ වීර්ය නො තිබුණොත් අපිරිසිදුභාවය නිසා ම, අපිළිවෙළ නිසා ම විසිරුණු සිතක උරුමයයි ඔබට හිමිවෙන්නේ. ඒ නිසාම ඔබේ සිතේ ධර්මයන් වැඩෙන්නේ නැහැ. අපිරිසිදු භාවයන්ට අදාළව අමනුෂ්‍ය කොටස්වල ග්‍රහණයන්ට ඔබව මැදිවෙනවා. එවැනි පරිසරයක් හේතුවෙන් ඔබ තුළ නැති ආශ්‍රවයන් වැඩෙනවා. භික්ෂුව අත්දැකීමෙන් ම දැකලා තිබෙනවා, භාවනා කරන සමහරක් පිංවතුන්ලාගේ නිවස, කාමරය, කුටිය අපිළිවෙළට, අපිරිසිදුවයි තිබෙන්නේ. අවශ්‍ය, අනවශ්‍ය දේවල්වලින් කාමරය පිරිලා. ඉවත දැමිය යුතු දේවල් තැන්පත් කර ගැනීමටයි උත්සාහ ගන්නේ. මෙවැනි හේතුන් සකස් වෙන්නේ, සබ්බාසව සූත්‍රයට අදාළව සමථ-විදර්ශනාවට පෙර කළ යුතු පූර්වකෘතිවලින් පරිපූර්ණ නො වීම නිසා ම යි.

මීළඟට පිංවත් ඔබ, සමාජයෙන් නැගෙන තියුණු චෝදනා, විවේචන, නරක වචන, නපුරු ඉරියව් වීර්යෙන් යුතුව ඉවසීමට පුරුදුවිය යුතු යි. සමාජය තුළ ලෝභ, ද්වේෂ, මෝහ අකුසල් මූලයන් වැඩි වශයෙන් වඩනවිට චෝදනා, විවේචන, නරක වචන, නපුරු ඉරියව් සමාජය තුළ වැඩිවෙනවා.

භික්ෂුවට මතකයි, භික්ෂුව එක්තරා ගමක පිණ්ඩපාතය වඩිනවිට වෙච්ච සිද්ධියක්. එදා භික්ෂුවගේ හිසරැවුල් වැවිලයි තිබුණේ. දැඩි අව්රශ්මියේ දහදිය දමාගෙන පෙරළා කුටියට වඩින භික්ෂුව දැකලා පාරේ එහා පැත්තෙන් සිටිය ශ්‍රද්ධාව අඩු මහත්මයෙක් අනෙක් කෙනාට කියනවා, "දැන් අපේ ගමට හිඟන්නො එනවා වැඩියි" කියලා. ඒ මහත්මයාගේ ඒ නපුරු වචන ඇසෙනවිට භික්ෂුව හදවතින් සිනාසුණා පමණක් ම යි. සාරිපුත්ත මහ රහතන් වහන්සේ සිංහනාදයක් කරනවා, "මම උදේට පාත්‍රය අරගෙන පිණ්ඩපාතයට කුටියෙන් එළියට බහින්නේ, රොඩී රැහැක රොඩී දරුවෙක් පොල්කට්ටක් අරගෙන සිඟමන් බලාපොරොත්තුවෙන් රොඩී රැහෙන් එළියට බහිනවා වගේ" කියලා. පාරේ අයිනේ සිටිය අදාළ මහත්මයා භික්ෂුවට සිඟන්නෙක් කියලා කියන විට භික්ෂුවට සිතුණේ භික්ෂුව වෙනුවෙන් ඒ මහත්මයා සිංහනාදයක් කළා ය කියලයි. අද වෙනවිට එම පිංවත් මහත්මයා භික්ෂුවට බොහෝ ම ගෞරවයෙන් දන් පූජා කරන මහත්මයෙක්.

දිනක් භික්ෂුව පිණ්ඩපාතය කරගෙන ප්‍රධාන මාර්ගයේ පෙරළා කුටියට පැමිණෙන විට පිංවතුන් තුන්දෙනෙක් පාපැදිවලින් භික්ෂුව පසුකරගෙන විරුද්ධ දිශාවට ගියා. ටික දුරක් ගියාට පස්සේ මේ පිංවතුන් තුන්දෙනා එකට ම "තට්ටයෝ" කියලා හයියෙන් කෑගැහුවා. මේ කාරණය ලියන විටත් භික්ෂුවට සිනායනවා. මේ සිනාව ම යි එදා භික්ෂුවට තට්ටයා කියලා කෑගසන විටත් ඇති වුණේ. මනුෂ්‍ය සමාජයේ තිබෙන ලොකු ම දුර්වලකම තමයි අනුන්ගේ දෙය මගේ කරගැනීම. අනුන් තුළත් පුද්ගල සංඥාවන් දකිනවා. තමා තුළත් මම සිටිනවා ය කියලා දකිනවා. සක්කාය දිට්ඨිය කියන්නේ ඔය දුර්වලතාවයට යි. යම්

පිංවතෙක් ඔබට චෝදනාවක්, අගෞරවයක්, පීඩාවක් කරනවා නම්, එය ඔබ සංසාරයේ කරන ලද අකුසල් සංස්කාරයක විපාකයක් වශයෙන් දකිමින් එම ක්‍රියාව කර්මය, කර්මඵල විශ්වාසයට භාරදෙන්න. අනුන්ගේ වැරදි ක්‍රියාවන් ඔබ ඔබේ කරගෙන අකුසල් දෙසට ගමන් කරන්න එපා. මේ ලෝකයේ සාධාරණ ම විනිශ්චය ලබාදෙන්නේ සංස්කාර ධර්මයන් තුළින් සකස්වන කර්මය, කර්මඵල විසිනුයි.

දේවදත්ත හාමුදුරුවෝ බුදුරජාණන් වහන්සේට දැඩි ආකාරයෙන් චෝදනා, විවේචන, පීඩා එල්ල කරනකොට බුදුරජාණන් වහන්සේ ඒවා උපේක්ෂාවෙන් යුතුව ඉවසුවේ කර්මය, කර්මඵල විශ්වාසයට අදාළව දේවදත්ත ලබන අවීචියේ දණ්ඩනය නුවණින් දකින ගමනුයි. අනුන් ඔබට කරන වැරදිවලට ඔබ දඬුවම් දෙන්න යන්න එපා. ඒවා වීර්යෙන් ඉවසන්න. එවිට අනුන් නිසා ඔබ දඬුවමට ලක්වන්නේ නැහැ. ඒ නිසා ඔබ තුළ නැති ආශ්‍රවයන් හටගන්නේ නැහැ; ඇති ආශ්‍රවයන් වර්ධනය වෙන්නේ නැහැ.

තෘෂ්ණාව දන්දී අහර පමණක් භුක්ති විඳින්න (ප්‍රත්‍යවේක්ෂාව ගැන....)

මීළඟට සබ්බාසව සූත්‍රයට අදාළව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ප්‍රත්‍යවේක්ෂාවෙන් ප්‍රහීණය කළ යුතු ආශ්‍රවයන් කියලා. කුමක්ද ඔබ ප්‍රත්‍යවේක්ෂා කරන්නේ? ඔබ ගන්නා වූ ආහාරය, ඇඳුම්-පැළඳුම්, ඖෂධ, නිවාස හෝ කුටිය. මේවා පරිහරණය කිරීමේ දී සිහිනුවණින් පරිහරණය කරනවා. ආහාරයක්, ගිලන්පසක්, ඖෂධයක්, නිවාසයක් පරිහරණය කිරීමේ දී මේවා කෙරෙහි තෘෂ්ණාවක් ඇතිකොට ගතහොත්, ඒවා කෙරෙහි සුබ, නිත්‍ය සංඥාවන් ඇතිකොට ගතහොත් ඔබ තුළ නැති ආශ්‍රවයන් වැඩෙනවා; ඇති ආශ්‍රවයන් වර්ධනය වෙනවා. ආහාරයත්, ගිලන්පසත්, ඖෂධත් ඔබ පරිහරණය කළ යුත්තේ, මේ ශරීරයේ ජවය, මදය, අලංකාරය පිණිස සිතිවිලි ඇති කොටගෙන නො වේ; අනිත්‍යභාවයට පත්වන ආයුෂ, වර්ණ, සැපය, බලය පිළිබඳ දැක්මක් ඇති කොටගෙන ය. ආහාරයක් ගැන සිතන මොහොතේ, ආහාරයක් සකස්කරන මොහොතේ, ආහාරයක් අනුභව කරන මොහොතේ ආහාරය කෙරෙහි ඇතිවන රස, ගුණ පිළිබඳ සිතිවිලි අනිත්‍ය වශයෙන් දකින්න ඔබ දක්ෂ නම් එතැන අර්ථවත් ප්‍රත්‍යවේක්ෂාවක් තිබෙනවා. සංසාරයක් පුරාවට ඔබ ආහාර ටොන් කී ලක්ෂයක් ගිල දමන්නට ඇති ද? රජ, සිටු, ඇමතිවරු වෙලා රාජ භෝජන කොතෙක් ගිලදමන්නට ඇතිද? සශ්‍රීක දෙවිවරු වෙලා දිව්‍ය භෝජන කොතෙක් වළඳන්න ඇති ද? තිරිසන් සතුන් වෙලා තණකොළ, පුන්නක්කු කොතෙක් ගිලදමන්නට ඇති ද? ප්‍රේතයෙක්, ප්‍රේතියක් වෙලා සෙම්, සොටු

මොනතරම් ආහාරය කොට ගන්න ඇති ද? යක්ෂයින් වෙලා භූත සත්වයන් මොන තරම් මරාගෙන කන්න ඇති ද? මේ හැම භවයක් ම, මේ සෑම ආහාරයක් ම අනිත්‍ය බව නුවණින් දකිමින් වර්තමාන කෑම මේසයේ කෑම පිඟාන භුක්තිවිඳින්න. ඔබ භුක්තිවිඳින කෑම පිඟානේ රසයත්, ගුණයත් පිළිබඳ සිතුවිලි අපවිත්‍රභාවයෙන් සෙම්, සොටු, රුධිරය, මූත්‍රා, වමනය අසූචි වශයෙන් නො ගැටෙන සිතෙන්, සංසන්දනාත්මක ව නුවණින් දකින්න. ඉහත කාරණයේ දී ඔබේ සිතේ ගැටීමක් ඇතිවෙනවා නම්, එම ගැටෙන සිතත් අනිත්‍ය වශයෙන් දකින්න. ආහාරය තුළ ඕපපාතිකව ඇතිවන පණුවෙක්, ප්‍රත්‍යවේක්ෂාවෙන් තොරව ආහාර ගැනීමේ ඵලයක් බව නුවණින් දකින්න. අනුභව කරන බත්-කටට වඩා, දන් දෙන බත්කට වටිනා බවත්, දන්දෙන බත්කටට වඩා, ප්‍රත්‍යවේක්ෂාකොට අනුභව කරන බත්කට ශ්‍රේෂ්ඨ බවත් සිහිපත් කරගන්න.

ආහාර ප්‍රත්‍යවේක්ෂාව ගැන සටහන තබනකොට, අතීතයේ වැඩ සිටිය ස්වාමීන් වහන්සේ නමක් මතකයට පැමිණියා. මේ ස්වාමීන් වහන්සේ රහතන් වහන්සේ නමක්. නමුත් අනිත් ස්වාමීන් වහන්සේලා මේ බව දැනගෙන සිටියේ නැහැ. මේ ස්වාමීන් වහන්සේ අනිකුත් ස්වාමීන් වහන්සේලාත් සමඟ දානගෙවල්වලට වැඩියහම පාත්‍රයට හත් වතාවක් ම දානෙ බෙදාගෙන වළඳනවා. වැඩිපුර දානය වළඳන මේ ස්වාමීන් වහන්සේ නිසා අනෙක් ස්වාමීන් වහන්සේලාට ලැජ්ජාවක් ඇතිවුණා. දිනපතා සිදුවන මේ ලැජ්ජාසහගත ක්‍රියාව නිසා ස්වාමීන් වහන්සේලා සිතුවේ අදාළ ස්වාමීන් වහන්සේ ගිජුකම නිසා වැඩිපුර දානය වළඳනවා කියලා. මේ කාරණය ස්වාමීන් වහන්සේලා විසින් බුදුරජාණන් වහන්සේට පැමිණිලි කරනවා. බුදුරජාණන් වහන්සේ දිවැසින් බලනවා, කවුද මේ සීමාව ඉක්මවාගොස් දානය වළඳන ස්වාමීන්වහන්සේ කියලා. එවිට බුදුරජාණන් වහන්සේ දකිනවා, උන්වහන්සේ රහතන් වහන්සේ නමක් ය කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, අතීතයේ පන්සියයක් ආත්මභාවවල ඇත් කුලයේ ඉපදීම නිසා ඒ සංසාර පුරුද්දට ආහාර වැඩිපුර

ගන්නවා කියලා. ඒ රහතන් වහන්සේ පාත්‍රයට හත් වතාවක් දානය බෙදාගෙන වැළඳුවත් උන්වහන්සේ වළඳන එක ම බත්කටක් නිසාවත් උන්වහන්සේ තුළ තෘෂ්ණාවක් ඇති නොවන බව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. පිංවත් ඔබත්, කෑම මේසයේ දී තෘෂ්ණාව දන් දී ආහාර පමණක් අනුභව කරන්න. එය ආහාර, ගිලන්පස ප්‍රත්‍යවේක්ෂාවේ ශ්‍රේෂ්ඨ ම ඵලය වෙනවා වගේම, ශ්‍රේෂ්ඨ ම දානය වෙනවා ඇත. එසේ නොවී, තෘෂ්ණාවෙන් ඔබ ආහාර, ගිලන්පස පරිහරණය කළොත්, ඔබ තුළ නැති ආශ්‍රවයන් ඇතිවෙනවා; ඇති ආශ්‍රවයන් වර්ධනය වෙනවා.

ඖෂධ පරිහරණයේදීත් රෝගීභාවය අනිත්‍යභාවයට පත්වී නිරෝගීභාවයත්, නිරෝගීභාවය අනිත්‍යභාවයට පත් වී රෝගීභාවයත් ඇතිවන අයුරු නුවණින් දකිමින් ඖෂධ ප්‍රත්‍යවේක්ෂාව සිදුකරන්න. වර්තමානයේ ඖෂධවල මිලගණන් අහනකොට, ඖෂධ මිලට ගන්නකොට නැති ආශ්‍රවයන් ඇතිවන බවක් සමාජය තුළින් අසන්නට ලැබෙනවා. මෙවැනි සිදුවීම් මනුෂ්‍යයාගේ ලෝභ, ද්වේෂ, මෝහ සිතිවිලි නිසා හටගන්නා අකුසලයන්ගේ විපාකයක් බව හඳුනාගනිමින් අකුසල් නිසා පිංවත් ඔබ නැති ආශ්‍රවයන් ඇතිකොට ගන්නේ නැතිව, මෙවැනි ප්‍රශ්න ධර්මානුකූලව ගළපාගන්න දක්ෂ වෙන්න ඕනේ. ඉපදීම නිසාමයි ජරා, ව්‍යාධි, මරණ සිද්ධවෙන්නේ. ඉපදීම නිරෝධය කිරීමෙන් තොරව ඉහත ප්‍රශ්නය නො විසඳෙන බව ඔබ නුවණින් දකින්න දක්ෂ නම්, එය ඖෂධ ප්‍රත්‍යවේක්ෂාවට අර්ථවත් ප්‍රවේශයක් වෙනවා.

මේ සටහන තබන දිනයේ භික්ෂුව උදේ ම කසායක්, චූර්ණයක් වැළඳුවා. සවසත් කසායක්, චූර්ණයක් වැළඳුවා. ඒ ඖෂධයන් ප්‍රත්‍යවේක්ෂා කිරීමේ දී භික්ෂුව දකින්නේ, වෙනස්වන නිරෝගීභාවයත්, වෙනස්වන රෝගීභාවයත් පමණ ම යි. ඉපදීම නිසා සකස්වෙන, වෙනස්වන, ජාති, ජරා, ව්‍යාධි ධර්මතාවලට නො වෙනස්වන විසඳුම ඖෂධ නො ව, ඉපදීමේ නිරෝධය

බවත්, එතෙක් ප්‍රත්‍යවේක්ෂාවෙන් ඖෂධ පරිහරණය කොට, ඇති ආශ්‍රවයන් නැතිකොට ගන්න ඔබ දක්ෂවෙන්න.

සංස්කාරයන්ට යටත්ව ජීවිතය නො දකින පිංවතා නිරෝගී භාවයට ගොඩාක් කැදරයි. ඒ නිසා ම ඖෂධ ප්‍රත්‍යවේක්ෂාවෙන් තොරවයි පරිහරණය කරන්නේ. බුදුරජාණන් වහන්සේගේ කාලයේ නිරෝගීබවට කැදරකමෙන් හොරාට පැවිදිවුණු අය හිටියා. රෝග සුවකිරීමේ දක්ෂ ජීවක වෛද්‍යවරයා, සංඝයාට තමයි විශේෂයෙන් ම බෙහෙත් කළේ. ඒ නිසා ම රෝගාබාධ සහිත මිනිසුන් ජීවක වෛද්‍යවරයාගෙන් වෛද්‍ය ප්‍රතිකාර ගන්න හොරාට පැවිදිවුණා. ඒ නිසා ම බුදුරජාණන් වහන්සේ යම් යම් රෝගාබාධයන් තිබෙන ගිහි පිංවතුන් පැවිදි කරගන්න එපා ය කියලා විනය කාරණාවක් පවා පනවනවා. වෙනස්වන නිරෝගීකමට කැදර මනුෂ්‍යයෝ බරපතළ වූ ආශ්‍රවයන් ඖෂධ නිසාත්, රෝගීභාවය නිසාත් ඇතිකොට ගන්නවා.

මේ භික්ෂුවගේ පැවිදි ජීවිතයේ ඖෂධ ප්‍රත්‍යවේක්ෂාවේ අර්ථවත් තැනක් තමයි, පැවිදි දිවියේ මුල් කාලවකවානුවල කායික වේදනාවන් උදෙසා හිමිදිරියේ ස්වමුත්‍රා පානය කිරීම. වර්තමානයේ නම් භික්ෂුව මේ පුරුද්දෙන් මිදිලයි සිටින්නේ. පිළිකුල් සහගත කයත්, පිළිකුල් සහගත ඖෂධත් තුළින් එදා භික්ෂුව කයත්, ඖෂධත් කෙරෙහි ඇති තෘෂ්ණාවට බරපතළ අභියෝගයක් එල්ල කළා. නමුත් එදා භික්ෂුව ප්‍රත්‍යවේක්ෂාව කියන වචනයේ අර්ථය නිවැරදිව දැනගෙන සිටියේ නැහැ.

ඔබේ නිවස පිහිටි බිම්කඩ, සසරේ ඔබ දහස් වරක් මිහිදන් වූ සුසානය ම නොවේ ද?

ආහාරය, ඖෂධ ප්‍රත්‍යවේක්ෂාවෙන් පරිහරණය කරනවා වගේ ම කුටිය, නිවස ද සිහියෙන් යුතුව පරිහරණය කරන්න කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. සුඛෝපභෝගී මන්දිරයක ජීවත්වෙන පිංවතා එම මන්දිරය කෙරෙහි ඇතිකරගෙන තිබෙන තෘෂ්ණාව ම, පොල්අතු පැලේ ජීවත්වන පිංවතාත් තම පොල්අතු පැල කෙරෙහි ඇති කරගෙන තිබෙනවා. තෘෂ්ණාව හේතුවෙන් මනුෂ්‍යයා තුළ සකස්වෙන සිතුවිලිවල සංකීර්ණභාවය නිසාම ඉදිවන සුඛෝපභෝගී නිවාස නිසා, නිවස කියන කාරණය මනුෂ්‍යයාට මාරබිමක් බවට පත් වී තිබෙනවා.

නිවස උදෙසා යටකරන අතිවිශාල ධනයත්, නිවස නඩත්තුවත්, ගෘහ අලංකාරයත් හේතුවෙන් මනුෂ්‍යයාට නිවස ප්‍රත්‍යවේක්ෂාවෙන් පරිහරණය කිරීම කියන කාරණය අමතකවී යනවා. වර්තමාන සමාජයේ ප්‍රත්‍යවේක්ෂාව කියන වචනයේ අර්ථය ජීවිතයට එකතු කර නො ගත් මනුෂ්‍යයෝ මැරෙන මොහොතේ තම නිවස කෙරෙහි තෘෂ්ණාවෙන් පරදත්තරූපජීවී ප්‍රේතයින් ලෙස ඉපදීමත්, එම නිවෙස්වල ම ගෙම්බන්, හූනන් ලෙස ඉපදීමත් සුලබ සිද්ධියක් බවට පත් වී තිබෙනවා. එම නිසා පිංවත් ඔබ ඔබේ නිවස, කුටිය පරිහරණය කරන්නේ කාමච්ඡන්දයන් වඩවා ගැනීම සඳහා නො ව, අව්, වැසි, පිනි ආදියෙන්, මැසිමදුරුවන්, සර්පයන්ගෙන් ආරක්ෂා වී කුසල් මාර්ගය

ශක්තිමත් කර, ධර්මයේ අර්ථයන් ජීවිතයට එකතු කරගැනීමට ය කියන කාරණය නුවණින් දකින්න.

ඔබේ සුඛෝපභෝගී නිවස පිහිටි බිම්කඩ, අතීතයේ ඔබ දසදහස් වාරයක් මැරී වළදැමූ සුසානභූමිය හැටියට දකින්න ඔබ දක්ෂවෙන්න. පිංවත් ඔබ රාත්‍රියට නිදියහනේ සැතපෙන විට අතීතයේ ඔබව මිහිදන් කළ සුසානභූමියක් මත සැතපෙනවා ය කියන කාරණය නුවණින් දකිමින් නින්දට යන්න. එවිට එම රාත්‍රිය පුරා ම ඔබට ධුතාංග ශීලයක අර්ථයක් ද යම් ප්‍රමාණයකට වැඩෙනු ඇත. පිංවත් ඔබ දකින අතීත නිවාස ප්‍රත්‍යවේක්ෂාව තුළින් වර්තමාන නිවස කෙරෙහි ඇති තෘෂ්ණාව හීන කරගැනීමට උත්සුක වන්න.

අතීතයේ පිංවත් ඔබ රාජරාජ මහාමාත්‍යයන් හැටියට ඉපදෙන වෙලාවේ ඔබ හිමි කරගෙන සිටි සුඛෝපභෝගී මන්දිර නුවණින් දකින්න. බෝධිසත්වයින් මහාසුදස්සන නමැති සක්විතිරජු ලෙස රජකරන සමයෙහි, දිව්‍යතලයන්ට අධිපති ශක්‍රදෙවියන්ගේ නියාමයෙන් දිව්‍යතලයේ වැඩසිටින විස්කම් දෙව්පුත් මහසුදස්සන රජුට 'දහම්පාය' නම් ගෙයක් මැව්වා ය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. විස්කම් දෙව්පුත් මැවූ දහම්පාය දිගින් යොදුනක්, පළලින් අඩ යොදුනක් විශාල ය. මෙම දහම්පායේ බිත්ති, ගෙබිම රනින් ද, රිදියෙන් ද, පළිඟුවලින් ද හැදුවා වූ ගඩොලින් නිමකරලා තිබෙන්නේ. මේ දහම්පායේ සෑම කුළුණක් ම, සෑම පියගැට පෙළක්ම රනින්, රිදියෙන්, පළිඟුවෙන් තමයි නිමවෙලා තිබෙන්නේ. මහාසුදස්සන රජුගේ අතීත කුසල් ශක්තියේ ඵලයයි විස්කම් දෙව්පුත් මැවූ දහම්පාය නමැති නිවස. මෙම නිවස යමෙක් දකින්නේ ද, ඔහුගේ ඇස් අඳුරු කරනවා. වලාකුළු පහවූ අහසේ ඇති හිරු දෙස යම් සේ බැලිය නො හැකි ද, රනින්, රිදියෙන්, පළිඟුවෙන් කළ දහම්පායේ දීප්තිය නිසා ම යමෙකුට දහම්පාය දෙස එකඑල්ලේ බැලිය නොහැකි යයි බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මේ සා අසිරිමත් දහම්පාය නම් නිවසත් අනිත්‍යභාවයට පත් වී ගියා ය කියලා

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. අතීතයේ පිංවත් ඔබ ම ජීවත් වූ මෙවන් අසිරිමත් මන්දිරයක් වෙනස් වී ගියා නම්, අහිමි වී ගියා නම්, ඒ සංස්කාර අනිත්‍ය වී ගියා නම් වර්තමානයේ ඔබ පරිහරණය කරන ඔය නිවස සෙල්ලම් ගෙදරක් නේද? අතීත නිවාස ප්‍රත්‍යවේක්ෂාව තුළින් වර්තමාන නිවස කෙරෙහි ධර්මයේ අර්ථය මතුකරගන්න.

ඉහත සටහන කියවන විට ඔබට ප්‍රශ්නයක් මතුවෙන්න පුළුවන්, මනුෂ්‍ය ලෝකයේ රජකම් කරපු මහාසුදස්සන බෝධිසත්ව සක්විති රජුට දිව්‍යතලයේ විස්කම් දෙව්පුත් දහම්පාය නිවස මැව්වේ කොහොමද කියලා. මේකට තමයි කුසලයේ ශක්තිය කියන්නේ. දිව්‍යතලයේ ශක්‍රයා යම් පිනකින්, කුසලයකින් පොහොසත් ද, සක්විති රජු ද එවැනි ම පිනකින් පොහොසත් කෙනෙක්. ඒ නිසා ම යි ශක්‍රයාට දිව්‍යතලයේ උරුම සම්පත්, සක්විති රජු මනුෂ්‍ය ලෝකයේ දී දෙවියන්ගේ මැවීම තුළින් ම ලබන්නේ.

අතීතයේ ඔබ සශ්‍රීක දිව්‍යතලවල දෙවියෙක්, දිව්‍යාංගනාවක් හැටියට ඉපදුණ වෙලාවේ මොන තරම් අසිරිමත් දිව්‍යවිමාන, දිව්‍ය මන්දිර මගේ කරගෙන ඔබ ජීවත්වෙන්න ඇති ද? ආටානාටිය සූත්‍රයේ දී සඳහන් වෙනවා දිව්‍යතලයේ වැඩසිටින සතරවරම් දෙවිවරුන්ගේ එක මහේශාක්‍ය දෙවියෙක් වන වෙසමුණි දිව්‍ය රජුන්ට අහසේ මවන ලද ආටානාටය, කුසිනාටාය, පරකුසිනාටාය යැයි දිව්‍ය නගරයක් තිබෙනවා ය කියලා. පරකුසිනාට නුවරට උතුරු දෙසින් කපිවන්ත නම් නුවරක් ද නවනවතිය නම් නුවරක් ද, ජනොඝ නම් නුවරක් ද, ආලකමන්දා නම් රාජධානියක් ද තිබෙනවා කියලා. මේ සියල්ල දිව්‍යතලයේ වෙසමුණි දිව්‍යරජු යටතේ පවතින දිව්‍ය රාජධානිය යි. මෙම රාජධානියේ විසිතුරු මල් උයනක් තිබෙනවා. එම මල් උයනේ භගලවතී නම් රනින් නිම වූ මන්දිරයක් තිබෙනවා. එම දිව්‍ය මල් උයනේ දිව්‍ය පක්ෂීන් බොහොමයක් සිටිනවා. දිව්‍ය මොනරුන්, කොස්වාලිහිණින්, කෝකිලයන්ගේ නාදයෙන් කුල්මත් වූ නිති එලදරන වෘක්ෂයෝ

එහි තිබෙනවා. එහි මල් ගොමුවල "ජීව, ජීව" යැයි හඬනගන ජීවජීවක නම් පක්ෂියෙක් ද, උට්ඨවචිත්ත නම් පක්ෂියෙක් ද, වළිකුකුළෝ ද, රන් කකුළුවෝ ද, පොක්ඛරසාතක නම් පක්ෂීහු ද, ගිරවුන්, සැළලිහිණියන්, දණ්ඩමානවක නම් පක්ෂීන් ද නිරතුරුවම ගැවසෙන වෙසමුණි දිව්‍ය රජුගේ දිව්‍ය මන්දිරය, දිව්‍ය මල් උයන විසිතුරුයි කියලා ආටානාටි සූත්‍රයේ සඳහන් වෙනවා. මෙවන් විසිතුරු දිව්‍ය මන්දිරවල ඔබ අතීතයේ ජීවත්වුණා නම්, ඒ විසිතුරු සංස්කාරයන් අනිත්‍ය වී ගියා නම් මේ මොහොතේ ඔබ ජීවත්වන නිවස කෙරෙහි කුමන තෘෂ්ණාවක් ඇතිකොට ගන්න ද? ඒ නිසා තෘෂ්ණාවෙන් තොරව නිවස පරිහරණය කරන්න.

සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දකිමින් නිවස පරිහරණය කරන්න. ඔබේ වසඟයේ තබා ගත නො හැකි දෙයක් වශයෙන් දකිමින් නිවස පරිහරණය කරන්න. එසේ නො වුණොත් නිවස නිසා ම පිංවත් ඔබ නැති ආශ්‍රවයන් ඇති කරගන්නවා; ඇති ආශ්‍රවයන් වර්ධනය කරගන්නවා. ඉහත ආකාරයට ම ඔබ පරිහරණය කරන ඇඳුම්-පැළඳුම් ද ප්‍රත්‍යවේක්ෂ නුවණින් යුතුව පරිහරණය කරන්න.

දිනකට අවම වශයෙන් අකුසල සිත් පහක් දුරු කරන්න පුරුදුවෙන්න

මීළඟට සබ්බාසව සූත්‍රයට අදාළව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, දුරුකිරීමෙන් ප්‍රහාණය කළ යුතු ආශ්‍රවයන් ගැන. මොනවද පිංවත් ඔබ දුරු කළ යුත්තේ? නිරතුරුව ම ඔබ තුළ සකස්වෙන කාම විතර්කයන්, කාමයේ ආදීනවයන් දකලා දුරුකරන්න ඕන. ලෝභ, ද්වේෂ, මෝහ අකුසල මූලයන්ට අදාළ විතර්කයන් ඒවායේ ආදීනවයන් දකලා දුරුකරනවා.

භික්ෂුව මුණගැසුණ මහත්මයෙක් ප්‍රකාශ කළේ, සත්වයින්ගේ ඕපපාතික උපතක් නැහැ ය කියලා. භික්ෂුව ඒ මහත්මයාට ප්‍රකාශ කළේ "මහත්තයෝ, ඔය මතය දුරුකරන්න"ය කියලා. මොකද, මෙවැනි මිථ්‍යාදෘෂ්ටික අදහස් නිසා නැති ආශ්‍රවයන් වැඩෙනවා. එක ලෝභ සිතක්, එක ද්වේෂ සිතක් දුරුකිරීමට ඔබ අදක්ෂ වුවහොත් සතරඅපායට වැටෙන බලවත් ආශ්‍රවයන් ඔබ තුළ ඇතිවෙන්න පුළුවන්. සිල්පදයක් බිඳින්න කියලා සිත කිව්වොත් එම සිත දුරුකරන්න. නරක මිතුරෙක් හමුවන්න, වැරදි ගමනක් යන්න සිත කිව්වොත් එම සිත දුරුකරන්න. කුසලයට අකමැති සිතක් සකස් වුවහොත් එම සිත දුරුකරන්න.

හෙට දවසේ හිමිදිරියේ සිට ඔබ සිහියෙන් යුතුව, දවස පුරාවට ඇතිවන අකුසල් සිත් දුරුකරනවා ය කියලා සිතුවොත්, එය ක්‍රියාත්මක කළොත්, ඔබ නැති ආශ්‍රවයන් මතුකර ගන්නේ නැහැ. අවම වශයෙන් දිනකට ඔබ තුළ සකස්වෙන අකුසල් සිත් පහක් දුරුකරන්න පුරුදුවෙන්න. ක්‍රමානුකූලව එය වැඩිකර

ගැනීමට උත්සාහ ගන්න. ඔබ පරිහරණය කරන සෙලියුලර් දුරකථනය, කොණ්ඩ මෝස්තරය, ඔබ අඳින ඇඳුම් විලාසිතාව, ඔබේ ඉරියව් පැවැත්ම නිසා ඔබ තුළ ආශ්‍රවයන් සකස්වෙන බව ඔබට දැනුණොත් ආශ්‍රවයන් වැඩෙන එම ධර්මතාවයන් දුරුකරන්න දක්ෂවෙන්න.

නවීන තාක්ෂණික ලෝකය සබ්බාසව සූත්‍රයේ අර්ථයන්ට බලවත් අභියෝගයන් එල්ලකර තිබෙනවා. එම අභියෝග යේ තරමටම මනුෂ්‍යයාගේ පංචඋපාදානස්කන්ධය නො සන්සුන්භාවයට පත්කිරීමට අදාළව ආශ්‍රවයන් වර්ධනය කරගන්නවා. පිංවත් ඔබ පිංකමක් සිදුකරන විට, සද්ධර්මය ශ්‍රවණය කරන විට අශ්‍රද්ධාවට අදාළ සිතුවිලි දුරුකරගෙන ඕනේ, එම කාර්යන් සිදුකරන්න. අනාගාමී ඵලයට පත් උග්ග ගෘහපතිතුමා සතු ආශ්චර්යවත් කාරණාවන්ගෙන් එකක් තමයි, එතුමා සද්ධර්මය ශ්‍රවණය කරන්නේ එම ධර්මයේ අඩුපාඩු, වැරදි සෙවීමට නො වේ; ඒවා සොයලා විවේචන කිරීමට නො වේ. උතුම් සද්ධර්මයේ අර්ථයක් ම ජීවිතයට එකතුකර ගන්නවා කියන බලාපොරොත්තුවෙන් ම යි. එය උග්ග ගෘහපතිවරයා සතු ආශ්චර්යවත් ගුණයක්. එම නිසා පිංවත් ඔබත් ධර්මයට අදාළ කාරණාවල දී අශ්‍රද්ධාවට අදාළ සිතුවිලි දුරුකරන්න පුරුදුවෙන්න. එසේ නො වුණොත් ධර්මයට අගෞරව කිරීම හේතුවෙන් බලවත් ආශ්‍රවයන් අපි ඇතිකර ගන්නවා. පන්සලකට යන්න, ආරණ්‍යයට යන්න, බුද්ධරත්නය, ධර්මරත්නය, සංඝරත්නය දකින්නට යන්න මන්දෝත්සාහී වෙන සිත දුරුකරන්න.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, සියක් දහසක් ඇතුන් ද, සියක් දහසක් අජානීය අශ්වයන් ද, සියක් දහසක් රනින් සරසන ලද කන්‍යාවෝ ද ලබන්න ඔබ යන ගමනක් වේ ද, තෙරුවන් දකින්න යන්නාහුගේ එක පියවරක් ඊට වඩා දසදහස් වාරයක් වටිනවා ය කියලා.

පිංවත් ඔබ දන්පැන් පූජා කරන අවස්ථාවල ලෝභ සිත් දුරුකරන්න දක්ෂවෙන්න. මසුරුකම් ඇති, දන්දෙන අයට අගුණ

කියන, යම් මසුරු මිනිසෙක් මෙලොව ඇති ද ඔහු ප්‍රේත ලෝකයටද, නිරයට ද, තිරිසන් ලෝකයට ද වැටෙනවා. මිනිසත් බවක් ලැබුවොත් ආහාර, වස්ත්‍ර, යානවාහන, කාමසම්පත් හීන, ඒවා දුක සේ ලබන දිළිඳු කුලයක ඉපදෙනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. සැවැත්නුවර සිටුතුමා මහා ධනස්කන්ධයකට හිමිකම් කිව්වත් බතකුයි හොද්දකුයි පමණයි ආහාරයට ගන්නේ. දිරාගිය ඇඳුමක් පරිහරණය කළේ. සිටුතුමා මොන තරම් ධනයක් තිබිලත් එම ධනය පරිහරණය කිරීමට සිත නො දීමේ හේතුව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

අතීතයේ සිටුවරයෙක් ලෙස ඉපදුණ වෙලාවේ, තගරසිඛී කියන පසේ බුදුරජාණන් වහන්සේ නිවසට පිණ්ඩපාතයට වැඩිය වෙලාවේ සිටුතුමා සේවකයින්ට දන්දෙන්න කියලා ඉවතට ගියා. දානේ දීමෙන් පසුව එම සිටුතුමා සිතනවා, දානයට දුන්න ආහාර ටික, සේවකයෙකුට දුන්නා නම් වැඩිපුර වැඩක් කරගන්න තිබුණා නේද කියලා. පසේ බුදුරජාණන් වහන්සේට දන්දෙන්න කියලා සේවකයින්ට කියපු නිසා එම පිනෙන් පස්වරක් සිටුතනතුරු ලැබුණා. නමුත් දන්දීමෙන් අනතුරුව, එම ආහාර සේවකයෙකුට දුන්නා නම් හොඳයි නේද කියලා සිතුණ නිසා ඇඳුම්, ආහාර, රථවාහන පරිහරණය කරන්න පින නැතුව ගියා. සිටුතනතුර ලැබුණත් සැප විඳින්න සිත දුන්නේ නැහැ. පිංවත් ඔබත් මසුරු සිත් දුරුකරමින් දන්පැන් දෙන්න. එසේ නො වුණොත් නැති ආශ්‍රවයන් ඇතිවෙනවා; ඇති ආශ්‍රවයන් වැඩෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ආහාර දෙන්නා බලය දෙන්නේ වේ, වස්ත්‍ර දෙන්නා වර්ණය දෙන්නේ වේ, රථවාහන දෙන්නා සැපදෙන්නේ වේ, පහන් දෙන්නා ඇස් දෙන්නේ වේ, යමෙක් ආවාස දෙයි ද හේ සියල්ල දෙන්නේ වෙයි, යමෙක් ධර්මානුශාසනා කෙරේ ද හේ අමෘතය දෙන්නේ වෙයි කියලා. යමෙක් මසුරු සිත දුරුකිරීමට අදක්ෂ නම් මේ සියල්ල ම ඔහුට අහිමි වී යනවා. නුවණ නැත්තා වූ යම් කෙනෙක් ආර්ය චර්යාවන් දුරුකරමින් හැසිරෙත් ද, ආර්ය ධර්මයන් දුරුකරමින් හැසිරෙයි ද ඔහු දරුණු වූ රෞරව නිරයට පැමිණ බොහෝ කලක් දුක් අනුභව කරයි

කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. පිංවත් ඔබ නිරතුරුව ම බුදුරජාණන් වහන්සේ කෙරෙහි වූ විශ්වාසය ඔබ ළඟට ගන්න. එවිට මිථ්‍යාදෘෂ්ටිය ඔබෙන් දුරුවෙනවා. ශීලය, කුසලය කෙරෙහි වූ විශ්වාසය ඔබ තුළට ගන්න. එවිට අකුසලය, දුශ්ශීලභාවය ඔබෙන් දුරුවෙනවා.

භික්ෂූන් වහන්සේගේ ඥාතිත්වය හඳුනාගන්න (නැතහොත් නැති ආශ්‍රවයන් ඇති වේවි)

මේ දවස්වල භික්ෂුව පිණ්ඩපාතයේ වඩින ප්‍රධාන මාර්ගයේ ප්‍රතිසංස්කරණය කරනවා. මාර්ගය දිගට ම ගල් කැබලි සහ ගල්කුඩු අතුරලා. භික්ෂුව මාර්ගය දිගේ පිණ්ඩපාතයේ වඩින විට භික්ෂුව පසුකරගෙන බස්රථයක් වේගයෙන් ගමන් කළා. බස්රථයේ වේගයට මුළු මාර්ගය ම ගල්කුඩු දූහුවිල්ලෙන් වැසීගියා. භික්ෂුවට සිදුවුණා, විනාඩියක් පමණ එකතැන නැවතී දෑස් පියාගෙන සිටින්න. එම බස්රථයේ රියදුරු මහතා තුළ අශ්‍රද්ධාවට අදාළව සකස්වුණ එක සිතුවිල්ලක් දුරුකිරීමට එම රියදුරු මහතා අදක්ෂවීම නිසා මොන තරම් කුසලයක් අහිමිකර ගත්තාද? එම රියදුරු මහත්මයාට පුළුවන් වුණා නම්, පිණ්ඩපාතයේ වඩින භික්ෂුව මහා සංඝරත්නය හැටියට දකලා, මම බස්රථය වේගයෙන් ධාවනය කළොත් ස්වාමීන් වහන්සේට දූහුවිල්ලෙන් පීඩාවක් වෙනවා කියලා හිතලා රථයේ වේගය අඩු කර ධාවනය කරන්න, ඒ සකස්කරගත් ශ්‍රද්ධාවට අදාළ එක සිතුවිල්ලෙන් ඔහු ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ජීවත්වුණා වෙනවා.

රියදුරු මහත්මයා ස්වාමීන් වහන්සේව සංඝයා හැටියට දකින මොහොතේ ම තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව, සම්මා දිට්ඨිය පෝෂණය වෙනවා. ස්වාමීන් වහන්සේට ගල්කුඩු දූහුවිල්ලෙන් පීඩාවක් ම යි කියලා සිතන විට ම හිංසාවෙන් බැහැරවෙච්ච සිත තුළ සම්මා සංකප්පයන් වැඩෙනවා. මෙහෙම සිතන්න දක්ෂ පිංවතා තුළ මේ මොහොතේ ම සිල්පද ආරක්ෂා

වෙනවා. කුසල් සිත් තව තව ශක්තිමත් කරගැනීම නිසා සම්මා වායාමෝ ධර්මයන් වැඩෙනවා. මේ සියල්ල සකස් වීමෙන් සම්මා සතිය ක්‍රියාත්මක වෙනවා. එම රියදුරු මහතා රාජකාරී කටයුතු සිදුකර ගන්නා මොහොතේ දී සකස්කර ගන්නා එක අර්ථවත් සිතුවිල්ලක් තුළින් ආර්ය අෂ්ටාංගික මාර්ගය ම ශක්තිමත් කරගැනීමට හැකියාව තිබියදී අශ්‍රද්ධාවට අදාළව සකස්වුණ එක අකුසල් සිතක් දුරුකිරීමට අදක්ෂ වූ නිසාම නැති ආශ්‍රවයන් ඇති කරගන්නවා; ඇති ආශ්‍රවයන් වර්ධනය කරගන්නවා. පිංවත් ඔබත් එදිනෙදා රාජකාරී ජීවිතයේ දී අනුන්ට පීඩාව උදෙසා අනුන්ගේ අයහපත, අකමැත්ත උදෙසා සකස්වෙන අකුසල් සිත් දුරුකිරීමට පුරුදුවෙන්න. එවිට නැති ආශ්‍රවයන් ඇතිවෙන්නේ නැහැ; ඇති ආශ්‍රවයන් හීන වී යනවා.

ඔබ තුළ ඇතිවන ළාමක කාම විතර්ක, ව්‍යාපාද විතර්ක, හිංසා විතර්ක දුරුකරන්න. ඒ විතර්කයන් දුක පිණිස ම යි වෙන්නේ. සමාධියෙන් එකඟ කරගත් සිතින් මෙය දුක යැයි දකින්න. මෙය දුකට හේතුව යැයි දකින්න. මෙය දුකේ නිරෝධයයැයි දකින්න. දුක නිරෝධය කිරීමේ මාර්ගය, ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩෙන සිතුවිලිවලින් ජීවිතය පෝෂණය කොටගන්න. එවිට ඔබ රාජකාරී වෙලාවෙත් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කළා වෙනවා.

ගිහි සමාජය තුළ පිංවතුන්ලාට යුතුකම් කියලා කොටසක් තිබෙනවා. පිංවත් ඔබ කෙනෙකුට උපකාරයක් කළොත් උපකාරය ලබාගන්නා තැනැත්තාට උපකාරයක් අවශ්‍ය වේලාවක දී පෙරළා උපකාරයක් කරන්න ඕනේ. ඔබේ මඟුල් ගෙදරට, මළගෙදරට ඥාතියෙක්, හිතවතෙක් සහභාගි වුවහොත් ඔබ පෙරළා ඔහුගේ මඟුල් ගෙදරට, මළගෙදරට සහභාගි වෙන්න ඕනේ. හිතවතෙක් ඔබට ආහාර වේලක් දුන්නොත් ඔබත් ඔහුට පෙරළා ආහාර වේලක් දෙන්න ඕනේ. නමුත් පැවිදි සමාජයත් සමඟ ගිහි පිංවතුන්ලා කටයුතු කරනවිට ඉහත පෙරළා ප්‍රතිඋපකාර කිරීමේ තත්වය වෙනස්වෙනවා. ගිහි පිංවතුන්ලා ස්වාමීන් වහන්සේ

නමකට පිණ්ඩපාතයක් පූජා කළත්, දානේ වේලක් පූජා කළත්, ප්‍රවාහන පහසුකමක් සලසා දුන්නත්, වෙනත් සිව්පසයෙන් ඇපඋපස්ථානයක් සිදුකළත් එය සිදුකළ මොහොතේ ම ස්වාමීන් වහන්සේලා අදාළ පිංවතාට පිං අනුමෝදන් කරනවා. ගිහි පිංවතාට සිදුකළ පිංකමට පිං අනුමෝදන් කළාට පස්සේ ස්වාමීන් වහන්සේට බැඳීමක් නැහැ. උන්වහන්සේ නිදහස්.

ස්වාමීන් වහන්සේ පෙරළා අදාළ ගිහි පිංවතාට උපකාර කළ යුතුයි කියලා කාරණයක් පැවිදි සමාජයට අදාළ නැහැ. එම නිසා ස්වාමීන් වහන්සේලාට ඔබ යම් පූජාවක් කළොත්, උන්වහන්සේලා ඔබලාට පිං අනුමෝදන් කරනවා. එම පින අනුමෝදන් වී, එම පිනෙන් සැහීමට පත් වී අතපිසදා ගැනීමට පිංවතුන්ලා දක්ෂ විය යුතු යි. එසේ නො වී, අපි ස්වාමීන් වහන්සේට සිව්පසයෙන් උපකාරයක් කළා, ස්වාමීන් වහන්සේ අපට පෙරළා ප්‍රතිඋපකාර කළ යුතු යි කියලා යම් පින්වතෙක් බලාපොරොත්තු වෙනවා නම්, ඔබ රැස්කරගත් පිනේ ශක්තිය අකුසල් මූලයන් නිසා ඔබ අවම කරගන්නවා. එම නිසා එවැනි සිතුවිලි දුරු කරන්න දක්ෂ වෙන්න. එසේ නො වුණහොත් ඔබ තුළ නැති ආශ්‍රවයන් ඇතිවෙනවා; ඇති ආශ්‍රවයන් වැඩෙනවා.

ඒ වගේ ම යි, ගිහි සමාජයේ දී පින්වතුන්ලා තමතමන් අතර හිතවත්කම්, යාළුමිත්‍ර සම්බන්ධතාවයන් ඇතිකොට ගන්නවා. එය ගිහි සමාජයට අත්‍යවශ්‍ය කාරණයක්. නමුත් පැවිදි පක්ෂයට ගිහි පිංවතුන්ලා සමඟ හිතවත්කම්, යාළුමිත්‍රකම් පවත්වන්න, සම්බන්ධතා ඇතිකර ගන්න බැහැ. භික්ෂූන් වහන්සේලාගේ ඥාතීන් වෙන්නේ බුදුරජාණන් වහන්සේත්, මහා සංඝරත්නයත් පමණයි. ඒ ඥාතිත්වයත් ස්වාමීන් වහන්සේලා පරිහරණය කළ යුත්තේ අනිත්‍යයි කියන දැක්ම තුළ සිටිමින්. බුදුරජාණන් වහන්සේ වරක් සුද්ධෝදන පියරජතුමා ඉදිරියේ සිංහනාදයක් කරනවා, "මහරජ, ඔබගේ වංශය ශාක්‍යවංශය යි. මාගේ වංශය බුද්ධවංශය යි" කියලා. බක්කුල මහ රහතන් වහන්සේ අවුරුදු 160ක් ආයුෂ වළඳලා, පිරිනිවන් පාන්නට පෙර දිනයේ සිංහනාදයක් කරනවා,

"අසූ වසරක් වන මගේ පැවිදි ජීවිතයේ දී කවදාවත් මම ආරාධනා දානයක් භාරගෙන නැහැ. කවදාවත් මම නිවසක් ඇතුළට වැඩම කරලා දානයක් පිළිඅරගෙන වළඳලා නැහැ" කියලා. මේ උත්තරීතර පරපුර තමයි, සංඝයාගේ පරපුර, ඥාතිත්වය කියන්නේ. පින්වත් ගිහි පිංවතුන්ලා මහා සංඝරත්නය සමඟ කටයුතු කිරීමේ දී මේ උතුම් ඥාතිත්වයේ රුවගුණ හොඳින් හඳුනාගෙනයි කටයුතු කළ යුත්තේ. එසේ නො වුණහොත්, නැති ආශ්‍රවයන් ඇතිවෙනවා; ඇති ආශ්‍රවයන් වර්ධනය වෙනවා. ගිහි පිංවතුන්ලා සංඝරත්නය උපයෝගි කරගත යුත්තේ, උතුම් සංඝරත්නය වශයෙන් දැකලා, සිව්පසයෙන් ඇපඋපස්ථාන ධර්මයන් සිදුකරගෙන කුසල් දහම් රැස්කරගැනීම සඳහා පමණක් ම යි.

භික්ෂුව මේ මොහොතේ වැඩ සිටින කුටිය පිහිටි ගමේ සියලුම පින්වතුන්ලා, අද දවසේ භික්ෂුවගේ දායක පින්වතුන්ලා. හෙට භික්ෂුව මේ කුටිය අතහැරලා වෙනත් කුටියකට වැඩියහොත්, එම ගමේ පින්වතුන්ලා භික්ෂුවගේ දායක කැපකරු පින්වතුන් වෙනවා. ස්වාමීන් වහන්සේලා ගමකින් තවත් ගමකට වැඩිය යුත්තේ සම්බන්ධතාවලින් දැත් පිසදාගෙනයි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. එම නිසා ගිහි පිංවතුන්ලා ස්වාමීන් වහන්සේලා සමඟ යාළුමිත්‍රකම් ඇතිකරගන්න උත්සාහ ගන්න එපා. එවැනි සිතුවිලි දුරුකරන්න. එවැනි කාරණාවන්ට ස්වාමීන් වහන්සේලාගෙන් අවස්ථාවක් නො ලැබෙන විට ගැටෙන සිත් ඇති වී පිංවත් ඔබ තුළ නැති ආශ්‍රවයන් ඇතිවෙන්න පුළුවන්; ඇති ආශ්‍රවයන් වර්ධනය වෙන්නත් පුළුවන්. ගිහි පිංවතුන්ලාගේ යාළුමිත්‍රකම් නිසා, ස්වාමීන් වහන්සේලා තුළ ද නැති ආශ්‍රවයන් ඇති වී, ඇති ආශ්‍රවයන් වර්ධනය වී පිරිහීමට පත්වෙන්න පුළුවන්. මේවා ගිහි පිංවතුන්ලා අනවබෝධය නිසා ම, ඇතිකොට ගන්නා බලවත් ආශ්‍රවයන් වෙනවා.

හොඳ ළමයෙක් වීමට වඩා අවබෝධාත්මක ළමයෙක් වීමයි වටින්නේ

පිංවත් ඔබ, ගෘහ ජීවිතයේ දී තමන්ට අසන්නට, දකින්නට, සිතන්නට අකමැති සිද්ධියක් නිසා බිරිඳ, ස්වාමි පුරුෂයා, දරුවා, දෙමාපියන්, ඥාතිවරයා, අසල්වැසියා නිසා නැති ආශ්‍රවයන් ඇති කරගන්නවා.

එක් පිංවතියක් භික්ෂුවට ප්‍රකාශ කළේ, "ස්වාමීන් වහන්ස, මට නිරතුරුව ම කේන්ති යනවා. මගේ තාත්තා වයස දහයේදී අපිව හැරගොස් වෙනත් විවාහයක් කරගත්තා. දැන් මගේ තාත්තා සිහිපත් වන සෑම මොහොතක ම මට දැඩි වෛරයක් ඇතිවෙනවා" කියලා. මේ ද්වේෂය දැන් මගේ ජීවිතයට පුරුද්දක් වෙලා ය කියලා. ඇයි මට මෙහෙම වුණේ කියලයි මේ තරුණ කාන්තාව භික්ෂුවගෙන් විමසන්නේ.

භික්ෂුව ඇයට ප්‍රකාශ කළේ, ඔබ සෑම නිමේෂයක ම ඔබේ තාත්තා කියන අර්ථයට ද්වේෂ කිරීම නිසා බලවත් අකුසල් සිදුකර ගැනීමෙනුයි සිටින්නේ. එම අකුසලයේ දිට්ඨධම්මවේදනීය විපාකය යි ඔබ ඔය අත්විඳිමින් සිටින්නේ. වයස දහයේ දී තාත්තා ඔබව දාලා ගියේ තාත්තාගේ වරදක් නිසා නො වේ. ඔබට ළමා වයසේ දී ම තාත්තා අහිමිවෙන්නේ ඔබේ අතීත අකුසලයන් නිසා. ඔබේ අකුසලයට තාත්තාට වෛර කරලා වැඩක් නැහැ. කරුණාකරලා මීට පස්සේ තාත්තා කියන රූපය සිහිවෙන සෑම මොහොතක දී ම ඔබ "සුවපත් වේවා!" කියලා චිත්තයක් ඇතිකර ගන්න. මෙතෙක් කල් ඔබ තාත්තා නිසා ඇතිකරගත් වෛර සිත්, අකුසල්

සිත්, සියල්ල ම මොහොතක් සිහියට නගාගෙන ඒ සෑම අතීත අකුසල් සිතක් ම අතීත පංචඋපාදානස්කන්ධයක් හැටියට දකිමින් අතීත පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දකින්න. ඔබ තාත්තලාට වෛර කරලා, පීඩාකරලා, තිබෙන්නේ මේ ජීවිතයේ දී විතරක් නො වෙයි. එය ඔබේ සාංසාරික පුරුද්දක්. එම සාංසාරික පුරුද්දයි මේ ජීවිතයේදීත් මතුවී එන්නේ. අතීතයේ තාත්තලාට කළ එම අකුසල් නිසයි, ඒවායේ විපාක හැටියට ඔබේ තාත්තා මේ ජීවිතයේ දී ඔබව ළමා කාලයේ දී ම හැරයන්නේ. එම නිසා පිංවත් ඔබ ඔය ආත්මීය වෛරය මෙතනින් නවතා දමන්න. ඔබ ඔය ආත්මීය වෛරය මෙතනින් නවතා දමන්න දක්ෂ වුණොත්, ඊළඟ ජීවිතයේදී ඔබට මනුෂ්‍ය ජීවිතයක් ලැබුණොත් ඔබට ආදරය කරන, ඔබව සුරක්ෂිත කරන තාත්තා කෙනෙක් ඔබට ලැබේවි. එසේ නො වී, තාත්තලා දුවලා මේ ජීවිතයේ දී වෛර කළොත් ඊළඟ ජීවිතයේදීත් ඔබ පූස්පැටියෙක් වෙලා ඉපදිලා එම පූස්පැටියාගේ තාත්තා විසින් ම පූස්පැටියාව මරාගෙන කන්න පුළුවන්. ද්වේෂය නිසා ඔබ කිඹුල් පැටියෙක්ව ඉපදිලා, කිඹුල් තාත්තා විසින් කිඹුල් පැටියාව මරාගෙන කන තත්වයට එන්න පුළුවන්. භික්ෂුව මේ කථාව කියන විට ඇය ගොඩාක් තැතිගත්තා. භික්ෂුව සිතනවා, මේ සටහන කියවලා පිංවත් ඔබ අකමැති ඔබේ දෙමාපියන්, බිරිඳ, ස්වාමි පුරුෂයා, දරුවා, ඥාතිවරයා, අසල්වැසියා සිහිපත් වන සෑම මොහොතකම ඊළඟ චිත්තය "සුවපත් වේවා!" කියලා ඇතිකර ගන්න. එවිට සුවපත් වෙන්නේ අනුන් නො ව, ඔබ ම බව හොඳින් තේරුම්ගන්න. එසේ නො වී, පිංවත් ඔබ වෛර සිත දුරු නො කළොත්, අකමැත්ත ඇතිවෙන තැනට වෛර කළොත් ඔබ තුළ නිරතුරුවම නැති ආශ්‍රවයන් ඇතිවෙනවා; ඇති ආශ්‍රවයන් වර්ධනය වෙනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

පසුගිය වසර දෙකක කාලය තුළ භික්ෂුව වැඩසිටින සමහර කුටිවල කැපකරු මහත්වරුන් තමන්ගේ සෙලියුලර් දුරකථන නිසා නැති ආශ්‍රවයන් ඇතිකර ගන්න බවත් ඇති ආශ්‍රවයන් වර්ධනය කරගන්නා බවත් භික්ෂුවට බොහෝ ම හොඳට පෙනෙනවා.

අපරාධයක තරම කියන්නේ, එම පිංවතුන් තමන් සංසරත්නය උදෙසා කරන සිව්පසයන්, ඇපඋපස්ථාන හේතුවෙන් රැස්වෙන පින, අකුසල් මූලයන් ඇතිකර ගැනීම තුළින් අපවිත්‍ර කරගන්නවා. භික්ෂුව නිහඬ ව බලාසිටිනවා. ලෝකය ගොඩාක් වේගයෙන් ඉදිරියට ගමන් කරනවා. ලෝකය ගමන් කරවන්නේ ආශ්‍රවයන් විසින් ම බව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

භික්ෂුව මුණගැසෙන්න පැමිණි විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන දරුවෙක් ප්‍රකාශ කළේ, "මම දැන් ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ශක්තිමත්ව ගමන් කරනවා, මගේ සිත විසිරෙන නිසා මම විශ්වවිද්‍යාලයේ කණ්ඩායම් කටයුතුවලට සහභාගි වෙන්නේ නැහැ"ය කියලා. එවිට භික්ෂුව ඔහුගෙන් ප්‍රශ්න කළේ, කණ්ඩායම් කටයුතුවලට සහභාගි වීමේ දී ඔබ සමාදන් වන සිල්පද බිඳෙනවා ද කියලා. එම ශිෂ්‍යයා ප්‍රකාශ කළේ "නැහැ"ය කියලා. විශ්වවිද්‍යාලයේ කණ්ඩායම් කටයුතුවල දී ඔබ සමාදන් වූ සිල්පද නො බිඳෙනවා නම් කණ්ඩායම් කටයුතුවලින් ඉවත්වීම සුදුසු නැහැ ය කියලයි භික්ෂුව ප්‍රකාශ කළේ. මෙතැනදී එක් පැත්තකින් ඔබ ශිෂ්‍යයන් අතර කොන්වීමකට ලක්වන්න පුළුවන්. එය ඔබේ අධ්‍යාපනයට බාධාවක්. දෙවනුව ඔබ තුළ "මම ධර්මය තුළ සිටිනවා. අනෙක් සියලු ම ශිෂ්‍යයින් ධර්මය තුළ නැහැ"ය කියලා ඔබ තුළ ධර්මයේ නාමයෙන් සක්කාය දිට්ඨිය වැඩෙන්න පුළුවන්. මේ කාරණා දෙක ම ඔබට අනතුරුදායක යි. ඔබ ඔය උත්සාහ ගන්නේ දෙමාපියන්, ගුරුවරුන් සහ ඔබ ඉදිරියේ ඔබ හොඳ ළමයෙක් වන්නයි. හොඳ ළමයෙක් වීම හොඳයි. නමුත් ඊටත් වඩා වැදගත් වන්නේ ඔබ අවබෝධාත්මක දරුවෙක් වීමයි. ඔබ අවබෝධාත්මක දරුවෙක් වීමට නම් කණ්ඩායම් තුළ කටයුතු කරමින් කණ්ඩායමේ ක්‍රියාකාරීත්වය නිසා ඔබ තුළ ඇතිවන සිතුවිලි දෙස බලන්න ඔබ දක්ෂ විය යුතු යි. එවිට ඔබට තේරෙනවා, ප්‍රශ්නය තිබෙන්නේ කණ්ඩායම තුළ නොව, කණ්ඩායම් කටයුතු නිසා ඇලීම්, ගැටීම් සකස්වෙන ඔබේ සිතුවිලි තුළ ය කියලා. මෙතන තමයි, අවබෝධාත්මක දරුවෙක් මතුකරගත යුතු දැක්ම.

මෙය සටහන් තබන භික්ෂුව ඔය වයසෙදි අකීකරු දරුවෙක්. මගේ දෙමාපියන් මට කිහිප වතාවක් ම කියලා තිබෙනවා, අපේ පවුලේ අකීකරු ම දරුවා මම ය කියලා. මගේ අනෙක් සහෝදර සහෝදරියන් තමයි මගේ දෙමාපියන්ට හොඳ දරුවන් වුණේ. ඒ හොඳ දරුවන් අද විවාහ ජීවිත ගතකරමින්, ලෝකය හොඳයි කියන ජීවිත ගතකරමින් සිටිනවා. අම්මා තාත්තාගෙන් මට ලකුණු නො ලැබුණත් මගේ අකීකරුභාවයන් නො වන්නට මට සමාජය හඳුනාගන්න, විනිවිද දකින්න, අත්දැකීම් ලබන්න නො හැකි වෙනවා.

පිංවත් ඔබට ජීවිතයෙන් ධර්මය මතුකර ගැනීමට නම් අනිවාර්යෙන් ම සම්මතයට එරෙහිව ඔබ විප්ලවයක් කළ යුතු ම වෙනවා. මෙහිදී ඔබ 'විප්ලවය' කියන වචනයට බියවෙන්න එපා. මේ විප්ලවය සිල්පද ආරක්ෂා කරමින් කරන විප්ලවයක්. යම් හෙයකින් සිල්පදයක් බිඳුණොත් එම සිල්පදය, විදර්ශනා නුවණින් දකිමින් කරන විප්ලවයක්. මෙම විප්ලවයේ දී සිල්පදයක් බිඳුණහොත්, එම සිල්පදය බිඳෙන්නේ ආස්වාදය සඳහා නො ව, ආස්වාදය තුළින් ලබන විදර්ශනාමය අවබෝධයක් උදෙසා ම යි. ඉහත කාරණාවන් භික්ෂුවගේ ගිහි ජීවිතයට අදාළ අත්දැකීම් මත කරන සටහන් බව කාරුණිකව සිහිපත් කරගන්න.

මනුෂ්‍ය සමාජයේ 'සම්මතය' කියලා කියන්නේ කුමකට ද? යමක් ඔබ ඇසෙන් දැක්කොත්, යමක් ඔබ කනෙන් ඇසුවොත්, යමක් ඔබට දැනුණොත් එක්කෝ ඔබ ඊට ඇලෙනවා; එක්කෝ ඔබ ඊට ගැටෙනවා; නැතිනම් ඔබ එය උපේක්ෂාවෙන් දරනවා; එසේත් නැතිනම් ඔබ දකින දෙයින්, ඇසෙන දෙයින්, දැනෙන දෙයින් පලායනවා.

ඉහත සඳහන් කළ විශ්වවිද්‍යාල ශිෂ්‍යයා තෝරාගන්නේ කණ්ඩායම් ක්‍රියාකාරීත්වයෙන් පලායෑම යි. ඉහත කාරණාවන් තමයි සමාජයේ සම්මත ක්‍රියාකාරීත්වය. ගිහි පිංවත් ඔබ ධර්මාවබෝධය ලබාගැනීම සඳහා ගමන් කිරීමට නම්, මේ

සම්මත ක්‍රියාකාරීත්වයෙන් ඔබ්බට යන්න ම සිදුවෙනවා. ඇලෙන තැන් සොයාගෙන ගොස් නො ඇලී සිටින්න, ගැටෙන තැන් සොයාගෙන ගොස් නො ගැටී සිටින්න දක්ෂ පිංවතා සම්මතයට එරෙහිව විප්ලවයක් සිදුකරන පිංවතා වෙනවා. මේ විප්ලවය ජයග්‍රහණය කරන පිංවතා, ඇලීම්-ගැටීම් සකස්වෙන්නේ සමාජය තුළ නො ව, රූපය ඇසුරෙන් තමාගේ පංචඋපාදානස්කන්ධය තුළම බව දැනගන්නවා. එම නිසා පිංවත් ඔබ, නිරතුරුව ම ඵස්සය හේතුවෙන් ඔබ තුළ සකස්වෙන ඇලීම, ගැටීම කියන ධර්මතාවයන් අවබෝධයෙන් හඳුනාගෙන දුරුකරන්න දක්ෂ වෙන්න. එසේ නො වුණහොත් ඇලීම, ගැටීම සකස්වෙන මොහොතක් පාසා, ඒවායින් පලායන මොහොතක් පාසා පිංවත් ඔබ තුළ නැති ආශ්‍රවයන් ඇති වේවි, ඇති ආශ්‍රවයන් වර්ධනය වේවි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

මඟහැරිය යුතු දේ මඟ නො හැරියහොත්....

බුදුරජාණන් වහන්සේ සබ්බාසව සූත්‍රයට අදාළව මඟහැර යෑමෙන් ප්‍රහාණය කළ යුතු ආශ්‍රවයන් ගැන දේශනා කරනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ස්ත්‍රීන් ගැවසෙන තැන්, නපුංසකයන් ගැවසෙන තැන්, කාමච්ඡන්දයන් වැඩෙන තැන් මඟහැර යන්න ය කියලා; නපුරු සතුන් මඟහැර යන්න ය කියලා. හෙල, ප්‍රපාත, අසූචිවළවල්, මඩ ගොහොරු, කටුපඳුරු මඟහැර යන්න ය කියලා; පිංවත් ඔබ අකමැති කථා, අකමැති වචන, අකමැති හැසිරීම් ඇති තැන් මඟහැර යන්න ය කියලා. මේවා ධර්මානුකූලව දැකීමට ඔබ අදක්ෂ නම්, මේවා හේතුවෙන් ඔබ තුළ නැති ආශ්‍රවයන් ඇතිවෙන්න පුළුවන්; ඇති ආශ්‍රවයන් වර්ධනය වෙන්න පුළුවන්.

පිංවත් ඔබ මිථ්‍යාදෘෂ්ටික භාවයට, අශ්‍රද්ධාවට අදාළ කථාවන්, දේශනයන්, පතපොත, ස්ථාන ආදිය මඟහැර යන්න. පිංවත් ඔබ අතීතයට සිත යොමුකොට බලන්න, මඟහැර යා යුතු තැන් මඟහැර නො යෑම නිසා අතීතයේ ඔබ මොන තරම් නැති ආශ්‍රවයන් ඇතිකොටගෙන තිබෙනවා ද කියලා. මේ දැක්ම තුළ සිටිමින් වර්තමානයේ මඟහැර යා යුතු තැන් හඳුනාගැනීමට ඔබ දක්ෂවෙන්න.

ධර්ම මාර්ගයේ ගමන් කරන පිංවතාට, කාන්තාව කියන්නේ මඟහැර යා යුතු ධර්මතාවයක් ම යි. අද දවසේ ඉපදුණ දැරියක් තනිව ම සිටින ස්ථානයක, උපසම්පදා භික්ෂුවකට රාත්‍රිය ගතකිරීම

බුදුරජාණන් වහන්සේ තහනම් කර තිබෙනවා. අද ඉපදුණු දැරියකගේවත් ශරීරය ස්පර්ශ කිරීම උපසම්පදා භික්ෂුවකට විනය විරෝධී ක්‍රියාවක් වෙනවා. උපසම්පදා භික්ෂුවකට තමන්ගේ අම්මාට කන්න බොන්න දෙන්න කෙනෙක් නැතිනම්, ඒ අම්මාව පෝෂණය කිරීමට බුදුරජාණන් වහන්සේ අවසර දෙනවා. නමුත් අම්මාගේ ශරීරය ස්පර්ශ කිරීම විනය විරෝධී ක්‍රියාවක් වෙනවා. කුඩා දැරියකගේවත් හිසට අත තබා ආශිර්වාද කිරීම විනය විරෝධී ක්‍රියාවක් වෙනවා.

සුදින්න කියන උපසම්පදා භික්ෂුව බොහොම හොඳින් ශීලයට ගරුකරමින් ජීවත්වුණ උපසම්පදා භික්ෂුවක්. නමුත්, තම ගිහිකාලයේ බිරිඳගේ බලකිරීමක්, පෙළඹවීමක් නිසා ඇය සමග සුදින්න භික්ෂුව කාමයෙහි හැසිරීමේ වරද සිදුකර ගන්නවා. මෙම අවාසනාවන්ත සිදුවීම සිදුවන්නේ කැලය තුළදියි. දෙවියන් තමයි මේ සිද්ධිය දකින්නේ. දෙවියන් හඬමින් ඇවිල්ලා බුදුරජාණන් වහන්සේට කියනවා, "භාග්‍යවතුන් වහන්ස, සුදින්න භික්ෂුව උතුම් උපසම්පදාව කිළිටි කළා, කෙළෙසුවා"ය කියලා. බුදුරජාණන් වහන්සේ සුදින්න භික්ෂුව කැඳවලා මේ සිද්ධියේ ඇත්ත නැත්ත විමසනවා. එවිට සුදින්න භික්ෂුව පිළිගන්නවා, තමන් ගිහි කාලයේ බිරිඳගේ පෙළඹවීම මත, කාමයේ වරදවා හැසිරීමක් සිදුකළ බව. ඒ මොහොතේ බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "තුච්ඡ පුරුෂය, හිස් පුරුෂය, ඔබ ඔබේ පුරුෂ ලිංගය ගිනි අඟුරු වළකට දැම්මා නම්, පිච්චීමේ වේදනාවෙන් ඔබ මියයාවි. එපමණයි සිද්ධවෙන්නේ. ඔබ ඔබේ පුරුෂ ලිංගය නයෙක් සිටින තුඹසකට දැම්මා නම්, නයා දෂ්ට කිරීමේ වේදනාවෙන් ඔබ මියයාවි. එපමණයි සිද්ධවෙන්නේ. ඔබ තියුණු මුවහත ඇති සැතක් අරගෙන ඔබේ පුරුෂ ලිංගය කපා දැම්මා නම් රුධිරය ගලායෑමේ වේදනාවෙන් ඔබ මියයාවි. එපමණයි සිද්ධවෙන්නේ. නමුත් ඔබ මේ කරගත් පාප ක්‍රියාවෙන් ඔබ කල්ප ගණනාවක නිරයේ දුකක් උරුමකර ගත්තා" ය කියලා. බුදුරජාණන් වහන්සේ දේශනා කරන ඉහත උපමාවන්ගෙන් පිංවත් ඔබට තේරුම්ගන්න

පුළුවන්, කාමය වරදවා හැසිරීමේ වරදට අදාළව සකස්වෙන විපාකයන්ගේ රුදුරුභාවය. මේ විපාකයන්ගේ රුදුරුභාවය නිසාම යි, ස්ත්‍රිය යනු මඟහැර යා යුතු ආශ්‍රවයක් ලෙස දේශනා කරන්නේ. එසේ නො වුණහොත් ඔබ ස්ත්‍රී පක්‍ෂය, පුරුෂ පක්‍ෂය නිසා ම නැති ආශ්‍රවයන් ඇතිකොට ගන්නවා; ඇති ආශ්‍රවයන් වර්ධනය කරගන්නවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ඉන්ද්‍රිය අසංවරභාවය ඇතිකොටදෙන කාමච්ඡන්දයන් වැඩෙන ස්ථාන, කාමච්ඡන්දයන් වැඩෙන සිතුවිලි මඟහැර යන්න ය කියලා. ඉන්ද්‍රිය අසංවරභාවයට පත් කරන මොන තරම් දේවල් සමාජය තුළ තිබෙනවා ද. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, කාම ලෝකයේ ජීවත්වෙන සත්වයා කියන්නේ, ඉරියව් කයක් ය කියලා. කාම ලෝකයේ ජීවත්වන සත්වයන්ගෙන්, අනුන් තුළ වඩාත් ම ඉන්ද්‍රිය අසංවරභාවය ඇතිකරන ඉරියව් කයක් පිහිටලා තිබෙන්නේ, සශ්‍රීක දිව්‍යතලවල ජීවත්වන දිව්‍යාංගනාවන්ට. දිව්‍යාංගනාවන්ගේ ඉරියව් කය තුළ රිද්මය, ලාලිත්‍යය, ප්‍රභාෂ්වරය හොඳින් ප්‍රකටව පෙනෙනවා. දිව්‍යාංගනාවන්ගේ අලංකෘත ඉරියව් නිසා දෙවිවරු අප්‍රමාණව නැති ආශ්‍රවයන් ඇතිකර ගන්නවා.

බුදුරජාණන් වහන්සේ වේදියකපව්ව නමැති කන්දේ වැඩසිටින කොට, ශක්‍රයාගේ නියමයෙන්, පන්සිළු දිව්‍යපුත් මුළු වේදිකාපව්ව ම ආලෝකවත් කරමින් බුදුරජාණන් වහන්සේ බැහැදකීමට පැමිණෙන්නේ තමන්ගේ බේළුව පාණ්ඩු වීණාව අරගෙන යි. පන්සිළු දෙවියා මේ දවස්වල සිටින්නේ දැඩි විරහ වේදනාවකින්. පන්සිළු දෙවියා තම ආදරවන්තියගේ වෙනස්වීමෙන් අසරණභාවයකට පත් ව සිටින මොහොතකයි බුදුරජාණන් වහන්සේ බැහැදකින්න පැමිණියේ. බුදුරජාණන් වහන්සේ ඉදිරියේ පන්සිළු දෙවියා තම විරහ වේදනාව, ගීතමය ස්වභාවයෙන්, වීණාවේ සංගීතයත් සමඟින් ගායනා කළා. සක්කපඤ්හ සූත්‍රයට අදාළව පන්සිළු දෙවියා ගායනා කළ එක් ගීපදයක් මෙහි සටහන් තබනවා.

"ළහිරු රැස් සෙයින් බබළන, සිරුර කැළුම් ඇත්තී, සොබනා අඟපසඟ ඇත්තී, මට සතුට දෙන්නී, සොඳුර, සොසුළුවනට සුළඟ සේ ද, පිපාසිතයිනට පැන් සේ ද, රහතුනට දහම් සේ ද ඔබ මට ප්‍රිය ය සොඳුරු"

බුදුරජාණන් වහන්සේ මේ විරහ වේදනාවෙන් පෙළෙන, පන්සිළු දෙවියාගේ සංගීතය මුසු ගායනයට නිහඬ ව සවන්දී, ගායනය අවසානයේ දී පන්සිළු දෙවියාට දේශනා කරනවා, "පන්සිළු, ඔබේ වීණාවේ තත් හඬ, ඔබගේ ගී හඬ සමඟ ද, ඔබගේ ගී හඬ, ඔබගේ වීණාවේ තත් හඬ සමඟ ද හොඳින් ගැළපෙනවා" කියලා; "පන්සිළු, ඔබේ තත් හඬ, ගී හඬ නොයික්මේ. ඔබගේ ගී හඬ තත් හඬ නොයික්මේ" කියලා. දිව්‍ය සංගීතය සම්බන්ධයෙන් නිවැරදි චිත්‍රයක් පිංවත් ඔබට ඉහත සක්කපඤ්හ සූත්‍රයෙන් ලබාගන්න පුළුවන්. ඉහත කාරණාවෙන් පිංවත් ඔබට පැහැදිලි වෙනවා, සශ්‍රීක දිව්‍යතලවල ජීවත්වෙන දෙවියන්, දිව්‍යාංගනාවන් පවා කාමච්ඡන්දයන් හේතුවෙන්, ආදරය, විරහව හේතුවෙන් නැති ආශ්‍රවයන් ඇතිකර ගන්නා ආකාරය.

පිංවත් ඔබ මොහොතක් කල්පනා කරලා බලන්නකෝ, මනුෂ්‍ය සමාජයේ ආදරය, විරහව නිසා, කාමයන්ගේ ආස්වාදයන් නිසා, මේ ධර්මතාවයන් මඟහැර යෑමට ඇති අදක්ෂභාවය නිසා පිංවත් ඔබ විවාහ බිඳවැටීම්, දික්කසාද, සියදිවි නසාගැනීම්, පළිගැනීම් හේතුවෙන් මොන තරම් නැති ආශ්‍රවයන් ඇතිකර ගන්නවා ද, ඇති ආශ්‍රවයන් වර්ධනය කරගන්නවා ද කියලා.

මඟහැර යාමෙන් මේ ආශ්‍රවයන් ද දුරු කළ හැකි ය

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, නපුරු සතුන් මඟහැර යන්න කියලා. පිංවත් ඔබ සිතන්න, නපුරු බල්ලෙක් සිටිනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ නපුරු බල්ලා මඟහැර යන්න කියලා. ඔබ නපුරු බල්ලා ඉදිරියට ගියොත් ඒ බල්ලා ඔබව සපාකන්න පුළුවන්. සමහරවිට ඒ නපුරු බල්ලා ඔබව දැකලා දුවන්න පුළුවන්. නපුරු බල්ලා ඔබව දැකලා දුවනවිට ඔබ තුළ නැති ආශ්‍රවයන් ඇතිවෙනවා. මගේ ශීලය, මගේ සමාධිය නිසයි නපුරු බල්ලා කරදරයක් නො කර දිවගියේ කියලා. ඔබ තුළ මමත්වයේ දැඩිභාවය වර්ධනය කරගන්න ඉහත කාරණා හේතුවෙනවා.

දිනක් පිංවත් මහත්මයෙක් බොහෝ ම ආඩම්බරයෙන් ප්‍රකාශ කළා, "හාමුදුරුවනේ, බිය කියන කාරණය සිතන්නේ නැතිව මම කැලයේ ඈතට ගමන් කළා. එහි වැවක් තිබුණා. වැවේ කුළුමීමෙක් ලැගලා සිටියා. ඒ කුළුමීමා මාව දැක්ක ගමන් අහක බලාගත්තා ය කියලා. ඒ මහත්මයා සිතන්නේ, කුළුමීමා අහක බලාගත්තේ තමාගේ ශීලයට, සමාධියට ගරුකරලා කියලා. භික්ෂුව ඒ පිංවත් මහත්මයාට ප්‍රකාශ කළේ, ඒ අවස්ථාවේ එතැනින් මුවෙක් ගමන් කළත් කුළුමීමා අහක බලාගන්නවා කියලා. මුවා දැකලා මඩේ ලැගලා සිටින කුළුමීමා අහක බලාගන්නේ මුවාගේ ශීලයකට ද, සමාධියකට ද කියලා. බුදුරජාණන් වහන්සේ නපුරු සතුන් මඟහැර යන්න කියලා දේශනා කර තිබියදී යම් පිංවතෙක්

නපුරු සතුන් සොයාගෙන යනවා නම් එම පිංවතුන් තුළ නැති ආශ්‍රවයන් ඇතිවෙනවා; ඇති ආශ්‍රවයන් වර්ධනය වෙනවා.

නැවතත් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, හෙල, ප්‍රපාත, මඩ වගුරු, අසූචිවළවල්, කසළ ගොඩවල් මඟහැර යන්නය කියලා. පිංවත් ඔබ කල්පනා කර බලන්න, කසළ ගොඩවල් නිසා අපේ සමාජයේ පිංවතුන්ලා මොන තරම් නැති ආශ්‍රවයන් ඇතිකර ගන්නවා ද කියලා. තමන්ගේ නිවස ඉදිරිපිට කසළ ගොඩක් දැම්මා ය කියලා ගහමරාගන්නා මනුෂ්‍යයෝ සමාජයේ සිටිනවා. කසළ ගොඩකින් අසූචිවළකින් හමන දුර්ගන්ධය නිසා මනුෂ්‍ය සමාජය බැනලා, චෝදනා කරලා, ගුටි ඇනගෙන නැති ආශ්‍රවයන් ඇතිකර ගන්නවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, හෙල, ප්‍රපාත ඇති තැන් මඟහැර යන්න ය කියලා. හෙලක ප්‍රපාතයක සංඝයා උදෙසා කුටියක් සෑදීම බුදුරජාණන් වහන්සේ විනය විරෝධී ක්‍රියාවක් බවට පත්කරලා තිබෙනවා. කුටියක් බැඳීමේ දී ගොනුන් දෙදෙනෙක් බැඳි කරත්තයකට කුටිය වටේ යාමට හැකියාව ඇති ප්‍රමාණයේ ඉඩකඩක් තිබීම අනිවාර්ය වෙනවා. හෙල, ප්‍රපාත වැනි ස්ථානවල ගැවසීම නිසා නිරතුරුවම අනතුරක් පිළිබඳ බියක් සමඟයි ජීවත්වෙන්න සිද්ධවෙන්නේ. ඒ නිසා ම නැති ආශ්‍රවයන් ඇතිවෙනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, පිංවත් ඔබ අකමැති කථා, අකමැති හැසිරීම්, අකමැති වචන, විරුද්ධ මතවාද ඇති තැන් මඟහැර යන්න ය කියලා. වර්තමාන සමාජයේ පිංවතුන්ලා බරපතළ ආශ්‍රවයන් ඇතිකර ගන්නා අවස්ථාවක් තමයි, මැතිවරණ කාලසීමාවන්. මාධ්‍ය හරහා, කටකථා හරහා, දේශනාවන් හරහා අනුන් නිසා බරපතළ ආශ්‍රවයන් සමාජයේ පිංවතුන්ලා ඇතිකර ගන්නවා. ගිහි පිංවතුන්ලා තමන් කැමති පක්ෂයට ඡන්දය ප්‍රකාශ කරන්න. එය ඔබේ ජාතික යුතුකමක් වෙනවා. නමුත් තාවකාලික මැතිවරණ සමයක් නිසා දීර්ඝකාලීන අකුසල් සකස්කර දෙන ස්ථාන, අවස්ථාවන්, පුද්ගලයන් මඟහැර යන්න පිංවත් ඔබ දක්ෂවෙන්න.

ශීලයේ ශක්තියෙන් යුද්ධයක් ජයගන්න අවස්ථාවක් සූත්‍රපිටකයේ තිබෙනවා. මේ යුද්ධය තමයි, බුදුරජාණන් වහන්සේ කාලයේ සිදුවුණු සුර-අසුර යුද්ධය. දිව්‍යතලයේදියි මේ යුද්ධය සිද්ධවෙන්නේ. දෙවියන්ගේ කණ්ඩායමේ නායකත්වය දරන්නේ තෙරුවන් සරණ ගිය ශක්‍රයා. අසුරයන්ගේ කණ්ඩායමේ නායකත්වය දරන්නේ වේපචිත්ති කියන අසුර නායකයා. සුරඅසුර යුද්ධයේ දී ශක්‍රයා අසුරයින් අතින් පරාජයට පත්වෙනවා. පරාජය ලැබූ ශක්‍රයා දිව්‍ය අජානීය අශ්වයන් යෙදූ, මාතලී දිව්‍ය පුත්‍රයා රියදුරු වූ ආජන්‍ය රථයෙන් වේගයෙන් පලාගියා. පලායන ශක්‍රයා කෙසේ හෝ ජීවග්‍රහයෙන් අල්ලාගන්න අසුරයින් ශක්‍රයාගේ රථය පසුපසින් වේගයෙන් ලුහුබැඳ පැමිණියා. ශක්‍රයා අජානීය අශ්ව රථයෙන් වේගයෙන් පලාඑද්දි හිඹුල්වනය නමැති ප්‍රදේශයක් පසුකරමිනුයි අශ්ව රථය වේගයෙන් ගමන් කරන්නේ. දිව්‍යතලයේ මේ හිඹුල්වනය ප්‍රදේශය දිව්‍ය ගුරුළු පක්ෂීන් බහුල වශයෙන් කැදලි තනාගෙන ජීවත්වන ප්‍රදේශයක්. පලායන ශක්‍රයා දකිනවා, අජානීය අශ්ව රථය තවදුරටත් වේගයෙන් ඉදිරියට ගියොත් ගුරුළු පක්ෂීන් සහ ගුරුළු කැදලි, ගුරුළු පැටවුන් මැරිලා විනාශවෙලා යනවා කියලා. ශක්‍රයා තම අජානීය අශ්ව රථයේ රියදුරු මාතලීට අණ කරනවා, මාතලී, මම අසුරයින්ට හසුවුණත් සිල්පදයක් බිඳින්නේ නැහැ කියලා. එම නිසා අශ්ව රථය මින් ඉදිරියට ධාවනය කරන්න එපා. මේ අහිංසක දිව්‍ය ගුරුළු පක්ෂීන් මැරෙනවා. එම නිසා රථය හරවාගෙන පැමිණි දිශාවට ම වේගයෙන් ම පදවන්න කියලා. ශක්‍රයා තම ශක්තිමත් ශීලය ගැන සත්‍යක්‍රියා කරමිනුයි රථය ආපසු හරවන්න අණ කළේ. පැරදී පලායන ශක්‍රයා නැවත තම දිව්‍යරථය හරවාගෙන වේගයෙන් තමන් ඉදිරියට පැමිණෙනවා දැක, අනිවාර්යෙන් ම ශක්‍රයා නැවත ශක්තිමත් වී දිව්‍ය සේනාව සමඟ ප්‍රතිප්‍රහාරය සඳහා පැමිණෙනවා යයි සැක සිතූ අසුර පිරිස තම රථය හරවාගෙන පලාගියා. ශක්‍රයා ද පලායන අසුරයින් ලුහුබැඳ ගොස් ඔවුන් අසුරපුරයට ම එලවා දැම්මා.

සුරඅසුර යුද්ධයේ දී පළමුව දෙවියන් අසුරයන්ට පැරදී, දෙවනුව අසුරයින් පරාජය කර දෙවියන් ජයග්‍රහණය ලබන්නේ දිව්‍යතලයේ හිඹුල්වනය නම් ප්‍රදේශයේ බහුල වශයෙන් ජීවත්වන දිව්‍ය ගුරුළු පක්ෂීන්ට, එම පක්ෂීන්ගේ කැදලිවලට, පැටවුන්ට අනතුරක්, සත්ව හිංසාවක්, සත්ව ඝාතනයක් නො කරනවා ය කියන අධිෂ්ඨානයෙන් තම ජීවිත ආශාව පවා අත්හැර ශක්‍රයා තමන්ගේ ශීලය කෙරෙහි ඇතිකරගත් විශ්වාසය නිසා ම යි; සමාදන් වූ සිල්පදයක් කඩ නො කරනවා ය කියලා ඇතිකරගත් අධිෂ්ඨානය නිසා ම යි. ශක්‍රයා සුරඅසුර යුද්ධය දිනන්නේ ශීලය සරණ කරගෙන යි. ශීලයේ ශක්තියෙන් අතීතයේ ශක්‍රයා ජයග්‍රහණය කළ මේ යුද්ධයේ අර්ථය වර්තමානයේ නම් හාස්‍යයට ලක්වෙන්නත් පුළුවන්. මොකද, වර්තමානයේ යුද්ධයක් කොයිහැටි වෙතත් මැතිවරණ සමයකදීත් සිල්පද බිඳිමින්, අකුසල් මූලයන් වඩමින්, නැති ආශ්‍රවයන් වඩවාගනිමින් තමයි කටයුතු සිද්ධවෙන්නේ. මේවායින් කුමක්ද අපි දකින්නේ? ශක්‍රයාට තිබෙන පින අපට නැහැ ය කියන කාරණය යි. යමක් ලබන්න නම්, යමක් දිනන්න නම් ගොඩාක් පව්කම් සිදුකරගෙන තමයි එය ලබන්න, දිනන්න වෙන්නේ. එම නිසා ආශ්‍රවයන් වැඩෙන මෙවැනි ධර්මතාවයන් මඟහැර යන්න ය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

පුංචි කුහුඹුවාගෙනුත් ඔබ ලොකු ආශ්‍රවයන් ඇතිකර ගන්නවා ද?

මැසිමදුරුවන්, කූඹින්, කැරපොත්තන්, ගොයම් මැස්සන් වැනි කෘමීන් ආදී උවදුරු මඟහැර යෑමට ඇති අදක්‍ෂභාවය නිසාම සමාජය නිරතුරුව ම නැති ආශ්‍රවයන් ඇතිකර ගන්නවා; ඇති ආශ්‍රවයන් වර්ධනය කරගන්නවා. එම නිසා පිංවතුන් දක්‍ෂවෙන්න, මෙවැනි කෘමි උවදුරු ආරක්‍ෂක ක්‍රමවේදයක් උපයෝගී කරගෙන මඟහැර යන්න.

මදුරුවන් ගැවසෙනවා නම්, මදුරුදැලක් පාවිච්චි කරන්න. කුහුඹුවන් පැමිණෙනවා නම් ඊට අදාළව ආරක්ෂිත උපක්‍රම ඇතිකර ගන්න. මැසිමදුරුවන්, කූඹින් වැඩිපුර ගැවසෙන නිවාසවල ජීවත්වන පිංවතුන්ලාට කේන්තියෑමේ, සිත විසිරීමේ ස්වභාවයන් වැඩිවෙනවා. සමහරක් පිංවතුන්ලා, දරුවන් ධර්මය ශ්‍රවණය කරනකොටත්, අත්පුඩි ගහනවා වගේ ශරීරයට ගහගන්නවා. ඒ කියන්නේ, දෂ්ට කරන මදුරුවා මරනවා. ඒ වෙලාවට භික්‍ෂුවට හිතෙනවා, "බණ අහන වෙලාවට මෙහෙම නම්, ගෙදර සිටින වෙලාවට කොහොම වෙයිද?" කියලා.

එක් දරුවෙක් භික්‍ෂුවට ප්‍රකාශ කළේ, අපේ අම්මා කෘමිනාශක යොදා නිරතුරුව ම කූඹින්, මැස්සන් මරනවා කියලයි.

ගුණාත්මකභාවයන් මඟහැර, අස්වැන්න වැඩිකර ගැනීමේ තෘෂ්ණාධික ක්‍රමවේදයන් නිසා, කෘෂිකර්මාන්තය ආශ්‍රිතව ද කෘමිනාශක හේතුවෙන් පිංවතුන්ලා බරපතළ වූ සත්ව ඝාතනයන්ට, හිංසාවන්ට අදාළ ආශ්‍රවයන් වර්ධනය කරගන්නවා. රූපය මාරයා

හැටියට දකින්න ඇති අදක්ෂභාවය නිසා ම, මඟහැර යා යුතු සිතුවිලි මඟහැර යෑමට ඇති අදක්ෂභාවය නිසාම ප්‍රාණඝාතනයට, සත්ව හිංසනයට අදාළ ආශ්‍රවයන් ඇතිකොට ගන්නවා.

පිංවත් ඔබ මැසිමදුරුවන්, ගොයම් මැස්සන්, කැරපොත්තන් කුඩා සතුන් ය කියලා, මෙවැනි සතුන් ඔබ අතින් මැරුණොත් අකුසලය අඩු ය කියලා හිතන්න නම් එපා. ඒ සිත මාර සිතක්ය කියලා දැක මඟහැර යන්න. පිංවත් ඔබ නිරතුරුව ම මෙවැනි කෘමිසතුන් මරාදමන කෙනෙක් නම්, ඔබ මැරෙන මොහොතේ මෙවැනි සත්ව ඝාතනයක් සිහිපත් වුණොත්, මෙවැනි ම කෘමි කුලවල ඉපදීමටත්, මනුෂ්‍ය ජීවිතයක් ලැබුවහොත්, නිරතුරුවම රෝගාබාධයන්ට ලක්වී ජීවත්වීමටත්, ශීලයෙන් හුඟක් දුර්වල කෙනෙක් නම්, නිරයට වැටීමටත් ඉඩ තිබෙනවා.

වර්තමාන බලකාමී ලෝකය තුළ වසවිස යොදා රසායනික අවි නිෂ්පාදනය වෙන්නේ, ඒවා නිෂ්පාදනය කිරීමට ලෝකයාට සිතදෙන්නේ, මනුෂ්‍යයා රසායනික, කෘමිනාශක යොදා සත්ව ඝාතනයන්, සත්ව හිංසාවන් සිදුකිරීමේ බලවත්භාවයට ප්‍රතිධර්මයක් හැටියට යි. වර්තමානයේ කෘමිනාශක යොදා මැස්සන්, මදුරුවන්, ගොයමේ, වගාබිමේ කෘමීන් මරාදමන පිංවතුන්ලා අනාගතයේ ඇතිවන රසායනික අවි යුද්ධවල දී, කර්මාන්තශාලා, විදුලිබලාගාර ආශ්‍රිත විෂවායු කාන්දුවීම්වල දී, අද කූඹින්, මැස්සන්, කැරපොත්තන්, ගොයම් මැස්සන් මරන ආකාරයට ම මියයෑමට ඔබට සිදුවනු ඇත.

වර්තමානයේ කෘමිනාශක යොදා කෘමීන්ව රංචු වශයෙන් මරන ආකාරයට ම, අනාගතයේ දී රංචු වශයෙන් මනුෂ්‍යයන් විෂ රසායන හේතුවෙන් මියයනු ඇත; රෝගීවනු ඇත. මේ මොහොතේත් සමාජයෙන් මැසිවිලි නැගෙනවා. වායුගෝලය විෂ රසායනයන්ගෙන් බහුලවීම හේතුවෙන්, වාතය දූෂණය වී පෙනහලු ආශ්‍රිත බරපතළ වූ රෝගාබාධයන්ට මනුෂ්‍යයා පත් වී ඇති ආකාරය පෙනෙනවා. මේ සියලු ලෝක තත්වයන් අකුසල් විපාකයන්ගේ හේතු ධර්මතාවයන් ය.

වාහනවල කළු දුම් පරීක්ෂා කළා කියලා, සාකච්ඡා, සම්මන්ත්‍රණ තිබ්බා ය කියලා මේ ලෝක ධර්මතාවයන් වළක්වන්න බැහැ. මෙම ව්‍යසනයන් ධර්මානුකූලව තේරුම් ගැනීමට දක්ෂ පිංවතුන්ලා පමණක් දුක දෙසට ගමන් කරන ලෝකයාට පාවඩ එලන්නේ නැතිව, තනිතනිව සත්ව ඝාතනයට, සත්ව හිංසාවට අදාළ ආශ්‍රවයන් ඇතිවන අවස්ථා මඟහැර යෑමට දක්ෂවෙන්න.

මෙතැන් සිට සමථ-විදර්ශනාවට එන්න

සබ්බාසව සූත්‍රයට අදාළව බුදුරජාණන් වහන්සේ දේශනා කළ, දර්ශනයෙන්, වීර්යෙන්, සංවරයෙන්, ප්‍රත්‍යවේක්ෂාවෙන්, දුරුකිරීමෙන්, මඟහැර යෑමෙන් ආශ්‍රවයන් ප්‍රහාණය කිරීමෙන් අනතුරුවයි, බුදුරජාණන් වහන්සේ සමථ-විදර්ශනාවෙන් ප්‍රහාණය කළ යුතු ආශ්‍රවයන් ගැන දේශනා කරන්නේ. පිංවත් ඔබ ඉහත කාරණා හයෙන් පිරිසිදුභාවයට පත්වුණොත් පමණයි, ඔබ තුළ අර්ථවත් ආකාරයට, සමථ-විදර්ශනාව වැඩෙන්නේ. ඉහත කාරණා හයෙන් ඔබේ කෙළෙස් ධර්මයන් තුනී කොටගැනීමෙන් තොරව, පළමු අදියරේ දී ම සමථ-විදර්ශනාව පුහුණුවීමට ගියොත්, සමථ-විදර්ශනාවේ නාමයෙන් ඔබ තුළ වැඩෙන්නේ සක්කාය දිට්ඨිය ම යි. එම නිසා පිංවත් ඔබ, එරමිණියා ගොතාගෙන සමථ-විදර්ශනාව පුහුණුවීමට පෙරාතුව, එදිනෙදා ජීවිතයේ දී, නිවසේ දී, කාර්යාලයේ දී, සබ්බාසව සූත්‍රයට අදාළව ඉහත කාරණා හය ජීවිතය තුළින් ක්‍රියාත්මක කරන්න. එය සමථ-විදර්ශනාව තුළ ශක්තිමත් වීමට ඔබට අර්ථවත් පූර්වකෘතියක් වේවි.

සබ්බාසව සූත්‍රය ගැන සටහන අවසන් කරනකොට, සබ්බාසව සූත්‍රයේ අර්ථයන්ගෙන් තොරව සමථ-විදර්ශනාව පුහුණු කළ මහත්මයෙක්ගේ ක්‍රියාවක් මතකයට එනවා. දිනක් භික්ෂුව ආරණ්‍යයක වැඩසිටින විට පිංවත් මහත්මයෙක් භික්ෂුවගෙන් විමසුවා, ආරණ්‍යයේ තමන්ට භාවනා කරන්න කුටියක් හිස්ව තිබෙනවා ද කියලා. ඒ මහත්මයා ප්‍රකාශ කළේ තමන් අධිගමලාභියෙක් ය කියලයි. භික්ෂුව එම මහත්මයාගෙන් විමසුවා, "ඇයි මහත්මයා නේවාසික භාවනා කුටියක් සොයන්නේ"

කියලා. එවිට ඒ මහත්මයා කියනවා, "හාමුදුරුවනේ, මම රාත්‍රියට ආහාර අනුභව කරලා, නිවසේ මගේ කාමරයට ගිහින් දොර අගුළු දමාගෙන භාවනා කරන්න පටන්ගන්නවා. පසුදා උදෑසන හයට තේ කෝප්පයක් හදාගෙන ඇවිත් මගේ බිරිඳ කාමරයේ දොරට ගහනවා. බිරිඳට කිව්වාට අහන්නේ නැහැ, පාන්දර හයට දොරට ගහන්න එපා ය කියලා. බිරිඳගේ මේ කරදරය නිසයි මම භාවනා කරන්න කුටියක් සොයන්නේ" කියලා. ඒ මහත්මයා මේ කියන්නේ, රාත්‍රී ආහාරයෙන් පසුව පටන්ගන්නා භාවනාව, පසුදා උදෑසන හය දක්වා කරගෙන යනවා කියලා. ඒ කියන්නේ පැය 9ක් පමණ එකදිගට භාවනා කරනවා, බිරිඳගේ උදේ තේ කෝප්පය නිසා භාවනාව කැඩෙනවා කියලා. මේ මහත්මයා එක පැත්තකින් තමා අධිගමලාභියෙක් හැටියට ප්‍රකාශ කරනවා. අනෙක් පැත්තෙන් තමා ඉස්මතුකොට පෙන්වීමට අමූලික බොරුවක් කියනවා. අවම වශයෙන් සිල්පද පහවත් ආරක්ෂාකර ගන්න උත්සාහයක් ගන්නේ නැහැ. සබ්බාසව සූත්‍රයට අදාළව, ආශ්‍රවයන් හීන කිරීමේ, සිත පිරිසිදු කිරීමේ පූර්වකෘති කිරීමෙන් තොරව සමථ විදර්ශනාව පුහුණු කරලා, සමථ-විදර්ශනාවේ නාමයෙන් සක්කාය දිට්ඨිය වඩවාගත්ත චරිතයක කථාවකුයි භික්ෂුව ඉහතින් සටහන් තැබුවේ. පිංවත් ඔබ සමථ-විදර්ශනාව පුහුණුවීමට පෙරාතුව සබ්බාසව සූත්‍රයේ අර්ථයන් නිවැරදිව ජීවිතයට එකතුකොට ගෙන සමථ-විදර්ශනාව සාර්ථක කොටගන්න දක්ෂ වෙන්න.

සබ්බාසව සූත්‍රයට අදාළ ලිපි මාලාව මෙතැනින් අවසන් වේ.
සතර සතිපට්ඨානයට අදාල ලිපි එකතුව
අතහැරීම 11 පොතෙහි ඇතුළත් වන බව
කාරුණිකව සලකන්න.



ඝෝරතර සසරේ
තවත් එක් සන්ධියක
ඉබාගාතේ ඇවිදි
සංසාර සතුන් හට
නොඇලෙන්න කියාදුන්
නොගැටෙන්න සිහිය දුන්
අතහරින සතිය දුන්
නිදුකානගේම පුත්
සඟ මැණික ඔබම විය

කරගන්න මහ කුසල්
බෙදා ලොවටම දහම
ඔබේ අවබෝධයෙන්
සැනසීය මනු කැලක්
එමතු නොව දෙවියෝද
එයින් තුටු වනු දනිමි

සාරිපුත් පරපුරේ
අපේ කාලේ උපන්
මහකසුප් මහතෙරගෙ
එමඟ යන බුදු පුතුනි
එක්කෝ මරණයය
නොමැතිනම් නිවනමය
කියා කළ සිහ නාද
තව කොහෙන් අසන්නද

ඔබේ දම් ගැලපුමට
නොතිත් පැසසුම් එතැයි
කියූ කල මා ඔබට
පුතේ මේ මගෙ නොවෙයි
බුදුරජුන් දහමමය
නිහතමානීව කිවු
ඒ වදන් රාවදෙයි

කොහේ හෝ වන පෙතක
මේ මොහොතෙ වැඩ සිටින
අපේ පිනටම උපන්
හිමියනේ ඔබෙ ගුණෙන්
දකිමු අපි බුදු රජුන්

ඒ අමා මෑණියන්
සහස් දෙකකුත් අඩක්
ගෙවී වස් ගතවෙතත්
වදයි ඔබ වැනි පුතුන්
ලෝ සතට සෙනෙහසින්

ISBN 978-955-7887-22-7

මුද්‍රණය: ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂනස් සෙන්ටර්

මිල රු. 170/-